සිල්මාතා කායිවි

මෑත කාලයේ පහළ වූ
රහත් තෙරණිය

ඇයගේ රහත් ඵලය
දක්වා
ගමන් මග
සහ
නිවන් අවබෝධය



භික්ඛු ආනන්ද
- බුද්ධංගල -

සිල්මාතා කායිවී

මෑත කාලයේ පහළ වූ රහත් තෙරණිය

භික්ඛු ආනන්ද

ඇයගේ රහත් ඵලය දක්වා ගමන් මග සහ
නිවන් අවබෝධය

"ධම් දානයකි. නොමිලේ බෙදාහැරීම පිණිසය"

© භික්ඛු ආනන්ද 2011

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල මණ්ඩලය - ප්‍රකාශන සුචිකරණ දත්ත

xxxxxxxx.....

පොත ලබාගත හැකි ස්ථාන

1. බුද්ධංගල ආරණ්‍යය
   අම්පාර
   063-3632330

2. කළමනාකාර
   ධම්ම කූඨ විපස්සනා භාවනා මධ්‍යස්ථානය
   මහකන්ද, හිඳගල
   08/12385774

3. කළමනාකාර

   හෝමාගම කාර්යාලය
   කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගම
   අංක 67, කටුවාන පාර, හෝමාගම
   011-2855520

   කොළඹ කාර්යාලය
   අංක 122/1,
   හැව්ලොක් පාර, කොළඹ 05
   011-4366203

4. ඔසුකි ආයුර්වේද
   117/1, බුත්ගමුව පාර
   කලපළුවාව, රාජගිරිය
   011-2792394

සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්) සමාගම මගින් මුද්‍රිත මෙම පොත FSC සහතිකය ලද කඩදාසියේ සහ එළවළු තෙල් භාවිතයෙන් නිපදවන ලැබූ විෂ රහිත තීන්ත ඇතුළු පරිසර හිතකාමී අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදනය කරන ලද්දකි.
(www.karusons.com)

අම්මා !

ලෝකය දෙස සංවරව බලන ලෙස මුල්වරට උගන්වා
සම්මා දිට්ඨියේ මුල වටහා දුන්නේ ඔබයි.

නිවැරදිව කල්පනා කළ යුතු බව මුලින් ම උගන්වා
සම්මා සංකල්පයේ තේරුම වටහා දුන්නේ ඔබයි.

කනට මිහිරි වචන කතා කළ යුතු යයි අවවාද දී
සම්මා වාචා හි වටිනාකම කියා දුන්නේ ඔබයි.

සියලු කායික ක්‍රියාවන්හි පවිත්‍රත්වය
රැකිය යුතු බව කියා දී
සම්මා කම්මන්තය සිතට කා වැද්දුවේ ඔබයි.

ජීවත් වීමට ගන්නා සෑම වෑයමක් ම අවංක වූ
පිරිසිදුවූ වෑයමක් විය යුතු බැව්
අවධාරණය කොට
සම්මා වායාම හදුන්වා දුන්නේ ඔබයි.

ධාර්මිකව තම ජීවිකාව
ගෙන යා යුතු බැව් මුලින් ම අනිවාර්ය කොට
කියා දී සම්මා ආජීවය වෙත
මා සිත යොමු කළේ ඔබයි.

එදිනෙදා තම කටයුතු හොඳ කල්පනාවෙන්
ඉටු කළ යුතු බවට දැඩිව වටහා දී
සම්මා සතිය මට පුරුදු පුහුණු කළේ ඔබයි.

උදේ සවස පන්සිල් ගනිමින් බුදු ගුණ සිහි කරමින්
බුද්ධානුස්මෘතිය වැඩීමට මා පොලඹවා
සම්මා සමාධිය මා සිත තුළ රෝපණය කළේ ඔබයි.

මෙසේ
ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ
මුල් පොත මට මුල් වරට කියා දුන්නේ ද ඔබයි.
අම්මේ,
ඔබ අපට ගෙදර බුදු කෙනෙක් වූවා.
මෑත යුගයේ පහළ වූ රහත් තෙරණියකගේ
ජීවිත කතාව අඩංගු මේ පොත,
පිළිගැන්වීමට
සුදුසු ම කාන්තාව ඔබයි.
මට අනුකම්පාවෙන් මේ පොත පිළිගනු මැනවි.
ඔබට මග එල ලැබීමේ ප්‍රාර්ථනාව ලැබේවා !

මේ ගිහි කල ඔබේ ලොකු පුතා

මේ පොත ගැන පරිවර්තකගෙන් .....

"මයි චි කායිව්" නම්වූ ඉංග්‍රීසි පොත මා අත පත්වූයේ 2010 වර්ෂයේ අග දී ය. පිටුවෙන් පිටුව කියවද්දී මාගේ උනන්දුව ටිකෙන් ටික වැඩි කළ පොතකි. පාසැල් නො ගිය පිටිසර ගමක හැදුණු වැඩුණු දිළිඳු ගැහැනියක් රහත් ඵලය දක්වා ගිය ගමන් මග එහි අපූර්ව ලෙසට විස්තර විය.

මේ කාලෙ රහත් වෙන්න පුළුවන් ද? පාලි වචනයක්වත් නොදැන ත්‍රිපිටකය පරිශීලනය නො කර, මේ වගේ ගොයම් හිටවපු, ඇඳුම් මහපු විකුණපු, බටපතුරු ගමන් මලු සාදපු සාමාන්‍ය මොළයක් තියන ගෙවිලියකට රහත් මනසක් කොහොම ඇතිකර ගන්න ද? කෙනෙක් රහත් කියල කියන්න පුළුවන් රහතන් වහන්සේ නමකට පමණයි. බුද්ධකාලෙ ගෑනු පිරිමි රහත් වුණේ ඒ කාලෙ උපදින්න ඒ අයට පෙර පින් තිබුණු නිසා.

මෙවන් අදහස් තැනින් තැන සාකච්ඡා වන සමාජයකට මෙම පොත ඉදිරිපත් කරද්දී සමහරකගේ අප්‍රසන්න විවේචනයන්ට ගොදුරු වීම වැළැක්විය නොහැක. මීට පිළිතුරු විශේෂ ලිපියකින් පොතෙහි අග "රහත් ඵලය ගැන සැක ඇත්තන් හට අනුකම්පාවෙනි." මාතෘකාව යටතේ දී ඇත. බුදු දහම ගැන ශාස්ත්‍රීය ග්‍රන්ථ රාශියක් කියවා හෙම්බත් වී සිටින මට, මිනිස් ස්ත්‍රියක ව උපදින්නට පින් තිබූ සාමාන්‍ය කාන්තාවකගේ "නිවන" කරා අහිංසක ව ගිය ප්‍රායෝගික මග, බුදුන් වදාළ ධර්මය ඉදිරියේ දහස් වරක් වැඳ වැටීමට තරම් මා දිරිමත් කළේ ය. ධර්මයේ අකාලික බව මෙම ශත වර්ෂයන්හි දී පවා අත්දැකිය හැකි බව මෙම පොත තුළින් ද සමාජයට කියාදිය හැකි යයි වැටහී සතුටට පත් වීමි. ධර්මය ගැන දහස් ගණනින් පොත පත කියවා ලබන විශාරද දැනීම

සහ ප්‍රායෝගිකව භාවනාවෙන් ලබන "යථාභූත ඥානය" අතර වෙනස මෙම පොතෙන් පැහැදිලිව පෙන්වා දෙයි. ධර්මය අදත් අප අතරේ ජීවමානව ඇත යන්න ස්ථිර කිරීමට සිල් මාතා කායිච්ගේ ජීවිත කතාව ප්‍රබල සාක්ෂියකි.

වර්තමානයේ පොහොය දිනක වේවා වෙනත් ආගමික වැඩ සටහනක දී වේවා පන්සලක හෝ එවන් තැනක අපට වැඩියෙන් දැකිය හැක්කේ කාන්තාවන් ය. පිරිමින්ගේ සහභාගිත්වය ඉතා අල්ප ය. ශ්‍රද්ධාව සහ භක්තිය යන සන්ධිස්ථානයන්හි නැවතුණු අතිවිශාල සංඛ්‍යාව කාන්තාවන් ය. ජීවිතයේ දරුණුම වේදනා විඳින්නෝ කාන්තාවෝ ය. දුක් වේදනාවන්ගෙන් මිදීමට විවිධ මං සොයන වැඩි පිරිස කාන්තාවෝ ය. සැනසීම සොයා බෝධිපූජාවන්හි වඩා නිරත වන්නෝ කාන්තාවෝය. එසේම ඕනෑම පිංකමක් අවසානයේ "නිවන්සැප ලැබේවා" යයි යන ආශීර්වාදය ඇසෙත් ම හඬ නගා සාදු කියන වැඩි පිරිස ද කාන්තාවෝ ය. සිදු කළ පින්කමෙන් නිවන ලැබේ ද එසේ නැතහොත් භාවනාවෙන් නිවන ලැබේ ද යන්න ඔවුන් සිතන්නේ දැයි විමසා බැලිය යුත්තකි.

මේ පොත සාමාන්‍ය ගැහැනියක් රහත් තෙරණියකගේ මනසක් තමා තුළ සකස් කරගත් අයුරු ලොවට පෙන්වන ආදර්ශවත් චරිත කතාවකි. විශේෂයෙන් ධර්මය සොය සොයා සතිඅන්ත පංතිවලට යමින්, වන්දනාවන්හි පමණක් සිරවී සිටින අහිංසක කාන්තාවන් ධෛර්යවත් කරන සත්‍ය කතාවකි. බුදුන් වහන්සේගේ අන්තිම දේශනාවට අනුව ආර්ය අෂ්ඨාංගික මාර්ගය පවතින තාක් ලෝකය රහතුන්ගෙන් හිස් නොවනු ඇත යන බුද්ධ වදන තහවුරු කරන කතාවකි.

මෑත යුගයේ පහළ වූ රහත් තෙරණියකගේ කතාව සිංහලට පරිවර්තනය කරද්දී මගේ සිහියට නැගී ආයේ අතීතයේ රහත් තෙරණින් ප්‍රකාශ කළ උදාන වාක්‍යයන් ය. විවිධ ජීවිත ගෙන ගිය කාන්තාවන් රහත් ඵලය සාක්ෂාත් කළ පසු ප්‍රකාශිත උදාන වාක්‍යයන්ගෙන් ඔවුන් ගිහි කල ගෙන ගිය ජීවන රටාව ද හෙළිදරව් කරයි. උදාහරණයක් වශයෙන් සුමුත්තා නම් වූ සරල දිවිපෙවෙතක් ගෙනගිය ගෘහණිය රහත් බවට පැමිණ මෙසේ උදම් අනන්නී ය.

"සුමුත්තා මැනවින් මිදුණේ වෙමි. තුන් කුදෙන් මිදුණේ වෙමි. වංගෙඩියෙන්, මෝල්ගසින් සහ කුදු සැමියාගෙන් මිදුණෙමි. ඉපදීම සහ මරණයෙන් ද මිදුණෙමි."

මේ කුදු මිනිසෙකු හා විවාහ වී නැමී නැමී වංගෙඩියෙන් මෝල් ගසින් වැඩපළ කළ දිළිඳු ගැහැනියක් රහත් වූ වගයි.

මෙම පොත කියවන ස්ත්‍රී පුරුෂ හැමටම ධර්මයේ ඵල නෙළා ගැනීමේ ධෛර්ය ඇතිවේවා! වීර්යය දියුණු වේවා! ප්‍රායෝගික භාවනාවට සිත් නැඹුරු වේවා! මේ ආත්මයේ දී ම නිවන් අවබෝධය සඳහා ප්‍රඥාව වැඩි දියුණු වේවා!

තායි භාෂාවෙන් මුල්වරට ලියැවුණු මෙම පොතෙහි ඉංග්‍රීසි පරිවර්තනය කරන ලද්දේ අතිපූජ්‍ය (අජාන්) සීලරතනො තෙරුන් වහන්සේ ය. උන්වහන්සේ ගැන කෙටි විස්තරයක් පසු පිටක ඇත. මෙම පොතෙහි කතා නායිකාවගේ කම්මට්ඨානාචාර්යයන් වහන්සේ වූයේ ලුවවංතා මහා බෝවා මහතෙරුන් වහන්සේ ය. උන්වහන්සේ මහරහතන් වහන්සේ නමක් බව ලොව ප්‍රචලිත ය. උන්වහන්සේගේ ගමන් මාර්ගය ගැන දේශනා කළ ධර්මදේශනා එකතුවක් වන "අර්හත් මාර්ගය අර්හත් ඵලය" නමැති පොතෙන් එම උත්තරීතර මනස ලබාගත් බව තහවුරු වේ. උන්වහන්සේ 2011 ජනවාරි මස 30 වැනි දින වයස අවුරුදු 97ක් ආයු වළඳා පිරිනිවී සේක. අජාන් සීලරතනො තෙරණුවෝ මහා බෝවා මහරහතන් වහන්සේ යටතේ අවුරුදු 30ක් මහණ දම් පිරූහ. උන්වහන්සේ දැනට තායිලන්තයේ "වට් පා සාලා නොයි" ආරණ්‍යයේ වැඩ වාසය කරති. මෙම පොත සිංහලට පරිවර්තනය කිරීමට අනුමැතිය සහ ඊට අදාළ උපදෙස් දුන් උන්වහන්සේට මම වැඳ නමස්කාර කර මගේ ගෞරවය පුද කරමි. පොත පරිවර්තනය කිරීමෙන් පසු එහි සඳහන් සමහර ධර්ම කරුණු නිවැරදිව තේරුම් ගැනීමට සහ පැහැදිලි කර ගැනීමට මම, උන් වහන්සේ වැඩ සිටි ආරණ්‍යයට වැඩම කළෙමි. එහි වැඩ සිටිනා භාවනානුයෝගී ලොකු කුඩා සියලු ම භික්ෂූන් වහන්සේලා, ධර්ම විනය අනුව ඉතා ආදර්ශවත් ජීවිත ගෙන යති. ආරණ්‍යයේ සේනාසනාධිපති, අජාන් නිපොන් අභිසම්පන්නො මහා තෙරුන් වහන්සේ ඇතුළු සියලු ම අරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා මාගේ සියලු ම අවශ්‍යතා ඉටුකර දීමට අනුකම්පාවෙන් සහාය දුන්හ. මම ඒ හැමදෙනා වහන්සේලා ම කෘතඥපූර්වක ව ගෞරවයෙන් සිහිපත් කරමි.

දහමට මගේ සිත මුල්වර නැඹුරු කළ මුල් ගුරුවරයන්, මගේ දෙමාපියන් ය. සතර බ්‍රහ්ම විහරණයන්ගෙන් පරිපූර්ණ සිත් ඇති එම පින්වත් දෙදෙනා සසර දුකින් මිදෙත්වා යි ප්‍රාර්ථනා කරමි.

රහත් ඵලය, නෙක්ඛම්ම සුඛය විඳින්නෝ හිමිකරගන්නා වාසනාවකි: සම්පත්තියකි. නෙක්ඛම්ම සුඛය විඳීම සඳහා මගේ පැවිදි ජීවිතය ධම්ම විනය අනුව සකස් කරනුයේ මාගේ පැවිදි ආචාර්යවරුන් ය. අදට වයස අවුරුදු 103ක් ආයු වළඳන රාමඤ්ඤ මහානිකායේ මහානායක අතිපූජ්‍ය වේවැල්දෙණියේ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ මාගේ උපසම්පදා උපාධ්‍යාචාර්යන් වහන්සේ ය. අතිපූජ්‍ය කලුතර ධම්මානන්ද මහා ස්වාමීන් වහන්සේ, අතිපූජ්‍ය බටයායේ අරියවංස මහා ස්වාමීන් වහන්සේ සහ පූජ්‍ය දීඝවාපියේ සුසීම ස්වාමීන් වහන්සේ යන උත්තමයෝ මාගේ ආචාර්යයන් වහන්සේලා ය. මාගේ භික්ෂු ජීවිතය සකස් කළ සකස් කරන මේ ගෞරවනීය ගුරුවරයන් වහන්සේලා, මා සංසාරයේ මෙතෙක් කල් එකතු කරගත් සියලු ම කුසල් අනුමෝදන් කර ගනිත්වා!

තායිලන්තයේ භික්ෂුණී ශාසනයක් නොමැත. ගිහිගෙයින් ස්ථිර ව ම නික්ම, හිස බා සුදුවත් හැඳ අෂ්ඨාංග ශීලය සමාදන් වී, ශාසනගත වූ කාන්තා කොට්ඨාසයකි. ගිහිගෙන් නික්ම අෂ්ඨාංග ශීලය මූලික පදනම කොටගෙන අර්හත් ඵලය දක්වා යා හැකි යයි සනාථ කරන මෙම පොත පරිච්ඡේද හතරකින් සමන්විත වන අතර අතුරු කථාංග 28කින් යුක්තය. හැකිතාක් දුරට ඉතා සරල වදන් යොදමින් රහත් ඵලය දක්වා මනසේ ඇතිවන එක් එක් ස්වභාවයන් සහ ආශ්චර්යවත් හැසිරීම් රටාව පැහැදිලි කර තිබේ. සිංහල භාෂාවට පරිවර්තනය කිරීමේදී භාෂා රීති විමසා සකස් කිරීමට සහ සෝදුපත් කියවා නිවැරදි කිරීමට අම්පාර බණ්ඩාරනායක බාලිකා විදුහලේ ආචාරිණී එච්. ඩබ්. තමරා නිල්මිණි නැගණිය මට මහත් සේ උපකාර වූවාය. ඇය ගත් වෙහෙස සසර කෙටිකර ගැනීමට ඉවහල් වේවා යයි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමි.

එමෙන් ම මෙවන් පොතක් අප රට තුළ මුද්‍රණය වන්නේ මුල් වතාවට බව මගේ හැඟීමයි. නවීන තාක්ෂණය උපයෝගි කර ගනිමින් මුද්‍රණ කටයුතු කර දුන් මුද්‍රණ ක්ෂේත්‍රයේ ඉදිරියෙන් සිටින කරුණාරත්න සහ පුත්‍රයෝ සමාගමේ අධ්‍යක්ෂතුමා සහ කාර්ය මණ්ඩලයටත්, මෙහි සම්බන්ධීකරණ කටයුතු කළ චතුර ජයංකිත මහතාටත්, පොතේ ගෞරවනීය තත්ත්වය ආරක්ෂා වන සේ මෙම පොතෙහි පිටකවරය නිර්මාණය කළ මාගේ සහෝදර ඩොනල්ඩ් වීරසේකර සහ අනුරාධ ඩයස් මහතාටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරනුයේ, ධර්මය අසා ධරා එහි ප්‍රතිඵල නෙළා ගැනීමට හැකි වේවා යන පින් අනුමෝදනාවෙනි.

ධර්ම දානයක් වශයෙන් නොමිලේ බෙදාහැරෙන මෙම පොත පිටපත් 30,000 ක් මුල් වරට මුද්‍රණය කිරීමට විශාල මුදලක් අවශ්‍ය විය. ඊට ස්වකැමැත්තෙන් ම ඉදිරිපත් වූයේ, මා වැඩිමහල් සොහොයුරියක සේ සලකන මොරීන් වීරතුංග මැතිණියයි. භාවනා පුහුණුව ගැන මහත් වූ උද්‍යෝගයක් දක්වන එතුමියට එම අවශ්‍ය මුදල දින කීපයක් තුළ දී එකතු කර ගැනීමට හැකි විය. සසරින් එතෙර වීමට ඇයට ඇති සියලු ප්‍රාර්ථනා සඵල වේවා! අලෝභ සිත්වලින් පරිපූර්ණ සම්මා කම්මන්තයන්හි යෙදෙන බොහෝ දෙනා මෙම ආරංචිය ලැබෙත් ම මුදලින් ආධාර කිරීමට උත්සුක වූහ. ඒ සියල්ලෝ ම පාහේ තම නම් ප්‍රසිද්ධ කිරීමට අකමැති අල්පේච්ඡ ගති ඇත්තෝ ය. මේ ආත්මයේ දී ම ප්‍රඥාව දියුණු කර ගැනීමට අවැසි චිත්ත ධෛර්යය ලැබේවා යි ඒ හැමට මම මෛත්‍රී සිතින් ප්‍රාර්ථනා කරමි.

මා වසන බුද්ධංගල ආරණ්‍යය, සර්වඥධාතූන් සහ සැරියුත් මුගලන් මහරහත් ධාතූන් එකට වැඩ සිටිනා චෛත්‍ය පිහිටි භූමිය, ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයේ පටන් පැවතෙන ඉපැරණි ආරණ්‍යයකි. රහතන් වහන්සේලා වැඩ සිටි ආරණ්‍යයකි. එහි ගහකොළ අතරින් හමන සුළඟ සුවදායක ය. ගහකොළ පර්වත රමණීය ය. සිත එකඟ කර ගැනීමට බුදුන් වදාළ සියලු ම සුදුසුකම් බුද්ධංගල ආරණ්‍යය සතුව ඇත. නිසල ය. සුන්දර ය. සිතට සැනසීම ගෙනෙයි. තැන්පත් වෙයි. මෙම පොත පරිවර්තනය කිරීමට මගේ ආරණ්‍යය මට මහෝපකාරී විය. මේ බිම අනාගතයේ දී දියුණු සිත් ඇති කරවන පවිවේකී පින් බිමක් වේවා!

භික්ඛු ආනන්ද

බුද්ධංගල ආරණ්‍ය සේනාසනය
අම්පාර
2011 ඇසළ මස 14 දින

පටුන

හැඳින්වීම **xvii**

ආශීර්වාදය

චන්ද්‍ර පාෂාණ මුතු 03
නිර්භීත රණවිරු චිත්ත ධෛර්යය 12
ජීවිත කාලයක ආශීර්වාදය 20
මල්බෙරි වදුල 30
කෙළවරක් නැති වැඩපළ 38
පුංචි කායිව් 44

අභිනිෂ්ක්‍රමණය

සියල්ල අතහැර යාම 55
නැති වූ නිධානය යළි අයැදියි 60
දෙබර කුඩුව ඇවිස්සුණි 67
දවස පුරා වතුර ඇද ඇද.. 72
සත්‍යාවබෝධ දොරටුව තුළින් 77
වල් උෆරා 85
කඳු වැටියේ භූතාත්ම 90
නොක් ක්‍රාබා ලෙන 96
ආධ්‍යාත්මික ශක්තියේ පරිහාණිය 103
කායගතා සතිය 108
පරමාදර්ශී බෞද්ධ සිල් මාතාව 114
වන්දනා ගමන 119

යථාර්ථය දැකීමේ ශක්තිය අඩංගු මනසේ අතිපාරිශුද්ධ සාරය

කර්ම පථ විච්ඡේදනය 129
ධර්මයේ පෙර නිමිත්ත 139
කය තුළ මළමිනිය 149
ක්ෂණික අවබෝධය 156
මනසේ ප්‍රභාස්වර පවිත්‍රත්වය 163
මලින් පිරුණු මහොගනි 169

පවිත්‍රත්වය

ගංගාව සහ සමුද්‍රය 179
නිර්ලෝභී කෘතඥතාවය 185
දිවිය පුරා ඇප කැප වී 191
පාරිශුද්ධ හදවත 195

භික්ඛු සීලරතනෝ 205

රහත් ඵලය ගැන සැක ඇත්තන් හට අනුකම්පාවෙනි 207

සිල්මාතා කායිව් රහත් තෙරණියගේ
උත්තම සිතිවිලි හා අවවාද 213

සමාප්තිය 223

සිහිවටන 225

මම

තරුණ ගැහැනු ළමයෙකු ලෙස
ආරණ්‍යය සේනාසනයට ගියේ
මාගේ දෙමාපියන් සමග ය.
එසේ ගිය මට,
භික්ෂූන් වහන්සේලා අතරට
යෑමට ඔවුහු ඉඩ නොදුන්හ.
භික්ෂූන් වහන්සේලා
ධර්ම සාකච්ඡා
කරද්දී මම ඈත කනට ඇසෙන
දුරකින් වාඩි වී
ඒ සාකච්ඡාවන්ට ඇහුම් කන්
දුන්නෙමි. භාවනා
කම්මට්ඨානාචාර්යයන් වහන්සේ
අපට බුදුන් සරණ යන අයුරු
කියා දී බුදුගුණ වර්ණනා
කරමින් වන්දනා කරන අයුරු
ඉගැන්වී ය. උන්වහන්සේ සියලු
සත්ත්වයන්ට මෛත්‍රිය පැතිරවීමට
අපව උනන්දු කර වූහ. එමෙන් ම
සෑමවිට ම විවෘත හදවතකින්
පරිත්‍යාගශීලි ව සිටීමට ද
අවවාද දුන්හ. අප මොන තරම්
ත්‍යාගශීලි ඇත්තෝ වුව ද,
එහි ඇති ශීලවන්තකම
සුදුවත් දරන
දැඩි වීර්යයකින්
දුකින් මිදීමට පුහුණු වන
සිල් මාතාවකගේ ශීලය හා
සංසන්දනය කළ නොහැකි
බැව් ද හෙතෙම දැන්වී ය.
එම පණිවිඩය මගේ හදවත
පතුළට හැමදා කිඳාබැස
තිබුණි.

සිල් මාතා කායිවි

හැඳින්වීම

මෙම පොත තම ජීවිත කාලය තුළ දී ම, බොදු මගෙහි හිනිපෙත්තට ම ගිය ස්ත්‍රියකගේ ජීවිත කතාවත්, ඇගේ භාවනා පුහුණුවත් හුවා දක්වන්නෙකි. ඇය හැඳින්වූයේ "මයි චී කායිව්" නමින් ය. මයි චී කායිව් කුඩා අවධියේ සිට ම ආධ්‍යාත්මික ජීවන රටාවකට හැඩ ගැසෙන බවක් ඇයට ම දැනුණි. ඇගේ ජීවිත කාලය තුළ, එවකට කීර්තියක් ඉසිලූ කම්මට්ඨානාචාර්යයන් මුණ ගැසීමට ඇය වාසනාවන්තියක් වූවාය. ඇය ඔවුනගේ උපදෙස් තදින් හදවතට ගෙන දැඩි උද්‍යෝගයකින්, තම ප්‍රතිපත්ති පුහුණුවට එකතු කර ගත්තීය. පෙර කුසලතා හේතුවෙන් භාවනාවට නැඹුරු වූ ඇය, සමාධි භාවනා කෞශල්‍යයේ ආශ්චර්යවත් ඵල ලබා ගත් ළදැරියක් විය. ඇගේ මනස ගැඹුරු ඒකාග්‍රතාවයකට පත් ව, එහි පැය කීපයක් රැඳී සිටීමින් අරුම පුදුම අපූර්ව දර්ශන මනසින් දැක බලා ගැනීමට ශක්තිමත් විය.

කාන්තාවක් ව සිටිය දී, පවුලක් තුළ රැකිය යුතු සම්ප්‍රදායන්, ඇය ව ආගමික කටයුතුවලට සම්බන්ධ වීම බොහෝ සෙයින් සීමා කළේය. ඇය ඉතා ඉවසීමකින් කාලයට ඉඩ දී එළඹෙන පළමුවන අවස්ථාවේ දී ම ප්‍රයෝජන ගැනීමට අපේක්ෂාවෙන් කල් ගත කළා ය. අවුරුදු විස්සක අසාර්ථක විවාහ ජීවිතයකින් පසු, අවසානයේ ඇයට ගිහිගෙය අත හැර යෑමේ දොර විවර වුණි. සිල් මාතාවක් ලෙස ඇය සුප්‍රසිද්ධ ගුරුවරුන් යටතේ, අවුරුදු ගණනාවක් භාවනා පුහුණුව ලැබුවා ය. ඇයගේ අසාමාන්‍ය භාවනා කුසලතාවයන් ගැන ඔවුහු ප්‍රශංසා කළෝ ය. විශේෂයෙන් ඇයගේ අධිමානසික චිත්ත බලයන් ගැන ඔවුහු පැහැදී සිටියෝ ය. ලෝකෝත්තර "සංඥා" විෂයයෙන් ඈ ලත් දියුණුවට සමීපවීමට හැකි වූයේ ටික දෙනකුට පමණි. නිතර නිතර වෙනස්

වන තත්ත්වයන්ගෙන් හෙබි ලෝකයේ ලෞකික ආශාවන්ට නො ඇලී, කිසිදු වෙනස් වීමකින් තොර ව පූර්ණ නිරෝධය කරා යෑමට ඇය සමත් වූවා ය.

බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් "උතුම් නිවන" කිසිදු ජාති පංති ස්ත්‍රිපුරුෂ භේදයකින් තොර ව, ඕනෑම කෙනෙකුට සාක්ෂාත් කිරීමට හැකි බවට, වර්තමානයේ අර්හත් ඵලය හිමි කරගත් කාන්තාවන් ටික දෙනෙක් අතර ඇය, ජීවමාන වූ ප්‍රබල සාක්ෂියක් විය. බුදුන් කල අසීමිත සංඛ්‍යාවක් කාන්තාවෝ භාවනා යෝගී ව විසූහ. ඔවුන්ගෙන් බොහෝ දෙනා ආර්ය මාර්ගයෙහි ඵල නෙළා ගත්හ. බොහෝ ස්ත්‍රීහු බුදුන්ගේ පැසසුමට ද ලක් වූහ. බුදුරජාණන් වහන්සේගේ මුල් දේශනාවන්හි වරින් වර, උන් වහන්සේගේ ශ්‍රාවිකාවන්ගේ කැපවීම, ඔවුනගේ ප්‍රඥාව, ධර්මය වටහා දීමේ හැකියාව ආදී කුසලතාවයන් ගැන වර්ණනා කළ අවස්ථා බොහෝ විය. බුද්ධ කාලයේ දී බොහෝ කාන්තාවන්, තම පවුල් අත හැර ගිහි ගෙයින් නික්මී, නෛෂ්ක්‍රම්‍යය සැපය සඳහා තම ජීවිත කැප කළ අවස්ථා ගැන කිසිදු සැකයක් නොමැත. සත්‍ය වශයෙන් ම, බුදුන් වහන්සේ භික්ෂුණී ශාසනය ආරම්භ කළ විට බොහෝ කාන්තාවෝ වහ වහා එක් වූවෝය. ස්ත්‍රීන්ගේ නිදහස බොහෝ සෙයින් සීමාවී තිබූ යුගයක, මෙය අසාමාන්‍ය ජයග්‍රහණයක් විය. පුරුෂයෙකු තම දෙමාපියනට, අඹුදරුවනට පිටු පා යෑමට දැක්වූ කැමැත්ත, සත්‍ය සොයා යන අධිෂ්ඨානයක සාක්ෂියක් වශයෙන් සමාජය පිළිගත්හ.

පුරුෂයෙකු, ආධ්‍යාත්මික ජීවන රටාවකට අවතීර්ණ වීම සඳහා තම පවුලේ අයවලුන් සහ නිවස අත හැර යෑම දැහැමි ලක්ෂණයක් සේ සලකන ලදී. නමුත් ස්ත්‍රීන් හට ඒ සඳහා බොහෝ සෙයින් දුෂ්කර වූ ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීමට සිදු විය. පුරුෂයන් මෙන් නොව, සීමිත නිදහසක් ඇති ව ජීවත් වූ කාන්තාවන්ට, ගිහිගෙය අතහැර යෑම සඳහා තම ස්වාමි පුරුෂයන්ගේ කැමැත්ත ගැනීමට මහත් සේ බැගෑපත් වීමට සිදු විය. මහලු දෙමාපියන් රැක බලා ගැනීමට එමෙන් ම කුඩා දරුවන් හදා වඩා ගැනීමට ඔවුහු බැඳී සිටියහ. භික්ෂුණී ශාසනයක් ආරම්භ කිරීමෙන් බුදුන් වහන්සේ සාමාජීය සහ සංස්කෘතික සීමා බන්ධනයන්ට කොටුවී සිටි කාන්තාවන් සඳහා විශේෂිත වරප්‍රසාදයක් විවර කර දුන් සේක. එවකට මුල් බැස තිබූ අන්තගාමී අදහස්වලට පිටුපාමින්, ධර්මය වටහා ගැනීමේ හැකියාව පුරුෂයන්ට හා සමාන ව කාන්තාවන්ට ද ඇති බැව් සනාථ කළ සේක. භික්ෂුණී ශාසනය කාන්තාවන් සඳහා බුදුන් වහන්සේ විසින්, ආරම්භ කළ ශාසනික ව්‍යාප්තියකි. දස දහස් වසරක් භික්ෂුණී

ශාසනය සාර්ථක ව ව්‍යාප්ත වුව ද, යුද අරගල සහ දුර්භික්ෂ හේතුවෙන් මෙම පරම්පරාව අභාවයට ගියේය. අභාවයට ගිය මෙම භික්ෂුණී ශාසනය නැවත පණ ගැන්වීමට ආගමික ක්‍රමවේදයක් බුදුන් වහන්සේ හඳුන්වා දී නැත. ථෙරවාදී බුදු දහම ඇති රටවල කාන්තාවන් හට සසුන් ගත වීමට ඇති එක ම මාර්ගය සිල් මාතාවන් සේ සසුන් ගත වී, අට සිල් හෝ දස සිල් හෝ රැකීමයි. තායිලන්තයේ සාමාන්‍ය සම්ප්‍රදාය වී ඇත්තේ අට සිල් රකින සිල් මාතාවන් ය. ඔවුන් තායි භාෂාවෙන් හඳුන්වනුයේ "මයි චී" යනුවෙනි. භික්ෂූන් වහන්සේලා සේම, අටසිල් මාතාවක් (මයි චී) හිසකේ කපා බෞද්ධ ගිහියන් සමාදන් වන සිල් පදවලට වෙනස් වූ ශික්ෂා පද සමාදන් වේ. සසුන් ගත භික්ෂුවකගේ සහ සාමාන්‍ය ගිහියෙකුගේ ජීවන රටාවන්ගෙන් අතිශයින් වෙනස් වූ නිශ්චිත සුදු සිවුරු මෙම සිල් මාතාවෝ පොරවති. "මයි චී" මාතාව ඇයට සුදුසු ඇඳුම, හැසිරීම සහ පැවැත්ම සම්බන්ධයෙන් ස්ථාවර විනය පද්ධතියක් අනුගමනය කරන්නී ය. කුලී වැඩට යෑම, ඉටු කළ කාර්යයන් සඳහා මුදල් ලබා ගැනීම, භාණ්ඩ මිලට ගැනීම් විකිණීම් ආදිය ඇයට තහනම් ය. ගෞරවනීය පෙනුම, සහ විශිෂ්ට හැසිරීම, තුළින් බෞද්ධ පිළිවෙතේ දැක්වෙන සුචරිතය ගැන අන් අයට සැබෑ උනන්දුවක් ඇති කළහැකි බැව් සිහි තබා ගතයුතු බවට ඇයට උපදෙස් දී ඇත. බොහෝ (මයි චී) සිල් මාතාවන් වාසය කරනුයේ භික්ෂූන් විසින් පාලනය කරනු ලබන ආශ්‍රමයන්හි ය. සිල් මාතාවෝ ටික දෙනෙකු වූ කල්හි, ඔවුනට කිට්ටු භික්ෂු ආරාමයක් සමීපයෙහි ස්ථාපිත උපාසිකාරාමයක විසුහ.

තායිලන්තයේ භාවනා පුහුණුව දෙනු ලබන ආරණ්‍යයන් එමෙන් ම මධ්‍යස්ථානයන්, කාන්තාවන්ට නිදහසේ තම භාවනා කටයුතු කරගෙන යෑමට නිදහස සහ උපදෙස් ලබාදී, ගිහිගෙයින් ඈත්වූ ප්‍රතිපදාවකට හැඩ ගස්වමින් එම පුහුණුව ලබා දෙයි. එසේ හෙයින් බොහෝ කාන්තාවෝ එවන් පුහුණු ආරාමයකට අනුබද්ධිත සිල් මාතා ආශ්‍රමයන්හි වෙසෙමින් තම පුහුණු කටයුතු කරගෙන යෑමට කැමැත්ත පල කරති. මෙම ක්‍රමය, භික්ෂූන් හා සසඳන කළ සිල් මාතාවන් දෙවැනි මට්ටමකට පහළ දමා ඇති බවක් පෙනේ. නමුත් තරමක් දුරට හෝ මෙම තත්ත්වය බෞද්ධ සිතිවිලි හේතු කොටගෙන තුනී වී ගොස් ඇත. සමාජය තුළ ක්‍රියාත්මක වන බලය සහ නිලය, එකී සමාජය සාමකාමී ව පවත්වා ගෙන යෑම සඳහා සැකසුණු සමාජ සම්මතයන් ය. නමුත් එම සමාජ පද්ධතියේ, කාන්තාවට හිමිවන තැන, කෙනෙකුගේ සත්‍ය වටිනාකම පිළිබිඹු වන්නක් නොවේ.

ලොව බොහෝ සංස්කෘතීන් තුළ මෙම ස්ත්‍රී පුරුෂ භේදය තදින් මුල් බැස ගත් සිද්ධාන්තයක් වී ඇත. එම භේදය දෙස ආගමික වශයෙන් බැලීම සාමාන්‍ය දෙයකි. ස්ත්‍රී පුරුෂ ලිංග භේදය අනිත්‍ය වූ ස්වභාවයකි. එය ඇති වී නැති වී යන්නෙකි. පෙර කර්මයකින් සකස් වූ දෙයකි. එය දෛවයේ ප්‍රභේදයකි. සත්ත්වයකුගේ මූලික හරය නමක් නැති රූපයක් නැති සංකලනයක් හෙයින් එහි ස්ත්‍රී පුරුෂ ලක්ෂණ නැත. මෙය බුදු දහමේ මූලික න්‍යායකි. ආත්මීය වශයෙන් ආරෝපණය කෙරෙන කරුණු බුදු දහමේ මූලික හර පද්ධතියෙන් බැහැර වූවකි. අද්විතීය පුද්ගලයෙකු සකස් කරවන සියල්ල සෑම මොහොතක ම වෙනස් වෙවී අවසානයේ සිදී බිඳී නැති වේ. සෑම පුද්ගලයෙකු ම තම අතීත ස්වභාවයෙන් වෙනස් ව, අලුත් ස්වභාවයකට පෙරලේ. මම යයි තදින් අල්ලා ගන්නා සාධකයන් නිත්‍ය බවෙන් තොර ව ශීඝ්‍රයෙන් වෙනස් වෙවී යයි. ශරීරයේ ඇති සියලුම රූප කොටස්, සිතෙහි ඇතිවන සිතිවිලි හා වේදනා, කිසිදු වටිනාකමකින් තොරව ක්ෂය වන දේවල් ය. එනිසා ශරීරයට සහ සිතට ඇලීම, දුක් දොම්නස් ජනිත වීමේ ප්‍රධාන නිධානයයි.

බාහිර ලක්ෂණයන්ගෙන් මිදුණු සිත, නිවන කරා යෑමේ ප්‍රවණතාවය දියුණු කිරීමට හෝ අඩාල කිරීමට හෝ ස්ත්‍රී පුරුෂ භාවය, නිල තල හෝ සමාජ තත්ත්වයන් බල නොපානු ඇත. අප ඉපදෙන මැරෙන සංසාර චක්‍රයෙන් ගැලවීමට නම් මම සාම්ප්‍රදායික බන්ධන කඩා වෙන් කළ යුතු වේ. මේ අනුව සෑම මනුෂ්‍යයෙකු ම එකම තලයක ලා සැලකිය යුතු වන්නේ, ක්ෂය කළ යුතු 'මෝහය' සෑම මිනිසෙකුගේ සිතකම පවතින හෙයිනි.

මනස තරම් විශ්මයජනක කිසිවක් නොමැත. ඉතා උසස් මට්ටමකින් පුහුණු කළ සිතකට කළ හැකි දේ ආශ්චර්යවත් ය. මයි චී කායිවිගේ මනස තියුණු බලවත් එකකි. ඇයගේ භාවනා මනස තුළින් අනාගත සිහින දර්ශන සහ මනෝ සංඥා දර්ශන ඉතා පහසුවෙන් දිස් විය. එමෙන් ම ඇයගේ තියුණු මානසික හැකියාවන් වරෙක ඇයට හානිකර වූවා මෙන් ම වරෙක දියුණු චිත්ත බලවේගයක් ද විය. මෙම විශේෂිත හැකියාවන්ට ඇය තදින් බැඳී සිටි හෙයින් අවුරුදු ගණනාවක් ඇය අන්ධ වී සිට, තම සිතේ නිවැරදි ශික්ෂණය ඇති කර ගැනීමට අපහසු ව සිටියා ය. සිත හික්මවා ගැනීම පසු කලක දී පුහුණු කරගත් පසු, එම විශේෂිත චිත්ත ශක්තීන් ආශ්චර්යවත් අරමුණු කරා යොමු කරවීමට හැකියාව උදා කර ගත්තා ය.

කර්මානුකූල ව මෙම ආත්මයේ ලබා ගත් චිත්ත ශක්තීන්, කෙනෙකුගෙන් කෙනෙකුට බොහෝ සේ වෙනස් වේ. මයි චී කායිව් වැන්නෝ ක්‍රියාශීලී ය, නිර්භීත ය. වෙනත් අය පහසුවෙන් තම අදහස් හෙලි නොකරන අතර ප්‍රවේසම් සහිත ද වේ. මේ දෙආකාරයෙන් ම භාවනාවේ දී ඵල ප්‍රයෝජන ලබා ගත හැකි ය. චිත්ත විශුද්ධියක් ලබා ගැනීම බොහෝ දෙනෙකුට ඉතා දුෂ්කර වූ සෙමින් ගමනකි. නමුත් කායිව් සිල් මාතාවගේ සිත, නිවන් මගෙහි ඉතා වේගයෙන් ගමන් කළේ ය. ඇයගේ භාවනා නිපුණතාවය සහ චිත්ත ශක්තිය තරම් දියුණු තත්ත්වයක සිටි කෙනෙකු සොයා ගැනීම එතරම් පහසු කරුණක් නොවේ. එනිසා සාමාන්‍ය කෙනෙකුට ඇය සතු වූ විවිධ ආශ්චර්යවත් මනෝ සංඥාවන් ලබා ගැනීම අතිශයින් දුෂ්කර කාර්යයක් විය. එවන් දෑ ලබා ගැනීමට කායිව් සිල් මාතාව හැදෑරූ ක්‍රමවේදයන් අන් අයගේ භාවනා පුහුණුව සඳහා සුදුසු මාර්ගෝපදේශයක් නො වීය.

කෙසේ වුව ද ගැඹුරින් සිතද්දී, කායිව් සිල් මාතාවගේ භාවනා ක්‍රමය, මැරි මැරී උපදින සංස්කාර ගොඩ නැගීමෙන් ඔබ්බට විහිදුණු විමුක්ති රසය පෙන්වන මාර්ගයක් බව පෙනේ. මෙය හදවත පතුලෙන් අවබෝධ කරන කළ, සිතෙහි ඇති මූලික ප්‍රභේද දෙකක් ඇති බව පෙනේ. සිතෙහි "දැනගැනීමේ ශක්තිය" සහ "සිතිවිලි සිත තුළම ඇති වී නැති වී යන ස්වභාවය" යි. මෙම ප්‍රභේදය නො දන්නා කල ඇති වී නැති වී යන තත්ත්වය, "සැබෑ සිත" යයි අපි පිළිගනිමු. නමුත් සත්‍ය වශයෙන් ම එහි ඇත්තේ, මොහොතින් මොහොත වෙනස් වෙමින්, අනිත්‍ය වූ සකස් වෙමින් යන අනිත්‍ය වූ ධර්මතාවයකි. සිතෙහි අඛණ්ඩ ව පවතින ස්වභාවය නම් දැනගැනීමේ ශක්තිය යි. අපි හැම දෙයම පටලවා ගොඩ ගසා ගෙන ඒ හැමට ම "සිත" යනුවෙන් හඳුන්වමු. නමුත් සිතෙහි ඇතිවන ස්වභාවයන් සියල්ල ම ඒවා දැනගැනීමේ ශක්තිය මත රඳා පවතී. සිතෙහි මතුවන දුක සහ සතුට යන ධර්මතාවයන්, සිතෙන් බැහැර ව පවතින ධර්ම බව වැටහෙනුයේ, සිත තුළ ක්‍රියාත්මක වන දැන ගැනීමේ ශක්තියෙනි. සිතෙහි යථා තත්ත්වය නම්, සකස් වන සියල්ල කිසිවකට නො ඇලී "දැනගැනීම වනු ඇත." එනිසා අනිත්‍ය වූ සොම්නස දොම්නස යන ස්වභාවයන්ට පිටතින් සිත පිහිටා සිටී. මෙය දැකීමට අපට හැකි නම්, සාම්ප්‍රදායික ව අප සත්‍යය යයි පිළිගන්නා දෑ අපට අත හැරීමට හැකි වනු ඇත. එම අවබෝධය ඇති කල්හි අතහැරීම, විමුක්තිය සිතෙහි අභිමතය පරිදි ම සිදු වන්නක් බව වැටහේ.

කායිව් සිල් මාතාව (මයි චී කායිව්) ගම්බද කාන්තාවකි. තායිලන්තයේ ඊසාන දිසාවේ පිහිටි, ඈත පිටිසර ගමක ඉතා චාම් දිවි පෙවතක් ගෙවූ ස්ත්‍රියකි. බුදුන් වහන්සේගේ දුකින් නිදහස් වීමේ ආර්ය මාර්ගය ඔස්සේ යෑම සඳහා ගිහි ජීවිතයෙන් ඈත් වීමට වෙහෙස දරද්දී, ඇය අතිදුෂ්කර වූ ගැටලුවලට මුහුණ දුන්නා ය. ඇයගේ අඛණ්ඩ උත්සාහය, අප්‍රතිහත ධෛර්යය සහ ප්‍රතිභා පූර්ණ ඥානය තුළින් එවකට තිබූ සාම්ප්‍රදායික කඩඉම්, අභිබවා යෑමට ඇයට හැකි විය. ඇය ජීවත් වූ ලෝකයේ සම්ප්‍රදායන් ඇයව එක් අයුරකින් සිර කර තැබූ අතර, ඇයගේ සිත තුළින් ම පැන නැඟුණු බාධක තවත් අයුරකින් ඇය සිර කර තැබුවා ය. මෙම බන්ධනවලින් ගැලවී, සංසාර බැම්මෙන් අත් මිදීමට ඇයට හැකි විය.

භාවනායෝගී දිවියකට යොමු වූ බොහෝ කාන්තාවන්ගේ නිදහස සීමා කෙරුණු බලපෑම්, ඔවුන් ඉවසා දරා සිටියා සේ ම, ඇය ද ඒ සියල්ල ඉවසුවාය. එසේ ඉවසමින්, අභියෝග භාර ගනිමින්, සියුම් ලෙස බාධා මග හරිමින් ආරණ්‍යය ගත සාම්ප්‍රදායික පටිපදාවකට නිසි වූ ශික්ෂණයකින්, භාවනාවට අවතීර්ණ වූවා ය. විටින් විට මුහුණ දුන් අඩු ලුහුඬුකම් ඇය ඇගේ යහපතට පෙරලා ගත්තා ය. ස්ත්‍රී පුරුෂ භේදය ගැන අසහනකාරී ව පැමිණිලි කරමින් නොසිට, කායිව් උපාසිකා මාතාව කැපවීමෙන්, ක්ෂණිකව සතිය පිහිටුවා ගැනීමට සිත දියුණු කොට, ඇගේ සිත පතුලට ම කිදා බැස තිබූ ආත්මීය සහ සමාජ සංස්කෘතික අනන්‍යතාවයන් කපා විනාශ කිරීමට සමත් වූවා ය. ලෝකෝත්තර ඥානාවබෝධය ලබද්දී, ඇය මෙතෙක් කල් ජීවත් වූ කටුක ලෝකය තුළ තිබූ පංති භේද සහ විවිධ වෙනස්කම් වාෂ්ප වී අන්තර්ධාන විය.

භාවනාවෙන් දියුණු මානසික තත්වයක් ලබා ගත් පැවිද්දන් සමාජ සංස්කෘතික භේදයන් ගැන කිසිදු තැකීමක් නැත. අටසිල් රකින, උනන්දුවෙන් භාවනාවට නැඹුරු වූ කාන්තාවෝ ඉතා දියුණු මානසික ඵල කරා එළඹෙන බවට කිසිදු සැකයක් නොමැත. ඇත්ත වශයෙන් ම කියතොත් කාන්තාවන්ට ධර්මය අවබෝධ කර ගැනීමට අපූර්ව හැකියාවක් ඇත. එම අවබෝධයෙන් ගැඹුරු සමාධියකට වැටී, අතිවිශිෂ්ට නුවණක් හා ප්‍රඥාවක් වර්ධනය කර ගැනීමට ඔවුනට ශක්තිය ඇත. තායිලන්තයේ බොහෝ සිල් මාතාවන් සහ උපාසිකාවන් හට, භික්ෂූන් අභිබවා දියුණු තලයන් කරා යෑමට හැකි වී ඇත. මේ නිසා කම්මට්ඨානාචාරීන් වහන්සේලා ඔවුනගේ භාවනා කුසලතාවයන්

පුරුෂයන් හා සමාන තත්වයේ ඇති බව පිළිගනිමින්, කාන්තාවන්ට උසස් ලෙස සලකති. තායිලන්තයේ වර්තමාන ගෞරවනීය ආචාර්යයන් වහන්සේලා ආර්ය මාර්ගයෙහි උසස් ම ඵල ලබා ගැනීමට කාන්තාවන් දක්ෂ බැව් පිළිගනිති. එමෙන්ම පැවිදි කාන්තාවෝ විශිෂ්ට ගුරුවරියන් බවට ද බොහෝ අවස්ථාවල නිර්දේශ කරති. බොහොමයක් ආරණ්‍යගත කම්මට්ඨානාචාරීන් වහන්සේලා හට ශිෂ්‍ය සිල් මාතාවන් සහ ශිෂ්‍ය උපාසිකාවන් සිටින අතර, ඔවුන් විශේෂිත වූ විෂයයන් ගැන ගුරුහරුකම් දීමට යොදා ගෙන ඇත. මෙම කාන්තාවෝ ඒ ඒ ආගමික කටයුතුවල ඉතා උනන්දුවෙන් යෙදෙති. සමහරු භාවනා කරන්නියන් ලෙස ද, සමහරු ලෙඩ සුව කරන්නියන් ලෙස ද, තවත් සමහරක් ගුරුවරියන් ලෙසද කටයුතු කරමින් ජනතාවගේ ගෞරවාදරයට පත්ව ඇත. කායිව් සිල් මාතාව එවන් කාන්තාවකි. ඈ මෙන් අනික් සිල් මාතාවන් ද, අනාගත පරපුර උනන්දු කරවමින්, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයට ම, ප්‍රතිඵල ලබා ගැනීමට බුදුමග විවර කර උරුම කර දෙති.

මයි චී කායිව්ගේ චරිතාපදානය මෙසේ ගොනුකොට ඇත්තේ ලබා ගත හැකි දත්ත එකතු කළ ඉතිහාස චරිත කතාවක් මෙනි. මට සොයාගත හැකි වූ ආරංචි, ඈ ජීවත් වූ කාලය සහ සමාජ තලය අනුව සකස් කෙළෙමි. ඈ විසින් ම පැවසූ වදන් සහ ඇගේ සමකාලීනයන් පැවසූ වදන්, එමෙන් ම සිද්ධීන් මෙයට ඇතුළත් කර ඇත. මා පවසන මෙම කතාව තායි භාෂාවෙන් ලියූ නොයෙක් මූලාශ්‍රයන්ගෙන් ගොනු කර ගත්තෙකි. ඇගේ භාවනා පටිපදාව සම්බන්ධිත ඉතා වැදගත් කතා තම වාචික හා ලිඛිත දේශන මගින් හෙළිදරව් කළ, අතිපූජ්‍ය මහා බෝවා තෙරුන් වහන්සේට මම ණය ගැති වෙමි. උන් වහන්සේ ඇගේ ලෝකෝත්තර ඥානය සහ ප්‍රඥාව ගැන කළ විස්තර, කායිව් සිල් මාතාව නිවන් අවබෝධය සඳහා පියවරෙන් පියවර ගත් ප්‍රගතිය විස්තර කිරීම සඳහා මම මෙහිදී යොදා ගතිමි. ඇය අතිපූජ්‍ය මහා බෝවා හිමිගේ කුසලතා පූර්ණ ශිෂ්‍යාවන්ගෙන් කෙනෙකි. උන් වහන්සේ ඇයගේ ආධ්‍යාත්මික දියුණුව ගැන කිසිදු සැකයක් අප තුළ ඇති නො කළේ ය.

පූජ්‍ය ඉන්තවායි හිමියෝ මෙම පොත ලිවීමෙහි ලා මට මහත් වූ ධෛර්යයක් වූහ. කායිව් සිල් මාතාව ළදරු කල සිට ම සමීපව ඇසුරු කළ හෙයින්, අතීත චාරිත්‍ර චාරිත්‍රාදී පසුබිම් විස්තර ගොනු කර ගැනීමේ දී වටිනා උල්පතක් විය. මයි චී කායිව්ගේ දැනට ජීවත් වන සමීප ඥාතීන්, ඇගේ පෞද්ගලික ජීවිතයේ

අභ්‍යන්තර විස්තරත්, ලෞකික ජීවිතයෙන් ඈත් ව ගත කළ මුල් අවධිය ගැනත් කරුණු මා වෙත ලබා දුණි. වෛද්‍ය පෙන්ශ්‍රි මකරනොන් ඇයගේ මහලු කාලය තුළ, මහත් වූ වෙහෙසක් ගෙන ඇය රැක බලා ගනිමින්, සාත්තු කළා ය. ඇය, සිල් මාතාවගේ අවසාන කාලයේ විවිධ ළඟන්නා සුළු විස්තර පැවසූ අතර සිල් මාතාව තම වෛද්‍ය සේවිකාවන්ට පෞද්ගලික ව පැවසූ ආශ්චර්යවත් කතා ද මා හට දැන ගත හැකි විය.

මෙම විස්තර සියල්ල ම ඇයගේ ජීවිත කතාව නමැති සළුව ගෙතීමට මම ගොනු කර ගත්තෙමි. එනමුදු කට වචනින් හා ලිඛිත ව මා වෙත ලබා දුන් සමහරක් විස්තර එකට එක නො ගැලපීමක් හා සම්බන්ධතාවයෙන් තොර බවක් දැටුවෙමි. එකම කතාවට විවිධ අර්ථකතන දුන් අවස්ථා බොහෝ විය. සමහර තැනක අවශ්‍ය ම කරුණ එහි නො වී ය. එවන් අවස්ථාවන්හි දී මම ඇයගේ අතිවිශේෂිත වූ අසාමාන්‍ය චිත්ත ප්‍රතිරූපයත් ඇයගේ විශිෂ්ට දක්ෂතාත් එක්කර ගනිමින් ගොතන සළුවට මාගේ පරිකල්පනය තුළින්, කටු සටහන් එකතු කෙළෙමි. මෙය ශාස්ත්‍රීය ග්‍රන්ථයක ස්වරූපයක් නොවන අතර බෞද්ධ ප්‍රතිපදාවෙහි යෙදෙන්නන් උනන්දු කරවීම සඳහා වැඩියත් ම ජීවිත වෘතාන්තයක් සේ සකස් කිරීම මගේ අරමුණ විය. එම අවශ්‍යතාවය සිත්හි දරාගෙන, පූර්ණ විමුක්තිය සාක්ෂාත් කිරීම සඳහා සිතෙහි ගැඹුරෙහි සියුම් ධර්මතාවන් මෙනෙහි කරමින් බුදු මගෙහි යෑමට කෙරෙන ආරාධනාවක් සේ මෙම පොත බලනු ඇතැයි මම විශ්වාස කරමි.

භික්ඛු සීලරතනො
වත් පා සාලා නොයි ආරණ්‍යය
තායිලන්තය

ආශීර්වාදය

අපි මෙලොවට බිහිවී ගෙවී ගෙවී යන
දින මාස අවුරුදුවලට ඇලෙමින්
ඒවාට වැදගත්කමක් ආදේශ කරමු.
අපගේත් අන් අයගේත් ජීවිතයන්හි
වැදගත්කම ගැන අපි විශ්වාස කරමු.
මේ හේතුව නිසා අපගේ සිත්
නිරන්තරයෙන් ඒ දුක් වේදනා ගැන සැලකිල්ලක් දක්වයි.

චන්ද්‍ර පාෂාණ මුතු

නමවන ශත වර්ෂය මුල දී තායි ජාතිකයන් දකුණු චීනයේ සිට, ටිකෙන් ටික සංක්‍රමණය වෙද්දී, මෝසම් සුළඟ සමඟ ජලධාරාවන් සන වනාන්තර තුළට මෙන් ම, සාරවත් තැනිතලාවන්ට කාන්දු වී, අහසේ වර්ණය සමග මුසු වී පොළවේ භූ විෂමතා ලක්ෂණ සුන්දර දර්ශන බවට පත් කරවීය. මෙම ආකර්ෂණීය දර්ශන සමඟ එතී ගෙතී අතීතයේ "සියම" නමින් හැඳින්වූ දේශයේ, කඳු අතර හා මිටියාවත්හි, දකුණු චීනයේ සිට සංක්‍රමණය වූ සාමාන්‍ය ජනයා, ගෝත්‍ර වශයෙන් බෙදී තැනින් තැන විසිරී පදිංචි වූවෝය. මෙම ගෝත්‍ර බොහොමයක් අතරින් "පූ තායි" කොටස ස්වාධීන වී දක්ෂ ගොවීන් මෙන් ම දක්ෂ දඩයක්කාරයෝ ද වූහ. රතු ගංගාවේ ඉවුරු අසබඩ ජීවත් වූ, ජියෝසි නම් වූ පරිපූර්ණ චීන ජන වර්ගයෙන් පැවතෙන මොවුහු, කලින් කල ඇති වූ දේශපාලන හේතූන් නිසා, අසල්වාසී දකුණු ලාවෝ රාජධානීන් අතරින්, පරම්පරාවෙන් පරම්පරාව, මීකොං ගඟ දක්වා තල්ලු වෙවී අවුත් පදිංචි වූහ. ඔවුහු ශතවර්ෂ ගණනාවක් රට අභ්‍යන්තර ව පදිංචිව සිට පසුව ගංගාවේ ඉස්මත්තෙහි, බටහිර දෙසට විහිදුණු සාරවත් පෙදෙස්හි විසිර පදිංචි වූහ.

සියවස් ගණනාවක් මොවුහු දුර්භික්ෂයන්ට ජල ගැලීම්වලට, ස්වභාවික ව්‍යසනයන්ට මෙන් ම, ශෝචනීය ජාතිවාදී අරගලයන්ට ද මැදි වූහ. පසු කාලයක

මෙම දක්ෂ පූ තායි ජාතිකයෝ දේශපාලනීය වශයෙන් එකට බැඳුණු ජන කොටසක් වශයෙන්, පාරම්පරික ව සටන්කාමී ව සිටි නායකයන් හා පාලකයන් යටතේ ජීවත් වූහ. මුක්දහන් රාජධානිය එනමින් හැඳින්වූයේ ගංගා ඉවුරු අසබඩින් සොයා ගත් "චන්ද්‍ර පාෂාණ මුතු" හමුවීමෙන් පසුව ය. මොවුනගේ ජන ජීවිතයේ කේන්ද්‍රස්ථානය මෙය විය.

පැරණි සියමෙහි මුක්දහන් ප්‍රාන්තයේ කාම් චා ඊ දිස්ත්‍රික්කයේ ජීවත් වූ, පූ තායි ගොවි පරම්පරාවට අයත් කුඩා ජන කොටසක් "බාන් හුආයි සායි" නමින් හැඳින්වුණි. මෙම කුඩා ගම පිහිටියේ ඈතට දිව ගිය මී කොං ගංගාවේ ඈත තැනිතලාවන්ට දකුණතින් පිහිටි, පූ පාන් කඳු වැටියේ පාමුල උස් වූ මනහර භූමි පෙදෙසක ය. මෙම ගම්මානය හුආයි බෑං සායි සහ හුආයි බෑං ඉ ගංගා අතර වූ උස් භූමියක පිහිටි ඝන වනාන්තරයේ පිහිටියේ ය. වාසය කිරීම සඳහා කවාකාරව සකසා ගත් භූමි කොටසක ලී කණු මත ගොඩ නැගූ ලැලි ගෙවල් සමූහයකින් මෙම ජනාවාසය සමන්විත විය. මෙම ගම්වාසීහු චාරිත්‍ර වාරිත්‍ර ගැන වැඩි වැටහීමක් නැති, දැඩි චරිත ඇති එහෙත් කපටි නොවූ සරල දිවිපෙවතක් ගෙන ගිය ඇත්තෝ ය. ඔවුනගේ ජීවිකාව වූයේ ගොවිතැන හා දඩයමයි. වනාන්තරයේ සීමාවන්හි එළි පෙහෙළි කරගත් සාරවත් බිම් කොටස්හි මොවුන් වී ගොවිතැන් කළෝ ය. කුඹුරු පිහිටි සීමාවන්ගෙන් ඔබ්බට නැවත වනාන්තරය ඈතට විහිදුණි. මෙම වනාන්තරය කොටින්ගෙන් සහ වල් අලින්ගෙන් ගහන වූවකි. එසේම අද්භූත වූ අනතුරුදායක තැන් ද බිය දනවන ස්ථාන ද, මෙම වනයෙහි ගහනව ඇති හෙයින්, ගම්වාසී සියල්ලෝම එකමුතු ව එක් කොටසකට පමණක් සීමා වී ආරක්ෂාව සඳහා සාමූහික ව ජීවත් වීමට පෙළඹුණෝ ය.

මී කොං ගංගාව ඔස්සේ දිව ගිය අතිවිශාල සරුසාර භූමි ප්‍රදේශයක පිහිටි මුක්දහන්, වෙනම රාජධානියක් ලෙස ක්‍රියාත්මක විය. පසුව සියමේ චක්‍රී රජ පෙළපතට පක්ෂපාත ව ස්වාධීන ප්‍රාන්ත රාජ්‍යයක් වශයෙන් ස්ථාපිත විය. පුරාවෘත්තියන්ට අනුව බාන් හුආයි සායි ගම්මානය පසු කලකදි රජ පෙළපතේ සොහොයුරියන් තිදෙනෙකුගේ වාස භූමිය විය. - කායිව් කුමරිය, ක්ලුම් කුමරිය, සහ කා තායි කුමරිය - මෙම ගම්මානය පූ තායි කාන්තාවන්ගේ පොදු චරිත ලක්ෂණයන්හි නො මැකෙන සටහන් තබා ඇත. මේ කුමරියන් තිදෙනාගේ පෞද්ගලික චරිත ලක්ෂණ, බුද්ධිමත්, අප්‍රතිහත ධෛර්යයෙන් යුත් සාධාරණ ව සිතන පතන පරපුරක් ගොඩ නැගීමට ඉවහල් විය. තම උරුමය ගැන ආඩම්බර

වුව ද, ස්වාධීන ව දායාද කරගත් ධෛර්යවන්තකමින් යුත්, පූ තායි ජාතිකයන් තම සිරිත් විරිත්, භාෂාව සහ සම්ප්‍රදායයන් හා එකට බැඳුණු විශේෂිත ජන කොටසක් වී ය. මෙම උරුමයන් පරම්පරාවෙන් පරම්පරාවට පූජනීය වගකීමක් ලෙස සංක්‍රමණය විය.

19 වන ශත වර්ෂය අග, සියමේ බාන් හුආයි සායි ගම්මානයේ මහේස්ත්‍රාත්වරයා වූයේ තසෝන් සියාත්ග්ලුම් ය. ඔහුගේ බලතල ඔහු පත් කළ දිස්ත්‍රික්කයේ අධිපති වූ ජඕ මියුං විසින් පැවරූ බලතල ය. ඔහුගේ බල ප්‍රදේශය තුළ ඇතිවන ආරවුල්වලට මැදිහත් වීමෙන් විසඳීම, සන්සුන් බව රැකීම, එමෙන් ම පූ තායි ජාතිකයන්ගේ සහජයෙන් ම පවතින යුතු අයුතුකම් ගැන දැනීම උපයෝගි කොටගෙන අසල්වාසීන්ගේ සාමය සමගිය ඇති කිරීම ඔහු සතු වගකීම් විය.

මහෙස්ත්‍රාත් තසොන් සාමාන්‍ය බුද්ධියක් ඇති ජනතාවට සේවය කිරීමට නිර්දේශිත යුක්තිගරුක මිනිසෙකි. ගෝත්‍රය තුළ සාමය පවත්වාගෙන යෑමෙන් පූ තායි ගෝත්‍රයේ අනන්‍යතාවය රැකීම සඳහා ඔහුගේ කාර්යභාරය එමඟින් ඉටුකළේය. ඔහුගේ බිරිඳ, ඩොන් ශාන්ත ගති පැවතුම් ඇති කරුණාවන්ත කාන්තාවකි. ඇය ද මහෙස්ත්‍රාත් නිලනාමය ඉසුලුව ද කීමට තරම් රාජකාරියක් ඈ සතුව නො තිබුණි. එනමුත් ඇය දරුවන් පස් දෙනෙකුගේ බර ඉසුලුවා ය. ඇයට සිටියේ වැඩිමහල් පිරිමි දරුවන් තිදෙනෙකු සහ ළඟ ළඟ ලැබුණු ගැහැනු දරුවන් දෙදෙනෙකි. බාල ම දැරිය ඉපදුණේ 1901 වසරේ නොවැම්බර් මස 8 වැනි දින අලුයම ය. ඇයගේ මව ඇයට 'තපායි' යනුවෙන් නම් තැබුවාය. එහි තේරුම, 'ඇසට ආකර්ෂණය වන' යන්නයි.

ළදරු කල සිට ම, වචනින් ප්‍රකාශ කිරීමට බැරි තරම් පුදුමාකාර දැනුම් සම්භාරයක් තපායි තුළ උද්දීපනය විය. ඇයට කථා කිරීමට හැකිවත් ම ඇගේ මවට මුමුණ මුමුණා, රාත්‍රි කාලයේ ආලෝකමත් වක්‍රාකාර විමාන තුළින් ආශ්චර්යමත් ස්ථානවලට ගිය සිද්ධීන් රහසේ පැවසුවා ය. එම ස්ථාන ගැන ඇයට වචනින් විස්තර කිරීමට අපහසු වුව ද ඉඟියෙන් විස්තර කිරීමට ඈ වෙහෙස දැරුවා ය. වසර ගණනාවකට පසු ඈ බෞද්ධ සිල් මාතාවක් වූවාට පසු දෙවඟනන් සමග ඈ හැදුණු වැඩුණු සැටිත්, ඔවුන් හා මිත්‍රව සිටි අයුරුත් නො පැකිල ව පැවසුවා ය. දෙව්ලොව ඇගේ මිතුරියන්ගේ ප්‍රභාස්වරය දැක ගත හැකි වූයේ ඇයට පමණි. එම දෙවඟනන් අසීමිත වාර ගණනක් ඇගේ

සහකාරියන් ව සිටි බැව් ද ඇය පැවසුවාය. වර්තමාන කායික ස්වරූපය ඇයගේ ආධ්‍යාත්මික ශක්තිය විනාශ කරනු ඇතැයි ඔවුහු බිය වූහ. ඇයගේ එම අධ්‍යාත්මික ශක්තිය මෙම පෘථිවි තලයට ඇලී සිටීම වැළැක්වීම සඳහා ය. ඇගේ රූපකායෙන් ගැලවී, දිව්‍යලෝකවල ඔවුන් සමග සැරි සැරීමට එම දේවතාවෝ ඇය ව පෙළඹුවෝ ය.

තපායිගේ මව සහ පියා ඉතා භක්තිමත් බෞද්ධයෝ වූහ. ඔවුන් බුදු මගෙහි උසස් ඵල ලබාගත් නැඹුරුවක් විද්‍යමාන වන බව අන් අයට පෙනුණි. උදාහරණයක් වශයෙන් එවකට පූ තායි සංස්කෘතියේ ඉතා ප්‍රකට ව තිබූ භූත වන්දනාවන්ගෙන් ඈත් විය. ඒවාට අගෞරවයක් නො වන සේ තම අධ්‍යාත්මික කටයුතුවල නිරත වූහ. මෙම පවුල ජීවත් වූයේ ගමේ පන්සල පිටිපස ය. පන්සල වටා ඉදි කළ උණ ගස් මොවුනගේ ඉඩමට යාබද ව පිහිටා තිබුණි. ඒවා කොතෙක් සමීප ව පිහිටා තිබුණා ද කිවහොත් ග්‍රීෂ්ම කාලයේ පන්සල් වැට අද්දර තිබූ විශාල අඹ ගසේ ඉදුණු ගෙඩි තපායිගේ ගෙමිදුලට වැටුණි. මෙම වටපිටාව සමඟ පන්සලේ උදේ සවස කෙරෙන සිත් සනසන වන්දනාවන්ට සවන් දෙමින් ආරාමයේ දෛනික ආගමික රටාවට හුරු පුරුදු වෙමින්, තපායි වයසින් මුහුකුරා වැඩුණි. තවමත් දැරියක ලෙස සිටිය ද භික්ෂූන්ගේ ගාථා ස්වරය තම හදවත තුළ ස්පන්දනය වන තුරු එම හඬ කෙරෙහි තම සිත පිහිටුවා එකඟ කර ගැනීමට ඇය පුරුදු වූවා ය. අවුරුද්ද තුළ පන්සලේ ඒ ඒ දිනයන්හි පැවැත්වෙන බෞද්ධ උත්සවයන්හි ඇති ප්‍රබෝධය, ඇය අතිශයින් කුල්මත් කළාය. ඇගේ නිවස පිටුපස පන්සල් භූමියේ එවැනි දිනවල පැවති සැණකෙළි සඳහා මුළු ගම ම එක් රැස් විය.

තම පියා භික්ෂූන් වහන්සේලාට දැක් වූ අතිමහත් වූ ගෞරවය තපායි විමසිල්ලෙන් බලා සිටියා ය. එම ගෞරවය රජයේ උසස් නිල දරුවනට දැක්වූ බියමුසු ගෞරවයක් නො වී ය. එය ස්වභාවයෙන් ම විවෘත හදින් පෙන් වූ ශ්‍රද්ධාවන්ත භක්ති ප්‍රණාමයකි. තපායි සහ ඇගේ අම්මා දිනපතා ම පිණ්ඩපාත වඩින ස්වාමීන් වහන්සේලාට කෙසෙල් කොළවල ඔතා කිරිබත් සහ ව්‍යංජන පාත්තරවලට පිළිගන්වති. ඇයගේ පියා භික්ෂූන් වහන්සේලා ගම්මානයේ සීමාව පසුකරන තෙක් පසු ගමන් යන්නේ ය. තසොන් බොහෝ විට භික්ෂූන් වහන්සේලා පිණ්ඩපාතය ලබා ගන්නා තුරු ඈතට වී බලා සිටීම පුරුද්දක් කොට සිටියේ ය. ඔහු සමහර දිනක ස්වාමීන් වහන්සේලාගේ ආහාරවලින්

පිරුණු පාත්තර පන්සල දක්වා රැගෙන ගොස් භාර දී ආපසු එන්නේය. තසොන් සතර පෝයට නොවරදවා ම සිල් සමාදන් වන කෙනෙකි. එම දිනයන්හි ඔහු මුළු දවසම පන්සලෙහි ඉතා සතුටින් ගත කරයි. භික්ෂූන් වහන්සේලාගේ සුළු සුළු වැඩ කර දීමෙන් සහ උන්වහන්සේලා සමඟ කතා බහ කිරීමෙන් ඔහු මහත් සතුටක් වින්දේ ය. ළාබාල ළදැරියක් ව සිටිය දී තපායිගේ ජීවන ශක්තිය, ලෞකික ලෝකයත් ලෝකෝත්තර ලෝකයත් අතර නිදහසේ ගමන් කරන්නට විය. නමුත් ඇයට අවුරුදු 5ක් ගත වෙද්දී, එම ලෝක දෙක ම ඈ ඉදිරියේ කඩා වැටුණි. කිසිදු සිතිවිල්ලක් හෝ අනතුරු හැඟවීමක් හෝ නොමැතිව නොසිතූ අවස්ථාවක ඇගේ මව අසනීපව මිය ගියා ය. ඇයගේ සිතෙහි ඇතිවූ කම්පනය සහ ව්‍යාකූලත්වය නිසා ඈ විශ්වාස කළ සියල්ල ම කඩා වැටී සී සී කඩ විසිරී ගියේ ය.

අවමගුල් උත්සවය චාම් ව පැවතුණි. එදින තපායි, නොසැලකිලිමත් සේ අවුරා තිබූ ලී කොට සහ දඬු මත තැන්පත් කර තිබූ සුදුරෙදි පොටවල් කීපයකින් එතූ ඇගේ අම්මාගේ ශීතල ව ඝන වූ ශරීරය දෙස භයෙන් බිරාන්ත ව බලා සිටියා ය. ගිනි දැල් විහිදී මිනිය ඔතා තිබූ රෙදි පිළිස්සී මිනියේ හම ද දැවී දිය පටට නගිමින් අමු අමුවේ මස් මාංශ පේශීන් පිච්චි පිච්චී කර ගඳ ගසද්දී, ඈ වේදනාවෙන් හිස වෙනතකට හරවා ගත්තා ය. අවසානයේ සියලුම ගිනි දැල් නිවී කලුපාට ව දුර්වර්ණ වූ ඇට කැබිලි සහ අළු පමණක් ඉතිරි වුව ද, ඇයට ඒ දෙස බලන්නට සිත ඉඩ නොදුන්නේ ය.

අම්මාගේ අභාවයත් සමඟ තපායි බාල වියේ දී ම "වෙනස්වීම" "අහිමිවීම" ජීවිතයේ එක් කොටසක් බවත්, "ශෝකය" සහ "මරණය" ජීවිතයේ වෙන් කළ නො හැකි අවස්ථා බවත් වටහා ගත්තා ය. ටිකෙන් ටික ඇගේ පවුලේ අයගේ පිහිටෙන් විශේෂයෙන් තම සොහොයුරන් වන පඩන් සහ ප ඉන්ගේ පිහිටෙන් ඇයගේ දුක තුනී කර ගැනීමට හැකි විය. තියුණු දැසක් සහ දැඩි අධිෂ්ඨාන ශක්තියක් ඇති තම නැඟණියට ඔවුහු බෙහෙවින් ආදරය කළහ. අම්මාගේ අභාවයෙන් ඔවුන් ද ශෝකයෙන් සිටිය මුත්, නැගණිය සතුටින් තබා ඇයගේ දුක තුනී කිරීමට ඔවුහු වෙහෙස දැරුවෝ ය. අවසානයේ තම පියා හා බැඳි ගැඹුරු පිය සෙනහස ඇයගේ දුක් දොම්නස දුරු කිරීමට සමත් විය.

තම බිරිඳගේ අභාවයෙන් පසු තසොන් සෑම සතර පෝය දිනක දී ම තම දියණිය තපායි, පන්සලට ගෙන යෑමට පුරුදු ව සිටියේ ය. පන්සල් භූමියේ ඇය

පියා සමඟ බොහෝ වේලාවක් අවට බලමින් අවට ශබ්ද අසමින් එමෙන් ම දවල් සිහින මවමින්, නිකරුණේ වාඩි වී සිටියා ය. එසේ වාඩිවී සිටීම දුක් තුනී කර ගැනීමට පිහිටකැයි ඔවුනට සිතුණි. තපායි පන්සලේ වටපිටාව ප්‍රිය කළා ය. ඉඩ ලත් සෑම වේලාවක දී ම පන්සලේ අඹ ගස යටට හොරෙන් හොරෙන් ගොස් වාඩි වී කිසිවක් නො කර නිසල බවේ ආස්වාදය රස වින්දා ය.

බුදුන් වහන්සේගේ උපත බුද්ධත්වය හා පරිනිර්වාණය සිහි කරන වෙසක් පොහෝදින උත්සව හා පූජාවන්ට සහභාගි වීමට තපායි අතිශයෙන් ප්‍රිය කළාය. බාන් හුඅායි සායි ගම්මානය වෙසක් මාසය තුළ අතිශයින් අසිරිමත් බවක් ඉසිලීය. වාර්ෂික වැසි කාලය ආරම්භ වෙත් ම සෑම තැනක ම මල් පිපී වර්ණවත් විය. උත්සව සමයේ පූජා කිරීම සඳහා බොහෝ දෙනාගේ දැත් නිතරම පාහේ සුවඳ මල්වලින් පිරී තිබුණි. දිලිසෙන බුදු රුව අබියස තට්ටු කීපයකින් යුත් මල් ආසනය මත නා නා වර්ණවලින් යුත් සුවඳැති මල් රාශියක් අතුරා තිබෙනු දැකිය හැක. සවස් කාලයේ දී සංඝයා වහන්සේ සහ ගිහි උපාසක උපාසිකාවෝ දැල්වෙන ඉටිපන්දම් අතැති ව බුදුගෙය වටා පෙළ ගැසුණහ. ඉන් පසුව සංඝ රත්නය මූලික ව සියල්ලෝ ම එකතුව බුද්ධ වන්දනා ධම්ම වන්දනා ගාථා සජ්ඣායනා කළෝ ය. මෙම වන්දනා ශෛලිය අතිශයෙන් මන බඳින සියල්ලෝ ම ප්‍රබෝධවත් කරවන පූජාවන් ය. එදිනෙදා ජීවත් වන තත්වයෙන් මේ අය ආධ්‍යාත්මික වශයෙන් ඔසවා තැබීමක් මෙම වන්දනාවන්ගෙන් සිදුවන බව සියල්ලෝ ම පිළිගත්හ.

පියාගේත් දියණියගේත් ආධ්‍යාත්මික ළබැඳියාව ටිකෙන් ටික වර්ධනය වෙද්දී, තපායි මුල දී අකමැත්තෙන් වුව ද ටික කලකට පසුව ඇය අත් විඳින අද්භූතජනක අපූර්ව බාහිර ලෝකය ගැන විස්තර තම පියාට පැවසුවා ය. තසොන් එම කතාවන්ට විමතියෙන් සහ ඉවසීමෙන් සවන් දුන්නේ ය. කෙළිලොල් දෙවිවරුන්ගේ කතා, සිහින ලෝකයේ නිර්මිත කතා, එමන් ම මනෝමය චාරිකා ගැන විස්තර දියණිය කියද්දී ඉවසා දරාගෙන අසා සිටිය ද ඒවා කෙරෙහි වැඩි විශ්වාසයක් ඔහු නො තැබී ය.

ඇයට වයස අවුරුදු 7 දී තපායි ඇයගේ පෙර භවයන්හි, මිනිස් ආත්ම සහ නොමිනිස් ආත්ම ගැන විවිධ මතක සටහන් අත් විඳීමට පටන් ගත්තා ය. මහත් වූ උනන්දුවකින් තමා වරෙක කිකිළියක ව, වෛද්‍යවරයෙකු ව, කුමාරිකාවක ව එමෙන් ම සාමාන්‍ය මිනිසෙකු ව පසුගිය ආත්මයන් තුළ ජීවත්

වූ අයුරු අහිංසක ව තම පියාට දන්වා සිටියා ය. තපායිගේ පියා ඇයගේ දිවැස් හැකියාව ගැන කිසිසේත් සතුටු නොවූයේ ය. ඊට ඇති තදබල අකමැත්ත ඔහු ඇයට කීවේ ය. ඔහුගේ කනස්සල්ල අතිශයින් වැඩි විය. මෙය තම සිතට වද දුන් ප්‍රබල හේතුවක් වූ නිසා ඔහුගේ මුහුණේ පැහැය පවා වෙනස් විය. කටහඬ තර්ජන ස්වරූපයකට පෙරළුණි. මෙම දිවැස් දර්ශන ගැන කිසිවකුට නොකියන ලෙස ඔහු තම දියණියට මුලින් කරුණාවෙන් කීව ද, පසුව දැඩිලෙස අවවාද දුන්නේ ය. මිනිස්සු ඇය උන්මත්තක කෙල්ලක් හැටියට හැඳින්විය හැකි යයි කියා, ඇයට අනතුරු හැඟවී ය. මෙම කුඩා ජන සමාජය තුළ හැදී වැඩෙන ඇයට මෙය නොමැකිය හැකි කැළලක් සේ ජීවිතයට බලපානු ඇතැයි දැන්වී ය. සාම්ප්‍රදායික වශයෙන් කාන්තාවකගෙන් පවුලට විය යුතු යුතුකම් තම පවුල වෙනුවෙන් ඉටු කිරීමට ඇය සතුටින් සූදානම් වූවා ය. ඇයගේ වැඩිමහල් සොහොයුරිය සමඟ ගෘහ පාලන කටයුතු බෙදා ගත්තා ය. සහෝදරියන් දෙදෙනාගෙන් වඩා ශක්තිමත් වූයේ ද වැඩපළවලට කැමැත්ත දැක්වූයේ ද තපායි ය. තම මව් ඉතා ප්‍රසන්න ලෙස ඉටු කළ ගෙදර දොරේ අසීමිත වැඩපල, ඇය සතුටින් භාර ගෙන පෙර සේ ම ඉටු කළා ය. ගෙදර කව්රු හෝ පාන්දරින් නැගිට ලිප ගිනි මොළවා එදින බත පිසීම කළ යුතු ව තිබුණි. කව්රු හෝ ආහාර පිළියෙල කළ පසුව භාජන සෝදා පසෙකින් තැබීම ද අවශ්‍ය ව තිබූ වැඩකි. අතු ගෑම, පිඟන් කෝප්ප සෝදා පිරිසිදු කිරීම, රෙදි සේදීම ආදී කාර්යයන්ට අමතර ව පුළුන් කැටීම, රෙදි විවීම, ඉරුණු ඇඳුම් අලුත් වැඩියා කිරීම ද ඇයගේ දෛනික කාර්යයන්ට අනිවාර්යයෙන් එකතු විය. කොසු අතින් සෑදූ ඒවා ය. එමෙන් ම නා නා මාදිලියේ මලු ද කාන්තාව අතින් සැකසුණි. බත් රැගෙන යාමට බට පතුරුවලින් තැනූ කුඩා භාජන ද, හතු හා පලා වර්ග එකතු කිරීම සඳහා වේවැල්වලින් සෑදූ තැටි ද ඔවුන් සතුව තිබුණි.

කුඩා කල සිට ම තපායි, මෙවන් අනේක මාදිලියේ කාර්යයන් ඉටුකිරීමට අධිෂ්ඨානයෙන් යුතුව තම ශරීරය සකස් කර ගත්තී ය. ගෙදර දොරේ එක් එක් දෛනික කාර්යයන් සඳහා මෙන් ම එක් එක් ගෘහ කර්මාන්ත සඳහා විශේෂිත දක්ෂතාවයන් තිබිය යුතු හෙයින්, එම හැකියාවන් ලබන තුරු පැය ගණනාවක් එම කාර්යයන්හි නිරත වීමට ඇයට සිදු විය. එම කාර්යයන්හි නොයෙදෙන වේලාවන්හි ඇය කුඹුරු වැඩෙහි හෝ යාබද කැලය ආශ්‍රිත වෙනත් වැඩක නිරත වූවා ය. එම වැඩ කිරීමට පවා අවශ්‍ය කුසලතා ඇය දියුණු කර ගත්තා ය. ඇගේ මව ජීවත් ව සිටිය දී, අවට කඳු අතරට විනෝද ගමන් ගොස්

ඖෂධ පැළෑටි සහ කැලෑ පලා වර්ග එකතු කළා ය. එසේ නැතහොත් කුඩා පොකුණුවල මසුන් ඇල්ලුවා ය. ඇය ඇගේ නැන්දලා සහ ඥාති සොහොයුරු සොහොයුරියන් සමඟ ආහාරයට සුදුසු හතු සහ විෂ සහිත හතු හඳුනා ගනිමින් ද පැණිරස ඖෂධ පැළෑටි සහ තිත්ත ඖෂධ පැළෑටි ගැන ඉගෙන ගනිමින් ද අවට කැලෑවේ සැරිසැරුවා ය. පැළ සිටුවීම, අස්වැන්න නෙළීම එසේත් නැතිනම් ආහාර වර්ග එකතු කිරීම දිනපතා කෙරුණු පොදු කාර්යයන් ය.

පූ තායි ජනයාගේ ප්‍රධාන ආහාරය වූයේ ඇලෙනසුලු හාලකින් පිසූ බත් ය. මෙම බත් අනුභව කිරීමෙන් ඔවුනගේ ජීවන රටාව වඩාත් ශක්තිමත් විය. වැස්ස බලාපොරොත්තුවෙන් ගොවියෝ කුඩා ලියදි සකසා එහි වී තවන් කළෝ ය. එම කාලයේ දී ම ඔවුනගේ මී හරක් යොදවා පොළොව සකස් කිරීම කර ගත්හ. වැසි කාලය ආරම්භ වී අවශ්‍ය තරම් පොළොව තෙත් වූවාට පසු නැවතත් මී හරකුන් යොදවා ලියදි මඩ කර පෝරු ගසා ගොයම් පැළ සිටුවීමට පොළොව සකසා ගනී. ඉන්පසු ගෙවිලියෝ කණ්ඩායම් ලෙස පේළි සැදී පියවරෙන් පියවර පිටුපසට යමින් ගොයම් පැළ මඩෙහි අනිමින් සිටුවති.

වී ගොවිතැන, ශ්‍රමය බොහෝ සේ වැය වන වගාවකි. නමුත් වී ගොවිතැන ගම්වැසියෝ සාමූහික ව එකට බැඳ තබන්නකි. තපායිගේ අම්මාගේ අභාවයෙන් පසු ඇගේ පවුලට ඥාති වූ හැම පවුලක ම කාන්තාවෝ ඇගේ පියාගේ කුඹුරේ පැළ සිටුවීමට එකතු වූවෝ ය. තවමත් එවැනි කාර්යයන් සඳහා නො මේරූ ඇය අඳුරු අහස්තලය යට නියර මත හිඳ වැඩිහිටි ස්ත්‍රීන් ගොයම් පැළ සිටුවනු බලා සිටියා ය. ඔවුන් හා එකට පේළි සැදී තමා ද ගොයම් සිටුවන දවස ගැන සිහිකරමින්, ඇය එදෙස බලා සිටියා ය. අම්මාගේ මරණයෙන් අවුරුදු කීපයක් ගත වූ පසු තපායිගේ පියා නැවත විවාහයක් කර ගත්තේ ය. ඔහුගේ අලුත් මනාලිය වූයේ, මෑතක තම ස්වාමියා, වසංගත රෝගයකින් මිය ගිය වැන්දඹුවකි. වරින් වර පැතිරෙන මෙම වසංගත රෝග, කටුක ජීවිත ගත කරන මෙම ගම්වාසීන්ගේ ජීවිත තවත් දුෂ්කර කරන්නක් විය. තපායි ඇගේ කුඩම්මා ප්‍රිය කළා ය. මේ දෙදෙනා ඔවුනොවුන්ගේ සමීප ඇසුර ප්‍රිය කළහ. කුඩම්මාගේ තරුණ දියණිය තපායිට ගැළපෙන මිතුරියක් වූවා ය. නව ආරම්භයකට තමා මුල පිරුවා සේ ඇයට හැඟුණි. ඒ ගැන ඇය සතුටු වූවා ය. ජීවිතයේ මෙතෙක් මුහුණ දුන් සෑම අවස්ථාවක් ම ඇය සිනා මුසු මුහුණින් භාර ගත්තා ය. බාහිර

කටයුතු සඳහා ඈ දැක්වූ ප්‍රසන්න ආකල්පය ගැමි ජීවිතයේ කටුක තැන් තුනී කරදීමට උපකාරී විය.

කුඩම්මා බිහි කළ බිළිඳු සොහොයුරා, මෙලොව එළිය දැක ටික දිනකින් මිය ගියේ ය. යමක් අහිමි වීමේ දුක වේදනාව, තපායි හට නැවතත් දැනුණි. අනිත්‍යභාවය තුළ සත්‍ය වශයෙන් ම පවතින අසහනය ඇය නැවතත් අත් දුටුවා ය. නිතර වෙනස් වන අහිමි වන ඇගේ ලෝකය ගැන අවශ්‍ය දැනීම දෙවෝපගත ව ලැබෙන බව ඇයට වැටහුණි. දිනෙන් දින, කලින් කල ඇගේ ලෝකය වරෙක කැඩී බිඳී ගොස් නැවත සකස් වන අයුරු ඇය අත්දුටුවා ය. වෙනස් වන ස්වභාවය ජීවිතයේ අඛණ්ඩ ව සිදුවන ධර්මතාවයකි. වෙන්වීම ජීවිතයේ සාමාන්‍ය දෙයකි.

පූ තායි ගමේ වැසියෝ දුෂ්කර ජීවිත ගත කළ ඇත්තෝ ය. නිමක් නැති වැඩපළ කාන්තාවන් සතු විය. ආහාර පිසීම, සේදීම, මැහීම, ගෙතීම, වැපිරීම, අස්වැන්න නෙළීම ආදී කාර්යයන් වසරෙන් වසර කිසිදු වෙනසක් නොමැතිව ගැමි කාන්තාවගේ දැතින් ඉටු විය. මෙවන් කාර්යයන්හි නිරත වෙමින් තපායි ද, තම කුඩම්මා සමග ඉතා සමගියෙන් කාලය ගත කළා ය. බර වැඩ දෙදෙනා අතර බෙදා හදා ගනිමින් ද විටක උසුළු විසුළු කර ගනිමින් ද සතුටින් කල දවස ගෙවූහ. තපායි ජීවත් වූ ප්‍රදේශයේ පාසැලක් නො තිබූ හෙයින් ඇයට විධිමත් අධ්‍යාපනයක් ලබා ගැනීමට නොහැකි විය. නමුත් වෙනත් ස්වරූපයකින් ඇයගේ බුද්ධිය වර්ධනය විය. ඇගේ නිවස, කුඹුරු යාය සහ ඝන වනාන්තරය ඇගේ පාසැල් විය. මෙම ආයතනවලින් ඇයගේ ජීවිතයට කල්පවතින විශේෂිත ගැඹුරු පාඩම් ලබා ගැනීමට හැකි විය. ආදරය පිළිබඳ පාඩම්, අත්හැරීම, අස්ථිරබව, ඉවසීම බලාපොරොත්තු කඩවීම සහ අධිෂ්ඨාන ශක්ති ආදී විෂයයන්ගෙන් ලැබිය හැකි පාඩම් මෙන් ම දුක් විඳීම සහ මැදහත් ව සිටීම ආදී පාඩම් ද එම වටිනා විෂයයන් අතර විය. මෙම අධ්‍යාපනය සමඟ ඇගේ ළමා කාලයේ දැනීම වසරෙන් වසර වර්ධනය විය.

ඔබ ඔබ ම හඳුනාගන්න.
ඔබේ වැරදි පිළිගෙන,
ඒවා නිවැරදි කරගැනීමට කටයුතු කරන්න.
ඔබ, කිසිවක් ඔබෙන් සඟවන්න එපා.
සැමට ම වැඩිය, ඔබ ඔබට බොරු කියා ගන්න එපා.
සතුටු නම් වුලු ලොවට ම ඔබට බොරු කිව හැක,
නමුත්, ඔබ ඔබට බොරු කියා නො ගත යුතුයි.

නිර්භීත රණවිරු චිත්ත ධෛර්යය

වර්ෂයේ වියළි උෂ්ණාධික කාලවල දී, විටින් විට ධුතාංගධාරී භික්ෂූහු බාන් හුආයි සායි ගම්මානය හරහා, හුදකලා ව භාවනාවට සුදුසු විවේකී තැන් සොය සොයා ගියහ. ගම්මානය වටකර පිහිටි කඳු වැටිය සහ අතිවිශාල ඝන කැලෑව ජනතාව වළක්වන අනතුරු දනවන ප්‍රදේශයක් විය. වන සතුන් නිදැල්ලේ හැසිරුණි. නීච භූතයෝ එම පෙදෙස් රජ කරමින් සිටියහ. මුළු පෙදෙසම ඝන කැලෑවෙන් ගහන වුව ද, එය බිය දනවන්නක් නො වී ය. ධුතාංගධාරී චාරිකා භික්ෂූන් හට ඔවුනගේ යෝගාවචර දිවිය හුදකලාවේ ගෙවීමට මෙම වනාන්තරය සුදුසු ම ස්ථානයක් විය.

මේ ධුතාංගධාරීන් සියල්ල අතහැර, නිවන් අරමුණු කොට මෙම පාළු කැලෑ පාරවල්හි පා ගමනින් නිහඬ ව නිතර නිතර යනු දක්නට ලැබුණි. ඔවුහු තම සිත කය සංසිඳුවා ගැනීම සඳහා සුදුසු ස්ථාන සොයමින් ගියහ. නිවන් මග යමින් දුක් දුරු කිරීම සඳහා කඳුවැටි, ගල්ගුහා, ලෙන් ආදිය සොයමින් මොවුහු චාරිකාවේ යෙදුනහ. ජීවිතයේ වැඩි කොටසක් එළිමහනේ ගත කරන මෙම ධුතාංගධාරී භික්ෂූහු කාලගුණික විපර්යාසයන්, සහ මූලධාතු විපරිනාමයන්ට ලක් වෙමින් ජීවත් වූහ. පරිසරය හා බද්ධ වෙමින්, ස්වභාව ධර්මයේ ලක්ෂණයන් හා එක් වෙමින් මොවුහු තම ජීවිත ගෙන ගියහ. පර්වත ගස්කොළන්, ඇළ දොළ

සහ ගංගා, කොටි වලසුන්, සර්පයින් වල් අලින් අතරට ධුතාංගධාරී භික්ෂුව ද එක් විය. උන් වහන්සේලාගේ දිවි පැවැත්මට, වනාන්තරය අද්දර පිහිටි කුඩා ගම්මානයන් ගොදුරු ගම්මානයන් සේ සලකා, පිණ්ඩපාතය සඳහා වඩින්නට පුරුදු වූහ.

රණවිරුවකු සතු නිර්භීත භාවය සහ චිත්ත ධෛර්යය, ධුතාංගධාරී භික්ෂූන් හා සසඳන කළ පිරිස එක සමාන බව පූ තායි ගම්වැසියෝ විශ්වාස කළහ. මෙම හේතුව නිසා එම භික්ෂූන්ගේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මෙම ගම්වාසීන්ගේ උපකාරය උන්වහන්සේලාට ලැබුණි. තපායිගේ පියා වනාන්තර ආශ්‍රිත භික්ෂූන් කෙරෙහි වැඩි ඇල්මක් දැක්වී ය. "මේ නියම බුද්ධ පුත්‍රයන් ය" යනුවෙන්, මුහුණට මඳ සිනහවක් නගා ගනිමින්, ඔහු උන්වහන්සේලා අගය කළේ ය. චාරිකාවේ වඩින එවන් භික්ෂූන් වහන්සේ දුටු වහාම කුඩා දරුවෙකු මෙන් උද්‍යෝගිමත් ව උන්වහන්සේලා පිළිගත්තේ ය.

1914 වසරේ දී, කීර්තිමත් ධුතාංගධාරී කම්මට්ඨානාචාර්ය කන්තසීලො හිමිගේ වැඩීමත් සමග, බාන් හුඅායි සායි ගම්මානයේ ආධ්‍යාත්මික තත්ත්වය දැඩිසේ වෙනස් විය. ඈත දිසාවක සිට අනුගාමික භික්ෂූන් වහන්සේලා කීප නමක් ද කැටුව, උන්වහන්සේ එක් දිනක නිදැල්ලේ පා ගමනින් මෙම ප්‍රදේශයට වැඩියහ.

ඔවුන් මාස ගණනාවක් ම ඇවිදිමින්, මුලින් ම ලාඕසයේ සිට සියමේ නකෝන් ෆනෝම් ප්‍රාන්තයට මී කොං ගංගාව හරහා පැමිණ ඇත. ඉන් පසුව සකොන් නකොන් හි නැගෙනහිරින් පිහිටි කඳු වැටිය අමාරුවෙන් තරණය කොට, මුක්දහාන් දක්වා ෆු ෆාන් වනාන්තරය හරහා පැමිණ ඇත.

පූජ්‍ය සාඕ තෙරුන් වහන්සේ වයස අවුරුදු 55 ක් වුවද, නිවර්තන ග්‍රීෂ්මය ඉවසමින් අති දුෂ්කර වූ බිම් පෙදෙස් දවස් ගණනාවක්, නොවෙනස් ව එකම ප්‍රමාණයේ පියවර තබමින්, ගමන් කළ සේක. උන්වහන්සේ සහ ශිෂ්‍ය පිරිස බාන් හුඅායි සායි ගම්මානය පෙනෙන තෙක් මානයට පැමිණෙද්දී, වාර්ෂික වැසි කාලය ආරම්භ වූවා පමණි. වලාකුළු එකිනෙක හැපී ශීතල පොද වැස්ස ටිකෙන් ටික වැටෙන්නට පටන් ගති. උණුසුම් පොළොව තෙතමනය උරා ගත් අතර කාන්තිමත් හිරු එළිය තවමත් නො අඩුව අහසේ පැතිරුණි. කාලගුණය මෙසේ වෙනස් වෙද්දී, වස්සාන කාලය එළඹෙන බවත්, වස් විසීම සඳහා සුදුසු

ස්ථානයක් සෙවිය යුතු බවත් ආචාර්ය සාඕ හිමිට ඉඟියෙන් මෙන් දැනුණි. මෙම වැසි සහිත මාස තුන භික්ෂූන් වහන්සේලා දැඩි ව භාවනාවේ නිරත වන කාලයයි. බුදුන් වහන්සේ ගේ උපදෙස් පරිදි භික්ෂූන් වහන්සේලා ඔවුනගේ චාරිකා සමය නවතා එක් ස්ථානයකට වී, වහලක් යට වාසය කරති.

ආචාර්ය සාඕ ස්වාමීන් වහන්සේ, තම ශිෂ්‍ය පිරිස ද කැටුව සංවර ගමනින්, තවමත් නින්දේ පසු වූ පූ තායි ගම්මානයට අලුයම ඇතුළු වුණි. තෙතමනයත් මීදුමත් අතරින් උන්වහන්සේත් පසුපසින් පෙළට ආ ගෝල පිරිසත් මුලින් ම පෙනුණේ ඡායාවන් සේ ය. ළං වෙත් ම සමර පාට සිවුරු පොරවාගත් භික්ෂූන් වහන්සේලා බව පැහැදිලි ව පෙනුණි.

පාවහන් නොමැති ව, එක් උරහිසක එල්වා ගත් පාත්තරය සහිත ව ගමන් ගන්නා මෙම භික්ෂූහු, ගම් වැසියන්ගේ පරිත්‍යාගයන්, දාන මාන ලබා ගැනීමට සූදානම් ව සිටියහ. බත් කරවල, කෙසෙල් යනාදිය මෙන් ම ඔවුන් ගේ සිනහ රැල්ලත්, ගෞරවනීය නමස්කාරයත් එම පරිත්‍යාගයන්ට අයත් විය. භික්ෂූන් වහන්සේලාගේ ශාන්ත ඉරියව් සහ ගෞරවනීය පෙනුම ගම් වාසීන්ගේ සිත් භක්තියෙන් කුල්මත් කළ අතර ගමේ ස්ත්‍රී පුරුෂයෝ සහ දරුවෝ මේ ධර්මයේ හැසිරෙන භික්ෂූන් හට යම් ආහාර වේලක් ලබා දීමට කෑ කෝ ගස්මින් එහෙ මෙහෙ දුවමින්, පොර කෑහ. සාඕ හිමි සහ උන්වහන්සේගේ ශිෂ්‍ය භික්ෂූන් තපායිගේ නිවස ඉදිරියෙන් පිණ්ඩපාතය සඳහා වඩිද්දී, ගෙදර සියල්ලෝ ම නිවස ඉදිරියෙන් දිවෙන, අපිරිසිදු අඩි පාර ට අවුත්, ආහාර ස්වල්පයක් හාමුදුරුවන්ගේ පාත්තරවලට බෙදන බලාපොරොත්තුවෙන් සිටගෙන සිටියහ. විශේෂිත වූ පින් රැස් කර ගැනීම ඔවුනගේ බලාපොරොත්තුව විය.

මෑතක දී මෙම පෙදෙසට සංක්‍රමණය වූ භික්ෂූන් ගැන වැඩි විස්තර දැන ගැනීම සඳහා තපායිගේ පියා, යහළුවන් කීප දෙනෙකු ද සමග උන් වහන්සේලා කඳුපාමුල තාවකාලික ව ලැගුම් ගත් අරණ සොයා ගියහ. පූජ්‍ය සාඕ තෙරුන් වහන්සේ, කීර්තිමත් කම්මට්ඨානාචාර්යයන් වහන්සේ නමක් හැටියට මුළු පළාතේ ම ප්‍රසිද්ධියක් ඉසුලුව ද තසොන් සහ ඔහුගේ මිතුරන් කිසිදිනක උන්වහන්සේ දැක නො තිබුණි. නමුත් උන්වහන්සේගේ නම කියවෙනවාත් සමග ම ඔවුනට නිම් හිම් නැති ප්‍රීතියක් උපන. තපායි ගේ පියා, සාඕ තෙරුන් හට වැහි කාලයේ තම ගම අසල වනයේ වාසය කිරීමට ආරාධනා කළේ

ය. මෙම ප්‍රදේශයේ භූ විෂමතා ලක්ෂණ ගැන තපායිගේ පියාට ඉතා හොඳ දැනීමක් තිබුණි.

වේගයෙන් ජලය ගලා යන ඇළ දොළවල් ද අවට ප්‍රදේශය වටා කරකැවෙමින් දිවෙන ගංගා ද, කඳු වැටියේ ඇති ගල් ලෙන් ද, ඉදිරියට නෙරා පිහිටි පර්වත කොටස් ද, එමෙන් ම තැනිතලා තෘණ භූමි සහ ඝන වනාන්තර ද මෙම ගම්මානය අසිරිමත් කළේ ය. මේ හැම ලක්ෂණයක් ගැන ම මනා දැනීමක් තපායි ගේ පියාට තිබුණි. ඒ නිසාම ඔහු ගරුතර ස්වාමීන් වහන්සේට මග පෙන්වන්නෙක් විය. වස් වැසීම සඳහා ස්ථාන කීපයක් ම ඔහු උන්වහන්සේට පෙන්වීය. ගම්මානයේ සිට පැයකින් පමණ යා හැකි දුරකින්, වනයේ බැන්ක්ලැං ගල් ලෙන සහ ඒ අවට ප්‍රදේශය වස් විසීම සඳහා සුදුසු යයි සාඕ ස්වාමීන් වහන්සේ තීරණය කළේ ය. තපායිගේ පියා ඒ ගැන සතුටු වුණු අතර සිතේ සැනසීමක් ද ඇති විය.

බුදු දහම හඳුන්වා දීමට ප්‍රථම පූ තායි වැසියෝ පැරණි සම්ප්‍රදායන්ට අනුව මළගියවුන් සහ භූත වන්දනාවන්හි ගැලී සිටියහ. කැලෑවට අධිපති දෙවියනට, භූතයනට, පරම්පරාවේ මළගිය ඇත්තනට බිලි පූජා පැවත්වීමටත් වන්දනා කිරීමටත් පුරුදු ව සිටියහ. තම පවුලේ මිය ගිය අයවලුන්ගේ භූත ආත්ම වන්දනා, සෑම නිවසක ම අනිවාර්යයෙන් කෙරෙන ආගමික වතාවතෙකි. ඒ සඳහා සෑම නිවසක ම වැඳුම් පිදුම් කිරීමට ස්ථානයක් වෙන් කර තිබුණි. අතීතයේ තම පවුල්වල මිය ගිය මුතුන් මිත්තන් සඳහා විවිධ පූජාවන් කිරීම දෛනික සිරිතක් ව පැවතුණි. මෙම මියගිය ඇත්තෝ, ඔවුනගේ පවුලේ අය වාසය කළ නිවස එමෙන් ම ගම අනතුරුවලින් වළක්වා, ආරක්ෂා කරනු ඇතැයි ඔව්හු විශ්වාස කළහ. එම පූජාවන් නො කිරීමෙන් අවාසනාවන්ත සිද්ධීන්ට ඔවුහු මුහුණපානු ඇතැයි ද, ඔවුන් තුළ බියක් තිබිණි. එදිනෙදා පවුලේ කෙරෙන කාර්යයන් හොඳින් කෙරෙතොත්, මිය ගිය ඇත්තෝ නිවසේ කෙරෙන පුද පූජා ගැන සතුටට පත්වී ඇතැයි ඔවුහු විශ්වාස කළහ. එසේම නිවසට කරදර කම්කටොලු පැමිණියහොත්, එසේ වූයේ පූජාවන් නිසිසේ නො කෙරුණ හෙයින් මිය ගිය ඇත්තෝ අසතුටින් නිසා යයි ද, විශ්වාස කළෝය. ශුභ දවස් බලා, ළඟපාත ගැවසෙන දෙවියන් භූතයන් සැනසීමට විවිධ පූජාවන් කිරීමට ද ඔවුහු මහත් උත්සාහයක් ගත්හ. භූමාට දෙවියන් සහ අහසේ වෙසෙන දෙව්වරු ද ඔවුන් අමතක කළේ නැත. සහල් සහ ජලය, දෙවියන් සමඟ ඇති සම්බන්ධතාවය ගැන ඔවුන් අතර ප්‍රචලිත මෙම පැරණි කියමනෙන් තහවුරු වේ.

"අනුභව කරද්දී කුඹුරට අධිගෘහිත දෙවියන් අමතක නො කරනු. අපට මසුන් ලබාදෙන ජලයට අධිගෘහිත දෙවියෝ කිසිදාක අමතක නො කරනු."

බොහෝ ගම්මාන මධ්‍යයේ බෞද්ධ සිද්ධස්ථානයක් හෝ වැඳුම් පිදුම් කිරීමට සුදුසු තැනක් තිබුණ ද, මළවුන් වන්දනාව ගම්වාසීන් ගේ ජීවිතවලට ඉතා තදින් කා වැදී තිබුණි. ආචාර්ය සාඕ හිමි ගම් අතරේ සැරිසරමින් ධාර්මික දිවියක ඇති ගුණාත්මකභාවය ඔවුනට පැහැදිලි කර දුණි. එසේම ඔවුනගේ ක්‍රියාවන් හා විශ්වාසයන් හේතු කොට ඇතිවිය හැකි ඵල විපාක ද ඔවුනට වටහා දුණි. දෙවියන් හා භූතයන් අප අතරේ ඉන්නා බව උන්වහන්සේ ප්‍රතික්ෂේප නො කරන ලදී. ඔවුන් සෑම තැනකට ම, සෑම දෙයකට ම අධිගෘහිත ව වෙසෙන බැව් කීය. කැලෑ, ගස්, කඳු, ලෙන්, ගංගා, කෙත්වතු, පොළොව සහ අහස යනාදියට අධිගෘහිත ඇත්තෝ සිටින බවද එසේම කයක් නො මැති ජීව කොටසක් ද ඉන්නා බවට ඇති විශ්වාස උන්වහන්සේ පිළිගති. එනමුදු උන්වහන්සේ එම දෙවියන් සහ භූතයන් හට, මිනිසාගේ දුක් දොම්නස් ඇති කරවන බලයක් තිබෙන බව විශ්වාස නො කළහ. එසේම බිලි පූජා ආදී අල්ලස් දී, කෙනෙකු මුහුණ දෙන අසහනකාරී තත්වයන් ගෙන් ආරක්ෂාව ලබාගත හැක යන විශ්වාසය ද උන් වහන්සේ නො පිළිගත්තේ ය.

ගමට පායන ඉර, වහින වැස්ස සහ විහිදෙන මීදුම, වාගේ ම මෙම අසල්වාසී දෙවියන් සහ භූතයන් පූ තායි ගම්මානයේ ම කොටසකි. ඔවුන් ද ඉපදීම හා මරණය මෙන් වෙන් කළ නොහැකිය. මෙය ද සාඕ හිමියන් ප්‍රතික්ෂේප නො කළේ ය. නමුත් මේ අමනුෂ්‍යයන්, ගම්වාසීන් මෙන් ම ඔවුනොවුන්ගේ කර්ම විපාක අනුව ඒ ඒ තත්වයන්ට පැමිණ ඇති බැව් උන්වහන්සේ ඔවුනට පහදා දුන්හ. සෑම සත්ත්වයෙකු ම, ගම් වැසියන් වාගේ ම කර්මය දායාද කොට ඇති බැව් වටහා දුණි. මෙම මළවුන් වන්දනාව සමහර විටක ඒවාට ඇබ්බැහි වූ අයට කිසියම් මානසික ශක්තියක් ලබා දෙයි. ආචාර්ය සාඕ හිමිගේ පණිවිඩයේ සාරය වූයේ පෞද්ගලික වගකීම සම්බන්ධවයි. කෙනෙකු අත්විඳින සතුට හෝ වේදනාව, ප්‍රීතිය හෝ දුක, ඔහුගේ අතීත කර්මයන්ගේ ප්‍රතිඵලයන් ය. එය ඔහුගේ වර්තමානයේ සදාචාර සම්පන්න යහගුණ මත සකස් වන්නක් බැව් ද පහදා දෙන ලදී.

වස් වැසීම සඳහා සාඕ හිමිගේ අසපුව ඉදි කිරීමේ දී වැස්සට ඔරොත්තු දෙන කුටි ඉදි කිරීම අවශ්‍ය ව තිබිණි. එක් එක් හිමි නමකට එක් එක් කුටිය

බැගින් ද, ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීමට සහ දන් වැළඳීම සඳහා ශාලාවක් ද අවශ්‍ය විය. සක්මන් භාවනා සඳහා පොළොව සමතලා කර නිසි අයුරු සකස් කිරීම ද, වැසිකිලි සඳහා වළවල් සෑරීම ද සිදුකිරීමට තිබුණි. හදවත පුරා ඉස්මතු වූ ප්‍රීතියකින් එමෙන් ම උද්‍යෝගයකින් තපායිගේ පියා එම සේවාවන් කර දීමට ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් විය. අත්තිවාරම් ලී කොට සඳහා ඊට සුදුසු ගස් කපා ඉරා සකස් කිරීම, බිම සකස් කිරීමට උණ බම්බු පලා තෙරපා සුදානම් කර ගැනීම, වහළ සෙවිලි කර ගැනීම සඳහා උස තණ කපා මිටි බැඳීම කළ යුතු ව තිබූ කාර්යයන් ය. ඔවුහු අඩි පාරවල් කපා සමතලා කොට වළගොඩැලි වසා, අතුගා භික්ෂූන්ට පහසුවෙන් යා හැකි සේ සකස් කළහ. වැසිකිලි වළවල් හාරා වට සෙවිලි කරන ලදී. තසොන් සහ ඔහුගේ යහඳුවන් මෙම ඉදිකිරීම් කර නිම වෙද්දී, ක්‍රම ක්‍රමයෙන් ජන ශූන්‍ය වනාන්තරයක පිළිවෙළකට සකැසුණු කුඩා ආරණ්‍යයක් සකස් වී තිබුණි.

පූ තායි ගම්මානය තුළ ටිකෙන් ටික අධ්‍යාත්මික පෙරළියක් ඇතිවිය. මුල දී එක පවුලකින් ආරම්භ වී පසුව අනික් පවුල්වලට ශ්‍රද්ධාව ව්‍යාප්ත ව ගියේය. බුදුරජාණන් වහන්සේ සරණ යෑමෙන් ලබන ආරක්ෂිත බලය සමාදන් වන ශීලයේ බලය ඔවුනට තදින් ම අවබෝධ විය. බොහෝ දෙනා ඔවුන් මෙතෙක් මෙතෙක් වැඳුම් පිදුම් කළ පූජස්ථාන, දේව රූප භූත රූප ආදිය ගිනි තබා විනාශකොට අඳු බවට පත් කරන ලදී. තවත් සමහරක් අය බුදු දහම ගැන සැක පහළ කරමින්, ධර්මය වැළඳ ගැනීමට පසුබට වූහ. අප අවට සැරිසරන අමනුෂ්‍යයෝ මේ ගැන කෙසේ ප්‍රතික්‍රියා දක්වත් ද? ඔවුහු පලි ගනිත් ද?

නිකරුණේ කතා නොකරන, සාඕ තෙරුන් වහන්සේ, උන්වහන්සේගේ සීමිත වචන උපයෝගි කර ගනිමින්, ගම්වාසීන් තුළ පැවති පොදු බිය මඟ හරවා ශ්‍රද්ධාව සහ ශීලය ඔවුන් තුළට කා වැද්දීමට සමත් විය. ඔවුනට ඉතා පහසුවෙන් තේරුම් ගත හැකිවන සේ, ඍජුව ම සරල පාඩම් මගින් ඉගැන්නුවේ ය. කෙනෙක් තුළ ශ්‍රද්ධාව ඇතිකරලීම සඳහා, බිලි පූජා චාරිත්‍රය වෙනුවට බුදුන්, දහම් සහ සඟ සරණ යෑම සුදුසු බව ඒත්තු ගැන්වී ය. ශීලය සිත් තුළට කා වැද්දීම සඳහා ඔවුනට පංච ශීලය සමාදන් වීමට හුරු කළේ ය. සතුන් මැරීමෙන් වැළකීම, සොරකම් කිරීමෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම, කාමය වරදවා හැසිරීමෙන් වැළකීම, සහ මත් ද්‍රව්‍ය ගැනීමෙන් වැළකී සිටීම ආදී සිල් පද ඉගැන්වීය. තම තමන්ගේ සිත් සහ ක්‍රියා සංවර කර ගැනීම

සරල සේ පෙනුණත් එහි ප්‍රබල ශක්තියක් ඇති බැව් ඔවුනට වැටහුණි. එසේම අන් අයටත් තමාටත් හානිකර හැසිරීමෙන් වැළකී සිටීම තමාගේ ආරක්ෂාව තහවුරු කර ගැනීමේ උපක්‍රමයක් බව ගම්වැසියෝ වටහා ගති.

ගම්වාසීන්ට උදව් කිරීමේ අටියෙන්, ඔවුනගේ බිය දුරු කිරීම සඳහා භාවනාවෙන් ලැබිය හැකි ආරක්ෂා සහිත බලය ඔවුනට කියා දුණි. පළමු ව, බුදුන් වැඳීම සඳහා සාමූහික ව බුදු ගුණ සජ්ඣායනා කිරීමට ඔවුන් පෙළඹුවේ ය. ඔවුනගේ හදවත් පිරිසිදු වී, සන්සුන් වූ පසු, ඒ ඇත්තන්ගේ සැකයන් හා අසහනයන් දුරු කිරීමට සරල බසින් කෙටියෙන් මෙසේ අවවාදානුශාසනා කළේ ය.

"භය වන්නට එපා, බුද්ධෝ.... බුද්ධෝ.... බුද්ධෝ යනුවෙන් සිත එකඟ කරගනිමින් භාවනා කරන කොට අමනුෂ්‍යයන් ඔබට බාධා පමුණුවන්නේ නැහැ. ජීවිත කාලය තුළ සෑම කෙනෙක් ම ලෙඩ වෙනවා. අපට ඇතිවෙන අසනීප, අමනුෂ්‍යයන් ප්‍රේතයන් භූතයන් නිසා ඇති වෙනවා කියා සිතීම මෝඩ කමක්. අපේ ශරීර සෑම මොහොතක ම ජරාවට පත් වෙමින්, වෙනස් වෙනවා. මනුෂ්‍ය ශරීරය සහ ලෙඩ වීම එකට එක බද්ධ වී යන එකක්. ඔබේ මැරිච්ච ඥාතීන්ගෙන් උදව් ඉල්ලීම කිසි වැඩක් නැති දෙයක්. භාවනා කරලා ඒ පිං මිය ගිය ඇත්තන්ට අනුමෝදන් කිරීම ඊට වඩා හොඳයි. එතකොට දෙගොල්ලන්ට ම මොකක් හෝ යහපතක් වෙනවා"

කැපවීමෙන් බෞද්ධ කටයුතුවල යෙදෙන ගම් වාසීහු චාරිත්‍රානුකූල ව සතර පොහොය වෙන් කරවා ගෙන ආගමික කටයුතුවල යෙදෙති. ඔවුහු මෙම දිනයන්හි භික්ෂූන් වහන්සේලාට දන් පිළිගැන්වීම, සාමූහික ව ගාථා කීම, ධර්ම දේශනාවන්ට සවන් දීම, භාවනා පුහුණුව ආදී දේවල්වලින් එකකට හෝ කීපයකට සහභාගි වෙමින් දවස ගෙවති. තපායි මේ වන විට අවුරුදු 16 ක ළදැරියකි. අලුතින් ඉදිවුණු බෑංක් ලෑං ලෙන ආශ්‍රිත ආරණ්‍යය වෙත තම දෙමාපියන් සමග බොහෝ දවසක උදෑසනින් ම පයින් යෑමට පුරුදු ව සිටියා ය. ගැහැනු දරුවෙකු නිසා භික්ෂූන් අතරේ සමීප ව හැසිරීමට ඇයට ඉඩ කඩ නො ලැබුණි. එහෙයින් ආචාර්ය සාඕ හිමි ගිහියන් අමතද්දී, තපායි ශාලාවේ ඈතට වී, උන් වහන්සේගේ මුදු මොළොක් කට හඬ ඇසෙන සීමාවක වාඩි වී, සවන් දුන්නා ය.

ගමේ කාන්තාවන්ගේ පිටුපසින් වාඩි වී, කුඩම්මාගේ උරහිසින් ඉස්සි ඉස්සී බල බලා සිටි තපායි හට, අවට ඇති ආධ්‍යාත්මික පරිසරය සහ උගන්වන දෑ අවබෝධ කර ගැනීමට හැකි විය. ගම්මානයේ අන් සියල්ලන් වාගේ ම තපායි ද, ඔවුනගේ සංස්කෘතික උරුමයන් සමග මෙතෙක් දුර වැඩී ආ කෙනෙකි. ඇය ලෝකය දෙස බලද්දී ද, අතීතයේ සිට ඇයට දායාද වූ එම සංස්කෘතික පසුබිමේ සිට බැලීමට සිදු විය. කුඩා කල සිට ම, දේව භූත යන්ගේ ජීවීන්ගේ පැවැත්මක් ඇති බව දැන සිටිය ද, එම අද්භූත විශ්වාසයන් ඈ වැළඳ නො ගත්තී ය. ඒ වෙනුවට ඇය, ඇයගේ සාමාන්‍ය දැනීමෙන්, හේතුවත් එහි ප්‍රතිඵලයත් සම්බන්ධ ව ඇත්ත සෙවීමට යුනුසුළු වූවා ය. ඇගේ නිවසේ මළගියවුන් සිහි කිරීමට කුඩා පුදසුනක් ඉදිකර තිබුණ ද, තපායිගේ සිත ස්වභාවයෙන් ම පෙළඹුණේ බුදුන් සරණ යෑම සහ බුදු හිමියන් දෙසූ සත්‍ය වූ දහම සරණ යෑමට ය.

මෙම කරුණු හේතු කොටගෙන අචාර්ය සාඕ හිමිගේ බලපෑම, ඇයට බාල වියේ දී ම නොවෙනස් ව පවතින බව වැටහුණි. උන්වහන්සේගේ සරල වූ ප්‍රායෝගික පිළිවෙත් ඈ ගෞරවයෙන් අගය කළා ය. උන්වහන්සේගේ ශාන්ත සුවිශේෂ තැන්පත් විලාසය, පූජනීය ලීලාව, එමෙන්ම අභිමානවත් පෙනුම ඇයගේ සිත් ගත් ආර්ය චරිත ලක්ෂණ විය. උන්වහන්සේගේ පැවැත්ම, වචන සහ චර්යාව තපායිගේ සිත තුළ නො සෙල්වෙන ගැඹුරු භක්තියක් ඇති කරවී ය. තෙරුන් වහන්සේ දුන් උපදෙස් අනුව, භාවනාව සඳහා තම සිත යොමු කිරීමට ඇය වැඩි වීර්යයක් නො ගත්ත ද, සාඕ හිමියන් අති උතුම් චිත්ත සුවයක් විඳින කෙනෙකු යයි ඇගේ හදවතට දැනුණි. වැඩිකල් නොගොස් සාඕ මහා තෙරුන් වහන්සේගේ පෞරුෂය තුළ ඇති සියුම් බලයකින්, ඇයව අලුත් දිශාවකට අදින බවක් ඉඟියෙන් මෙන් ඇයට වැටහුණි.

අමතක නොවන එක් දිනයක, මෙම ආකර්ෂණය ඇයට අරුම පුදුම ලෙස මනාව අවබෝධ විය. භික්ෂූන් වහන්සේලාගේ පැවැත්ම සඳහා කාන්තාවන්ගේ දන් දීම ගැන, සාඕ හිමියෝ එක් දිනක ප්‍රශංසා මුඛයෙන් අගය කළහ. ඔවුන් දිනපතා ලබාදෙන පිණ්ඩපාත දානය සහ අනෙක් අවශ්‍යතා සොයා බලා සපිරීම භික්ෂූන් වහන්සේලාට මහත්වූ පිළිසරණක් වනවා සේම, එම කුසල් මහත් ඵල මහානිසංස වන බවද පැවසීය. තව ද, ගිහිගෙන් නික්මී, වනගතව සුදු වත් හඳින සිල් මාතාවන්ගේ බ්‍රහ්මචරියා ශීලයේ ආනිශංස, දානානිශංස හා කිසිසේත් සමාන කළ නොහැකි බව දැන් වීය.

මෙම ප්‍රකාශය තපායි ගේ හදවත සසල කරවී ය. සිල් මාතාවෝ සෑම සත්ත්වයකුට ම පින් කෙතක් බඳු යයි ආචාර්ය සාඕ තෙරුන් වහන්සේ වැඩිදුරටත් පැවසූහ. මෙම නිශ්චිත ප්‍රකාශයත් සමඟ ම මහ තෙරුන් වහන්සේ මේ ළාබාල ගැහැනු දරුවාගේ හදවත පතුලේ කුඩා බීජයක් රෝපණය කරන ලදී. එය පසු කාලයක දී, යම් දිනක, දැවැන්ත බෝධි වෘක්ෂයක් වන බීජයක් විය.

භාවනාවේ අගය ගැන
කිසිදු සැකයක් ඇති කර නොගන්න.
එසේම ඔබේ හැකියාවන් ගැන ද
අවතක්සේරු නො කරන්න. ඔබ යම් ප්‍රගතියක් ලබන්නේ ද,
එයින් සෑහීමකට පත් වන්න, ඒ මක් නිසාද,
ඔබ සොයන සත්‍යය එයින් පිළිබිඹු වන බැවිනි.
එනිසා, භාවනාව බලාපොරොත්තු නැඹිය හැකි දෙයකි.

ජීවිත කාලයක ආශීර්වාදය

සාඕ තෙරුන් වහන්සේ බාන් හුආයි සායි ගම්මානය අවට වසර තුනක්, වරෙක කැලෑ කුට්ටියක ද, තවත් වරෙක වෙනත් කැලෑ කුට්ටියක ද සැරිසරමින් වාසය කළහ. උන් වහන්සේ බාම් චා ඊ දිස්ත්‍රික්කය අත හැර, උතුරු ප්‍රදේශයේ චාරිකා සඳහා වඩින කාලය වන විට, ප්‍රදේශයේ ආගමික මුහුණුවර බොහෝ සේ යහපත් අතට පෙරළී තිබුණි. ප්‍රදේශවාසීන් හට සාඕ හිමියන් කොතරම් බල පෑමක් කළේ ද කියතොත්, මේ වන විට බොහෝ දෙනා මළවුන් වන්දනා අත හැර බෞද්ධ ප්‍රතිපත්තීන් වැළඳ ඊට ගරු කිරීමට කැමැත්ත දැක්වූහ.

සාඕ හිමියන් ප්‍රදේශයේ විවිධ ස්ථානයන් කරා වඩිද්දී, තපායිගේ පියා ද උන්වහන්සේ සමඟ යමින්, හුදකලා වූ භාවනාවට සුදුසු තැන් පෙන්වා දුන්නේ ය. අවශ්‍ය වූ විට භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය කුඩා උණ බම්බු කුටි තම යහඳුවන් සමග එකතු වී සාදා දුණි. ප්‍රජාව තුළ බෞද්ධ පුනර්ජීවනයක් ඇතිවීම ගැන ඔහු ද අන් අය වාගේ ම සතුටු වූයේ ය. සාඕ හිමියන් ප්‍රදේශය අත හැර යෑම ගැන තපායිගේ පියා ශෝක වූ නමුත්, පූ තායි ගම්වාසීන්ගේ සිත්සතන්හි බුදුදහම තදින් කා වැදුණු බැව් දැන, සැනසීමට පත් විය. පූජ්‍ය සාඕ හිමියන් ගම අත හැර යෑමත් සමඟ ම, එවකට කාගේත් අතිපූජනීය ගෞරව ප්‍රණාමයට පත් බෞද්ධ ආචාර්යයන් වහන්සේ නමක් මෙම පෙදෙසට පැමිණේ යයි ඔහු කිසි විටක නො සිතුවේ ය.

අතිපූජ්‍ය ආචාර්ය මුන් භූරිදත්ත හිමිපාණෝ විශේෂිත පුරාවෘත්තයක් ගොඩ නගති. උන්වහන්සේගේ ජීවිත කතාව සහ සාක්ෂාත් කළ ආධ්‍යාත්මික දියුණුව මෑත කාලයේ තායිලන්ත ඉතිහාසයට නොදෙවැනි වූ පූජනීය තත්ත්වයක් ලබාදෙනු ඇත. මේ වන විටත් උන්වහන්සේ ගේ විශ්වසනීය කීර්ති නාමය කටින් කට පැතිරී, ඊසාන දිග ප්‍රාන්තයන් පුරා පැතිරී ගොස් තිබුණි. ගම්භීර වූ සද්ධර්මය සවිස්තරව අර්ථ දක්වද්දී, එම දේශනා මොන තරම් බලයකින් හා විශ්වාසනීය අන්දමකින් කළාද කියතොත්, උන්වහන්සේ ඉදිරියේ අමනුෂ්‍යයෝ පවා මෙල්ල වූහ. දේව, නාග, ගරුඬ සහ අසුර ආදීන් උන් වහන්සේගේ මෙත් කරුණා කිරණවලින් ඇද බැඳ අවනත කර ගති. උන් වහන්සේගේ අල්පේච්ඡ රටාව කාගේත් පැසසුමට භාජනය විය. මෑත ඉතිහාසයේ ධුතාංගධාරී භික්ෂූන් හැඩ ගැස්වීමේ මුල් කම්මට්ඨානාචාර්යවරයෙක් වශයෙන් මුන් මහ තෙරුන් වහන්සේ ප්‍රසිද්ධ විය. ආචාර්ය මුන් මහ තෙරුන් වහන්සේගේ අනුගාමික ශිෂ්‍ය භික්ෂූන් සහ උපාසක උපාසිකාවන් උන් වහන්සේගේ ධර්ම සේනාංකය විය. ඒ සැවොම දැඩි විනයකින් යුතුව පරිපූර්ණ රණවිරුවන් කරවීම සඳහා උන්වහන්සේ මග පෙන්වන ලදී. ආචාර්ය මුන් හිමි එක් වරක් මුණ ගැසුණ හොත්, භාග්‍ය සම්පන්න අනාගතයකට ආශීර්වාද ලැබෙනු ඇතැයි මිනිසුන් අතර විශ්වාසයක් ගොඩ නැගී තිබුණි. ධුතාංගධාරී නියම චාරිකා භික්ෂුවක් වශයෙන් මුන් මහ තෙරුන් වහන්සේ බොහෝ විට වස්සාන කාලයේ එක් ස්ථානයක එක් වරකට වඩා වැඩි වාර ගණනක් නො සිටියහ. වැසි සමය නිම වූ පසු උන් වහන්සේ තම ගෝල පිරිසත් සමඟ සුළඟ හමන දිසාවට, සිත්සේ පාවීයන කුරුල්ලන් සේ ඉතා සැහැල්ලුවෙන් ඊසාන දිග වනාන්තරයන්හි නිදහසේ හැසුරුණේය. ඉහළ අහසේ පාවෙමින්, පියාසර කරන කුරුල්ලෝ සතුටු පරිදි ගසක් මත හෝ, පොකුණක් ළඟ හෝ මඩ වගුරක් සමීපයේ හෝ සිතැඟි පරිදි පියඹා අවුත් වසති. එතැනින් නැවත පියඹා යද්දී කිසිදු බරක්, බැඳීමක්, ළතැවීමක් නොමැති ව සියල්ල අතහැර ඉගිලී යති. ධුතාංගධාරී භික්ෂූන් සියල්ල අතහැර උතුම් ජීවිත ගෙන යන්නේ ද මෙලෙසිනි.

1917 වසරේ, මෝසම් සමය ළංවෙද්දී ආචාර්ය මුන් තෙරුන් වහන්සේ, තවත් සැට නමක් සමඟ උතුරු දෙසින් විහිදුණු කැලෑබද කඳු පාමුල දක්වා බැස, බාන් හුආයි සායි ගම්මානය පෙනෙන තෙක් මානයට පැමිණියහ. ඔවුහු ගස් යට, ගල් ලෙන් සහ ගුහාවල එමෙන් ම සුසාන භූමිවල ලැගුම් ගත්හ. බාන් හුආයි සායි ගම්මානයට ළඟාවීම සඳහා ආචාර්ය හිමි වෙනුවෙන් කැලෑව

ශ්‍රද්ධ කොට සෑදූ අඩි පාර ඔස්සේ, උන්වහන්සේ වඩින දර්ශනය දුටු ගම්වාසීහු ශ්‍රද්ධාවෙන් කුල්මත් වූහ. බාන් හුආයි සායි ගම්වාසීහු සියල්ලෝ ම මෙම ධම්ම ගවේශී භික්ෂූන් වහන්සේලා මහත් වූ ශ්‍රද්ධා භක්තියෙන් පිළිගත්හ.

ආචාර්ය මුන් ස්ථවිරයන් වහන්සේ සහ ශ්‍රාවක පිරිස ඔවුනට හමුවූ නව පරිසරය තුළ ධුතාංග සම්ප්‍රදායයන් අනුව, සරල දිවියක් ගෙවමින් භාවනා කටයුතු ආරම්භ කළහ. බොහෝ ගම්වාසීහු සතර පොහොය දිනයන්හි, මෙම කඳු පාමුල ඉදි වූ ආරණ්‍යයට එක් රොක් වූහ. තපායිගේ දෙමාපියෝ ද, එම ගම්වාසීන්ට අනිවාර්යයෙන් එකතු වූහ. මේ වන විට ආචාර්ය මුන් හිමිගේ ගෞරවනීය කීර්තිය ඇය දැන සිටියේ නැත. ආචාර්ය සාඕ හිමි ගැන කතා කරද්දී, එම නම ද කියැවෙනවා පමණක් ඇය අසා තිබුණි. උන්වහන්සේලා දෙනම එකිනෙකාට උදව් කර ගනිමින්, උනන්දු කර ගනිමින් භාවනා පුහුණුවෙහි නිරත වූ කළ්‍යාණ මිතුරන් දෙදෙනෙකි. තපායි දැන සිටියේ එපමණකි. වරින් වර තම දෙමාපියන් සමග ගිය ගමන්වල දී, ආචාර්ය මුන් හිමි සහ ආචාර්ය සාඕ හිමි අතර තිබූ වෙනස්කම් ඇය දුටුවා ය. ආචාර්ය මුන් හිමිගේ වේගවත් ක්‍රියාශීලී ප්‍රබල චරිතයත්, ආචාර්ය සාඕ හිමිගේ තැන්පත් ශාන්ත ස්වභාවයත් ඇයට එක් වර ම වැටහිණි. මුන් තෙරුන් වහන්සේ සාඕ හිමිට වඩා උසින් අඩු, කෙසඟ ශරීරයකින් යුක්ත වූ නමුත් කතා කරද්දී, දෙඅත් විසි කරමින් අර්ථය පැහැදිලි කිරීමට දැත් හසුරුවමින් දෙදරවන කට හඬකින් කතා කළහ.

ආචාර්ය මුන් තෙරුන් වහන්සේ ගැන මුල දී තපායි බිය වූවා ය. උන්වහන්සේගේ තියුණු විලාසය ඇයට චකිතයක් ගෙන දුණි. ගමට පිණ්ඩපාතය සඳහා වැඩි සෑම අවස්ථාවක දී ම, උන් වහන්සේගේ පාත්තරයට ඇය ආහාර තැන්පත් කරද්දී, මුන් ස්ථවිරයෝ මඳක් නැවතී ඇයට කතා කොට, ආරණ්‍යයට අවුත් උන්වහන්සේ හමුවන ලෙසට අවවාද කළහ. ආචාර්යයන් වහන්සේ ඉදිරියේ ලජ්ජාවෙන් හා බියගුලුකමින් මිරිකුණු ඇය, විශේෂිත ආගමික දිනයන්හි දී පමණක්, ඇගේ දෙමාපියන් හා ගම්වාසීන් එකතුව හැදුණු කණ්ඩායමක් සමග ආරණ්‍යයට ගියා ය. ආචාර්ය මුන් ඇයට විශේෂ සැලකිල්ලක් දැක්වී ය. පොහොය දිනයන්හි දී ඇගේ පැමිණීම ගැන සතුට ප්‍රකාශ කොට, වචනයක් දෙකක් ඇය හා කතා කළේ ය. ඇයට අසාමාන්‍ය ආධ්‍යාත්මික කුසලතා ඇති බවත්, දැඩි කැපවීමක් ඇති චරිතයක් බවත්, තම ප්‍රතිභා ඥානයෙන් දැනගත් උන්වහන්සේ, ඇයව භාවනා කිරීමට උනන්දු කළහ. ආචාර්ය සාඕ ඉගැන් වූ

මූලික ක්‍රම වේදය ම උන් වහන්සේ ද ඇයට ඉගැන්වී ය. එනම්, නිශ්ශබ්දව භාවනා වදන, "බුද්ධෝ" යන්න නො කඩවා නිහඬව කීමයි. ඇයගේ දැනීමේ එකම අරමුණ මෙම බුද්ධෝ යන වචනය බව තදින් ම සිතට අවබෝධ වනතුරු දිගින් දිගට ම පුහුණු කළ යුතු බැව් පැවසුවේය. සිහිය මෙම අරමුණෙහි පවත්වා ගැනීම ගැන අවධාරණය කළේ ය.

"බුද් - ධෝ බුද් - ධෝ" යන මාත්‍රා නො කඩවා කියමින්, මොහොතින් මොහොත එහි ම සිහිය පිහිටුවා ගනිමින් සිටීමට වීර්ය ගත යුතු බැව් අවධාරණය කළේ ය. මෙසේ පුන පුනා කියද්දී, එක් එක් අවස්ථාවේ නැගීම බැසීම ගැන සුපරීක්ෂාකාරී ව අවධානයෙන් සිටීමට හැකි වන බව ද පැවසී ය. මෙය ඉතා සරල ක්‍රමය කැයි ඇය සිතුවා ය. ජන්මයෙන් ම ඇයට හිමිව තිබූ ලජ්ජා භය නිසා මුල දී මේ අවවාද පිළිගැනීමට ඇය අදි මදි කළාය.

ආචාර්ය මුන් තෙරණුවෝ නොයෙක් වර ඇයට භාවනා කිරීමට මහන්සි ගන්නා ලෙසට බල කළහ. තපායි, ඇය තුළ සහජ හැකියාවක් තිබීමට පුලුවනැයි සැක කිරීමට පටන් ගත්තා ය. ඇය මෙසේ සිතුවා ය.

"මම ගමක ඉපදුණ සාමාන්‍ය කෙල්ලක්. ඒ වුනාට මට උප්පත්තියෙන් යම් කුසලතාවයන් තියෙන්න පුළුවන්. එහෙම නැතිනම්, උන්වහන්සේ මා ගැන මෙච්චර උනන්දුවක් පෙන්වන්නේ ඇයි? මම අද පටන්, උන්වහන්සේ මට අනුකම්පාවෙන් දුන්නු උපදෙස් අනුව භාවනා පුහුණුව පටන් ගන්න ඕනැ"

එක් සැන්දෑවක, රාත්‍රී කෑමෙන් පසු, ඇඟපත සෝදා පිරිසිදු වී, වේලාසනින් ම ඇය තම නිදන කාමරයට ගියා ය. එදින මුළු දවස පුරාම, ඇගේ හදවත තුළින් අමුතුම සැනසිලිදායක අධිෂ්ඨානයක් මතු වෙවී එන බවක් ඇයට වැටහුණි. ආචාර්ය මුන් හිමි දුන් උපදෙස් පරිදි, "බුද්ධෝ" යන්න වෙත තම සිත සම්පූර්ණයෙන් ම යොමු කොට, නො නවත්වා කීමට ආරම්භ කරන දිනය අද බව ඇයට සිතුණි. අතිමහත් භක්තියකින් ද, මෙය ඇයට අත්‍යවශ්‍ය දෙයක් හෙයින් ද, කැපවීමෙන් කළයුතු දෙයක් යයි සිතා, භාවනායෝගී ව හිඳ, "බුද්ධෝ" යන පදය නො නවත්වා ම සජ්ඣායනා කිරීමට පටන් ගත්තා ය. මිනිත්තු පහළොවක් පමණ අඛණ්ඩ ව සුපරීක්ෂාකාරී ව එසේ සංගායනා කළ පසු හදිසියේ ම, ඇගේ සවිඤ්ඤාණක මනස හදවත පතුලට වැටී, ගැඹුරු වූ නිසලතාවයකට එක් වුණි. මේ සිදුවීම, හදිසියේ ළිං

පතුළකට වැටී, ඇගේ කයත් සිතත් නිශ්චල තැනක නැති වූවා සේ ඇයට දැනුණි. මෙම නවතම අත් දැකීම කොතරම් අපූර්ව දැයි කියතොත් ඇයට කුමක් වූවා දැයි ඇයට ම වටහා ගැනීමට නොහැකි විය. ටික වේලාවකට පසු, ඇගේ මනස ගැඹුරු සමාධියෙන් යන්තමින් ඈත් වී, ඇගේ මියගිය සිරුර, ඇය ඉදිරියේ හොවා තිබෙන දර්ශනයක් ඇයට දිස් විය. එය ප්‍රියජනක දසුනක් නො වී ය. ඈ ඇයගේ මළ සිරුර නිවැරදි ව හඳුනා ගත්තී ය. ඇගේ ම මළසිරුරෙහි සියුම් කොටස් පවා කොතරම් පැහැදිලි ව ඇයට පෙනුණේ ද කියතොත්, ඇත්තෙන් ම මැරී ඇති බවක් ඇයට වැටහුණි. හදිසියේ ඇගේ මනසට තවත් සිතිවිල්ලක් නැගී අවුත්, ඇගේ සන්සුන්භාවය දෙදරවා, අසහනයට පත් කළේ ය. එනම්,

"දැන් මම මැරුණ නිසා කව්ද මං වෙනුවට ගෙදර කෑම උයන්නෙ? කව්ද හෙට පිණ්ඩපාත වඩින භාමුදුරුවරුන්ගේ පාත්තරවලට ආහාර බෙදන්නෙ? අද රාත්‍රියේ භාවනා කරමින් සිටිද්දී මම මැරුණ බව ආචාර්ය මුන් හිමියන්ට කව්ද කියන්නේ ?"

මෙම අසහනකාරී සිතිවිලි වහාම මර්දනය කරගෙන, සිත මෙල්ල කර ගනිමින් ඇය මෙසේ ද කල්පනා කළා ය.

"මම මැරුණා නම් මම මැරිලා මේ ලෝකෙ හැම කෙනෙක් ම මැරෙන්න නියමයි. කාටවත් මරණෙන් ගැලවීමක් නැහැ. ප්‍රතාපවත් රජ කෙනෙක් වුවත් මැරෙන්න ඕනෑ."

ටික වේලාවකින් ඇගේ සිත නැවතත් මුණින් වැටී ඇති ඇයගේ මළ සිරුර වෙත ඍජු ව යොමු විය. ඇගේ මළමිණියේ දර්ශනය කිසිදු අයුරකින් දුර්වර්ණ වී හෝ වෙනස් වී හෝ නො තිබුණි. එහෙයින් ඇය සත්‍ය වශයෙන් ම මැරී ඇති බවක් ඇයට වැටහුණි. මරණයේ ඵල විපාක ගැන කිසිදු තීරණයකට නො බැස කල්පනා කරමින් සිටිද්දී, ගමේ වැසියන් කුඩා කණ්ඩායමක් ඇයට දිස් විය. ඔවුන් ඉබේට ම වාගේ හදිසියෙන් මතු විය. කිසිදු හැලහොල්මනක් නැති, ප්‍රාණයක් නැති ඇගේ මළ සිරුර, ඔවුහු ඔසවා ගෙන අසල සුසාන භූමිය වෙත ගෙන ගියහ. සොහොනේ පාලු පැත්තක, හරි මැද, ඔවුහු ඇයගේ මළ සිරුර තැන්පත් කළහ. එවිට ම වාගේ, ආචාර්ය මුන් ස්වාමීන් වහන්සේ තවත් භික්ෂූන් කීප නමක් සමඟ ඇගේ මළ සිරුර දෙසට ගාම්භීර පෙනුමෙන්

එනු ඇය දුටුවා ය. ආචාර්ය මුන් හිමි මළ සිරුර දෙස මොහොතක් බලාසිට, භික්ෂූන් දෙසට හැරී "මේ ගැහැනු ළමයා මැරිලා. මම දැන් ඇගේ අවමඟුල් චාරිත්‍ර ඉටුකරන්නම්." යි පැවසුවේ ය.

භික්ෂූන් වහන්සේලා බිමට හෙළා ගත් ඇස් ඇතිව, ශාන්තව සිටි අතර ආචාර්ය මුන් හිමියෝ සෙමින් අවසන් කටයුතු සඳහා නියමිත ගාථා සජ්ඣායනා කළහ. "අනිච්චා වත සංඛාරා ..... කය සකස් වුණු දෙයකි. කය මැරුණ පසු එම කොටස කිසිදු ප්‍රයෝජනයක් නොමැති තත්ත්වයකට පත් වේ. එනමුත් හදවත මැරෙන්නේ නැත. එය නො කඩවා ක්‍රියා කරයි. එය ධර්මානුකූල ව දියුණු කරගතහොත් එයින් ලබන ප්‍රතිලාභ අසීමිත ය. නමුත් එය හිංසාකාරී ලෙස යෙදවුවහොත්, එය කෙනෙකුට අනතුරු පමුණුවයි."

මෙම සිද්ධාන්තය ආචාර්ය මුන් ස්වාමීන් වහන්සේ ඉතා සන්සුන් ලෙස තුන් වරක් නැවත නැවත ප්‍රකාශ කළහ. සෘජු ව සිටගෙන නො සෙල්වී සිටි උන්වහන්සේගේ අත පමණක් සෙලවුණි. උන්වහන්සේගේ සැරමිටියෙන් මළ සිරුරට තුන් වරක් තට්ටු කළේ ය. එසේ තට්ටු කළ හැම වාරයකදී ම:

"කය පවතින්නේ නැත. ඉපදුණ හෙයින් එය මිය යා යුතුය. කෙසේ වෙතත් හදවත නොමැරී පවතී. එය කවර විටක වත් ඉපදෙන්නේ නැත. කය මිය යද්දී, හදවත මිය නො යයි. එය හැම විට ම ක්‍රියාත්මක වේ. හේතු ඵල ධර්මයට අවශ්‍ය කරුණු හසුරුවන අයුරින්, භ්‍රමණය වෙවී තැනින් තැන දුවයි" යනුවෙන් පැවසුවේය.

තම සැරයටියේ අගින් රිද්මයකට අනුව මළසිරුරට තට්ටු කරමින්, ආචාර්ය මුන් ස්වාමීන් වහන්සේ මෙම සත්‍යය නැවත නැවත කියන බවක් ඇගේ දසුනට පෙනුණි. සැරයටියෙන් සෙමින් තට්ටු කරන සෑම වාරයක දීම, ඇගේ සිරුර ක්‍රමයෙන් කුණු වීමට පටන් ගත්තේ ය. පළමුව සමේ දියපට්ට මතුවී අවුත් පැලී ගැලවී, සමෙන් වැසී තිබූ මස් තට්ටු පෙනෙන්නට විය.

දෙවනුව තට්ටු කරද්දී, අතිශයින් කුණු වූ මාංශ පේශීන් සහ අස්ථීන් දියවී වැටී ඇතුළත කොටස් හා ඇට කටු දිස්වෙන්නට පටන් ගති. මෝහනයකට පත් වූවා සේ තපායි තම සිරුරේ ඇට කටු පමණක් ඉතිරිවන තුරු, මුලු සිරුර ම ජරාවට යන අයුරු බලා සිටියා ය. ආචාර්ය මුන් හිමි, තම අත, ඇට සැකිල්ල අතරට රිංගවා හදවතේ මදය තම අල්ලට ගෙන මෙසේ ප්‍රකාශ කළේ ය.

"හදවත කිසි දාක විනාශ කිරීමට නො හැක. එය විනාශ වුණි නම් ඔබ නැවත සිහිය නො ලබනු ඇත."

මෙම සම්පූර්ණ දර්ශනය දිග හැරෙන විලාශය, ගෞරවය මුසු බියකින් සහ චකිතයකින් තපායි නැරඹුවා ය. මෙය කෙසේ වටහා ගත යුත්තේ දැයි ඇයට දැනීමක් නො තිබුණි. ආචාර්ය මුන් හිමියන්ගේ කතාව නිම වූ පසු ඇයට මෙය වටහා ගත නොහැකි ප්‍රහේලිකාවක් විය,

"ඇට කටු පමණක් ඉතිරි වී මුළු ශරීරය ම කුණු වී විනාශ වී යන්නේ නම් නැවත සිහිය ලබන්නේ කුමකින් ද?"

තම අතේ මේ වන තෙක් රඳවාගෙන සිටි, හදවතේ මදය දෙස එක එල්ලේ බලාගෙන ම ආචාර්ය මුන් හිමි, ඇගේ විතර්කයට පිළිතුරු දුණි.

"එය ස්ථිර ව ම ආපසු පැමිණේ. සිහිය නැවත ගෙන එන හදවතේ මදය තවමත් පවතිද්දී, ඔබට නැවත සිහිය නො එළඹ සිටින්නේ කෙසේද? හෙට උදේ පාන්දර ඔබ නැවත සිහිය ලබනු ඇත."

ඇගේ මළ සිරුරේ දර්ශනයට සම්පූර්ණයෙන් ම ඇලී ගැලී මුළු රාත්‍රිය ම තපායි පර්යංකයෙන් වාඩි වී භාවනාවේ නිරත වූවා ය. ඇගේ සිත ගැඹුරු සමාධියෙන් ඉවත් වූයේ අරුණලු නැගෙද්දී ය. ඇය ගැන දැනීමක් ඇයට පහළ වෙද්දී, ඇඳේ හිඳගෙන සිටිද්දී ම, ඇය විමතියෙන් ඇගේ ශරීරය දෙස බැලුවා ය. ඇය නො මැරී සිටින බව දැන සැනසුම් සුසුමක් හෙළුවා ය. ප්‍රකෘති ලෙස අවදි වූවාට පසු, ඇය නො මැරුණු බව දැනගත් හෙයින්, ඇයට තරමක සතුටක් ඇති විය. එනමුත් රාත්‍රි කාලයේ දුටු සිහින ගැන සිතා බලද්දී, ඈ නින්දට යෑම පිළිබඳවත් භාවනා නො කර නින්දෙන් සිහින දකිමින් සිටීම ගැනත් ඇය ඇයට ම දොස් පවරා ගත්තා ය. ආචාර්ය මුන් ඈ ගැන කළකිරීමට පත්වනු ඇතැයි ඇය විශ්වාස කළා ය.

ආචාර්ය මුන් ස්වාමීන් වහන්සේ එදින උදේ පිණ්ඩපාතය සඳහා ඇගේ නිවස ද පසු කරමින් වැඩියහ. උන්වහන්සේගේ පාත්තරයට ඇය එදින ආහාර පිළිගන්වද්දී ඈ දෙස කුතුහලයෙන් මෙන් බලා සිනාසී, උදේ කෑමෙන් පසු උන්වහන්සේ හමුවීමට පැමිණෙන ලෙස දැන්වී ය. ඒ අනුව, ඇගේ පියා තපායි ද කැටුව සුපුරුදු අඩි පාර දිගේ මුන් මහ තෙරුන් සිටි තාවකාලික ආරාමයට

ගියේ ය. ඇයට කුමක් නිසා ඒමට දැන්වූයේ දැයි ඔහු දැන නො සිටියේ ය. ප්‍රශ්නය කුමක් විය හැකි ද? භාවනා කාලයේ දී නින්ද යෑම නිසා, තපායි ලජ්ජාවෙන් නිහඬව පියා පසුපස ගමන් කළා ය. ඇය ලොකු හාමුදුරුවන්ට මොනවා කියන්නද? ඇත්තෙන් ම උන් වහන්සේ ඇය ගැන අසතුටට පත් වේ යයි ඇයට සිතුණි. වරෙක, ඇයට සැඟවෙන්නට සිතුණි. නමුත් සැඟවෙන්නේ කොතැනක ද, කෙසේ ද කියා වැටහීමක් ඇයට නො තිබුණි. ආරණ්‍යයේ කුටි සංකීර්ණය වෙත ඇතුලු වූ විගස ම, ඇය මොනවාදෝ තම පියාට මුමුණා කියා, වතුර ගෙන ඒම සඳහා ඇළට ගොස් සිටි කාන්තාවන්ට උදව් දීම සඳහා දිව ගියා ය. තනිවම එන තෙසොන් දුටු ආචාර්ය මුන් පුදුම වී තපායි ගැන විමසුවේ ය. එවිට තෙසොන් කලබල වී, දිය ඇළ අසල සිටි තපායි සොයාගෙන විත් හිමි ඉදිරියට පැමුණුවේ ය.

භයෙන් තැති ගත් තපායි ආචාර්ය මුන් තෙරුන් සිටි තැනට දණ ගා ගොස් තුන් වරක් වැඳ වැටුණා ය. එවිට ම, ඇයට හුස්මක් වත් ගන්නට ඉඩ නොදී ඇගෙන්, "කොහොමද ඊයේ රාත්‍රි කාලයේ ඔබේ භාවනාව ?" යි විමසුවේ ය.

"කිසි වැඩක් නැහැ ස්වාමීනි, මිනිත්තු පහළොවක් විතර "බුද්ධෝ" කියන වචනය කිය කියා හිටියාට පස්සේ මට තේරුණා මගේ හිත ගැඹුරු ළිඳකට වැටුණා වාගේ. ඊට පස්සෙ මට නින්ද ගියා. මුළු රාත්‍රියේ ම මම සිහින බැලුවා. උදේ පාන්දර ඇහැරුණාට පස්සෙ, මට මගේ භාවනාව එපා වුණා. තාමත් මගේ හිත කඩා වැටිලා. මම උත්සාහ ගන්නේ නැහැ කියලා, ඔබ වහන්සේ මට බනියි කියලා, මම භය වුණා." යනුවෙන් බයාදු හඬකින් ලජ්ජාවෙන් ඇඹරී ඇඹරී පිළිතුරු දුන්නා ය.

ඇයට සවන් දුන් ආචාර්ය මුන් හිමි, හඬනගා සිනාසී, "ඔබ කොහොමද නිදා ගත්තෙ? කරුණාකරලා මට කියන්නකෝ." යි සෘජු ව ම ඇගෙන් ඉල්ලා සිටියේ ය.

ඇය සිදුවූ සියල්ල පැවසූ පසු උන් වහන්සේ මහ හඬින් සිනාසුණහ. ඇගේ කතාවෙන් අතිශයෙන් සතුටු වූ ආචාර්ය මුන් හිමියෝ මෙසේ පැවසූහ.

"ඒ නින්දක් නොවෙයි. ඔබ සිහින දැක්කත් නොවෙයි. ඔබ අත් දුටුවේ සමාධිය කියා හඳුන්වන එක් තැනකට පැමිණි සිතේ ශාන්ත තත්ත්වය යි. මේක

හොඳින් මතක තියා ගන්න. ඔබ සිහිනයක් යයි සිතුවේ, ඒකාග්‍රතාවයකට පැමිණි ගැඹුරු සමාධියේ ක්ෂණික ව පැන නගින දර්ශනයක්. මේ වාගේ අත් දැකීම් මතුවටත් ඇතිවුණොත් කලබල වෙන්නෙ නැතුව, ඒවා ඇතිවෙන්න ඉඩ හරින්න. ඒවා ගැන භය වෙන්නවත් කනස්සල්ලට පත් වෙන්නවත් අවශ්‍ය නැහැ. ඔබට භය වෙන්න දෙයක් නැහැ. නමුත් හොඳ කල්පනාවෙන්, භාවනා කරන අවස්ථාවේ මොනවා සිදුවුණත්, ඒ ගැන හොඳ සිහියෙන් අවධානයෙන් ඉන්න. මම මෙතැන ජීවත් ව ඉන්නා කල් ඔබට අනතුරක් වෙන්නෙ නැහැ. හැබැයි දැන් ඉඳලා භාවනා කරන කොට ඔබ දකින සියලු දර්ශන ගැන විස්තර, කරුණාකරලා මට ඇවිත් කියන්න."

ගොවියෙකු ඔහුගේ කුඹුර වගා කරනවා සේම
ඔබ ඔබේ මනස ද වගා කරන්න.
ක්‍රමක්‍රමයෙන් පොළොව ශුද්ධ කරන්න.
පස සකස් කරන්න. ලියදි බඳින්න.
බීජ වපුරන්න. පොහොර යොදන්න.
ගොයම් පැළවලට වතුර බඳින්න.
වල් පැළෑටි උගුලන්න. අවසානයේ, ඔබ රන්වන් ඇස්වැන්නක් නෙළා ගන්නවා ඇත.

මල්බෙරි වදුල

වෙහෙස වී වැඩපළ කරමින් තපායි හැදී වැඩී තම නව යොවුන් කාලය ගත කළා ය. ඇය ස්වභාවයෙන් ම ධෛර්ය සම්පන්න ශක්තිමත් ගැහැනියකි. කිසිවකුගේ බල පෑමක් හෝ උනන්දු කිරීමක් හෝ නොමැති ව ඇය කළයුතු වැඩ සොයා බලා ආරම්භ කොට නිම කළා ය. එක් වසරක අස්වැන්න නෙළා, වී ආරක්ෂිත ව ගබඩා කළ පසු ඇය ඉතා උනන්දුවෙන් මල්බෙරි වගාවක් ආරම්භ කළා ය.

පූ තායි ගම්මානයේ වැසියෝ පටපණුවන් වර්ධනය කිරීමේ විශේෂඥයෝ වූහ. ඔවුහු පට පණුවන්ගේ පිලා කෝෂයන්ගෙන් ලබාගන්නා අමු පට නූල්වලින් නූල් සකසා රෙදි විවීම සඳහා ප්‍රයෝජනයට ගති. මල්බෙරි කොළ, පටපණුවාගේ ප්‍රධාන ආහාරය වේ. මල්බෙරි ගසේ ගෙඩි ඉදුණු පසු, ඒවායේ කොළ කපා, පළල් ව සහ කොටට සෑදූ කුඩවල පටපණුවන් රාශියක් සමඟ අතුරයි. මල්බෙරි වගාව ආදායම් ලැබිය හැකි මාර්ගයක් බැව් ද, එය අමතර ජීවනෝපායක් බව ද ඇය දැන සිටියා ය.

පටපණු වගාව ගැන, ඇය විස්තර දැනගත්තේ ඇයගේ කුඩම්මාගෙනි. ඇයට දැන් අවශ්‍ය වූයේ ඇයගේ ම ස්වාධීන වූ මල්බෙරි කොළ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමයි. තපායි තම පවුලේ කුඹුරු සීමාවට යාබද වනයේ, විශාල කඳු

ගැටයක් ආසන්න බිම් කොටසක් මෙම මල්බෙරි වගාවට සුදුසු බව දැක, ඉතා උනන්දුවෙන් එම ඉඩම එළි පෙහෙළි කළා ය. ඉතාමත් උත්සාහයකින් සහ කැපවීමකින්, ඇය ගස් කොළන් කපා ශුද්ධ කොට පොළොව වගාවට සුදුසු පරිදි සකස් කළා ය. එසේ සකස් කළ භූමියෙහි ඇය මල්බෙරි පැල රෝපණය කළා ය. ඉඩම අවට තිබූ විශාල ගස්, තද අවුවෙන් පැළ ආරක්ෂා කළේ ය. තපායි, මල්බෙරි පැළ මුල් අල්ලන තුරු වගාව රැක බලා ගත්තා ය. මල්බෙරි වගාවේ ගස් මේරූ පසු, පටපණුවන් බෝ කිරීමට ඈ සැලසුම් කළා ය.

වැඩි දවසක් යෑමට කලින්, ආචාර්ය මුන් තෙරුන් වහන්සේ, ළඟ එන වස් කාලයේ වස් විසීම සඳහා සුදුසු තැනක් සොයන බව, තපායි ගම්වාසීන් ගෙන් දැන ගත්තා ය. උන් වහන්සේට අවශ්‍ය ව තිබුණේ, පළල් වූ උස් භූමියක, ඝනව වැඩුණු ගස් කොළන් නොමැති, හිරු එළිය වැටෙන පෙදෙසකි. දීර්ඝ වූ මෝසම් සුළං සහිත වැසි කාලයේ පොළොවේ තෙතමනය, වැඩි කාලයක් රඳා පවතින හෙයින් හිරු එළිය වැටෙන කොටසක් සුදුසු බව, උන් වහන්සේ පැහැදිලි කර ඇත. එය කණ වැටුණු තපායි හට ක්ෂණිකව සිතට නැඟුණේ, ඇයගේ මල්බෙරි වගා භූමිය ඊට සුදුසු ඉඩමක් බවයි. එය, කුඹුරු යායට ඉහළින් පිහිටි කඳු ගැටයකට යාබදව පිහිටි ඉඩමකි. වැහි වතුර පහසුවෙන් පහළට ගලා යන ඉඩමකි. කුඹුරු හරහා හමන සුළඟ, තෙතමනය වේලා සුවදායක සිසිලක් ඇති කරවයි. මල්බෙරි වගාව සඳහා එළිකළ ඉඩම, භික්ෂූන් හට අවශ්‍ය කුටි සෑදීමට සුදුසු බවත්, හුදකලාව විසීමට අවට විශාල ගස් ප්‍රයෝජන වනු ඇති බවත් ඇයට වැටහුණි.

තම පියා සහ සහෝදරයන් සමග මේ ගැන සාකච්ඡා කළ තපායි, තම ඉඩමේ සුදුසු නුසුදුසු භාවය සොයා බැලීමට වඩින ලෙස ආචාර්ය මුන් ස්වාමීන් වහන්සේට ආරාධනා කළා ය. ඉඩම සහ අවට පරිසරය ගැන උන් වහන්සේ සතුට පල කරද්දී, ඇය ප්‍රීතියෙන් මඳ සිනහ පා, මෙම ඉඩම උන් වහන්සේට පූජා කරන බවත්, ඇයට අනුකම්පාවෙන් මෙම ඉඩම භාර ගෙන එහි වස් වසන ලෙසටත් ආරාධනා කිරීමට සූදානම් වූවා ය. නමුත් ඇය ඒ බව කීමට කට ඇරීමට ප්‍රථම, උන් වහන්සේ මල්බෙරි වගාවේ ඒ වන විට රැස්ව සිටි ගම්වාසීන්ට ඇසෙන සේ, ළඟ එන වස් සමයේ කුඩා ආරණ්‍යයක් ඉදි කිරීමට මෙම ඉඩම ඉතාම සුදුසු බව ශබ්ද නගා පැවසී ය.

ඇය බිරාන්ත ව බලා සිටියා ය. සියල්ල ඇගේ සිතේ හැටියට ම සිදු වූ හෙයින් ඇයට කතා කිරීමට පවා අමතක විය. ආචාර්ය මුන් තෙරුන් තපායි දෙසට හැරී සමච්චලයට මෙන් සිනාසුණේ ය. ඇගේ හදවතට අනුව මල්බෙරි ගොමුව දැනටමත් උන් වහන්සේට පූජා වී හමාර ය. දෙදෙනාම ඒ බව දනී. ඉතිරිව ඇත්තේ සාම්ප්‍රදායික ලෙස භාර දීමයි. ඇය වහාම උන් වහන්සේ ඉදිරියේ දණ ගසා, තුන් වරක් දෙපා වැඳ, මෙම ඉඩම් කැබැල්ල තම පවුලේ අය කරන පූජාවක් ලෙස සලකන ලෙස බැගෑපත් ව ඉල්ලා සිටියා ය. මුන් තෙරුන් වහන්සේ හිස සලා කැමැත්ත ප්‍රකාශ කොට පින් අනුමෝදන් කළහ. මේ පින හේතු කොටගෙන ඇය මේ ආත්මයේ දුප්පත් නොවන බව ද අනුශාසනාවේ දී කියැවුණි.

ආචාර්ය මුන් හිමිගේ නව අසපුවේ නම "වට් නොං නොං" විය. මෙම නම අසල කුඩා විලක නමකින් උපුටා ගත්තෙකි. තපායිගේ පියා මූලික ව, ගම් වැසියෝ ඉක්මනින් ආරණ්‍යය ඉදි කිරීමේ වැඩ ආරම්භ කළහ. කුඩා ගස් කපමින්, ඉරමින්, උණ බම්බු පළමින්, නායක හිමි ඇතුළු භික්ෂූන් වහන්සේලාට කුටි ඉදි කළහ. වට් නොං නොං ආරණ්‍යයෙහි, ආචාර්ය මුන් හිමි සමග වස් විසීමට අවසර ලැබුණේ දොළොස් නමකට පමණි. කාම් චා ඊ දිස්ත්‍රික්කයේ විසිරී තිබූ එක් එක් ගම්මාන ආශ්‍රිත ව, වස් වැසීම සඳහා භික්ෂූන් කුඩා කණ්ඩායම්වලට බෙදා පිටත් කර හැරියේ ය. ආචාර්ය මුන් හිමි, තම ශිෂ්‍යයන් හිතා මතා ම වට් නොං නොං ආරණ්‍යයට වැඩි දුරත් නොවන, ළඟත් නොවන තැන්වලට පිටත් කර හැරිය ද, ඔවුනගේ ධර්ම ගැටලු විසඳා ගැනීමට උන් වහන්සේ වෙත ඒමට හැකි දුරකින් ඔවුන් රැඳවී ය. බොහෝ දෙනා එක තැන සිටීම භාවනා පුහුණුවට නුසුදුසු හෙයින් මෙම ක්‍රමය වඩාත් ශුභදායක විය.

තණකොළ සෙවිලි කළ කුටි තරමක් කුඩා වුවත් ප්‍රධාන ශාලාව පනස් දෙනකුට හැට දෙනකුට එක වර වාඩි වී සිටීමට හැකි වන සේ ඉදි විය. සතර පොහොය දිනවල මෙම ශාලාවේ ප්‍රාතිමෝක්ෂ ශීලය දේශනා කරන බැවින්, එය ශ්‍රවණය කිරීමට වෙනත් ස්ථානවලින් ද භික්ෂූන් ඒකරාශී වන නිසා තරමක් ලොකු ශාලාවක් අවශ්‍ය විය. එනිසා ගම්වාසීන් ශක්තිමත් ලී කොට කපා ඉරා සකස් කොට බාල්ක, පරාල සඳහා ද, අඩි හතරක් උසින් ඉදිවෙන ගොඩනැගිල්ලේ අත්තිවාරම සඳහා ද පාවිච්චි කළහ. මෙසේ ඔසවා ඉදිකිරීම අවශ්‍ය වූයේ, මහ වැසි නිසා එකතුවන ජලයෙන් ආරක්ෂා වීම සඳහා ය.

වස් සමාදන් වන පළමුවන දිනයේ පැවති ආගමික රැස්වීමට පැමිණි තපායි, ශාලාවේ කොනක වාඩි වී සිටියා ය. උස් අසුනක වාඩිවී සිටි ආචාර්ය මුන් හිමි ගම්වාසීන් ඇමතී ය. ශාලාව පිරී තිබුණ හෙයින්, ඉන් පිටත ද පැදුරු එලා බොහෝ දෙනා වාඩි වී සිටියහ. ආචාර්ය මුන් හිමි මුලින් ම දන් දීමේ ආනිශංස දේශනා කළහ. තපායිගේ හදවත ප්‍රීතියෙන් පිනා ගියේ ය. මෙම ඉඩම ඇය පූජා කළ හෙයින්, අද වැනි දිනකට සහභාගි වීමට හැකි වීම, ඈ ලද භාග්‍යයක් සේ සලකා ඈ සතුටු වූවා ය.

ආත්ම පරිත්‍යාගයෙන් දෙන දානයේ අගය උන් වහන්සේ උස් වූ, දෙදරන හඬකින් වටහා දුන්නේ ය. අන් අයගේ ප්‍රයෝජනය සඳහා, කිසිවක් ආපසු බලාපොරොත්තු නො වෙමින්, නොමිලේ දෙන දානය මහත් ඵල මහානිසංස බැව් පැවසී ය. එම දන් දීමේ හේතුවෙන් ආධ්‍යාත්මික සුවය, තම හදවත තුළ පළමුව ජනිත වන කුසලයයි. දන් දීමට ඇති යහපත් චේතනාව ධෛර්යවත් කරනුයේ, හදවතයි. කුසල් නමැති බීජ වපුරන්නේ හදවත බවත්, අස්වැන්න නෙළා ගන්නේ හදවත බවත් උන්වහන්සේ පැහැදිලි කළහ. දානය අනාගතය සඳහා කරන ආයෝජනයක් බවත්, සුගතගාමී උත්පත්තියකට අඩිතාලමක් බවත් වැඩි දුරටත් පැවසීය.

ඉන්පසු උන් වහන්සේ අර්ථ දැක්වූයේ ශීලයේ ආනිශංසයි. යහපත් මිනිසෙකු වීමේ ශ්‍රද්ධාවෙන් පංචශීලය සමාදන්වීමෙන් ආනිශංස ලැබෙන බව කීවේය. එක් එක් සිල් පදය විශේෂිත විපාක ගෙන දෙයි. සතුන්ට හිංසා කිරීමෙන් වැළකීමෙන්, නිරෝගි සුවය සහ දීර්ඝායු බලාපොරොත්තු විය හැක. අන් සතු දෙයක් සොරකම් කිරීමෙන් වැළකීමෙන්, අපගේ ධනය සහ දේපොල ආරක්ෂා වේ. කාමය වරදවා හැසිරීමෙන් වැළකීමෙන්, අඹුසැමියන් අන්‍යෝන්‍ය විශ්වාසයෙන් ජීවත් වෙමින්, ලජ්ජා භයෙන් තොර තෘප්තිමත් දිවියක් ගෙවීමට හැකි වේ. බොරු කීමෙන් වැළකීමෙන්, අන් අය අප කෙරෙහි හැමකල්හි ම විශ්වාසය තබනු ඇත. අපගේ අවංකත්වයට ගරු කරනු ඇත. රහමෙර පානයෙන් වැළකීමෙන්, අපගේ බුද්ධිය ආරක්ෂා කර ගැනීමට හැකි වේ. ප්‍රබෝධවත් නුවණැත්තෙකු ලෙස සමාජය ඉදිරියේ සිටීමට හැකිවනු ඇත. නුවණැත්තන් පහසුවෙන් මුළා කිරීමට හෝ නොමග යැවීමට නොහැක. ශීලයේ පරිපූර්ණ බව රකින ඇත්තෝ, අන් අය ද උනන්දු කරවති. ශීලය අන්‍යෝන්‍ය විශ්වාසය ගොඩනගන බවත්, සැහැල්ලු දිවි පෙවතක සතුට විඳිය හැකි බවත්

සියලු සත්ත්වයන්ට සහතික වේ. ශීලය ආරක්ෂා කිරීමේ සහ අනුබල දීමේ බලය, ඉහළ තලයන්හි උපත ලැබීමට හේතු වන හෙයින් උසස් ශීලයන් රකින අය මරණින් මතු දිව්‍යලෝකයන්හි උපදින බව ස්ථිර ය.

ශීලයේ ඵල විපාක තේරුම් කරදෙන අතර ම, භාවනාව මහත් ඵල මහානිශංස ගෙනදෙන බව ද ආචාර්ය මුන් වැඩිදුරටත් වටහා දුණි. මුළු විශ්වයේ ම ඇති වටිනාම වස්තුව හදවතයි. එසේම කෙනෙකුගේ භෞතික හා ආධ්‍යාත්මික ශුභසිද්ධිය රඳා පවතින්නේ හදවත මනාව සකස් කරගතහොත් පමණි. කෙනෙකු ජීවත් වන්නේ හදවත නිසා බව උන් වහන්සේ පැවසී ය. ජීවිතයක සෑහීමකට පත් වීම සහ නොවීම යන අවස්ථා දෙකම අත්දකිනුයේ හදවත තුළිනි. කෙනෙකු මැරෙද්දී ඔහු වෙන් වන්නේ හදවත නිසා ය. කෙනෙකු නැවත ඉපදෙන විට, එසේ උපදින්නේ හදවත ප්‍රධාන හේතුව කොටගත් කර්ම ශක්තිය නිසා ය. හැම දෙයකට හේතුව හදවත බැවින් එම හදවත නිවැරදිව පුහුණු කළ යුතු වේ. ඔහුගේ වර්තමාන හැසිරීම සහ අනාගත හැසිරීම ශුභදායක එසේම ප්‍රතිඵලදායක වනුයේ, හදවත නිසියාකාර ව පුහුණු කළහොත් පමණි. හදවත නිසියාකාර ව පුහුණු කළ හැක්කේ භාවනාව තුළිනි. අසංවර සිතිවිලි පාලනය කිරීම සඳහා භාවනාව උපයෝගී කර ගනිමින්, ආධ්‍යාත්මික සන්සිඳීමකට, නිසල භාවයකට අඩිතාලමක් දැමිය හැක.

ඊළඟ මාස තුන තුළ දී ම, තපායි භාවනාව සඳහා දැඩි අධිෂ්ඨානයකින් යුතුව ක්‍රියා කළා ය. ආචාර්ය මුන් තෙරුන් වහන්සේ කෙරෙහි ඇති දැඩි භක්තියත්, භාවනා වැඩි දියුණු කර ගැනීම සඳහා උන්වහන්සේගෙන් ලැබුණු ප්‍රඥාවන්ත අනුශාසනාත් හේතු කොට ඇගේ පුහුණුව ඉක්මණින් දියුණු විය. උත්පත්තියෙන් ම විවිධ දර්ශන දැකීමටත් මානසික සංසිද්ධීන් අත්විඳීමටත් නැඹුරු වී සිටි තපායි, සෑම රාත්‍රියක දී ම සමාධි භාවනාවේ දී, අපූර්ව අද්භූත සිද්ධීන් අත් දුටුවා ය.

උත්පත්තියෙන් ඇය උරුම කර ගත් කුසලතා හඳුනා ගෙන සිටි, ආචාර්ය මුන් හිමි, ඈ ගැන විශේෂ අවධානයක් යොමු කළේ ය. සෑම රාත්‍රියක දී ම, භාවනාවේ යෙදී සිටිමින්, උන් වහන්සේගේ විඤ්ඤාණ ධාරාව, ඈ වෙත යොමු කොට එවකට ඇගේ මනසේ තත්ත්වය විමසා බලන්නේය. එනිසා, ඇගේ භාවනාමය අත්දැකීම් උන්වහන්සේ නිතරම දැන සිටියේක. ඈ භාවනාවේ

නිරතව සිටිය දී, ඈ මුහුණ දෙන විශේෂිත අවස්ථාවක් වුවහොත්, පසු දින උන්වහන්සේ හමුවීමට ආරණ්‍යයට පැමිණෙන ලෙස ඇයට පණිවිඩ යැවී ය.

ආචාර්ය මුන් තෙරණුවෝ සහ සඟ පිරිස, සෑම දිනක ම හිරු නැඟ ටික වේලාවකට පසු පිණ්ඩපාතය සඳහා ගමට වඩිති. ඒ හැම දිනක ම උන්වහන්සේගේ පාත්තරයට ආහාර බෙදීමේ අවස්ථාව ඈ හිමිකර ගත්තී ය. දන් බෙදීම සඳහා ගම් වාසීහු ඔවුනොවුන්ගේ පිළියෙල කර ගත් ආහාර රැගෙන, පෝලිමට සිට ගත්තෝ ය. තපායි ද ඒ අතර සිට ගෙන, ආචාර්ය මුන් හිමි දානය පිළිගනිමින් තමා ළඟට එන තුරු නොඉවසිලිමත් ව සිටියා ය. පිණ්ඩපාතය සඳහා වඩිද්දී, උන් වහන්සේ කෙනෙකු හා කතා කළේ කලාතුරකිනි. නමුත් තපායිගේ භාවනාවේ ප්‍රගතියක් පෙර දින රාත්‍රියේ දැක, ඇය දන් පිළිගන්වද්දී, ආරාමයට අවුත්, දානය වැළඳුවාට පසු උන්වහන්සේ හමුවන ලෙස ඇයට දැන්වූයේ ය. එදින, උදය ගෙවෙද්දී ඇයගේ පවුලේ අය සමග ඇය ආරාමයට ගියා ය. ආචාර්ය මුන් හට ඇගේ අස්වාභාවික අත්දැකීම් කියද්දී, ආරාමයේ අනෙක් භික්ෂූහු ඇයට ඇහුම්කන් දීමට රොක් වූහ. අරූප ලෝක ගැන ඇයගේ කතා සහ ඒවා ගැන ආචාර්යයන් වහන්සේ දෙන උපදෙස් ඇසීමට ඔවුහු උනන්දුවක් දැක්වූහ.

ආචාර්ය මුන් හිමි වහන්සේ ඇයට අනුකම්පාවෙන්, ඇගේ විස්තරාත්මක කතා අසා සිටියේ ය. ඇගේ මනසට උප්පත්තියෙන් ම විවිධ සංසිද්ධීන් හා ඍජු ව, නිර්භීත ව එමෙන් ම වේගයෙන් සම්බන්ධ වීමට හැකියාවක් තිබූ බැව් ආචාර්ය මුන් ස්ථවිරයන් දැන සිටියේ ය. එම හැකියාවන් සාමාන්‍ය අයෙකුට වටහා ගැනීමට අපහසු විය. මෙවන් කරුණු ගැන, ආචාර්ය මුන් ස්ථවිරයන් වහන්සේගේ අති මහත් වූ දැනුම් සම්භාරය සහ අත්දැකීම්, තපායිහට අවශ්‍ය අවවාද දීමට ප්‍රයෝජනවත් විය. වැඩි කල් නො ගොස් ගුරුවරයා සහ ශිෂ්‍යාව අතර දැඩි ආධ්‍යාත්මක බැඳීමක් වර්ධනය විය. තපායි, ආචාර්ය මුන් තෙරුන් වහන්සේ කෙරෙහි දැක්වූයේ මහත් වූ භක්තියකි. උන් වහන්සේගේ කාලය සහ ඇය කෙරෙහි දැක් වූ අවධානය, ඒ අයුරින් ලබා ගැනීමට ඇය වාසනාවන්ත වූවා යයි ඇයට වැටහුණි.

වස්සාන කාලය නිම වෙත් ම, එක් දිනක ආචාර්ය මුන් හිමිගෙන්, ආරණ්‍යයට එන ලෙසට ඇයට පණිවිඩයක් ලැබුණි. ඒ අනුව ඇය උන්වහන්සේ හමුවීමට පැමිණි විට, ධුතාංගධාරී භික්ෂූන් එක් තැනක නොසිට චාරිකාවේ

යෙදෙන බවත්, තව ටික දිනකින් උන්වහන්සේලා ද, එසේ වෙනත් ප්‍රදේශයකට වඩින බවත් දැන්වීය. ආචාර්ය මුන් හිමි, තපායි හට එසේ දන්වා, තම ඇස් බැමි වටකුරු වනසේ ඔසවා, මඳ සිනහවක් පාමින්, ඇයට පෙම්වතෙක් සිටී දැයි විමසුවේ ය. තපායි හිස වනා ලජ්ජාවෙන් එසේ නැති බව හැඟෙව්වා ය. උන්වහන්සේ ද හිස සලා එය පිළිගෙන, ඇයට ගිහිගෙන් නික්මී සුදු වත් හඳින සිල් මාතාවක් ලෙස සසුන්ගත වී, උන් වහන්සේලා සමඟ, ඇය කැමති නම් චාරිකාවේ යෙදිය හැකි බැව්, යෝජනා කළේ ය. නමුත් තම පියාගේ කැමැත්ත පළමුවෙන් ගත යුතු බැව් ද ඇයට දැන්වී ය.

තෙරුන් වහන්සේ කළ යෝජනාවෙන් දරාගත නොහැකි වූ සතුටකින් ඇය ගොළු වූවා ය. ඈ උන් වහන්සේ දෙස විමතියෙන් බලා සිටියා ය. උන් වහන්සේ ද, නිහඬව ඈ දෙස බලා සිටීමින් පිළිතුරක් බලාපොරොත්තු වූවා ය. ගැඹුරු සුසුමක් හෙළීමට වෙර දරමින්, පිළිතුරු දීමට ඊට සුදුසු වචන සොයමින්, ගොත ගසමින්, ඈ සසුන්ගත වී උන් වහන්සේ සමග ධුතාංග චාරිකාවේ යෑමට කැමති නමුත් පියා ඊට කිසිසේත් ඉඩ නො දෙන බව පැවසුවා ය. ඇයට බලාපොරොත්තු ඇතිකරවන සිනහවකින් හිස සැලූ මුන් හිමි ඇය නිවසට පිටත් කර හැරියේ ය.

තපායි ගේ පියා එම යෝජනාව ගැන කිසිදු උනන්දුවක් නො දැක්වූයේ ය. ඔහු ඇයට සසුන්ගත වීමට අවසර නො දුන්නේ ය. යම් හෙයකින් ඔහුගේ දියණිය සුදු සිල් ඇඳුම් හැර දමා, නැවත ගිහි ජීවිතයට පැමිණිය හොත් ඇයට ස්වාමියෙක් සෙවීම අමාරු කාර්යයක් වන බැවින්, ඔහු එයට බිය විය. සාමාන්‍ය ගිහි ජීවිතයේ සිට ආගමික වතාවත්හි නිරත වෙමින්, එම සතුටෙන් සෑහීමකට පත් වන්නැයි ඔහු ඇගෙන් ඉල්ලා සිටියේ ය.

පියාගේ පිළිතුර තමා කලින් දන්නා බව අඟවන සිනහවකින් ආචාර්ය මුන් හිමි, ඇයට ඉවසීමෙන් සිටින ලෙසත්, ඇයගේ නියමිත වෙලාව පැමිණෙන බවත් කියා, ඇයව උනන්දු කළේ ය. ඒ අතර ම උන්වහන්සේ, ගමෙන් පිටව යද්දී දුන් අවවාද ඇය පිළිපැදිය යුතු බවද දැන්වූයේ ය. තමා චාරිකාවේ පිටත්ව ගිය පසු, භාවනා පුහුණුව සම්පූර්ණයෙන් නවතා දැමිය යුතු යයි ආචාර්ය මුන් හිමි ඇයට දැඩි ලෙස අවවාද කළේ ය. දැනට සාමාන්‍ය ජන ජීවිතයේ කටයුතුවල නිරත වන්නැයි වැඩිදුරටත් කී ය. සුදුසු වේලාව පැමිණි පසු ඇයට නැවත භාවනා පුහුණුවට අවස්ථාව එළඹෙනු ඇතැයි පහදා දුන්නේ ය. අනාගතයේ

ඊට සුදුසුකම් ඇති වෙනත් කම්මට්ඨානාචාර්යයන් වහන්සේ නමක් වඩින බවත්, උන් වහන්සේ ඇයව නිවැරදි මාර්ගයට යොමු කරවන බවත් පැවසී ය. එතෙක් ඉවසා සිටින ලෙස අවසාන වශයෙන් කී ය.

තපායිගේ මනස ස්වභාවයෙන් ම අතිධාවන ක්‍රියාශීලී එකක් බැව් ආචාර්ය මුන් හිමි දැන සිටියේ ය. ඇයට ආරක්ෂා සහිත ව සිත පාලනය කර ගනිමින් තනිව ම භාවනා පුහුණුව කරගෙන යෑම උගහට ය. අතර මග යම් අවාසනාවන්ත තත්වයකට ඇය මුහුණ දුනහොත්, ඇයට අවස්ථානුකූල ව අවවාද දීමට උන් වහන්සේ ඈ සමීපයේ නොමැති වීම, ඇයට නරකක් විය හැකි හෙයිනි. ඇය හිතුමනාපේ භාවනා කටයුතු කරගෙන ගියහොත් ඇයව පාලනය කිරීමට දක්ෂ කමටහන් ආචාර්යවරයෙක් අවශ්‍ය වනු ඇත. එසේ නැති වුවහොත් ඇයට වන්නේ විශාල හානියකි. මෙම කරුණු නිසා උන් වහන්සේ පිටව ගිය පසු භාවනා නොකරන හැටියට ඇයට අවවාද දුන්නේ ය.

මෙම දැඩි තහනමට හේතුව තපායි නො දැන සිටිය ද, ආචාර්ය මුන් හිමි කෙරෙහි මහත් ගෞරවයක් දැක්වූවා ය. එනිසා ඇය ඇගේ භාවනා පුහුණුව වහා ම නවතා දැමීය. භාවනාව දිගටම කරගෙන යෑමට ඇයට තදබල ආශාවක් තිබුණ ද, එය නවතා දැමීමෙන් තම පපුව පැළීයා දැයි සැකයක් ද ඈ තුළ ඇති විය.

ඇය භාවනා පුහුණුව නැවත ආරම්භ කරනුයේ වසර විස්සකට පසුව ය.

ඔබේ කය
ඔබේ සිත ඔබේ ජීවිතය - මේ දෑ
ඔබට අයිති නැත.
එනිසා සත්‍ය වූ ප්‍රීතියක් සුවයක්
සැදහා මේ දෑ ගැන
විශ්වාසයක් නො තබන්න.

කෙළවරක් නැති වැඩපළ

ආචාර්ය මුන් හිමි එම ප්‍රදේශයෙන් නික්ම ගිය පසු තපායිගේ ජීවිතය පසුබෑමකට පත්වී නිහඬ හුදකලාවකට පෙරළිණි. හාත්පස පැතිර තිබූ ඇගේ සතුට හා ප්‍රබෝධය, භාවනාව නැවතූ පසු මුලුමනින් ම අතුරුදහන් විය. උත්පත්තියෙන් ම ලජ්ජාශීලි චරිතයක් හිමි තපායි, සමාජ කටයුතුවල නියැළීමට පෙළඹුණේ නැත. ඒ වෙනුවට ඇගේ සම්පූර්ණ කාලය ගේ දොර වැඩපළ සඳහා යෙදෙව්වා ය.

ඇගේ දැත් නිතරම කාර්ය බහුල විය. ඇගේ ශරීරය නිතරම ක්‍රියාශීලී විය. ඈ කපු වගා කළා ය. සුදු පාටින් කපු පිරුණු ගෙඩි, රැගෙන විත්, ඒවා පීරමින් කටිමින්, සන නූල් සාදා බීරළුවල එතුවා ය. පසුව ඇය ඒවායින් රෙදි විවීම ආරම්භ කළා ය. ඈ අවරිය පැළ (ඉන්ඩිගොෆෝරා) සිටුවා ඒවා කපා තලා මිරිකා තද නිල් පාට යුෂ එකතු කොට, වියා නිම කළ රෙදිවලට වර්ණ පෙව්වා ය. රෙදි වියන යන්ත්‍රය ළඟ පැය ගණනක් පට නූල් කෙඳි වෙන් කරමින්, රෙදි විවීමේ නිරත වෙමින් වාඩි වී සිටියා ය. පසුව එම රෙදි ඉතා සූක්ෂම ව කපා සාය හැට්ට මසා දර්ශනීය පාට යොදා හැඩ වැඩ කළා ය. පට පණුවන් බෝ කිරීම මල් බෙරි වගාව ඇය දිගින් දිගට ම කරගෙන ගියා ය. ගම්මානයේ වෙහෙසකර බර වැඩ කිරීමේ දී ඇඳිය හැකි, ඇඳුම් විවීම සඳහා ඇය අමු පට නූල් සකස් කළා ය.

බට පතුරු හා කෙඳිවලින් මලු සෑදීමට ඈ තුළ තිබූ කෘතහස්තභාවය ද ඇය සමාජයට හෙළි කළා ය. උණ බම්බු පතුරු හා බට කෙඳිවලින් කල් පවතින විවිධ මාදිලියේ ගමන් මලු නොයෙක් හැඩ වැඩ දමා සකස් කළා ය. එමෙන් ම සිනිඳු පුළුන් ඔබ්බවා ඈ කොට්ට මෙට්ට ආදිය මසා නිම කළා ය. මීට අමතරව ශීත කාලයට ඇඳිය හැකි ලොමින් කළ ඇඳුම් ද ඈ මැසුවා ය. කලක් ඇඳ, ඉරී දුර්වර්ණ වූ පැරණි ඇඳුම් නැවත සූක්ෂම ව අලුත්වැඩියා කොට සකස් කළා ය. කැලෑවල වැවෙන අනර්ඝ පලා වර්ග ඈ දුටු පමණින් නැතහොත් සුවඳින් හඳුනා ගත්තා ය. ඈ වනාන්තරයේ දවස පුරා ඇවිද කෑමට සුදුසු පලා වර්ග එමෙන් ම ඖෂධ වර්ග තෝරා සොයා ගත්තාය. සවස් වන විට ඈ රැගෙන ගිය කූඩය පුරවා ගෙදර ගෙනාවා ය. එසේ ගෙනා කැලෑ පලා වර්ග සිහින් ලෙස ලියා අල වර්ග සමඟ මාළු හෝ මස් හෝ කෑලි මුසු ව, විවිධාකාරයෙන් උයා සම්පූර්ණ කෑම වේලක් සකස් කිරීමට ඇය දක්ෂ වූවා ය.

තපායිගේ බහුවිධ දක්ෂතා ගැන ආරංචි පැතිරෙත් ම, පූ තායි ගම්මානය දෙස බොහෝ දෙනෙකුගේ අවධානය යොමු විය. තරුණියක් සතු සාම්ප්‍රදායික දක්ෂතා බොහෝ දෙනාගේ ප්‍රශංසාවට ලක් විය. ඔවුහු කුසලතා පරිපූර්ණ මනාලියන් ලෙස අවට ලෝකයා සැලකුහ. ඊට අමතර ව ඇය සුවිශේෂ ලක්ෂණයන්ගෙන් සමන්විත වූවා ය. ශරීර ශක්තිය, විශ්වාසනීය බව, සාම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍රයන් ගරු කොට සුරැකීම, සහ වැඩිහිටියන්ට ඇති ගරුත්වය ඒ විශේෂිත චරිත ලක්ෂණයන්ගෙන් සමහරෙකි.

මෙම ආරංචි පැතිරෙත් ම වැඩි කල් යන්නට මත්තෙන් විවාහ අපේක්ෂකයන් එන්නට පටන් ගත්තේ ය. එයින් එක් තරුණයෙක් ඈ ගැන විශේෂ සැලකිල්ලක් දැක්වූයේ ය. ඔහු යාබද ගමක ඇයට වඩා අවුරුද්දකින් වයසින් අඩු බුන්මා නමැත්තෙකි. ඔහු තපායිගේ දෙමාපියන් මේ ගැන උනන්දු කරවීමට නොයෙක් අයුරින් තැත් කළේ ය. මේ වන විටත් ආචාර්ය මුන් හිමිගේ ගුරුහරුකම් ගැන තදින් ම පැහැදී සිටි ඇය, ප්‍රේම සම්බන්ධතා ගැන හෝ විවාහය ගැන හෝ කිසිදු උනන්දුවක් නො දැක්වී ය. නමුත් ඇයගේ දෙමාපියන් බුන්මාගේ යෝජනාවට කැමැත්ත දුන් පසු, එයට විරෝධය පෑමට ඈ සූදානම් නො වී ය. ඒ වන විට ඊට විරුද්ධ වීමට ද කිසිදු ඉඩ කඩක් නො වී ය. උද්ගත වී ඇති කරුණු දෙස බලද්දී ලෞකික ජීවිතයේ මෙම පැතිකඩ පිළිබඳ, දෙමාපියන් වෙනුවෙන් සැලකිල්ලක් දැක්විය යුතු යයි තපායිට හැඟුණි.

වැහි කාලය ආරම්භ වෙද්දී, දහ හත් හැවිරිදි තපායි, පූ තායි විවාහ චාරිත්‍රානුකූල ව බුන්මා සමඟ විවාහ විය. චාරිත්‍රානුකූල ව ඇය ඇගේ ස්වාමි පුරුෂයාගේ ඥාතීන් සමග පදිංචියට ගියා ය. එම නිවස, තම දෙමාපියනගේ නිවසේ සිට වැඩි දුරක් නොවී ය. ඇය පදිංචියට ගිය එම ඥාති නිවස දැවවලින් සෑදූ තණකොළ මිටිවලින් මුදුන් වහල වැසූ විශාල නිවසකි. මේ නිවසේ ද ඇය පවුලේ බාලයා වූ හෙයින්, නිවෙසේ එදිනෙදා වැඩපළවල වැඩි බර ඇයට උසුලන්නට සිදුවිය.

තපායිගේ කාර්යශූර දැඩි ස්වභාවය කවදත් නොවෙනස් ව පැවතුන හෙයින්, බර වැඩ මග හැරීමට ඇගේ සිත ඉඩ නො දුණි. නමුත් බුන්මා අනික් අය වැඩ කරද්දී නිකරුණේ කතා කර කර සැහැල්ලුවෙන් විනෝදයෙන් කල් ගත කිරීමට ප්‍රිය කළ කෙනෙකි. කුඹුරේ පැළ සිටුවීමට, අස්වැන්න නෙළීමට කුලියට ගැනීම ඔහුගේ සිරිත විය. තම බිරිඳ එක් ලියද්දක වෙහෙසෙමින් වැඩ කරද්දී, අනික් ලියද්දේ වැඩ කරන කෙල්ලන් සමග විනෝද වෙමින්, ආල බස් දොඩමින්, දවස ගත කළේ ය. සමහර විටක ඔවුන් සමග තපායි ගැන රහසේ ඕපා දූප ද කතා කළේ ය. ඇය මේ සැම ඉවසා දරා සිටියා ය. තපායි ඊර්ෂ්‍යාවෙන් එකට එක කරනු ඇතැයි ඔහු බලාපොරොත්තු වන්නට ඇත. නමුත් ඔහුගේ අවිචාරමත් හැසිරීම ගැන කිසිදු වෙනසක් දක්වන්නේ නැතිව, නිහඬව තම වැඩෙහි යෙදුණා ය.

විවාහයෙන් පසු පදිංචියට පැමිණි අලුත් නිවසේ දහසකුත් එකක් වැඩවල නිමක් නැති විය. තරුණ බිරිඳක් හැටියට ආහාර ඉඳුම් හිටුම් ආදී කෙළවරක් නැති වැඩ ඇගේ කරපිට පැවරුණේ ය. ඉරු නැගීමට පෙර ඉටිපන්දම් එළියෙන් දවසේ වැඩපළ ඈ ආරම්භ කරන්නී ය. අඟුරු අසුරා ඇති තැනින් අඟුරු ගෙන දර සමග ලිප ගිනි මොලවා සුළං ගසමින් තද ගින්දර අවුළුවා ගන්නී ය. භාජනයක වතුර උණු කර ඉන් මතුවෙන හුමාලය කේතුවක හැඩයට තැනූ ගොටුවක බහාලූ සහල් අතරට යවා දවසේ බත තම්බා ගන්නී ය. මුලු දවසට ම අවශ්‍ය ආහාර උදෑසන එකවර ඈ පිස ගත්තා ය. ඇයටත් ඇගේ ස්වාමියාටත් තුන් වේලට ම ප්‍රමාණවත් ආහාර පිස ගන්නා අතර තවත් අමුත්තෙකුට හෝ දෙදෙනෙකුට ද අවශ්‍ය ආහාර සූදානම් කර තැබුවා ය.

නිවස පිටුපස සත්ව ගොවිපොළක් ද විය. සතුන්ට අවශ්‍ය කෑම වතුර සකස් කර දීම ද ඇය ඉටු කළ තවත් කාර්යයකි. නිවසට ජලය සපයා ගැනීමද දුෂ්කර කරුණක් විය. ගම්වාසීන් තම නිවෙස්වලට ජලය සපයා ගත්තේ තැනින් තැන ඉදි කළ පොදු ළිංවලින් ය. සියලු ගම් වැසියෝ, එම ළිංවලින් වතුර ඇද භාජන පුරවා කදක බැඳ තම නිවෙස් කරා කරෙන් ගෙන යති. කීප වාරයක් මෙසේ වතුර ගෙන ගොස්, තම නිවෙස්වල තනා ගත් විශාල මැටි භාජනවල අසුරා ගනී. මෙම ජලය, බීමට, පිසීමට, සේදීමට, නෑමට ආදී නිවසේ සෑම අවශ්‍යතාවයකට ම ප්‍රයෝජනයට ගනිති.

ගමේ ජන ජීවිතය ගොවිතැන හා බද්ධ වූවකි. එසේම අස්වැන්න වැස්ස මත රඳා පවතී. වැස්ස වසරේ කාලගුණික විපර්යාසයන් මත රඳා පවතී. වැස්ස ශුභ නිමිත්තක් ලෙස සැලකුහ. වැස්ස නිමිති කොට විවිධ විශ්වාසයන් මත උත්සව ද පවත්වති. කෙසේ වුවත්, වැස්ස ජන ජීවිතයේ බොහෝ කටයුතුවල ආරම්භයයි. ජනයාගේ ශ්‍රම ශක්තිය උරගා බලන්නේ වරුසාවේ ආරම්භයත් සමගිනි. පළමුවන මහ වැස්සෙන් පොළොව තෙමුණු පසු එනම් මැයි මාසය මුල දී ගොවියෝ සී සෑම ආරම්භ කරති. දැවැන්ත මී හරක් ජෝඩුවක් විය ගසකින් සම්බන්ධ කොට ලීයෙන් තැනූ නගුලකින් ඉහළට පහළට කීප වාරයක් ගෙන ගොස් පොළොව සකස් කරති. පොළොව මඩ කිරීම සඳහා ද උන් මෙසේ දක්කමින් ලියදි සකස් කර ගනිති. මීට පෙර කුඩා දිය පාරවල් ප්‍රයෝජනයට ගනිමින් තමන්ට අවශ්‍ය ගොයම් පැළ තවන් කර ගනිති. පැළ සිටවන කාලය පැමිණි විට, හැම කලකට ම රඟ දක්වන නර්තනයකට සූදානම් වන්නා සේ කාන්තාවෝ රටාවකට පේළි සෑදී පැළ සිටුවති. මේ ගෙවිලියෝ පහතට නැමී, පස්සෙන් පස්සට යමින් ගොයම් පැළ සිටුවති.

වැසි සමය තුළදී අවට ගම්මාන පරිසරය අමුතුම සිරියාවක් ගෙන දුණි. ඈතට විහිදී යන කොටු කොටු ලියදි වැහිබර අහස මුළු ප්‍රදේශය ම තෙතමනයෙන් යුතු සුන්දර පරිසරයකට පරිවර්තනය කරයි. පේන තෙක් මානයේ කඳු වැටි අතිවිශාල උණ පඳුරුවලින් ගහණ ය. නො කඩවා හැලෙන හිරි පොද වැස්ස පොළොවේ ස්වභාවය දවසින් දවස වෙනස් කරයි. වතුරෙන් පිරුණු ලියදි පුරා පේළියට සිටවූ ගොයම් පැළ අමුතුම සුන්දරත්වයක් පරිසරයට එක් කරයි. උදය කාලය ශාන්ත ය. තරමක උණුසුමක් ද එක් කළේ ය. සවස් කාලය පටන්

ගනිද්දී ගෙම්බන්ගේ හඬ ද පොකුණු අද්දර කොකුන් ගේ හඬ ද මුළු පරිසරය පුරා ඇසුණි.

එක් එක් වැසි කාලය ඇරඹෙද්දී තපායිගේ සිතට සංකාවක් ඇති විය. අගෝස්තු මාසයේ නිරිත දිග සුළං තුනී වී වැස්ස ටිකෙන් ටික අඩුවෙද්දී ඇගේ හදවතට අමුතුම කනස්සල්ලක් ඇති වේ. සැප්තැම්බර් මාසයේ ගංවතුර ගැලීම තවත් හිත් අමාරුවකි. ගම්මාන හරහා නිවර්තන සුළි සුළඟ හමා තද වැසි හේතුවෙන් තැනින් තැන ජලයෙන් යට වීම තවත් කනස්සල්ලකි. පාරවල් මඩවී සෑදෙන වළ ගොඩැලි මී හරක් සහ කරත්ත යෑමෙන් තවත් අබලන් වේ. මේවා නිසා මිනිසුන්ගේ සහ තිරිසනුන්ගේ දරා ගැනීමේ හැකියාව හීන වේ. මේවා දැකීම ද තපායිට හිසරදයකි. වරෙක ධාරාණිපාත වැසි වසී. වරෙක පොද වැසි වසී. මේ අතරේ ගොයම් පැළ දර්ශනීය ලෙස උසින් වැඩි කොළපාට තණනිල්ලක් සේ දිස් වේ.

ඔක්තෝබර් මස මැද භාගයේ ගොයම් පීදී, රන්වන් කරල්වලින් නැමී මුදු යාය ම සිත් සනසන දර්ශනීය පරිසරයක් මවයි. අස්වැන්න නෙළන කාලයේ දී තපායි ද තම පවුලේ සාමාජිකයන්ට එක් වූවා ය. සියල්ලෝ සමතලා දැකැති රැගෙන ගොයම් මිටි මිටි කපා සමතලා කොටසක ගොයම් ගොඩ ගසති. අව් රශ්මිය ඉවසමින් මෙම ගොවියෝ දින ගණනක් අස්වැන්න නෙළති. ඔක්තෝබර් මස අග භාගයේ දී වී පාගා වේලා සකස් කර ගැනීමට සැලසුම් කරති.

තපායි විවාහයෙන් සම්බන්ධ වූ අළුත් පවුලේ ජීවනෝපාය සඳහා ඇය ද කොටස් කාරියක් විය. කුඹුරු වැඩ සහ ගෙදර දොරේ වැඩපළ ඇය කිසිදු පැකිලීමකින් තොරව ඉටු කළා ය. එමෙන් ම කුඹුරේ වල් නෙළීම, ඇළ වේලි සකස් කිරීම ආදිය ඉටු කිරීමට ඇය මහත් වූ වෙහෙසක් දැරුවා ය. අස්වැන්න නෙළා ගත් පසු බැත ආරක්ෂා කිරීම සඳහා ඇය තම ස්වාමියා සමග කමතේ නිදි වැරී ය. බැත පාගා සුළං කිරීම කාන්තාවන්ට අයත් වූ විශේෂිත කාර්යයකි. එම කාර්යයට ද තපායි අනෙක් කාන්තාවන්ට එක් වූවා ය. එම දිනයන්හි ඇය අන් ස්ත්‍රීන් හා එළිමහනේ ශීතල ඉවසමින් කමතේ නිදාගත්තා ය.

ගෙවිලියෝ වී මිටි දැතින් ගෙන හිසට උඩින් ඔසවා වේගයෙන් පහළට නැමී පොළොවේ ගසා වී ඇට වෙන්කර ගනිති. මෙසේ පැය ගණනක් නැමී

නැමී කාන්තාවෝ මෙම දුෂ්කර කාර්යයේ නිරත වෙති. ඉන් පසු මෙම වී උණ බම්බු පටිවලින් තැනූ විශාල බඳුන්වල බහා හුළං කරති. දෙතුන් දෙනෙක් එක්වී මෙම බඳුන්වල ඇති වී වේගයෙන් අහසට විසිකර නැවත බඳුන පහළින් අල්ලා, පොළා ගනිති. වී පොතු සුළඟට විසි වී පිරිසිදු වී ඇට බඳුනේ ඉතිරි වේ. මෙය ද බොහෝ වේලාවක් කළ යුතු වෙහෙසකර කාර්යයකි. මෙසේ පොළා වේලා ගන්නා වී මී හරක් කරත්තයක පටවා නිවෙස් කරා ගෙන යති. එම වී තම පවුලට අයත් කුඩා ධාන්‍යාගාරවල අසුරති.

මගේ ඉඳුරන් නිරන්තරයෙන් බෝම්බ වරුසාවකට ලක් වෙනවා -
ඇස රූපයන්ගෙන්,
කන ශබ්දවලින්, නාසය ගඳසුවඳින්,
දිව රසයන් ගෙන්, ශරීරය ස්පර්ශයන්ගෙන්,
මේ හැම දෙයක් ගැන ම මම පරීක්ෂා කරනවා.
එසේ කරන විට මාගේ සෑම ඉන්ද්‍රියයක් ම
මට ගුරුවරයෙක් වෙනවා.

පුංචි කායිවි

තපායි මේ කලබලකාරී ලෝකයට අකමැති වූ නමුත් ඇය සියල්ල ඉවසා දරා සිටියා ය. ඇගේ එකම සැනසිල්ල වූයේ ආරණ්‍යයේ ආගමික කටයුතු හා භාවනා පුහුණුවයි. මෙම අසහනයට අමතරව ස්වාමියා ඇගේ නිදහස සීමා කිරීම තවත් බරක් විය. ගැහැනිය සිටිය යුතු සීමාව ඇගේ පවුල සහ නිවස බවත් අවට ලෝකය නොවන බවත් ඔහුගේ අදහස විය. ආධ්‍යාත්මික ලෝකය ගැහැනියකට කිසිසේත් අයත් නොවන බව ඔහුගේ පිළිගැනීම විය. උස් පහත් භේදය, ගැහැනු පිරිමි වෙනස ආදී පැරණි මති මතාන්තර නිසා පූතායි ගම්මානයේ සංස්කෘතිය ද බෙදා වෙන් කෙරුණි. තපායි ද මැදි වී සිටියේ එම ලෝකයට ය. මෙම ආකල්පයන්ට විරුද්ධ නො විය යුතු බවත්, ඒවා ඇය ද ඉදිරියට ගෙන යා යුතු බවත් ඇගේ සිතට කුඩා කල සිට ම කා වද්දා තිබුණි. ඇගේ පෞද්ගලික නිදහසට තපායිගේ ස්වාමියාගෙන් ඉඩ කඩ ලැබුණේ ඉතා ස්වල්පයකි. එසේ තීරණ ගැනීම ඔහුගේ වරප්‍රසාදයයි. මෙය, එකිනෙකා හඳුනා නො ගනිමින් කෙරෙන යෝජිත විවාහයක එක් ප්‍රතිඵලයකි.

ඇය සතර පෝයට ම ආරණ්‍යයට යෑම ඔහු තහනම් කළේ ය. උදේ පිණ්ඩපාතය සඳහා වඩින භික්ෂූන් වහන්සේලාට දානය පිළිගැන්වීමටත්, රාත්‍රි කාලයේ නිවස තුළ පිරිත් කීමටත් පමණක් ඔහු ඇයට අවසර දුණි. ඇය ඔහුගේ

තීරණවලට කීකරු වූවා ය. ඇයට කළ හැකි වෙනත් දෙයක් නො තිබුණි. නිවසේ සහ ගොවිපොළේ වැඩපළ තපායිගේ ආධ්‍යාත්මික අපේක්ෂා වෙනස් කළේ ය. ඇගේ දවස දීර්ඝ වූ වෙහෙසකාරී එකක් විය. නමුත් එම පීඩාකාරී තත්ත්වය මධ්‍යයේ ඇය, ඇගේ සිත තැන්පත් කර ගැනීමට වෙහෙස දැරුවා ය. අවුල් සහිත පටලැවිලි සහිත ජීවිතය මැද තම සිත එකඟ කර ගැනීමට ඇය තනිව ම පුරුදු පුහුණු වූවාය. කෝපය සහ අප්‍රසාදය දනවන සිතිවිලි තම සිත තුළින් නැඟ එද්දී, දැඩි ආයාසයකින් ඒවා පාලනය කර ඇය තම සිත මෙල්ල කර ගත්තා ය. ඇගේ ස්වාමි පුරුෂයා ගැන සිතෙහි අමනාපයක් නැඟ එද්දී, එම හැඟීම් ඇය මෛත්‍රියට කරුණාවට පෙරළා ගත්තා ය. අනුන් ගැන ඊර්ෂ්‍යා සිතිවිලි ඉස්මතු වෙද්දී ඇය ගිහිගෙය හැරදා ගිය සිල් මාතාවක් සේ සිතන්නට පුරුදු වූවා ය. එමෙන් ම, කවදා මුත් දිනයක තමා ගිහිගෙය අතැර දා, සුදු වත අඳින සිල් මාතාවක් වන බවට ආචාර්ය මුන් හිමියන් කී අනාවැකිය, ඈ නිතර සිහි කළා ය. ගැඹුරු ආධ්‍යාත්මික පුහුණුවක අගය ඇය ඇගේ සහජ නුවණින් දැන සිටියා ය. එසේ වුවත්, දැනට, එදිනෙදා ජීවිතය ගෙවෙන අයුරු ගැන ද ඇය සෑහීමකට පත් ව සිටිය යුතු බව ද ඇය වටහා ගත්තා ය.

ගෙදර දොරේ වැඩපළ කිරීමේ යුතුකම ඇය මැනවින් ඉටු කළා ය. ඒවායින් ඇය තෘප්තියක් නො ලද බව ඇගේ යටි සිත දැන සිටියා ය. ඇය ගෙන යන ජීවිතය, ඇය කොටුවී සිටින සීමාවන්, ඇය නිවැරදිව හඳුනා ගත්තා ය. එම සීමා ඉතා කුඩා ඒවා විය. ඇගේ විවාහය එම සීමාවන් තවත් කුඩා කළේ ය. ඇය දුටු සියල්ල, ඇසූ සියල්ල සහ ඇය විඳි සියල්ල ඇයගේ සිතට කිසිදු සැනසිල්ලක් ගෙන දුන් ඒවා නො වී ය. ඇය වයස අවුරුදු දහ හතේ සිට විසි හත දක්වා ඒකාකාරී වූ අතෘප්තිකර අසහනකාරී ජීවිතයක් ගෙව්වා ය. වසරෙන් වසර ඇය ගෙවූ ජීවිතය, කළකිරීම සහ වේදනාවන්ගෙන් යුක්ත විය. කිසිදු අන් වෙනසක් ඇයට අත් දැකීමට නො ලැබුණි. ඈ අවට සිදුවූ සියල්ල සිදුවන සියල්ල දෙස ඉතා ඉවසීමෙන් බලා සිටියා ය. ඉඩ ලද සුළු වේලාවන්හි දී, ඇය හුදකලාව භාවනාවට යොමු වී, ඒ සුළු මොහොත වුවද පූජනීය මොහොතක් කළා ය.

සංකීර්ණ ජීවන රටාවකින් තොර වූ, චාම් සුදු ඇඳුමකින් සැරසුණු සිල් මාතාවක් වීම සඳහා මේ ලෝකය අත හැර දැමීමට ඇය නොයෙක් වර සිතුවා ය. ඇගේ අධිෂ්ඨානය කලින් කළ වේගවත් වී, වෙන කිසිවක් අවශ්‍ය නොවන

තැනට ඇගේ හැඟීම් උත්සන්න විය. අවසානයේ එක් සැන්දෑවක, කෑමෙන් පසු ඇය තම ස්වාමියා ඉදිරියේ දණ ගසා ගෙන කරුණු පහදා දීමට වෙර දැරුවා ය. ගෙදර වැඩපළවලින් මිදී, ගිහිගෙය අත හැර සසුන් ගත වීමට ඇය තුළ ඇති ආශාව, ඔහුට තේරුම් කර දීමට ඇය මහන්සි ගත්තා ය. ඇයගේ ස්වාමිපුරුෂයා එම ඉල්ලීම ගැන කිසිදු තැකීමක් නො කොට ප්‍රතික්ෂේප කළේ ය. ඒ සම්බන්ධ ව කිසිදු කතාබහකට තමා අකමැති බව ද හෙතෙම පැවසී ය. කීකරු බිරිඳක් සේ බිමට හෙළා ගත් දෑසින් යුතුව, නිහඬ ව ඔහුගේ තීරණය පිළිගෙන නැවත සුපුරුදු ඒකාකාරී ජීවිතය ගෙන ගියා ය.

තපායිගේ අසහනකාරී ජීවිතය දවසින් දවස කිසිදු වෙනසක් නො වී ගෙවී ගියේ ය. ඇගේ අරමුණ ගැන බලාපොරොත්තු සහිත ව ඉවසීමෙන් ඇය කාලයට ඉඩ දී බලා සිටියා ය. සති කීපයක් ගත වූ පසු, තම ස්වාමියා හොඳ මුහුණුවරකින් සිටින දිනයක නැවත වරක් ඇගේ නිදහස ඉල්ලා ඈ ඔහු ඉදිරියේ බැගෑපත් වූවා ය. එවර ද ඔහු ඇගේ ආයාචනය ප්‍රතික්ෂේප කළේ ය. ඇයට සිල් මාතාවක් වීමට ඔහු අවසර දුන හොත්, මිනිසුන් ඔහු ගැන කට කතා පතුරවමින් සමච්චලයට ලක් කිරීමට හැකි බව කීවේ ය. එමෙන් ම ඇයට දරුවෙක් ලබා දීමට ඔහුට හැකි කමක් නො තිබුණ නිසා ඔහු හෙළා දැකිය යුතු පිරිමියෙකු යයි, මිනිසුන් ඕපාදූප කතා කරනු ඇතැයි ද ඔහු කියා සිටියේ ය.

මෙම ගැටලුවට කෙසේ පිළිතුරු දිය යුතු දැයි ඇයට වැටහීමක් නො තිබුණි. ඔවුන් දෙදෙනා අවුරුදු දහයක් දරුවෙක් නොමැතිව එකට ජීවත් වූ බව ඇත්ත ය. දෙදෙනාගේ ම පවුල්වල දූ දරුවෝ සහ සමීප ඥාතීන් බොහෝ ය. නමුත් ඔවුන් දෙදෙනාගේ පවුල වර්ධනය නො වී ය. සමහර විටෙක මෙය කර්මානුකූල ව සිදුවූ යහපතක් ද විය හැක. දෙවයේ මෙම පෙරළීම, ඇයට නිවසින් පිටවීම පහසු කරුණක් කිරීමට ද ඉඩ තිබිණි. නමුත් එම කරුණ ඇය නිවසින් පිටවීම වැළැක්වීමට ඇගේ ස්වාමියා යොදා ගත්තේ ය. ඇය තවත් වරක් අවසර ඉල්ලුවා ය. එවර ද ඔහු ඇයගේ ඉල්ලීමට අවසර නො දුණි.

පූ තායි ගම්මානයේ සාමාන්‍ය පවුලක සාමාජික සංඛ්‍යාව තරමක් වැඩි ය. සෑම දරු උපතක් ම වෙනුවෙන් උත්සවයක් ගෙන සැමරීම ඔවුන්ගේ සිරිතක් වූ අතර දරු උපතක් ජීවත් වීමට ලද රුකුලක් සේ ද සැලකුණි. අලුත් දරුවා පවුලේ වැඩපළ කර ගැනීමට ලද ආශීර්වාදයකි. ගොවිතැන් කිරීමට සහ ගෙදර දොරේ වැඩපළ කිරීමට දරුවන් හැදී වැඩී වැඩිමහල්ලනට එකතු වේ.

දෙමාපියන් මහලු වූ පසු ඔවුන් රැක බලා ගැනීම ද දරුවන් සතු වගකීමක් විය. තපායිගේ, දරුවෙක් නැති විවාහ ජීවිතය ගැන ඇගේ නැන්දලා සහ ඥාති සහෝදර සහෝදරියෝ කනස්සල්ලට පත් වූහ. ඈ මහලු වූ පසු ඇයව රැක බලා ගන්නේ කවුරුන් ද?

දරුවන් කීප දෙනෙකුගේ මවක් වූ ඇගේ ඥාති සොහොයුරියකට නැවතත් දරුවෙකු ලැබීමේ ලකුණු පහළ විය. දරුවා බිහි කළ පසු, බිළිඳා හදා වඩා ගැනීමට තපායිට දිය යුතුයයි සමීප ඥාතීන් තීරණය කළහ. තපායි ඇගේ මව සමග මේ ගැන සාකච්ඡා කොට, ඥාති සොහොයුරිය දරුවා බිහි කරන දින, ඇයට උපකාර කළා ය. එදා බිහිවූ ගැහැනු දරුවා තුරුළු කරගෙන තපායි එදින ම ගෙදර ගෙනාවා ය. නිවසට අලුත් අමුත්තා ගෙන ආ මොහොතේ ම බිළිඳාට කායිව් යනුවෙන් නම් තැබුවා ය. ඇගේ "සුරතල් පොඩ්ඩි."

බිළිඳා ලැබුණාට පසු ඇය ඉතා සතුටින් ඉන්නා බව ගම්වාසීන් හට පෙනුණි. මව් සෙනහස පාමින්, බිළිඳාගේ වැඩපළ ඉතා සතුටින් කළ තපායි බොහෝ වේලා සිඟිත්තා කරපින්නා ගෙන සිටින බව ගම්වාසීන්ට පෙනුණි. ඇයට "මායි කායිව්" යනුවෙන් නම් පට බැඳුණි. "කායිව් ගේ අම්මා" මේ නම ඇයට ජන්මයෙන් ම උරුම වූවක් මෙනි. මෙතැන් පටන් කව්රුත් සෙනහසින් තපායි ඇමතුවේ, "මායි කායිව්" කියාය.

කුඩා කායිව් හැදී වැඩී, කඩිසර බුද්ධිමත් ගැහැනු ළමයෙක් වූවා ය. ඇය ඉතා උනන්දුවෙන් අම්මාගේ එදිනෙදා වැඩපළ ඉගෙන ගත්තා ය. උද්යෝග යෙන් හා කඩිසර ව ඇගේ අම්මාව අනුකරණය කළ තරුණ කායිව්ගේ ඇඟපත ඒ ඒ වැඩට අවශ්‍ය පරිදි ලාලිත්‍යයෙන් හැසුරුවා ය. කඩිසර ව ගෙදර දොරේ කටයුතුවල යෙදීම ඇයට සාමාන්‍ය දෙයක් විය. මායි කායිව් ගේ අම්මා, ඇය කුඩා කල බලාපොරොත්තු නොවූ අවස්ථාවක මිය ගිය හෙයින්, ගෙදර දොර වැඩපළ ඉගෙන ගැනීමට ඇයට මහත් වෙහෙසක් දැරීමට සිදු විය. එසේ හෙයින් මායි කායිව් ඇගේ කුඩා දියණියට කැප වීමෙන් වැඩ කිරීමේ අවශ්‍යතාවය ඉගැන්නුවා ය.

දියණියක් හදා වඩා ගැනීම, මායි කායිව් හට කෙළිලොල්, එමෙන් ම සතුට දනවන අත්දැකීමක් විය. ඇය කොටු වී සිටි සීමාවන් ගෙන් තාවකාලික ව මිදී වෙහෙසකාරී ජීවිතයෙන් තරමක් හෝ අස්වැසිල්ලක් දරුවා නිසා ලැබුවා

ය. ඇගේ ආධ්‍යාත්මික අපේක්ෂාවන් කවුරුන් සමඟ හෝ බෙදා හදා ගැනීමට ඇය ඉමහත් ආශාවකින් පුල පුලා බලා සිටියා ය. එනමුදු කායිවි තවම කුඩා ළදැරියකි. ඈ වටා ඇති දුක්ඛිත ලෝකය ගැන දැන ගැනීමට තරම් මෝරා නැත. ඇය අහිංසක ය. නමුත් මායි කායිවි මේ ලෝකයේ වේදනාවන්ට සහ දුක් කන්දරාවට මුහුණ දී බොහෝ කල් ය. ඈ අවට සිටි අය මුහුණ දුන් දුක් පීඩා, ඇගේ පපුවේ තියුණු වේදනා ගෙන දෙන තුවාලයක් සේ ඇයට දැනුණි. කිසිවකුගෙන් කිසිදු අනුකම්පාවක් නො ලබා එදිනෙදා වැඩපොළෙහි යෙදෙන ගම්වාසීන්ගේ සිත් වේදනා ඇයට වැටහුණි. ඔවුන් තරුණ වියේ සිට මහලු වී මැරෙන තුරා, නිරත වූයේ එදිනෙදා කෙරෙන වැඩපොළවල පමණි.

"උපතක සතුට මරණයක දුක පසු පස දිව එන්නකි"

"නියඟයක ව්‍යසනය පසුපස ජල ගැල්මක විනාශය ද පැමිණේ."

කායිවි හදා වඩා ගැනීමට ගෙන ආ වසරේ ම මායි කායිවිගේ පියා මිය ගියේ ය. සතුට පසුපස දුක ලුහු බැඳ ආයේ ය. මෙවර වරුසාව ද පැමිණියේ නැත. ඒ හේතුවෙන් ගොවිතැන් පාළු වී සහල් නො ලැබුණි. සැප හා දුක එකට එක් වී එකවර මතු වී එයි. මිනිසෙකුගේ ජීවිතය මරණය කරා ගෙන යන කරත්තයක එකට බැඳි රෝද දෙකක් මෙනි. අළුත් රෝද සකස් වූ පසු, එය අනාගත උත්පත්තිය කරා ඇද ගෙන යයි. මායි කායිවි මෙම වෙනස් වීම, සහ දුක ඇතිවීම, ජීවිතයේ මැද පවතින බව දුටුවා ය.

සැප දුක් අතරේ වුව ද, යහපත් අයහපත් කාලය තුළ වුව ද, ඇගේ හදවත පතුලේ තිබූ අපේක්ෂා ඇය අත නො හැරියා ය. මතුපිටින් දකින දේ මොන ආකාරයෙන් වෙනස් වුව ද හදවත පතුලේ මුල් බැස තිබූ ගිහිගෙය අත් හැරීමේ ආශාව ඇගේ ජීවිතයේ එක ම බලාපොරොත්තුව විය. වට නොං නොං ආරණ්‍යයේ, කෙස් කැපූ, චාම් සුදු සිල් රෙදි හැඳි, සිල් මාතාවක් වන චිත්‍රය, ඇය නිතර ම තම සිතේ මවා ගත්තාය. හුදකලාව නිහඬව කිසිදු බාහිර බාධාවකින් තොරව භාවනා කරන අයුරු ඇගේ සිත තුළ මවා ගත්තා ය. අභිනිෂ්ක්‍රමණය ජීවිතයේ වටිනා එක් අංගයක් බව ඇය වටහා ගත්තා ය. අවුරුදු ගණනාවක් ඇය මේ ලෝකයේ අතරමං නොවී ජීවත් වීමට ඉගෙන ගත්තා ය. සිතේ කැළඹීම වටහා ගැනීමටත් එය සන්සුන් කර ගන්නා අයුරුත් ඇය ඉගෙන ගත්තා ය. සැප දුක සතුට අසතුට ආදිය අඩු වැඩි වෙවී ඈ වෙත

පැමිණීම විටක ඇගේ සන්සුන්භාවය අහෝසි කළේ ය. එසේම වරින් වර සිත රවටන සිතිවිලි ඉස්මතු වී අවුත් තවත් වරෙක ඈ මුලා කළේ ය. වයසින් මෝරා වගකීම් වැඩි වෙද්දී ඇගේ අනාගත බලාපොරොත්තු කඩවන ලකුණු පහළ විය. එම කඩවීම් හමුවේ ඇගේ නිදහස ද විනාශ විය. ආචාර්ය මුන් හිමි, අවසන් වරට ඇය යම් දිනක එම සිහිනයේ ඵල අත් විඳින බවට දුන් පොරොන්දුව, ඇගේ අසහනකාරී මනසට තිබූ එකම සැනසීම ය. නමුත් දැන් ඇයට කුඩා දියණියක් හදා වඩා ගැනීමට සිදු වී ඇත. සසුන්ගත වීම ඈ වෙතින් තවත් ඈතට ගිය බවක් ඇයට දැනුණි.

පූර්ණ කාලීන සිල් මාතාවක් සේ කල් ගත කිරීමට ඇයට ඉඩ කඩ නො ලැබුණත්, කෙටි කාලීන ආගමික වැඩසටහනකටවත් සහභාගි වීමට අවස්ථාව ලබා ගත හැකි වනු ඇතැයි ඇයට හැඟුණි. තරුණ පිරිමි ළමයි වස් කාලයේ තාවකාලික ව සසුන් ගත වී මහණ දම් පුරන බව ද ඇයට සිහි විය. එය නිවැරදි පිළිවෙතකි. විවාහක පිරිමින් පවා ගිහිගෙයින් නික්ම ටික කලකට මහණ දම් පුරති. මේ දේ ඇයට කරන්න බැරි ඇයි? එසේ වුවහොත් දුව ගැන බැලීම කළ යුතුව ඇත. නමුත් කායිව් අවුරුදු අටක දැරියක් වුවද මාස තුනකට ගෙදර වැඩපළ බලා ගැනීම හා පියාගේ අවශ්‍යතා ඉටුකර දීමට ඈ දක්ෂ වූවා ය. මායි කායිව්ගේ ඥාති සොහොයුරියන් ඇයට උදව් කරන බවට ඇයට විශ්වාසයක් තිබුණි. මේ සඳහා ගෙදර බර වැඩ ඈ කලින් නිම කළ යුතු ව තිබුනි. සී සෑම සහ පැළ සිටුවීම ඒ දුෂ්කර වැඩ අතරට වැටුණු කාර්යයන් ය. කෙටි කාලීන ආගමික වැඩසටහනට සහභාගි වී එය නිමවා අස්වැන්න නෙළීම සඳහා ඇයට නැවත ගෙදර පැමිණිය හැක. ආධ්‍යාත්මික මගක යෑමට ඇයව කිසිදිනක නිදහස් නොකරන බවට ඇගේ ස්වාමියා පවසා ඇත. කිසිදු නිදහසක් නැති වනවාට වඩා කෙටි නිදහසක් හෝ තිබීම යහපතකි. යා යුතු මාර්ගයේ පියවර කීපයක්වත් යෑම, මුළු ගමන නැති වීමට වඩා යහපතකි.

වසර දහයකට ප්‍රථම තම ස්වාමියා ඉදිරියේ වැඳ දණ ගසා ආයාචනා කළා සේ ම මායි කායිව් මෙවර ද ඔහු ඉදිරියේ දණ ගසා ඇයට කෙටි නිදහසක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියා ය. හදවත පතුලෙන් ම ළයාන්විත ව කරුණු පහදා දී ඇගේ ජීවිතයේ තිබූ එකම ආශාව ටික කලකට හෝ ඉටුකර ගැනීමට කුඩා කවුලුවක් විවර කර දෙන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටියා ය. පවුල සහ නිවස බිරිඳකට ගැහැනියකට නිසි තැන බව ඈ පිළිගත්තා ය. එනමුත් ජීවිතය

පුරා ඇය ගෙන ආ සිහිනය මුදුන් පත් කර ගැනීමට ටික කලකට හෝ ඉඩ දෙන ලෙස ඉල්ලමින් දණගසා ඔහු ඉදිරියේ බැගෑපත් වූවා ය. නිවසේ පාලනය සැලසුම් කර ඇති අයුරු ඈ ඔහුට තේරුම් කළ අතර, ඇය නිවසින් ඈත්ව සිටින කාලයේ වැඩපළ නිසියාකාරව කෙරෙන බවට ඇය ඔහුට පොරොන්දු වූවා ය. මාස තුනේ වස් ආගමික වැඩ සටහන නිම වූවාට පසු නැවත ගෙදර එන බවට ද ඇය ස්ථිර ව ම ඔහු ඉදිරියේ පොරොන්දු වූවා ය.

එක් දිසාවකට මුහුණ හරවා ගත් ඇගේ ස්වාමියා කිසිදු හැඟීමක් නැතුවා සේ ඈ එතෙක් පැවසූ දේ නිහඬ ව අසා සිටියා ය. ඇගේ කතාව නිම වූ පසු ඉල්ලීම අනුමත නො කරන බව අඟවන සේ හිස සලමින් ඇගේ මුහුණ දෙස ඇස් අයා බලා, මහණ වීම අමතක කරන්නැයි පැවසී ය. ඇයට රැක බලා ගන්න ස්වාමිපුරුෂයෙක් සිටින බවත් හදා වඩා ගැනීමට දියණියක් සිටින බවත් මතක් කරමින් මින් පසු ඇගේ සිහිනවලට කන් දීමට ඔහු සතුටු නැති බැව් පැවසුවේ ය.

මායි කායිව් නැවතත් ඇගේ සීමාවන්ට කොටු විය. ඉවසීම ශීලයකි. කරුණාව සහ සමාව දීම ද ශීලයන් ය. තම ස්වාමියා ඇයට පැනවූ තහංචිවලට විරුද්ධ වීමෙන් ඇය වැළකුණා ය. ඇය දියණියට ආදරය කළා මෙන් ම තම හිමිගේ අපේක්ෂාවන්ට ගරු කළා ය. නමුත් ඇගේ අනාගත සිහින මැවීම ඈ නතර නො කළා ය. ඇගේ බලාපොරොත්තුව ඉටුවීම මායි කායිව් හට ඇගේ පසුපස එන, ඈ ඉතිරි කළ කුසලයක් විය. එසේ හෙයින්, ඊළඟ වස් කාලය එළඹෙද්දී ඇය නැවත වරක් ඇගේ ස්වාමියාගෙන් සහනයක් පැතීය. මෙවර ඔහුගේ පිළිතුර යාන්තමින් සැනසිලිදායක වූ අතර එය පූර්ණ ප්‍රතික්ෂේපයක් ද නො විණි.

ඇය මුහුණ පා සිටින අසීරු තත්ත්වය දෙපැත්තේ ම ඥාතීන් අතර කතාබහට බඳුන් වූ කාරණාවක් විය. සමහරක් පක්ෂපාතී වූ අතර තවත් කොටසක් ඊට විරුද්ධත්වය පෑහ. කාගේත් ගෞරවයට භාජනය වූ සාධාරණ තීරණ ගැනීමේ හැකියාව ඇති ඥානවන්ත මාමා කෙනෙකුට මේ සම්බන්ධ ව මැදිහත් වීමට ඥාතීහු ඉල්ලීමක් කළහ. ඔහු මායි කායිව් කුඩා ළැදැරියක ව සිටි කාලයේ සිට දන්නා කෙනෙකි. ආචාර්ය මුන් හිමි හමුවීමට ඇගේ පියා සමග ආරණ්‍යයට එන යන අයුරු ඔහුට මතක තිබුණි. එමෙන් ම ඇයගේ ආධ්‍යාත්මික බලාපොරොත්තු ගැන ඔහුගේ අනුකම්පාව ඇය වෙත යොමු

විය. ඔහු ඇගේ ලේලියගේ මැරුණු පියා වෙනුවෙන් ඇගේ ස්වාමියා හා කතා බහ කොට වාසිදායක පිළිතුරක් ලබා දීමට ඉදිරිපත් විය. ඔහු මායි කායිව්ගේ ස්වාමිපුරුෂයා සමග පෞද්ගලිකව සාකච්ඡා කළේ ය. ඔහුට ද, ආධ්‍යාත්මික කටයුතුවල නියැළීමෙන් ලබන ඵල විපාක තේරුම් කර දුන්නේ ය. ඔහු සමග තර්ක කරමින් කෙමෙන් කෙමෙන් ඔහුට බල කරමින් ටික කාලයකට එම භාවනා කටයුතුවලට යෑමට අවසරය දෙන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියේ ය. අවසානයේ බුන්මා ඔහුගේ බිරිඳට මාස තුනක වස් කාලයේ දී පමණක් සිල් මාතාවක් සේ මහණ වී සසුන් ගත වීමට අවසර දුන්නේ ය. අමතරව වැඩිපුර එක් දිනකටවත් අවසර නො ලැබුණි. ඔහුගේ පැත්තෙන්, පවුලේ ගෞරවය ආරක්ෂා කරන හැටියටත් තම දියණිය ඈ නැති කාලයේ බලා කියා ගැනීමටත් ඥාතීන් එකඟ කර ගති. මෙම සහනය ලබා දුන් වයසක මාමා, එම මාස තුන තුළ පංච ශීලය ගැන ශ්‍රද්ධාව ඇති කර, එම සිල් පද සමාදන් වී ඇය එන තුරු ඒවා රැකිය යුතු බවටත් මායි කායිව්ගේ ස්වාමියා පොරොන්දු කර ගත්තේ ය. සතුන් මැරීමෙන්, සොරකම් කිරීමෙන්, බොරු කීමෙන්, මෙථුන සේවනයෙන්, සහ මත් ද්‍රව්‍ය ගැනීමෙන් වැළකී සිටින ලෙස ඔහු එකඟ කර ගත්තේ ය. පංච ශීලය සමාදන් වී, එවා රැකීම ගමේ පොදු ආගමික චාරිත්‍රයක් වුව ද, ඔහු ඒවා ගැන කිසිදු තැකීමක් නො කළ කෙනෙකි.

හදිසියෙන් උද්ගත වූ තත්වය ඇය පුදුමයටත් උද්දාමයටත් පත් කළේ ය. මායි කායිව් දෑත් එක් කොට නළලෙහි තබා, සියල්ලන්ට ම පින් සිදු වේවා යයි කියමින්, ඒ සිතුවිල්ල හදවතේ පතුලට ම කිඳා බැසීමට ඉඩ දුණි. අවසානයේ, ආචාර්ය මුන් මහා තෙරුන් අවුරුදු විස්සකට ප්‍රථම කළ අනාවැකිය මල් පල ගැනෙන ලකුණු පහළ විය. දෑස් පියාගත් ඇය, තම හදවත තුළ මනස මොහොතක් එකඟ කර මේ දිනාගත් කෙටි කාලය තුළ සිල් මාතාවක් වශයෙන් උපරිම ඵල නෙළා ගන්නා බවට, ඇය තමාට ම දිවුරා පොරොන්දු වූවා ය. ඇගේ සිතිවිලි ධාරාවේ ඉදිරියෙන් ම පිහිටි සිතුවිල්ල නම්, භාවනාවයි. මේ වාසනාව මෙතෙක් ඉටුකර ගැනීමට උගහට වූ දෙයකි. කාලය විසින් කල් මර මරා අප්‍රාණික ව තිබූ සිතිවිල්ලකි. නමුත් මේ වන විට එම සිතිවිල්ල දැඩි අවධානයකට යොමු වෙමින් පවතී. මොන තරම් බලාපොරොත්තු කඩවීම්වලට ඇය මුහුණ දුන්න ද, ඇය කිසි දිනක මතු බලාපොරොත්තු කඩ කර ගත්තේ නැත.

අභිනිෂ්ක්‍රමණය



මූලික භාවනා පුහුණුව
පීදුණු කෙසෙල් ගසකට සිටවූ රුකුලක් මෙහි.
එය,
විශාල ව සෑදෙන කෙසෙල් කැහ
සුදුසු කාලයේ පැහී ඉදී වැඩීමට ඉඩ දෙයි.
එය,
අකාලයේ බිම ඇද වැටීමට ඉඩ නොදේ.

සියල්ල අතහැර යාම

එදා ඇසළ පුන් පොහොය දා ය. ඇගේ වයස අවුරුදු තිස් හයකි. ඇයට අයත් යයි හැඟුණ සියල්ල ම, එසේ ම ජීවිතයේ ඇය බැඳ තැබුවායයි හැඟුණ සියල්ල ම, කිසිදු පසු තැවීමක් නොමැති ව අතහැර දමා වට් නොං නොං ආරණ්‍යයේ භික්ෂූන් වහන්සේලා සහ සිල් මාතාවන් ඉදිරියේ දණ ගසා දොහොත් මුදුන් දී වැන්දා ය. පැරණි එමෙන් ම ප්‍රසන්න වූ සරල ආගමික චාරිත්‍රයකට සහභාගි වී, ඇය විනයානුකූල ව සසුන් ගත වූ සිල් මාතාවක් "මයි චී" වෙමි යි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළා ය.

මයි චී කායිව් සිල් මාතා කායිව් ඇගේ සසුන්ගත දිවිය ආරම්භ කිරීම සඳහා එදින පාන්දර ආරණ්‍යයට පැමිණියා ය. ආරණ්‍යවාසී සිල් මාතාවන්ට බයාදු සිනහවකින් සංග්‍රහ කරමින් ඔවුනට ගෞරවයෙන් ආචාර කළා ය. ගරුසරු ඇතිව ඔවුන් හා එකට වාඩි වී, උදේ ආහාරය ගත්තා ය. අවසානයේ, ඈ මෙතෙක් සිහින මවමින් බලාපොරොත්තුව සිටි උපේක්ෂා සහගත ආර්ය බ්‍රහ්මචරියා ජීවිතය, එමෙන් ම සියල්ල අත හැරීමේ අවසන් මොහොත ළඟා විය.

ඇය ගිහි කළ වෙන් කොට හඳුනා ගත් ඇගේ පැරණි ඇඳුම් ආයිත්තම් එකින් එක ගලවා දැමුණි. ඉන් පසු ළිඳ ළඟට කැඳවා ගෙන ගිය ඇය උක්කුටියෙන්

වාඩිවීමට සැලැස් වී ය. වෙව්ල වෙව්ලා එසේ වාඩිවූ ඇය තම බෙල්ල ඉදිරියට නෙරා නිහඬ වූවා ය. ජෝෂ්ඨ සිල් මාතාව මයි චී ඩැං, මොට්ට කතුරකින් ඇගේ දික් වූ කඳු පාට කේශ කලාපය, මිටින් මිට අල්ලා, හුරු පුරුදු ලෙස කපා දැමුවාය. ඉතා කොට හිසකේ කැලි පමණක් ඇයගේ හිසේ ඉතිරි විය. හිස කෙස් මිට මිට ඇගේ ඉදිරියේ විසිරී වැටෙද්දී, කිසිදු හැඟීමකින් තොරව මිනිස් ශරීරයේ මායාකාරී ස්වභාවය ගැන සිහිකරමින්, ඒ හිසකේ කැලි දෙස බලා සිටියා ය. කෙස් යනු මම නො වෙමි : කෙස් මගේ නොවේ : ශරීරයේ අන් කොටස් වාගේම කෙස් ද ස්වභාව ධර්මයේ කොටසකිඃ එය අයත් වන්නේ මට නොව, ස්වභාව ධර්මය නැමැති ලෝකයටයි "මම" යයි හැඳින් වූ කෙනාට එහි කිසිදු අවශ්‍යතාවයක් නොමැත.

ඉන් පසු තියුණු දැළිපිහියකින්, ඇගේ හිස් කබල මතුපිට දිලිසෙන සම පමණක් මතු වන සේ, මයි චී ඩැං මාතාව ඇගේ හිස මුඩු කළා ය. දෙ අල්ලෙන් ඇගේ හිස පිරිමදිමින්, සියල්ල අතහරිමින් සිනාසුණා ය.

අනෙක් සිල් මාතාවෝ ඇය වටා රොක් වී, සිල් මාතාවකට එනම් මයි චී කෙනෙකුට, සුදුසු සාම්ප්‍රදායික තනිකර සුදු සිල් ඇඳුම් ඇන්දූහ. දණහිසෙන් පහළට විලුඹ තෙක් වැටෙන වටසාය, බුරුලට මැසූ බෙල්ල දක්වා බොත්තම් දැමූ අත් දිග හැට්ටය, දකුණු කිහිල්ල යටින් ගෙන, වම් උරහිස වටා ක්‍රමවත් ව එතූ දිග උතුරු සළුව බෞද්ධයින් ගේ ගෞරවාදරයට පත් වූ ශාසනික ඇඳුම් ය.

ඇගේ මහණ පිංකමේ ආගමික චාරිත්‍ර වාරිත්‍ර ඉටු කිරීමේ ප්‍රධාන තැන ඉසුලූ අචාර්ය කම් පහාන් හිමි ඉදිරියේ සිල් මාතා කායිව් තුන් වරක් වැඳ නමස්කාර කළා ය. වැඳ ගත් දෑතින් මිරිකා ගත් ඉටිපන්දම, හඳුන්කුරු සහ නෙළුම් මල අතැතිව ඇය බුදුන් සරණ ගියා ය.

බුද්ධම් සරණම් ගච්ඡාමි .....

සියල්ල අභිබවා යන බුදුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය ඇය සරණ ගියා ය.

ධම්මම් සරණම් ගච්ඡාමි .....

භික්ඛු භික්ඛුණී ආර්ය සංඝ රත්නය සරණ ඈ ගියාය.

සංඝම් සරණම් ගච්ඡාමි. .....

දැඩි අධිෂ්ඨානයකින් සහ අවංක වූ කැපවීමකින් ශික්ෂා පදයන්හි පිහිටා, ඇය රැස් වූ සියල්ලන් ඉදිරියේ සිල් මාතාවකට (මයි චී) අයත් මූලික සිල් පද පිළිවෙළින් සජ්ඣායනා කළා ය. පණ ඇති සතුන්ට හිංසා කිරීමෙන් වළකින බවට ඇය සහතික වශයෙන් පොරොන්දු වූවා ය : නුදුන් දේ ගැනීමෙන් : අබ්‍රහ්මචරියා හැසිරීමෙන් : බොරු කීමෙන් : මත් ද්‍රව්‍ය ගැනීමෙන් : හිරු අවරට ගියාට පසු ආහාර ගැනීමෙන් : විනෝදවීම්වලට සහභාගි වීමෙන්: සුවඳ විලවුන් පාවිච්චියෙන් : උස් අසුන් හා සැප පහසු අසුන් පාවිච්චියෙන් වළකින බවට ඇය සහතික වශයෙන් පොරොන්දු වූවා ය.

සිල් මාතා කායිව් ශික්ෂා පදයන් සමාදන් වී, එහි පිහිටියාට පසු ව, ආචාර්ය කම් පහාන් තෙරුන් වහන්සේ ඈ දෙස සෘජු ව බලා, සමාදන් වූ ශික්ෂා පද එකින් එක උන් වහන්සේ විස්තර කරන බවත්, ඒවාට අවධානය යොමු කොට ඇහුම්කන් දෙන ලෙසටත් ඇයට අවවාද කළහ.

බුදුන් දෙසූ නිවන් මග යෑම සඳහා සෑම බෞද්ධයෙකු ම පළමුව අනිවාර්යයෙන් කළ යුතු වන්නේ බුද්ධ ධම්ම සංඝ ත්‍රිවිධ රත්නයේ සරණ යෑමයි. ආධ්‍යාත්මික දියුණුවේ හිණිපෙත්තට යෑම සඳහා ඇති පරමාදර්ශය බුදුරජාණන් වහන්සේ ය. නිවන් අවබෝධය සඳහා එකම ශාස්තෘවරයා බුදුන් වහන්සේ ය. බුදුන් සරණ යෑමෙන් ඔබ එම පරමාදර්ශී උත්තමයා ඔබේ ගුරුවරයා වශයෙන් පිළිගනී. මිථ්‍යාදෘෂ්ටික දර්ශනයන් සෙවීමෙන් වැළකීමට ද, ඔබ එයින් ප්‍රතිඥා දෙයි. නිවන් සාක්ෂාත් කිරීම සඳහා සත්‍ය වූ මාර්ගය සහ හරය මෙම ධර්ම මාර්ගයයි. ධර්මය සරණ යෑමෙන් ඔබ එම සත්‍යය ඔබේ එකම අරමුණ බවට පිළිගනී. බොළඳ මාර්ගයන් ඔස්සේ යෑමෙන් සහ මිථ්‍යා අදහස් පිළිගැනීමෙන් වළකින බවට ද ඔබ ප්‍රතිඥා දෙයි. සංඝ රත්නය එම උතුම් ධර්මය නිරූපණය කරන නිවන් මගෙහි යන පිරිස වේ. සංඝයා සරණ යෑමෙන් ඔබ බුද්ධ ශාසනය තුළ ඔබේ රැකවරණය පිළිගනී. මිථ්‍යා දෘෂ්ටිකයන්, දුශ්ශීලයන්ගෙන් ඈත් වීමට ද ඔබ ප්‍රතිඥා දෙයි. මේ ආකාරයට බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නය සරණ යෑමෙන්, නිවැරදි ආධ්‍යාත්මික පරමාදර්ශයන් පිළිගැනීමට ඔබ කැප වේ. කෙලෙස් දුරු කිරීමේ මූලික දැනීම ඇතිකර ගැනීමට ඔබ යොමු වේ.

සත්‍ය වූ නිවනෙහි අඩිතාලම ත්‍රිවිධ රත්නය සරණ යෑමයි. විමුක්තිය සඳහා නිවන් මඟෙහි යෑමට මෙම ශික්ෂා පද ඊට අවශ්‍ය කොන්දේසි සහ සීමාවන් සකස් කරයි. ශීලය ශ්‍රද්ධාවෙන් රකිද්දී, කෙනෙකු ගේ මනස වරදින් හා කනස්සල්ලෙන් නිදහස් කරයි. අනතුරුවලින් බේරා ආරක්ෂා කර දීමේ මහත් වූ බලයක් ශීලය ඇතිකරවයි. මුලින් ම, මොන තරම් කුඩා වුවත් පණ ඇති සතෙක් ඔබ නො මැරිය යුතුය: එසේම මැරීමට හෝ හිංසා කිරීමට අනුබල නො දිය යුතුයි. සෑම පණ ඇති සතෙකුට ම ජීවිතය වටිනා දෙයකි. එනිසා එම සතා මරා, උෆ ආදරයෙන් ආරක්ෂා කරන එම වටිනාකම ඔබ විනාශ නො කළ යුතුයි : ඒ වෙනුවට සියලු සත්ත්වයන් කෙරෙහි, ඔබේ හදවත කරුණාවෙන් පුරවා ගන්න.

ඔබ කිසිවකුට අයත් දෙයක් සොරකම් නො කළ යුතුයි. අන් අය ඊට පොළඹවා නො ගත යුතුයි ; සෑම සත්ත්වයෙකුම උනුනට අයත් දේ ආදරයෙන් ආරක්ෂා කරයි ; වැඩි වටිනා කමක් නැතැයි ඔබට හැඟුණ ද, එය අයත් කෙනාට එහි වටිනාකමක් ඇත ; එනිසා අන් කෙනෙකුට අයත් කිසිදු දෙයක් සොර සිතින් ගෙන, එම වටිනාකම විනාශ කරන්න එපා; එසේ සොරකම් කිරීමෙන් විනාශ වන්නේ ඔවුන් සතු දේපොල පමණක් නොව ඔවුනගේ හදවත් පවා විනාශ වේ : එනිසා, දීම, ත්‍යාගශීලී බව ඔබව හසුරුවන ප්‍රතිපත්ති බවට පත් කර ගන්න.

මෙතැන් සිට ඔබ සියලුම ලිංගික සම්බන්ධතාවයන්ගෙන් වැළකී සිටිය යුතුයි. පූර්ණ බ්‍රහ්මචාරී ජීවිතයක් ගෙන යා යුතුයි ; කාමෝද්දීපනය සහ රාගය, සිතේ සහ කයේ සන්සුන් බව විනාශ කර, ආධ්‍යාත්මික ජීවිතයේ අරමුණට ප්‍රතිවිරුද්ධ දිසාවට දුවයි. පිරිසිදු මෛත්‍රියේ බලය සහ භක්තිය ඒ වෙනුවට සිත තුළ මතු වීමට ඉඩ දෙන්න.

ඔබ බොරු කීමෙන් වැළකී, හැම කල්හි ම සත්‍ය කතා කළ යුතු වේ. ඔබේ ක්‍රියාවන්හි දී හෝ කතාවන්හි දී, කිසිවිටක අනුනට වංක නො වන්න: අනුන් නො රවටන්න. බොරුව, විශ්වාසය බිඳ හෙලන අතර, එකිනෙකාට ඇති ගෞරවය අහිමි කරවයි. ඔබේ සිත නිදහස් කිරීමට සත්‍යයේ බලයට ඉඩ දෙන්න.

මතු සඳහන් කළ ප්‍රධාන ශික්ෂා පද සතර ආධ්‍යාත්මික ගුණ වගාවේ මූල ධර්මයන් වන අතර ඒවා ඔබේ කය සන්සුන් කරගැනීමටත් සිත පිරිසිදු කර ගැනීමටත් අවශ්‍ය දෑ සකස් කරයි. එසේ සකස් කර ගැනීම සඳහා, සිත විකෘති කරන, පිරිසිදු තීරණ ගැනීම වළකන, රහමෙර පානය කිරීමෙන් හෝ මොනම ආකාරයක මත් ද්‍රව්‍ය කිසිම දින ගැනීමෙන් හෝ වැළකිය යුතුයි. කබලීකාහාර හිරු අවරට ගිය පසු නො ගත යුතුයි. ඔබ ගී කීමෙන්, නැටීමෙන්, හා වෙනත් විනෝද වීමේ අංගයන්ට සහභාගිවීමෙන් වැළකී සිටිය යුතු අතර ලස්සන වීම සඳහා කනකර ආභරණ සහ මල් පැළඳීමෙන් ද, නා නා සුවඳ විලවුන් ගැල්වීමෙන් ද වැළකිය යුතු වේ. සුවදායක සිනිඳු කොට්ට මෙට්ට සහිත උස් ඇඳන් හි නිදා ගැනීමෙන් ඔබ වැළකිය යුතු අතර සැප දායක හැඩ වැඩ දැමූ මහ අසුන්වල හිඳ ගැනීමෙන් ද වැළකිය යුතු වේ.

මෙම සිල් පද අට මනා සිහියෙන් ආරක්ෂා කරන විට, ඔබ ගිහි ජීවිතයේ දොරටු තාවකාලික ව වැසුවා සේ වනු ඇත. විමුක්තිය කරා යන මාර්ගයේ එක් කවුළුවක් විවෘත කළා සේ ය. මෙම සිල් පද රැකීමේ මූලික පරමාර්ථය, ඔබ කරන කියන සෑම දෙයෙහි ම, ශික්ෂාපදයන්හි අන්තර්ගත මූලික හරය ඇතුළත් විය යුතු බැව් සිහි තබා ගැනීම ය. එසේ ක්‍රියා කරන විට නොනවත්වා මැරි මැරී ඉපිද ඉපිද යන මෙම සංසාර චක්‍රයට, ඔබ බැඳ තබන කෙලෙස් ප්‍රහීනය සඳහා ඔබේ මනස පුහුණු කර ගැනීමට හැකි වනු ඇත.

ශික්ෂා පද රැකීමට පුරුදු පුහුණු වීමෙන් නරක දේ කිරීම නතර වනවා සේ ම හොඳ දේ වර්ධනය කර ගැනීම තීව්‍ර වේ. දුක් වේදනා ගෙන එන හිංසාකාරී හැසිරීම්වලින් තම සිත මෙල්ල කර දොර කවුළු වසා, විමුක්තිය සඳහා තම සිත කය පිරිසිදුවීම, මෙම ශික්ෂා පදවලින් ඉටු වන කාර්යයකි. බෞද්ධ පුහුණු කටයුතුවල අනිවාර්යයෙන් තිබිය යුතු පදනම ද මෙම ශික්ෂා පද වේ. එමෙන්ම මෙම සිල් පද නිවන් මගෙහි වැදගත් සන්ධිස්ථානයක් බව ද සිහි තබා ගතයුතු වේ. එනිසා උතුම් වූ ශික්ෂා පදයන්ට හිමි උදාර ගෞරවය ආරක්ෂා කරමින්, උද්‍යෝගිමත් ව සමාදන් වී ආරක්ෂා කරන්න.

ආචාර්ය කම් පහාන් ස්ථවිරයන් වහන්සේ මෙම ගම්භීර කර්තව්‍යයේ අවශ්‍යතාවය ගැන උනන්දු කර එසේම පොළඹවා, සිල් මාතාවක් සේ විනයානුකූල ව සසුනට භාර ගැනීමේ සාම්ප්‍රදායික වන්දනා ගාථා සජ්ඣායනා කළහ. එය අවසාන වනවාත් සමගම මයි වී කායිව් - සිල් මාතා කායිව් - ඇගේ ජීවිතයේ මෙතෙක් ගෙන ආ බලාපොරොත්තුව ඉටු කර ගත්තා ය.

මගේ අධිෂ්ඨානය පරීක්ෂා කර බැලීම සඳහා
මම, බොහෝ දුක් කම්කටොලු ඉවසුවෙමි.
බොහෝ දින ගණනක් මම නිරාහාර ව සිටියෙමි.
රාත්‍රී ගණනාවක් දිගා වී නිදා ගැනීම ප්‍රතික්ෂේප කෙළෙමි.
මගේ හදවත පෝෂණය කළ ආහාරය ඉවසීමයි.
මගේ හිස සැනපීම සඳහා මා ලද කොට්ටය කැපවීමයි.

නැති වූ නිධානය යළි අයැදියි

සිල් මාතා කායිව්, සාමාන්‍ය ලෝකයෙන් පසු බැස ආධ්‍යාත්මික පූජනීය ලොවකට ඇතුළු වූවාය. ඇගේ සිහිනය මල් පල ගැනුණ ද, ඇය කළ යුතුව ඇති දේ ආරම්භ වූවා පමණි. එකම ආරණ්‍යයේ වෙන් කරන ලද කොටසක සිල් මාතාවෝ වාසය කළහ. භික්ෂූන් වාසය කළ සීමාව මෙම කොටසින් වෙන් වූයේ, ඝනව වැඩුණු උස උණ පඳුරු වැටියකිනි. සිල් මාතා කායිව් ට ලැබුණු කුටිය මැතක දී නිම කළ එකකි. එහි බිමට යෙදූ උණ බම්බු පතුරුවල දිස්නය හා කොළ පාට තවමත් රැඳී තිබූණි. එහි වහල සෙවිලි කළ අමු තණ කොළ අලුතින් කපා, මිටි බැඳි ඒවා ය.

සිල් මාතාවන්ගේ ජ්‍යෙෂ්ඨ මාතාව මයි චී ඩැං ය. වසර හයකට ඉහතදී ඇය සිල් මාතාවක් වීමේ ප්‍රතිඥාව ගත් අවස්ථාවේ සිල් මාතා කායිව් ද එම ආගමික සභාවේ සිටියා ය. පවුලේ සමීප යෙහෙළියක් වශයෙනුත්, ගිහිගෙය අත හැර සසුන් ගත වූ ශ්‍රද්ධාවන්ත භක්තිමත් අයෙකු හැටියටත් සිල් මාතා කායිව් ඇයට ගරු කළාය. අගය කළා ය. ඇය කණිෂ්ඨ සිල් මාතාවන්ට ආදර්ශවත් මාතාවක් වූවා ය. ඇය දෙස බලමින්, ඇය අනුගමනය කරමින්, සෙසු අය ධෛර්යවත් වූහ. මයි චී ඩැං සසුන් ගතවී ටික දිනකට පසු, මයි චී යිං සිල් මාතාවක් වූවා ය. මේ සිල් මාතාවෝ දෙදෙන, වට් නොං නොං ආරණ්‍යයේ කුඩා පිරිසක් වූ

අනෙක් සිල් මාතාවන් ධර්මයේ පිහිටුවීමෙන් සහ සමගිය වර්ධනය කිරීමෙන් ඔවුනගේ වගකීම ඉටු කළහ.

සසුන්ගත වූ පළමු දිනයේ දී ම, සිල් මාතා කායිව් ඇගේ අලුත් ජීවිතයේ නිසල රටාවට අවතීර්ණ වූවා ය. ඇය දිනපතා අලුයම 3.00 ට අවදි වූවා ය. ශීතල වතුර දෝතකින් මුහුණ සෝදා, ඉටිපන්දම් ලන්තෑරුම් දල්වා, ඇගේ කුටිය ඉදිරියේ සකසා තිබූ සක්මන් මලුවේ සක්මන් භාවනාවේ යෙදුණාය. නිහඬව, "බුද් ..... ධෝ බුද් ..... ධොඩී යන දෙදපය එකින් එක මාරු වෙද්දී, අවධානයෙන් යුතුව මුමුණ මුමුණා කියමින් සක්මන් කළා ය. එසේ නො කඩවා සජ්ඣායනා කරමින්, විසිරුණ සිත එක්තැන් කරමින්, වාඩිවී භාවනා කිරීමට සුදුසු තැන්පත් මනස පිහිටින තෙක් ඈ සක්මන් භාවනාවෙහි යෙදුණා ය. ඉන් අනතුරුව හිරු උදාවන තෙක් කොන්ද කෙළින් තබා වාඩිවී, ශාන්ත වූ එකඟ වූ සිත එක් අරමුණක පිහිටවා ගත්තා ය. ඉන්පසු හනි හනිකට ප්‍රධාන ශාලාව වෙත ගොස් භික්ෂූන් වහන්සේලා සහ සිල් මාතාවන් එකතුව කෙරෙන, සමූහ බුද්ධ වන්දනාවන්ට සහභාගි වූවා ය.

වන්දනා ගාථාවන්හි ශබ්දය කෙමෙන් අඩු වී අවසන් වූ පසු, භික්ෂූන් සහ සිල් මාතාවෝ විනාඩි කීපයක් භාවනායෝගී ව සිටිති. ඉන්පසු සිල් මාතාවෝ, එළිමහනේ සෑදූ කුස්සියට විත් බත් සහ ව්‍යංජන එකක් දෙකක් පිසති. භික්ෂූන් වහන්සේලා පිණ්ඩපාතයේ වැඩ, ගෙනෙන ආහාරවලට අමතරව මෙසේ සකස් කර ගන්නා ආහාර ද හීල් දානය සඳහා එකතු කර ගනිති. සිල් මාතා කායිව් ඉතා සතුටින් ආහාර පිළියෙළ කිරීමට සහාය වී, පසුව සිල් මාතාවන් සමඟ දවසේ එකම ආහාර වේල වැළඳීමට එකතු වූවාය. භික්ෂූන් වහන්සේලා සහ සිල් මාතාවෝ ද අනුභව කළේ දිනකට එක් ආහාර වේලක් පමණි. භාවනා යෝගී ජීවන රටාවට මෙය ද එක් පුහුණුවකි. අඩුවෙන් ආහාර ගැනීම නිසා භාවනා කටයුතු සැහැල්ලුවෙන් කර ගැනීමට හැකිවේ ; වැඩියෙන් ආහාර ගැනීම මනස උදාසීන කරවයි ; උනන්දුව හීන කරවයි ; ආහාරවලට ඇති තණ්හාව සහ කෑදරකම සිත කිලිටි කරන විසක් වේ. සාමූහික ව ආහාර පිස, පිරිසිදු කිරීම් නිම කළ පසු සිල් මාතාවෝ තම සම්පූර්ණ කාලය භාවනා පුහුණුව සඳහා යෙදවූහ. ආහාර ගැන කිසිදු තැකීමක් නොමැති ව, සැහැල්ලු වූ සිතක් කයක් ඇති ව, භාවනා පුහුණුව සඳහා පමණක් දවසේ ඉතිරි කාලය සම්පූර්ණයෙන් ම යෙදවූහ.

ආහාර පිසීම්, පිරිසිදු කිරීම් ආදී සරල අවශ්‍යතා සිල් මාතාවන් සාමූහික ව ඉටු කරන හෙයින්, මුළු ආරණ්‍යයේ ම ශුභ සාධනය ඉබේ ම සැලසුණි. සෑම සැන්දෑවක දී ම ආරණ්‍යයේ සියලු ම සිල් මාතාවෝ සන්සුන් සිතින් හා සතියෙන් ඉදල් සහ කොසු ගෙන තම තමන්ගේ කුටි අවට ශුද්ධ පවිත්‍ර කර ගනිති. එසේම එක් එක් සිල් මාතාවන්ගේ කුටි සම්බන්ධ කෙරුණු කුඩා අඩි පාරවල් ද, ඔවුහු සමගියෙන් අතුපතු ගා පිරිසිදු කළහ. ඉන් පසු කුස්සිය අවට ද, එමෙන් ම උයන පිහන භාජන ද දූවිලි ගසා නිසි සේ තැන්පත් කරති. පසු දින හීල් දානය සඳහා සහල් ටිකක් දියේ දාන්න ද ඔවුන් අමතක කළේ නැත. ඉන්පසු ළිඳ අසලට ගොස් නිහඬ ව තම තමන්ගේ ඇඳුම් සෝදා දිය නා ගනිති. ඉරු බැස යත් ම, සියලු ම සිල් මාතාවෝ, භික්ෂූන් සමඟ සවස බුද්ධ වන්දනාවට ප්‍රධාන ශාලාවට ගොස් සූදානම් වෙති. වන්දනා කිරීම අවසන් වන විට අඳුර වැටී ඇති හෙයින්, දිග ඉටිපන්දම් දල්වා ගෙන තම තමන්ගේ කුටි කරා ගොස් රාත්‍රි කාලයේ බොහෝ වේලාවක් යනතුරු ම භාවනා කරති.

බොහෝ වෙහෙසක් දරමින් සිල් මාතා කායිව් රාත්‍රි කාලය සක්මනින් සහ වාඩිවී භාවනා කර, පසුගිය කාලයේ ඇයට අහිමි වූ ගැඹුරු සමාධිය, සිත එක් තැන් කර ගණිමින් නැවත ලබා ගැනීමට වෙහෙස දැරුවාය. ආචාර්ය මුන් හිමි දැනට අවුරුදු 20කට කලින්, තම ගම්මානය අත හැර ගියදා සිට, ඇයට ක්‍රමවත් භාවනා පුණුවකට යොමු වීමට නොහැකි විය. ඇගේ ගිහි ජීවිතයේ කටුක අත්දැකීම් සහ ගෙදර දොරේ වැඩපල ගැන බොහෝ නොවැදගත් දේ, ඇගේ සිත තුළ පොදි බැඳෙන්නට විය. එසේ වුවද, ඇය වීර්යයේ වටිනාකම ගැන මනාව දැන සිටියා ය. එනිසා නොබිය ව, ඇගේ සිත කුඹුරක් යයි සිතමින්, සී සාමින්, ලියද්දෙන් ලියද්ද බිම් සකස් කිරීම ආරම්භ කළා ය. ..... බුද්ධෝ ..... නැවතත් ..... බුද්ධෝ .....

නොපසුබට උත්සාහයෙන් කටයුතු කිරීමට ඇය හොඳින් දැන සිටියා ය. ඇයට විශ්වාසය තැබිය හැකිව තිබුණේ එම ගුණාංග මත පමණකි. ඇය, ඇගේ ලෞකික ජීවිතය ස්ථිර ව සිතින් ඇත් කොට, තම අරමුණ වෙත තීව්‍ර ව සිත යොමු කරද්දී, මුල් පියවර දෙක තුළදී ම, ඇය ආශ්චර්යමත් මාවතකට ක්ෂණික ව යොමු විය. මෙම ක්ෂණික දියුණුව ඇසූ කෙනෙකු පුදුම වනු නියතය. නිසල වූ මැදියම් රැය ඇය වෙළාගෙන සිටිය දී, එමෙන්ම පිරිසිදුව භාවනාව ඉදිරියට කෙරී ගෙන යද්දී, හදිසියේ ම ඇගේ සිත සහ කය හෙළකින්

බිමට වැටුණා සේ, ගැඹුරු ළිඳකට වැටුණා සේ දැනුණි : සියල්ල අතුරුදහන් වී ගැඹුරු නිසලතාවයකට පත්වුණි. ඇගේ දැනීම තුළ කිසිවක් සටහන් වූයේ ද නැත. දැනීම පමණක් ඉතිරි විය. - දැනුම විනිවිද ගිය නිර්මල වූ තියුණු සිත කය ඉක්මවා ගිය අවබෝධ ඥානයක පිහිටියේ ය. මෙම අත්දැකීම පැවතියේ සුළු මොහොතක් පමණි. එම මොහොත අතිශයෙන් පිරුණු ශාන්ත භාවයකි. එම ශාන්ත තත්ත්වයෙන් නැවත සමාධිය ඉස්මතු වී පැමිණි විට, ඇගේ සිත දීප්තිමත් ව පවිත්‍ර ව, තීක්ෂණ ව පිහිටි බව ඇයට වැටහුණි. කලක් ඇයට අහිමි ව තිබූ නිධානය, නැවත අයැදීමෙන් ලබා ගත් බව ඇය දැන ගත්තා ය.

ගැඹුරු සමාධියෙන් ටිකෙන් ටික පිබිදෙන විට, නුහුරු නුපුරුදු මතු සිදුවන දේ දැකිය හැකි මානසික තත්ත්වයකට ඇගේ සිත පත් වූවා සේ ඇයට දැනුණි. එය සිහිනයක් දැක අවදි වූ මොහොතක් සේ දැනුණි. හදිසියේ ම, කොහේදෝ සිට හිස කඳින් වෙන් වූ විශාල මිනිසෙකුගේ බියකරු අවතාරයක් පාවී අවුත් ඇගේ දර්ශන පථයට ඇතුළු වුණි. චකිතයෙන් එදෙස බලා සිටි ඇයට, හිසකේ නැති, ඒ බිහිසුණු මිනිසාගේ පපුව මැද රතු පාටින් දිලිසෙන එක ඇසක් පිහිටා ඇති බවත්, ඒ ඇසින් තර්ජනාත්මක ව, රෞද්‍ර ලෙස ඈ දෙස එක එල්ලේ බලා සිටින බවත් ඇය දුටුවා ය. සූදානමක් නො මැතිව සිටි ඇය, අනතුරක් වේ යයි බියෙන්, බේරී පලා යන්නට සිතුවා ය. ඇගේ සිතෙහි ඒකාග්‍රතාවය විසිරෙද්දී, ඈ තුළ තිබූ බිය සහ සැකය තව තවත් වර්ධනය විය. ඇගේ බිය වැඩිවත් ම, ඒ බියකරු අවතාරය ද ටිකෙන් ටික ප්‍රමාණයෙන් විශාල වී, ඇගේ බිය තව තවත් වැඩි කළේ ය. ඇගේ බියෙන් තැති ගත් හදවත සැලෙන්නට පටන් ගත්තේ ය. ඒ ක්ෂණයේ ම ආචාර්ය මුන් තෙරුන් වහන්සේ දුන් අවවාදය ඇගේ මතකයට ආයේ ය.

"බිය වී කිසි දිනක දුවන්න එපා. සතියෙන් හා අවබෝධයෙන් එයට මුහුණ දෙන්න."

එම සිහිකිරීමත් සමඟ ම, පවිත්‍ර දැනීම ඉස්මතු වී, වර්තමානයේ පිරිසිදු සංඥාවක සිත නතර වුණි. හිස නැති බියකරු අවතාරයෙන් සිත ඉවතට ගෙන, හදවතේ ඇතිවූ තියුණු තැතිගත් වේදනාව වෙත පමණක් සිත යොමු කොට, ඇගේ සිතෙහි ඇති වූ උද්වේගය සහ බිය ටිකෙන් ටික සමනය වීමට ඉඩ හැරියා ය. ඒ සමග ම ඇගේ මනසේ ඇති වූ බියකරු දර්ශනය ද තුනී වී ගොස් අතුරුදහන් විය.

සමාධියෙන් නැගී සිට, නැවත පියවි තත්ත්වයට සිත පත් වූ කල් හි, සිල් මාතා කායිවි භය නිසා ඇතිවන අනතුරු ගැන ගැඹුරින් සිතා බැලුවා ය. සිතෙහි ඇතිවන භයවීම ම, එහි තිබූ එක ම අනතුර බවත්, ඇය ඇති කලා යයි සිතන රූපයේ කිසිදු බියක් අන්තර්ගත ව නැති බවත් ඇගේ ප්‍රතිභා ඥානයෙන් දැනගත්තා ය. භාවනාවේ දී දකින රූප මානසික සංසිද්ධි පමණක් බවත්, ඒ රූපයන්ට කෙනෙකුගේ සිතට හෝ කයට හෝ අනතුරක් ගෙන ඒමට කිසිදු ශක්තියක් නොමැති බවත් ඇය දැන ගත්තා ය. ඒවා අකර්මක, කිසිදු තේරුමක් නැති, ඒවා තුළින් ම පැන නගින දර්ශනයන් ය. දර්ශන දකින අවස්ථාවේ දී, එම දර්ශනවලට තම සිත තුළින් දෙන අර්ථකථනය තීරණාත්මක ය. අනතුර ගෙන එන හේතුව ද මෙයයි. සිත අපට දනවන අර්ථකථනය අනුව, භය සහ අප්‍රසන්නතාවය උත්පාදනය කරවයි. එය සිතේ සමතුලිතතාවයට හානි පමුණුවන ප්‍රකෘති සිහිය අවුල් කරවන විෂ සහිත සිතිවිලි උත්පාදනය කරන්නකි. බියකරු රූපය ගැන ඉබේට ම තම අවධානය යොමු කළ විට, අශුභවාදී, සිත සසල කරවන සිතිවිලි මතු කර, අනතුර දෙගුණ තෙගුණ කරයි. සිත එම බියකරු චිත්ත රූපයෙන් මුදවා, බිහි වූ භය ගැන පමණක් අවධානය යොමු කළ විට, රූපයේ ඝනත්වය තුනී වී ගොස් සිත පෙර තිබූ තැනට එනම් වර්තමානයට, ගෙන එයි. එසේ වන්නේ, එම රූපයට සහ භය නැමැති සංසිද්ධියට එකට එක්වී සිටිය නොහැකි බැවිනි. එනිසා "භය" මෙල්ල නො කළහොත්, තම භාවනාවට හානි සිදුවිය හැකි බව සිල් මාතා කායිවි හට තියුණු ප්‍රඥාවෙන් වැටහුණේ ය.

ආචාර්ය මුන් ඇයට ඉගැන්වූ භාවනා ක්‍රමය, ඉතා සරල වූවකි. බුද්ධෝ යන්න නො නවත්වා ශ්‍රද්ධාවෙන් රටාවකට කීම පහසු ක්‍රමයකි. නමුත් වසර ගණනාවක් අතපසු කර සිට, නැවත එක් අරමුණකට සිත එකඟ කර ගැනීමට ඇයට මහත් වූ වීර්යයක් ගැනීමට සිදු විය. මුල දී එපා වන තත්ත්වයන්ට ඇය මුහුණ දුන්නා ය. සමහර අවස්ථාවක ඇගේ සිතත් කයත් සමබර තාවයෙන් ක්‍රියා නොකර දෙපැත්තකට අදින බවක් වැටහුණි. සිතට එක් දෙයක් අවශ්‍ය වූ විට කයට වෙන දෙයක් අවශ්‍ය වේ. සිතට මෙය ඕනෑ වූ විට කයට එය ඕනෑ වේ. සිතෙහිත් කයෙහිත් එකඟතාවයක් ඇති බවක් නො පෙනුණි. වැඩියෙන් ආහාර ගත් කළ අලස බව ඇති කළේ ය. ආහාර මඳක් ගත් කළ අසම්මත සිතුවිලිවල පටලැවුණේ ය. කෑම, බීම, හිඳීම, නිදා ගැනීම, ඇවිදීම, පෞද්ගලික කටයුතු, සාමූහික කටයුතු, මේ හැම එකක් ම සමබරව ගෙන යන්නේ කෙසේ

දැයි ඇය සොයා බැලුවා ය. දවසේ කෙරෙන හැම කටයුත්තක දී ම, වෙනස් වන හැම මොහොතක දී ම තම සිත ඒ ඒ අරමුණෙහි තබා ගැනීම කෙසේ කළ යුතු දැයි ඇය නිතර වෙහෙස දරමින් සිතුවා ය.

නිරාහාරව දින කීපයක් කුස ගින්නේ සිටීමින් සිල් මාතා පර්යේෂණ කළාය. ආහාර අඩු වීම, උදාසීනත්වය හා අලසකම ඇතිකරන බවත් අසහනකාරී සිතිවිලි වරින් වර ඇති කරන බවත්, ඇගේ ආධ්‍යාත්මික ශක්තිය හීන කරවන බවත් වැටහුණි. එම සියුම් බාධාව නිසා ඈ තුළ භාවනා දියුණුව සඳහා ඇති උද්යෝගය අඩුවන බව ද, අවබෝධ විය. නමුත් ආචාර්ය මුන් තෙරුන් යටතේ පුහුණුව ලබන බොහෝ භික්ෂූන්, නිරාහාර ව සිටීම භාවනාවේ දියුණුවට ඇති වටිනා උපදේශයක් යයි පිළිගති. උන් වහන්සේලා නිතරම වාගේ ආහාර නොගෙන හිරිහැර විදිමින්, සවිමත් මනසක් ඇතිකර ගැනීමටත් මානසික සුපරීක්ෂාව වැඩිදියුණු කර සිතේ ඒකාග්‍රතාවය ඇති කරගැනීමටත් මෙය රුකුලක් වේ යයි පිළිගත්හ. නමුත් සිල් මාතා කායිව්ගේ මනස එම අදහසට නැඹුරුවක් නො දැක්වී ය. ඇගේ සිත ක්‍රියාකාරී වන ස්වභාවය අනුව, ආහාර නොගෙන සිටීම සුදුසු නොවන බව ඇය අවසානයේ තීරණය කළා ය.

නො නිදා සිටීම වෙනම කරුණකි. ඇගේ වස් සමයේ, දෙවන මාසය, ඇය ඉරියව් තුනකින් පමණක් ගත කළා ය. වාඩිවී, සිටගෙන සහ ඇවිදීමෙනි. එනම් බිම දිගා වූයේ නැත. ඇය "හිඳි පුහුණුව" ගැන ද පරීක්ෂණ පැවැත්වූවා ය. ඇගේ ස්වාභාවික ශක්තිය උපයෝගී කරගෙන භාවනාවේ දියුණුව ශීඝ්‍රගාමී කර ගැනීමට ගන්නා ප්‍රයත්නයක් බැව් වටහා ගත්තා ය. නො නිදා සිටීමෙන් ඇගේ මනස දීප්තිමත් ව, තීව්‍ර වන බවත්, නිසලව ශාන්ත බවකට පත්වන බවත් ඇය සොයා ගත්තා ය. ඉන්පසු ඇය දින විසි එකක් බම දිගා නොවී සිටියාය. නොනිදා සිටි සෑම දවසක ම ඇගේ භාවනාව ගැඹුරු අඩියකට වැටුණු අතර භාවනාවේ දියුණුව කෙරෙහි ඈ තුළ ඇති විශ්වාසය ද තව තවත් වැඩි විය. ඇගේ ආධ්‍යාත්මික ඉන්ද්‍රියයන් තියුණු කර, ඇයව නිර්භීත අභියෝගයන්ට මුහුණ දිය හැකි මානාවක් කළා ය. ඈ උත්පත්තියෙන් ලද චරිත ලක්ෂණ සමග මෙම කරුණු මනාව එකිනෙක ගැලපුණේ ය. ඈ දකින අස්වාභාවික දර්ශන, වෙනදාට වඩා නිතර නිතර පෙනුණු අතර ඒවා අතිවිශේෂ දර්ශන විය: සමහර ඒවා මතු සිදුවිය හැකි දර්ශන ය. සමහරක් අරූප තලයන් වෙතින් ලද සංඥා ය. තවත් විටෙක බුද්ධ දේශනාවන්හි අන්තර්ගත ගම්භීර සත්‍යයන් ද එළිදරව් විය.

එක් රාත්‍රියක, ගැඹුරු සමාධියෙන් නැගී සිටි සිල් මාතා කායිවී, ඇගේ මළ සිරුර රෙදි වියන යන්ත්‍රයක් ඉදිරියේ හොවා තිබෙනු දුටුවා ය. මළ සිරුර නිල් පාට වී ඉදිමී, කුණු වී පැළී ඕජස ගලමින් තිබුණි. ලොකු පුංචි පණුවන්, කුණුවූ මස් තුළින් මතුවී අවුත් සිරුර පුරා ගැවසුණි. එසේ ජරාවට ගිය සිරුරේ සත්‍ය ස්වභාවය දුටු ඇය, කම්පාවී බිය වූවා ය. හදිසියෙන් ආචාර්ය මුන් හිමි තමාට පිටුපසින්, සමීප ව සිටින බවක් වැටහුණි. ඇගේ සිරුර උඩින් එම විරූපී සුරුර දෙස උන් වහන්සේ බලන ලෙසක් ඇයට වැටහුණි. සෙමින් නමුත් වගකීමෙන්, මරණය ඉපදීමේ ස්වභාවික ප්‍රතිඵලයක් යයි ඇයට සිහිපත් කළේ ය. මේ ලොවෙහි උපදින සෑම සත්ත්වයෙකු ම අවසානයේ මරණයට පත් වේ. එම මළ සිරුරු ජරාවට පත් වී, ඒවා කලින් තිබූ මූලධාතුවලට ඒ ආකාරයෙන් ම ආපසු පෙරළෙයි. සැබවින් ම මේ විශ්වයේ සියල්ල අනිත්‍යය ය, සෑම මොහොතක ම වෙනස් වෙමින් පවතී. සෑම දෙයක් ම කුඩා කොටස්වලට බිඳී අතුරුදහන් වේ. මරණය හැම විටම අප ළඟ තිබුණ ද, අප ඒ ගැන කල්පනා කරන්නේ කලාතුරකිනි. ආචාර්ය මුන් හිමි, ඇගේ උපත ගැනත් වයසට යෑම ගැනත් අසනීප සහ මරණය ගැනත් ඉතා උනන්දුවෙන් සිහි කිරීමට ආරම්භ කරන ලෙස දැන්වී ය.

වචනයේ පරිසමාප්තයෙන් ම සිල් මාතාවක් වන්න.
දුගඳ හමන ලෞකික ජීවිතයේ
බැඳීම්වල පැටලී, ඔබ මේ ගෙන යන සිල් මාතා ජීවිතය
නාස්ති කරගන්න ඕනෑ නැහැ.
ඒ නිසා, ඔබේ නිවස සහ වූ දරුවන් දෙස දොළුකින්
නැවත යන්තමින්වත් හැරී බලන්න එපා.

දෙබර කුඩුව ඇවිස්සුණි

පුංචි දුව කායිව්, වැසි කාලයේ නිවස අවට වැඩ කරමින් ඇගේ ඥාති සොහොයුරියන් හා සෙල්ලම් කරමින් කාලය ගත කළා ය. ඇය නිතර ම සතුටින් ඉන්නා දැරියක් වුව ද, නිවස තුළ ඇගේ අම්මාගේ තැන්පත් වූ ශාන්ත හැසිරීම නොමැති වීම, ඇයට තදින් දැනෙන්නට විය. ඇගේ පියා, බුන්මා සතුටින් තැබීමට ඇය ගෙදර දොරේ වැඩපළ මහත් වෙහෙසක් ගෙන, උනන්දුවෙන් ඉටු කළා ය. නමුත් ඔහුගේ සිත තුළ කුමක් හෝ කැළඹීමක් ඇති බව පෙනී ගියේ ය. අලුයම නිවසින් පිටව යන ඔහු බොහෝ දිනයන්හි නැවත පැමිණියේ බොහෝ රෑ බෝ වීය.

පොහොය දිනයන්හි කායිව් ගමේ කාන්තාවන් සමඟ වටි නොං නොං ආරණ්‍යයට ගොස් ඇගේ අම්මා සමඟ බුද්ධ වන්දනාවන්ට සහභාගි වූවා ය. ගෙදර සිදුවන දේ ගැන සියලු විස්තර ඇය නොනවත්වා ම මවට කියාගෙන කියාගෙන ගියා ය. දුවගේ විස්තර ඇසූ සිල් මාතා කායිව්, ඇගේ ස්වාමියා වරින් වර ගෙදර නො ඒම ගැන කනස්සල්ලට පත් වූවා ය. ඔහු සමහර දිනක බීමත් ව ගෙදර එන බව ද ඒ කතාවලින් ඇට වැටහුණි. ඒ නිසා පුංචි දුව වෙනුවෙන් ඉඳහිට ගෙදර ගොස් වැඩපළවලට ඇයට සහාය වී, එමඟින් ස්වාමියාගේ හැසිරීම ගැන ද තරමක් අවධානයෙන් සිටීමටත් ඇය තීරණය කළා ය.

ගෙදරට ඇතුළු වෙද්දී, ඇගේ ස්වාමියා ගෙදර නො සිටි බැව් ඇයට එක වරට ම ඒත්තු ගියේ ය. දවස් කීපයක් ම, ඇය ඇගේ දියණියට උදව් වීම සඳහා, උයා පිහා, රෙදි සෝදා, ගෙදර දොර පිරිසිදු කිරීම් ආදී වැඩපළවල යෙදුණා ය. නමුත් බුන්මා ගෙදර පැමිණියේ නැත. වස් විසූ අන්තිම මාසයේ සතියකට එක් දිනක් ඇය ගෙදර ගිය මුත්, ඒ එක ද දිනයක දී වත් තම ස්වාමියා මුණ නො ගැසුණි. අසල ගෙදරක වැන්දඹුවක් සමඟ ඔහු ප්‍රේම සම්බන්ධයක් ගෙන යන බවට ඕපා දූප පැතිරෙන්නට විය. ඒවා ඇගේ කනට ද වැටුණි. ඔහු මත් පැන් බොන බවත් ඇයට හොරා මත් පැන් බොන තැන්වල නිතර ගැවසෙන බවත් ආරංචි විය.

සිල් මාතා කායිව් ඇගේ ස්වාමියාගේ හැසිරීම ගැන කළකිරීමට පත් වූවා ය. අසාරවත් විවාහ ජීවිතයක් ගෙන යමින්, නැවතත් නිවස කරා ඒම ඇයට දරා ගත නො හැකි විය. ආර්ය මාර්ගයේ ගමන් කිරීමට ඇය සිත තුළින් ප්‍රාර්ථනා කළා ය. සිල් මාතා කායිව් ඇය දුන් පොරොන්දුවේ ගෞරවය ආරක්ෂා කළ ද, ඇගේ ස්වාමියාට විවාහ ජීවිතයේ සදාචාරාත්මක මූලික සිද්ධාන්ත පවා රැකීමට අපහසු වූ හෙයින්, ඔවුනගේ විවාහ ජීවිතයේ අනාගතය අනතුරට පත් විය.

වස් විසීමේ අවසන් දින කීපය ළං වෙද්දී, ඇගේ මීළඟ පියවර කුමක් විය යුතු දැයි සිතමින් සිල් මාතා කායිව් වෙහෙසෙන්නට වූවා ය. නැවත මෙම විවාහ ජීවිතයට කොටු වීමට ඇයට කිසිසේත් ආශාවක් ඇති නොවූ නමුත් ඇගේ දියණියගේ අනාගතය ගැන ඇය කනස්සල්ලට පත් වූවා ය. පුංචි දියණියට සමීප ව සිටීමට ඇයට වුවමනාව තිබුණ ද, අවුරුදු දහයක් වයස ඇති ඇයව, ආරණ්‍යයේ තබා ගැනීම කළ නොහැකි දෙයක් බව ද ඇයට වැටහුණි. ගිහිගෙය අතැර දා, පැමිණි කෙනෙකුට, තවත් දැරියක් ආරණ්‍යය තුළ හදා වඩා ගැනීමට කිසිදු හැකියාවක් නොතිබුණි. ආරණ්‍යයේ පිළියෙල වූ ආහාර ප්‍රමාණවත් වූයේ එහි සිටි අයගේ යැපීම සඳහා පමණි.

මෙම වේදනා ගෙන දෙන සිතිවිලි ඇය, සති ගණනක් සැලකිල්ලට යොමු කරමින්, කුමක් කළ යුතු දැයි, කල්පනා කළා ය. එහිදී ඇයගේ ආරණ්‍යය ජීවිතය සහ ගෘහ ජීවිතය යන ලෝක දෙකම තම දෛනික ජීවිතයට සම්බන්ධ කර ගත හැකි බැව් ඇයට වැටහුණි. මවක් ලෙස සහ බිරිඳක් ලෙස ඇගේ යුතුකම්, දහවල් කාලයේ දී නිවසෙහි දී කළ හැකි බවත්, රාත්‍රි කාලයේ ආරණ්‍යයේ භාවනා කරමින් ඇගේ ආධ්‍යාත්මික අරමුණු ඉටු කර ගැනීමට වෙහෙස දැරිය

හැකි බවත් ඇයට වැටහුණි. මෙම සැලසුම සදාචාර සම්මතයෙන් බැහැර වුව ද, අතාත්වික වුව ද, ඇය එසේ කරගෙන යෑමට අසහනයෙන් වුවත් මහන්සි ගත්තා ය.

වස් වසීම අවසාන වූ දිනයේ දී, සිල් මාතා කායිව් තම නිවස කරා පැමිණියා ය. නමුත් ඇය ඇගේ සුදු සිල් ඇඳුම් අත නො හැරියා ය. එසේ ම ඇය සමාදන් වූ ශීලය පවාරණය කළේ ද නැත. සසුන් ගත වූ සිල් මාතාවක් ලෙස දිගින් දිගටම සිටීමට ඈ තීරණය කළා ය. ඇගේ ඇත්ත තත්ත්වය ලෝකයෙන් සැඟවීමට, කළු හැට්ටයක් සහ කළු සායක්, තම සුදු සිල් ඇඳුම් මතු පිටින් ඇන්දා ය. උදය වරුව සහ දහවල් වරුව, ඇය කායිව් දියණිය සමග ගත කරමින්, ගේ දොර වැඩපල සහ ආහාර පිසීම් ආදිය කළා ය. රාත්‍රී ආහාරය සකස් කොට මේසය මත තබා, කළුවර නැගී ඒමට ප්‍රථම ආරණ්‍යය කරා යෑමට ඇය සැලසුම් කළා ය. සිල් මාතා කායිව්, ඇගේ ස්වාමියා සමග රාත්‍රී කෑමට හිඳ ගත්ත ද ඔහුට පමණක් ආහාර බෙදා, ඇය නොකා සිටියා ය. ඇය ආරණ්‍යයේ අන් සිල් මාතාවන් මෙන් දහවල් කෑමෙන් පසු ආහාර ගැනීමෙන් වැළකී, එම ශික්ෂා පදය දිගටම ආරක්ෂා කළා ය. සිල් මාතා කායිව්ගේ රාත්‍රී කාලයේ නිවසේ නො රැඳීම, ඇගේ ස්වාමියාගේ ක්‍රෝධය උත්සන්න වීමට හේතුවක් විය. ඇගේ අමුතු හැසිරීම ගැන නිදහසට කරුණු කීමට ඔහු ඇයට තර්ජනය කර, ඔහු සමග එකට වාඩිවී රාත්‍රී කෑම කෑමට බල කළේ ය. ඇය එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළවිට, ඔහු කෝපයෙන් නැගිට ඇගේ අතින් මිරිකා අල්ලා ගත්තේ ය. අත ගසා දැමූ ඇය, ඔහුගෙන් මිදී, වේගයෙන් පියගැට පෙළ බැස, නිවසින් පිට වී දුවන්නට වූවා ය. බුන්මා ඇගේ පසුපස දුවන්නට විය. නමුත් වාසනාවකට ඇගේ වැඩිමහල් සහෝදරයා අතර මඟදී හමුවූ හෙයින්, ඔහු ඇයට යන්නට ඉඩ දෙන ලෙස, බුන්මාට අවවාද කළේ ය. ඔවුනගේ විවාහය විනාශ වූයේ යයි බුන්මා කෝපයෙන් කෑ මොර දෙන්නට විය.

"උඹට අපේ දේපොලවලින් කොටසක් ඕනෑ වුනොත්, මට විරුද්ධ ව දිස්ත්‍රික් මහ උසාවියේ නඩුවක් දාපං" යි කියමින් බුන්මා කෑ ගැසුවේය. සිල් මාතා කායිව් ඉර බැස යද්දී, ගම හරහා වෙහෙස නොතකා දිගටම දුවන්නට වූවා ය. ඇගේ ලෞකික ජීවිතයේ අසීමිත දුක් කම්කටොලු වේදනා ගැන සිතමින්, දැඩි අසහනයට පත් වූ ඇය, කිසි දිනක තම සිල් ඇඳුම් නො ගලවන්නට ඒ මොහොතේ තීරණය කළා ය.

සිල් මාතා කායිව් නැවත ආරණ්‍යය වෙත එද්දී, අන් සියලු සිල් මාතාවන් ඈ ගැන අතිශයෙන් කනස්සල්ලට පත්වී සිටින බවක් පෙනුණි. ඇයට සිදුවූ අකරතැබ්බය, ඔවුනට විස්තර කරද්දී, ජ්‍යෙෂ්ඨ සිල් මාතා ඩැං, එනම් මයි චී ඩැං, ඇයට බැණ වැදුණාය.

"මොකටද ඔබ ආයෙමත් ස්වාමි පුරුෂයා ළඟට ගියේ ? ඔබ කරන්නේ දෙබර කුඩුවක් අවුස්සනවා වාගේ වැඩක්. පාඩමක් ඉගෙන ගන්න. ගින්දරට අත දික් කරන්න යන්න එපා. ඔබේ අත පිච්චුනේ නැතත්, ඔබ ඔබේ ආත්ම ගෞරවය පුච්චා ගන්නවා"

සිල් මාතා කායිව්, ඇගේ ස්වාමියා සමග ඇති සියලුම සම්බන්ධතා බිඳ දැමීමට තනිවම තර්ක කළා ය. නමුත් ඇයගේ සොහොයුරෝ, ස්වාමියා සමග ඇතිවූ ආරවුල, තම ස්වාමියා සමග මුලින් විසඳා ගැනීමට මහන්සි ගත යුතුයයි ඇගෙන් ඉල්ලා සිටියහ. ඔවුනට කීකරු වූ ඇය, දින කීපයකට පසු නැවත ගෙදර ගොස්, ඔවුනගේ විවාහය සම්බන්ධව ස්වාමියා සමග සාකච්ඡා කොට සුදුසු තීරණයකට ඒමට මහන්සි ගත්තා ය. නමුත් ඇගේ ස්වාමියා කිසිදු තීරණයකට එළඹීමට කැමැත්තක් නො දැක්වී ය. විවාහයෙන් පසු ඇය ලබා ගත් සියල්ල ම ඔහුට අයිති විය යුතුයයි ඔහු තරයේ කියා සිටියේ ය. තීරණයක් ගත යුතුව තිබුණේ, පාරම්පරික ව ඇගේ දෙමාපියන් ගෙන් ඇය සතු වූ දේපොළ ගැන ය. දැනටමත් සියල්ල අතහැර, ගිහිගෙන් නික් ම සිටින සිල් මාතා කායිව් හට, ඈ සතු සියල්ල බුන්මා හට පැවරීම ඉතා සුලු දෙයක් විය. පුවක් ශුද්ධ කිරීමට ඈ සතුව තිබූ කුඩා පිහිය හැර වෙන කිසිවක් ඔහුගෙන් බලාපොරොත්තු නොවන බව ඇය ඔහුට පැවසුවා ය. කෝපයෙන් කෑ ගැසූ බුන්මා, එම පිහි කෑල්ලත් ඔවුනගේ දෑවැද්දත් සමග ලැබුණ දෙයක් හෙයින් එය ද අයිති වන්නේ ඔහුට බව බෙරිහන් දෙමින් කීය. එම ප්‍රතික්ෂේප කිරීමත් සමඟ ම සිල් මාතා කායිව්, ඇගේ ගෘහ ජීවිතයට සම්පූර්ණයෙන් ම පිටුපා ඈ සතු සියලුම ලෞකික වස්තූන් ගැන කිසිදු ඇලීමක් නොකර අතහැරියා ය.

සියල්ල නිගමනය කළ පසු ඇය දියණියට රහසේ කතා කළා ය. ඇයගේ සිතට දරා ගත හැකි වන තරමට සිදුවූ සියල්ල ඇයට පහදා දී, ඔවුනගේ ජීවිතවල පරිවර්තනය වටහා දී, ඒවා ගැන ඉවසීමෙන් අවබෝධ කරගන්නා හැටියට ආදරයෙන් ඉල්ලා සිටියා ය. අම්මාගේ අරමුණ වටහා ගත් කුඩා කායිව්, ඇය ද ආරණ්‍යයට ගෙන ගොස් දෙදෙනාම එකට ජීවත් වීමට අහිංසක ව අවසර ඉල්ලමින් බැගෑපත් වූවා ය.

සිල් මාතා ආරණ්‍යයේ විනය රෙගුලාසීන්ට අනුව එය කළ නොහැකි දෙයක් බව ඇය කෙරෙහි මහත් කරුණාවෙන් වේදනා මුසු ව පිළිතුරු දුන්නා ය. ඈ සතු සියල්ල ඇගේ පියාට භාර දුන් නිසා, ඇයව හදා වඩා පෝෂණය කිරීමට ඇයට වත්කමක් දැනට නැති බව ඇය පැවසුවා ය. එමෙන් ම සිල් මාතා ආරණ්‍යය, කුඩා ළදැරියක් හදා වඩා ගැනීමට සුදුසු තැනක් නොවන බව ද පැවසුවා ය. සිල් මාතා කායිව් ඇයට ඇගේ පියා සමඟ, මේ කාලයේ රැඳී සිටින ලෙස ඉතා සන්සුන් ව එහෙත් තරයේ කියා සිටියා ය. ඇගේ පියාට ඇයව බලා කියා ගැනීමට සියලු පහසුකම් හා සම්පත් ඇති බව පවසා ඒ සියලු ම වත්කම් හා දේපොල පරම්පරාවෙන් ඇයට අයිති වන බව ද පැවසුවා ය. ඇය වැඩිවිය පැමිණි පසු මේ ආශාව එවිට ද පැවතිය හොත්, ඇයට අම්මා සමඟ ජීවත්වීමට ආරණ්‍යයට පැමිණිය හැකි බැව් ද පැවසුවා ය. ඇගේ අම්මා එදින මුළු හදවතින් ම ඇයව පිළිගෙන, ඇගේ ආධ්‍යාත්මික ජීවිතයේ ගුරුවරිය වීමට ද පොරොන්දු වූවා ය. අකමැත්තෙන් වුවද, අම්මාට කීකරු ව, දුන් අවවාද පිළිගෙන, පියා සමඟ ජීවත්වීමට ඇය එකඟ වූවා ය.

දුක් මුසුව කල්පනා කරමින් සිල් මාතා කායිව් ආරණ්‍යය බලා පිය නැගුවා ය. සියලු ඥාතීන්ගෙන් සහ හිත මිතුරන්ගෙන් ස්ථිරව ම ඈත් වී යෑමට ගත් මෙම තීරණය ගැන හොඳ නරක සිතමින් ඈ සෙමින් සෙමින් ගමන් කළා ය. එසේ යන ඇයට සිහි වූයේ සියලු රාජකීය සැප සම්පත් හා වස්තූන් අතහැර සිද්ධාර්ථ කුමරු යසෝධරාව සහ පුත් රාහුල තනිකර මාළිගාවෙන් පිටව ගිය අයුරු ය. ඔහු දෙමාපිය යුතුකම්වලට පිටුපා ගිහිගෙය අතහැර එම අභීත ගමන පිටත්වූයේ, මුළු විශ්වය ම ගරු කළ විශිෂ්ට ආර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට ඉපදීම සහ මරණය අඩංගු සංසාර චක්‍රය සම්පූර්ණයෙන් ම විනාශ කිරීමේ දෘඪ අධිෂ්ඨානයෙනි. සම්බුද්ධත්වයට පත් වූ බුදුරජාණන් වහන්සේ සියලුම ලෞකික පරිත්‍යාගයන්ගෙන් ඔබ්බට ගොස්, සියලු ම සම්මුති ධර්මයන් ඉක්ම වූ බුද්ධත්වය සාක්ෂාත් කළ සේක. දුකින් නිදහස් වූ උන් වහන්සේ අනන්ත වූ සත්ත්ව සංඛ්‍යාවකට දුකින් නිදහස් වීමට මාර්ගය කියා දුන් සේක. බ්‍රහ්මචර්යා දිවියේ අරමුණ මැනවින්, කිසිදු වෙනසක් නොමැති ව සිත්හි ධාරණය කරගත් සිල් මාතා කායිව්, බුදුන් වහන්සේ ගත් මග යෑමට අති මහත් උනන්දුවකින් අධිෂ්ඨාන කර ගත්තා ය.

ඔබේ මනස දූෂණය කිරීමට, පරිහාණියට පත් කිරීමට
ගලා එන කෙලෙස් ප්‍රවාහයන් දෙස
විමසිල්ලෙන් බලා සිටින්න.
ඔබ රැවටීමට ඒවාට ඉඩ නොදෙන්න.
එම කෙලෙස්වල හැසිරීම හඳුනා ගැනීමට
ඔබ දක්ෂ වුව හොත්, එම අශුභවාදී ශක්තීන් ශුභවාදී ආධ්‍යාත්මික ශක්තීන්ට
පෙරළීමට ඔබට හැකිවනු ඇත.

දවස පුරා වතුර ඇද ඇද.....

සිල් මාතා කායිව්ගේ එඩිතර තීරණය, බාන් හුආයි සායි ගම්මානයේ කාගේත් හැඟීම් අවුස්සන හේතුවක් විය. දෙපාර්ශවයේ ම වගකිව යුතු ඥාතීන් මෙම සිද්ධිය ගැන දැඩි විෂම අදහස් කියා පෑහ. වට් නොං නොං ආරණ්‍යයේ සසුන්ගත ව සිටි බොහෝ කාන්තාවෝ ද, මෙම ගම්මානයට නෑකම් ඇති අයවලුන් බැවින්, මෙම කලබැගෑණියට සම්බන්ධ නොවී සිටීමට නොහැකි විය. ඔවුන් සිල් මාතා කායිව්ගේ තීරණයට එකඟ වූහ. වැඩි දෙනා ඇයට සහාය දුන්හ. මෙම සිද්ධිය, ගමේ අනවශ්‍ය ඕපාදූප පැතිරයන්ට ද අවකාශයක් ලබා දුන් අතර, සිල් මාතාවන්ගේ ආරණ්‍යය තුළට ගමේ ප්‍රශ්න ඇතුළුවීමට අනවශ්‍ය ලෙස ඉන් ඉඩ සැලසුණි. ආරණ්‍යය, ගමට ආසන්නව පිහිටා තිබූ හෙයින් ඉන් වැලකී සිටීමට ද අපහසු විය. කරුණු කෙසේ වෙතත් ගමේ ගිහි ප්‍රශ්න ආරණ්‍යයේ ආධ්‍යාත්මික සන්සුන් බවට හානියක් නොකර ගැනීමට, ඉදිරියේදී ඊට සුදුසු තීරණයක් ගැනීමේ අවශ්‍යතාවය පැන නැගුණි. ගිහි ප්‍රශ්නවලින් ඈත් වීම සඳහා ආරණ්‍යය ගමෙන් ඈත වෙනත් තැනකට ගෙන යා යුතු යයි සිල් මාතාවෝ සාකච්ඡා කළහ. ආරණ්‍යයේ ජ්‍යෙෂ්ඨ සිල් මාතාව වූ මයි චී ඩැං මාතාව, එම අදහසට එකඟ වූවා ය. ගමේ කටයුතු නිසා ආරණ්‍යයේ ඇති සාමකාමී වාතාවරණයට හානිකර නො වන සේ දුරකින් ආරණ්‍යය ස්ථාපිත විය යුතු බව ඇගේ ද අදහස විය.

ආචාර්ය කම් පාන් හිමියෝ වටි නොං නොං ආරණ්‍යයේ සේනාසනාධිපති වූහ. උන්වහන්සේ භාවනාවෙන් සිත දියුණු කර ගත් දැඩි විනයකින් යුත්, ධුතාංග භික්ෂුවක් වශයෙන් බොහෝ දෙනාගේ ගෞරවාදරයට පාත්‍ර වූ, ආචාර්ය කන්තසීලෝ හිමිගේ ගෝල හිමි නමකි. ආරණ්‍යයේ විනය, සුභ සාධනය සහ ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ ආධ්‍යාත්මික ගුණ වගාවේ වගකීම උන්වහන්සේ සතු විය. ගිහියන්ගේ ප්‍රශ්න, ආරණ්‍යගත සිල් මාතාවන්ට තදින් බලපා ඇති හේතුව නිසා, සිල් මාතා ඩැං සහ සිල් මාතා යිං, මෙම කරුණ ආචාර්ය කම් පාන් හිමි සමග දීර්ඝ ව සාකච්ඡා කළහ. අවසාන තීරණය උන්වහන්සේගේ ය. ආරණ්‍යයේ භික්ෂූන් හා සිල් මාතාවන් සමග අදහස් හුවමාරු කර ගැනීමෙන් පසුව, ආසන්නයේ කඳුවැටියක නව ආරණ්‍යයක් ඉදිකර එහි වාසය සඳහා යෑමට උන්වහන්සේ තීරණය කළහ.

පූ ගාඕ කන්ද පිහිටියේ, කුඩා කඳුවැටියක් වන පූ පාන් කඳුවැටියේ පා මුලය. බාන් හුආයි සායි සිට සැතපුම් හයක් වයඹ දෙසින් පිහිටියේ ය. ඉතා පැරණි අඩි පාරවල් සහ මී හරක් කරත්ත පාරවල් මෙම කඳු පාමුලට වනාන්තරය හරහා වැටී තිබුණි. තැනක් සොයාගෙන එම පාරවල් දිගේ කෙනෙකුට යෑම දුෂ්කර කාර්යයකි. ඉහළ කඳුවැටිය, කඳුගල් හෙල්වලින් සමන්විත විය. පර්වත ප්‍රපාතයන් බහුල ව පිහිටා තිබූ අතර උසට වැඩුණු උණ පඳුරු ඊට ගෑවෙමින් වැඩී තිබුණි. දර්ශනීය කඳු ගල් ප්‍රපාත, කඳුවැටියේ දිගට තද දුඹුරු පාටින් විහිදී ගිය අතර, වියළුණු පෙඳ පාසි ඒවායේ ඇලී පැවතිණි. ඉදිරියට නෙරා ගිය ස්වාභාවික ව ම නිර්මාණය වූ ගල් ලෙන් වැස්සෙන් හා තද අව්වෙන් කෙනෙකුට ආරක්ෂාව ලබා දුණි. මුලදී, සුදුසු කුටි සාදා ගැනීමට කල් වේලා ගතවන හෙයින් එතෙක් එම ගල් ලෙන්වල භික්ෂූන් සහ සිල් මාතාවන් ලැගුම් ගත්හ. තාවකාලිකව උණ බටවලින් කුඩා මැසි බැඳ තෙත පොළොව නොගෑවෙන ලෙස සකසා ගත්හ. එක් එක් කෙනා, වෙන වෙන ස්ථානවල සාදා ගත් මැසි මත නිදමින් භාවනා කරමින් වාසය කළහ. වැසිකිළි නො තිබූ හෙයින් ඔවුන් ලෙන් සංකීර්ණය කෙළවර තම තමන්ගේ ශරීරකෘත්‍ය කළේ, ගස් උඩ සිටි වඳුරන් විමතියෙන් බලා සිටිද්දී ය.

මූලික අවශ්‍යතාවය වූයේ වතුර ය. පිරිසිදු වතුර ගෙන ඒමට පැය භාගයක් පමණ දුෂ්කර ගමනක් යාමට සිදුවිය. කඳු දෙකක් අතරින් පහළට බැස, ගල්පර අතරින් කඳු පාමුල ඇති කුඩා ඔයෙන් වතුර ගෙන ඒමට සිදු විය. කාගේත්

එකඟතාවය මත කනිෂ්ඨ සිල් මාතාවන්ට වතුර ගෙන ඒමේ කාර්ය ය භාර විය. භික්ෂූහු සහ අසල ගම්වාසී ගොවියෝ නව ආරණ්‍යයට අවශ්‍ය මූලික ඉදිකිරීම්වල නිරත වූහ.

දිනපතා හීල් දානයෙන් පසු අනෙක් සිල් මාතාවන් සමග වතුර ගෙන ඒම සඳහා සිල් මාතා කායිව් ද සහභාගි වූවා ය. හිස් භාජන දෙකක්, ලීයක දෙකොනේ බැඳ, කදක් සේ සකසා වතුර ගෙන ඒමේ රාජකාරියට ඇය ද එකතු වූවා ය. කඳු පාමුල ඔයට බසින තුරු, ඇය සීරුවෙන් බෑවුම් සහිත ගල් අතරින් ගස් අතරින්, සාදා ගත් අඩි පාර ඔස්සේ ප්‍රවේසමෙන් ගමන් කළා ය. ගලායන ඔය ඉවුරේ දණ ගසාගෙන, භාජනවලට පිරිසිදු වතුර පිරෙන තුරු ඇය සතුටින් බලා සිටියා ය. කද දෙපැත්තේ වතුර පිරුණු භාජන දෙක එල්ලා ගෙන, වතුර කද එක් කරකට ගෙන නැවතත් එම දුෂ්කර අඩි පාරෙන් ම කන්ද නැග, අළුතින් ඉදි වෙන ආරණ්‍යයට ඈ පැමිණෙන්නී ය. ගල් පර නගිමින්, ගස් ගල් අතරින් රිංගමින්, කද සම බර ව තබා ගනිමින්, ඇද ගත් වතුර ටික ප්‍රවේසමෙන් අරණට ගෙන එන්නී ය. හති දමමින් අරණ වෙත එන සිල් මාතා කායිව්, වෙහෙස නොබලා දෙවෙනි වරට ද, වතුර ගෙන ඒම සඳහා පහළට බසින්නී ය. තුන් වැනි වරට ද ඇය කන්ද නගින්නී ය. බසින්නී ය. තවත් වරක්.... නගින්නී ය..... බසින්නී ය.

වතුර ගෙන ඒම අතිශයින් වෙහෙසකර කාර්යයකි. දිනපතා එකම ඒකාකාරී වෙහෙස කර නැගීමකි. බැසීමකි. ඇය කිසි අයුරකින් පසු නොබැස සෑම දිනකම ඇයට අයත් වතුර ඇදීම ඉටු කළා ය. ඇගේ මූලික අධිෂ්ඨානයේ කිසිදු වෙනසක් ඇති නො වුණි. ලෞකික ජීවිතයේ විපත් ආධ්‍යාත්මික ජීවිතයේ කුසල් බවට පෙරලා ගැනීමට අදිටන් කරගත් සිල් මාතා කායිව්, ඇය තබන එක් එක් පියවරක් පාසා බුද්ධෝ බුද්ධෝ කියමින්, සිහියෙන් උඩට පහළට ගමන් කළා ය. දකුණු පය තබද්දී බුද් යන්නද, වම් පය තබද්දී ධෝ යන්නද කියමින් සතියෙන් ගමන් කළා ය. ඇගේ හදවත ශාන්ත විය. වතුර භාජන සැහැල්ලු විය. මහන්සිය අඩු විය. වතුර ගෙන ඒම ඇයට ඉතා පහසු කාර්යයක් විය. හැම මොහොතකම ඇය සතියෙන් ගත කළා ය. සෑම පියවරක් ම සතියෙන් තැබුවා ය.

සිල් මාතා කායිව්ගේ සොහොයුරෝ දෙදෙනා ඇය බැලීමට පූ ගාඕ ආරණ්‍යයට ඉඳහිට පැමිණියහ. ඈ ගෙන යන දුෂ්කර ජීවිතය දැක

සොහොයුරෝ දෙදෙනා පුදුම වූහ. ඇයට ඔවුන්ගේ සහාය තිබෙන බව ඔවූහු ඇයට දැන්වූහ. ඔවූහු දෙදෙනා ද සිල් මාතාවන්ට වතුර ඇද දීමට උදව් වූහ. එසේ වුවත් භික්ෂූන් හය දෙනෙකුටත් සිල් මාතාවන් පස් දෙනෙකුටත් එම ජලය ප්‍රමාණවත් නො වී ය. ඈ විඳින දුෂ්කර ජීවිතය දුටු සහෝදරයෝ, අවසානයේ ඇයට ඔවුන් සමග බාන් හුආයි සායි ගමට නැවත එන ලෙස ඇවිටිලි කළෝ ය. ඔවුන් දෙදෙනා තම නැගණිය බලාගන්නා බවටත්, ඇගේ අවශ්‍යතා සපුරා දෙන බවටත් පොරොන්දු විය. ඇගේ ස්වාමියා නැවත විවාහයක් කරගෙන, කායිව් දියණිය ද කැටුව නිවස ද විකුණා වෙනත් ප්‍රාන්තයකට පදිංචියට ගිය බව දැන්වූහ. නමුත් සිල් මාතා කායිව් ඇගේ ආරණ්‍ය ගත ජීවිතය වෙනස් නො කර ආචාර්ය කම් පාන් හිමි සමඟ භාවනායෝගී ව පූ ගාඕ කන්ද ආශ්‍රිත ව වාසය කිරීමට ඉටා ගත්තා ය.

ටික දිනක් ගතවෙද්දී ආරණ්‍යයේ ඉදිකිරීම් කටයුතු ටිකෙන් ටික නිම විය. නමුත් ජල ප්‍රශ්නය උග්‍ර වන්නට විය. කඳු පාමුල ඔයේ සිට දිනපතා වතුර ඉහළට ගෙන එමින්, වැඩි කලක් වාසය කිරීමට අපහසු බැව් කාටත් වැටහුණේ ය. ළඟ පාත වතුර උල්පත් සෙවීම ද නිෂ්ඵල ප්‍රයත්නයක් විය. ජලය ගැන සුන් වූ බලාපොරොත්තු ඇති ව, දිනක් සිල් මාතා කායිව් දැඩි අධිෂ්ඨානයකින් භාවනාවට හිඳ ගත්තා ය. පර්යංකයෙන්, කඳ කෙලින් කොට වාඩි වූ ඇය, තම හදවත තුළට සිත යොමු කරවමින් අධිෂ්ඨානයක් කළා ය.

"මටත් ආරණ්‍යයේ අන් අයටත් දිගට ම මෙම ආරණ්‍යයේ වාසය කිරීමට වාසනාව ඇත්නම්, මේ ළඟපාත ජල උල්පත් අපට හමු වන්න ඕනෑ."

ඇය මෙසේ අධිෂ්ඨානයෙන් යුතුව භාවනාවට යොමු වූවා ය. එදින මැදියම් රාත්‍රියේ ඇය ගැඹුරු සමාධියෙන් පිබිදෙද්දී උල්පත් එකොළොසක් ඇති දර්ශනයක් ඇයට දිස් විය. එම උල්පත් තුරු වැල්වලින්, දිග තණ කොළවලින් වැසී තිබුණි. ඇය මෙම කන්ද අවට ඇවිද හුරු පුරුදු බැවින්, මෙම උල්පත් ඇති ඉසව්ව ඇය භාවනාව තුළින් හඳුනා ගත්තා ය. ප්‍රධාන ලෙනේ සිට එම උල්පත්වලට ඇත්තේ ඉතා කෙටි දුරක් බවද ඈ දුටු දසුනෙන් වටහා ගත්තා ය.

පසු දින සිල් මාතා කායිව්ගේ නොඉවසිලිමත් ඉල්ලීම පරිදි අනෙක් සිල් මාතාවෝ ද උල්පත් සෙවීමට පටන් ගත්හ. ප්‍රධාන ලෙනට ආසන්නයේ, ඇය

දැන්වූ පරිදිම තුරු වැල්වලින් වැසුණු උල්පත් ගණනාවක් හමුවිය. ආචාර්ය කම් පාන් හිමි ලද ආරංචියෙන් සතුටු ව සිල් මාතාවෝ සහ ගම්මුන් ද එකතු ව වල් බිහිවී තිබූ උල්පත් පාදා ශුද්ධ කරන්නට වූහ. සමහර උල්පත් අඩි විස්සක් පමණ ගැඹුරට හැරී තිබුණි. මතුපිට රැඳී තිබූ පාසි කොළ රොඩු ශුද්ධ කොට, සියල්ලෝ ම පිරිසිදු ජල උල්පත් පාදා ගති. ශුද්ධ පවිත්‍ර කිරීම නිම වන විට මුළු ආරණ්‍යයට ම අවුරුද්ද පුරා කිසිදු අඩුවක් නොමැතිව ජලය ඇති තරම් තිබෙන බව ඔවුහු දැන ගති.

මිනිසුන් දුකට පත්වන්නේ
අතහරින්නේ නැතිව තදින් අල්ලා ගන්නා හෙයිනි.
සෑහීමකට පත් නොවීම, ඔවුන් පසු පස,
යන යන තැන හඹා යයි.
ඔබ ඔබේ හදවත දෙස සුපරීක්ෂාකාරී ව බලා
දුකට හේතුව සොයා එය අතහරින්න.

සත්‍යාවබෝධ දොරටුව තුළින් ....

පූ ගාඕ කඳු වැටියේ ගල් ලෙන්වල වාසය කරන කාලයේ, රාත්‍රී කාලයේ භාවනා කරද්දී, බොහෝ අවස්ථාවල අරුම පුදුම අස්වාභාවික සංසිද්ධීන්ට සිල් මාතා කායිව් මුහුණ පෑවා ය. ඒවා ඇය කිසි දිනක අත් නුදුටු අද්භූත දර්ශනයන් ය. ගැඹුරු සමාධියෙන් තරමක් පිබිදුණු පසු, ඇගේ මනස ආධ්‍යාත්මික ශක්තීන් එකිනෙක හරහා යන, හුරුපුරුදු ලොවක් කරා එළඹෙන බව ඇයට වැටහුණි: එම ලෝක, භූත ප්‍රේත ජීවීන් වෙසෙන ගිණිය නොහැකි තරම් තලයන්ගෙන් සමන්විත ය. මෙම තලයන්හි, වෙසෙන ඇතැම් සත්වයෝ, අඳුරු පහත් තලයන්ට අයත් කයක් නැති සත්ත්වයන් ය. සෙසු ජීවීන් උසස් තලයන්ට අයත් ප්‍රභාස්වර වූ දිව්‍ය බ්‍රහ්ම ලෝකයන්ට අයත් ජීවින් ය. ඇගේ භාවනා සිත මෙසේ එවන් තලයන්ට යොමු වීම, ඇයව වෙනත් විශ්වයකට ඇතුළු වන සේ විවෘත දොරටුවකට තල්ලු කළාක් මෙන් ඇයට හැඟුණි.

බල ශක්තීන් දෙකක් දෙපැත්තට අදිමින් ඇගේ අවධානය ලබා ගැනීමට තරග කරන්නා සේ ඇගේ හදවතට දැනුණි. මෙම අවස්ථාව ආචාර්ය මුන් හඳුන්වා දී තිබුණේ උපචාර සමාධිය යනුවෙනි. මේ මොහොත ළඟා වෙද්දී, ඇයට මෙම විශ්ව ශක්තීන්ට ගොදුරු වීමේ අවධානය බොහෝ සෙයින් ඇති බවත්, මෙම දොරටුවෙන් එළියට යෑමට ප්‍රථම, තම සිත දැඩි ඒකාග්‍රතාවයකින්

පාලනය කරගත යුතු බවත් උන්වහන්සේ අනතුරු අඟවා තිබුණි. එම අවවාදය සිල් මාතා කායිව් පිළිගත්ත ද අන්තරාදායක තත්ත්වයකට මුහුණ දීමේ එඩිතරකම ඈ සතුව තිබූ හෙයින්, පිටත බැලීමේ කුතුහලය ඇයට වළක්වා ගත නොහැකි විය.

ඇය එම මොහොතේ දුටු දේ ඇය වශී කළා මෙන් ම භයෙන් බිරාන්ත කළේ ය. සිරුරක් නැති භූතයෝ කතා කරති. - සමහරක් හඬමින් විලාප නගති. ඇය වටකර ගත් මේ ඇත්තෝ ඔවුන්ට පිහිට ඉල්ලා කෑගසමින්, අඳෝනා නගමින්, ආයාචනා කරන්නට විය. ඔවුන් කළ කී දේ නිසා පත්ව ඇති මේ දුක්ඛිත තත්ත්වයෙන් ඔවුනට අනුකම්පාවෙන්, මුදවා ගන්නා ලෙස බැගෑපත් වන්නට විය. සමහරක් විකාර රූප සහ විරූපී දුමාරයන් සේ සෑදුණු භූත රූප ඔවුනට ඇලී තිබුණා සේ ඇයට පෙනුණි. පෙර ආත්මවල ඔවුන් සතු වූ සමහරක් රූප කොටස් භයානක පෙනුමෙන් යුක්තව ඔවුන් පසුපස පාවෙන අවතාරයන් සේ ඇලී එන බවක් ද පෙනුණි. මෙතෙක් නිම නොවූ ඔවුන්ගේ භයානක දිගු ගමනක මෙයද එක් කොටසක් බැව් ඒ බිහිසුණු දර්ශනයන් දුටු ඇයට වැටහුණි. මේ සියල්ලෝ ඇගේ අවධානය අනුකම්පාව කරුණාව ඉල්ලා හඬමින් පින්සෙණ්ඩු වූහ. ඇගේ අනුකම්පාව ලදොත් එම අන්ධකාර වළෙන් ගොඩ ඒමට යන්තමින්වත් රුකුලක් ලැබෙනු ඇතැයි සමහර භූතයෝ ඉඟි කළහ.

ඇගේ භාවනා දර්ශන පථයන්ට බොහෝ අවස්ථාවල දී මරණයට පත්වූ, හිස කඳින් වෙන්වූ තිරිසන් සතුන් ගේ භූත රූප දිස් විය. ඔවුන් අතිමහත් වූ දුක් වේදනා විඳින බවත් එයින් අත් මිදීමට ඔවුනට ඇගෙන් පින් ටිකක් ලබා දෙන ලෙසත් ඉල්ලමින් බැගෑපත් වූහ. එක් දිනක් මැදියම් රාත්‍රියේ සිල් මාතා කායිව් ගැඹුරු සමාධියෙන් පිබිදෙද්දී මෑතක දී මරනු ලැබූ, විඥානය පමණක් ඇති හිස කඳින් වෙන් වූ මී හරකෙකුගේ දර්ශනයක් ඈ ඉදිරියේ දිස් විය. උගේ දෛවය ගැන ලතවෙමින් වේදනාවෙන් ඇය ඉදිරියේ කෑ මොර දුන්නේ ය. භූත අවතාරයක් සේ ඇගේ දර්ශන පථයේ එල්ලී සිටි එම භූත ස්වරූපය, උගේ දුක්ඛිත අතීත කතාව ඇය ඉදිරියේ වහ වහා සංනිවේදනය කළේ ය. සිල් මාතා කායිව් ඇගේ මනසින් එම පණිවිඩය උරා ගනිද්දී, මී ගවයා උගේ අයිතිකරුවා දරුණු කුරිරු මිනිසෙකු බවත් ඔහු හදවතේ කිසිදු කරුණාවක් නැති, සෙනහසක් නැති මිනිසෙකු බවත් පැවසී ය. ඔහු තම මී ගවයා උදේ

සිට සවස් වන තුරු ම නගුලෙන් සී සෑමට හෝ කරත්තය ඇදීමට හෝ යෙදවූ නමුත් දවසේ බර වැඩ නිම වූවාට පසු උෆ කෙරෙහි කිසිදු සැලකීමක් නො දක්වන බව කී ය. එපමණක් නොව මේ කෲර මිනිසා නිතරම උෆට පහර දෙන්නත් නොයෙක් ආකාරයේ ශරීර වධ බන්ධන දෙන්නත් පුරුදු ව සිටි නපුරු මිනිසෙකු බව ද කීවේය. අන්තිමේදී මේ අහිංසක මී ගවයා ගසකට හිර කර බැඳ කුරිරු ලෙස ඝාතනය කර මසට ගත් බව ද වේදනාවෙන් පැවසී ය. මැරෙන්නට කලින් වචනෙන් තේරුම් ගන්නට බැරිතරම් දරුණු වේදනා වධ හිංසා වින්ද බව දැඩි හිත් වේදනාවෙන් යුතුව සිල් මාතාවට සංනිවේදනය කළේ ය. ඒ දරුණු මිනිසා දැවැන්ත පොල්ලකින් ඒ සතාගේ හිසට එක දිගට පහර දෙන්නට වූ බවත් අවට අහස දෝංකාර දෙන්න තරම් මහ හඬින් කෑ මොර දුන් බවත් සිහිසන් නැතිව බිම ඇද වැටෙන තුරු පහර දුන් බවත් කීවේ ය. මේ කතාව කියන මී ගවයාගේ සිරුරක් නැති විඥානය මේ වන විටත් භීතියෙන් තැති ගනිමින් උගේ පැරණි ගවරූප කලාපයන්ට ඇලී සිටියේ ය. එසේ විරූපී ස්වරූපයෙන් සිටිමින් සිල් මාතා කායිව්ගෙන් පිං ඉල්ලා බැගෑපත් වූයේ ය. මෙසේ හඬමින් පිං ඉල්ලා සිටින්නේ මතු මිනිස් ආත්මයක ඉපදීමට ඉන් හැකියාවක් ඇතැයි උෆ තුළ විශ්වාසයක් ඇති හෙයිනැයි ද කීවේ ය.

සිල් මාතා කායිව්ගේ කාරුණික හදවත ඉවෙන් මෙන් හඳුනාගත් ඒ ගව භූතයා උෆ අයත් සත්ව වර්ගයා පොදුවේ විඳින දුක් වේදනා ගැන දිගින් දිගට ම ඇයට විස්තර කළේ ය. කුඹුරු වැඩට ගන්නා මී හරක් මොන තරම් මිනිසාගේ කුරිරුකම් ඉවසා දරා සිටිය යුතු දැයි විස්තර කළේ ය. මිනිසුන් උන් කෙරෙහි කිසිදු දයානුකම්පාවක් දක්වන්නේ නැති බව දැන්වී ය. අනික් තිරිසන් සත්තු ද නිතරම වාගේ මී ගවයාට වෙනස්කම් කරති. ගොවිපොළවල්වල ඉන්නා සතුන් නොයෙක් වද හිංසා දුක් වේදනා විඳිමින් කොපමණ අගෞරවයන්ට ලක්වෙනවා ද? නමුත් ඉතාම පහත් මට්ටමේ ජීවත්වන නීච දුප්පත් මිනිසෙකුවත් එවන් අගෞරවයන්ට පාත්‍ර නොවන බව ද දැඩි දුකකින් කීය. මේ කරුණු නිසා මී ගවයා මතු ආත්මයේ දී මිනිසෙකු වීමට දැඩි කැමැත්තක් දක්වන බව ද අවසානයේ කියා සිටියේ ය.

මිනිසාගේ කුරිරුකම් සම්බන්ධව මී ගවයා කී කතාව සිල් මාතා කායිව් පුදුමයෙන් අසා සිටියා ය. නමුත් ඈ දන්නා හඳුනන ගම අවට වෙසෙන බොහෝ ගොවියෝ කරුණාවන්ත, මිත්‍රශීලී අය බව හොඳින් දන්නා නිසා, ඇයට එම

කතාවෙන් ඇතිවූ සැකය, භාවනාව තුළින් ම මී ගවයාට දැන්වූවා ය. උගේ ස්වාමියා කිසිදු මානුෂික සදාචාරයක් නො දන්නා, නපුරු කුරිරු මිනිසෙක් බව මී ගවයා ඇයට දැන්වූයේ ය. මී ගවයාගේ හදවත ක්‍රෝධයෙන් සහ පලිගැනීමෙන් යුක්ත හෙයින් කතාව විකෘති කරන්නට ඇතැයි ඇයට සැක සිතුණි. සමහර විට මී ගවයාගේ හැසිරීම ද නොහොබිනා හෙයින් ස්වාමියා උෆට හිරිහැර කරන්නට ඇතැයි ද ඇයට සිතුණි. මී ගවයාගේ අයිතිකාරයා උෆට තලන්නට ඇත්තේ සමහර විට සධාරණ හේතුවකට වන්නත් පිළිවන් බව ඇයට ඒත්තු ගියේ ය. මෙම අදහස් ඇගේ හදවත විවෘත කොට මී ගවයාට සන්නිවේදනය කළා ය.

"ඔබ කවදා හෝ අන් අය සිටවූ එළවඳු ඒ ගෙවතුවලට වැදී කෑවා ද? කුඹුරුවලට යාබද ව වගා කළ එළවළු කොටු ඔබ කා විනාශ කළේ ද? මේ ගම්මානය අවට ජීවත් වන මිනිස්සු කරුණාවන්ත හොඳ ගොවියෝ. ඔබත් වැරදි කළේ නැතිනම් ඔවුන් ඔබට වධ හිංසා කරන්නේ මොකට ද? මට හිතෙන්නෙ ඔබත් වැරදි වැඩ කරපු නිසා ඒ වාගේ දඬුවමක් ලැබෙන්න ඇති කියලයි. මම හරි නේ ද?" යි ඇය මනසින් විමසුවා ය.

මී ගවයා එම ප්‍රශ්නයට දුන් පිළිතුර සිල් මාතා කායිච්ගේ හදවත සසල කරවීය. "මම ඒ දේවල් කළේ මගේ ම මෝඩකම නිසයි. මගෙන් මුළු දවස තිස්සේම වැඩ අරගෙන මාව ටික වේලාවකටවත් තණකොළ ටිකක් කන්න තණබිමකට නිදහස් කළේ නැහැ. මගේ බඩගින්න මගේ තෙහෙට්ටුව නිසා මට කන්න පුළුවන් ඕනෑම ගසක් පැළෑටියක් කොහේ තිබුණත් මම කෑවා. මොන වර්ගයේ එළවළුවක් වුනත් මම කිසිම සැලකීමක් නැතිව කාගෙන කාගෙන ගියා. සමහර එළවළු වගාවන්ට අයිතිකරුවෙක් ඇතැයි නේද කියලාවත් මට හිතුනේ නැහැ. මම හොරකමක් කරනවා කියලා මට කොහොමටවත් හිතුනේ නැහැ. බඩගින්න නිසා කෑවා. මිනිස්සු කතා කරන භාෂාව මම දැන සිටියානම් මම ඒ වැරැද්ද කිසිදාක කරන එකක් නැහැ. මිනිස්සු තිරිසන් අපට වඩා බුද්ධිමත්. ඒ නිසා තිරිසන් අපේ ජන්ම ගති ගැන මිනිස්සු මීට වඩා අනුකම්පා කරලා සමාව දෙන්න ඕනෑ. මිනිසුන්ගේ සදාචාර සම්පන්න සිරිත් විරිත්, තිරිසන් වූ අපි අතින් කැඩුණොත්, ඒ ඇත්තෝ අපට අනුකම්පා කරන්න එපායැ. එහෙම නැතිව ඔවුන්ගේ බලය පාවිච්චි කරලා අපට හිරිහැර කරන එක හොඳ නැහැනෙ? හොඳට හැදිච්ච සදාචාර සම්පන්න මිනිහෙක් ඒ වාගේ ලජ්ජා නැතිව හැසිරෙන්නෙ නැහැ. ඔබ කීවා වාගේ ම මේ පළාතේ බොහොමයක් ගොවියෝ

කරුණාවන්ත තැන්පත් මිනිස්සු. නමුත් මගේ අයිතිකාරයා, ටොං මහත්තයා මනුෂ්‍ය සදාචාරය නො දන්නා මහා නපුරු වස මිනිහෙක්. ඒ වැදගම්මකට නැති ජරා මිනිහා හිතේ තෙත් ගතියක් නැති සමාව දීමක් කරුණාවක් නැති දුෂ්ට මිනිහෙක්. ඔහු ඔහුගේම වර්ගයාට නපුරුකම් කරන මිනිහෙක්. අපි වාගේ තිරිසන් සතුන්ට කොහොම සලකයි ද?"

කුඩා කල සිට ම ගොවිපොළ සතුන් ගැන, සිල් මාතා කායිව් හට තිබුණේ හදවත පතුලෙන් ම පැන නැගි කරුණාවකි. ඈ ඔවුන්ගේ එළ හරකුන්ට සහ මී ගවයන්ට ගෙදර පිසූ බත් ටික ටික කෑමට දුන්නා ය. එසේ කෑමට දී, උන්ගේ කනට රහසින් මෙසේ කීවා ය. "ඔයගොල්ලොනුත් අපේ කුඹුරේ මහන්සි වෙලා වැඩ කරපු නිසා බත් කන්න ඔය ගොල්ලන්ටත් අයිතියක් තියනවා" යි කියමින් උන් කන දෙස බලා සතුටු වූවා ය. මේ නිසා ගොවිපොළ සතුන් ඇයට ආදරය කළා ය. ඈ ඔවුන් ගැන සැලකිලිමත් වන බව එම සත්තු දැන සිටියහ. ගවයන් ඇයට කොතරම් කොපමණ හිතවත් වූවාදැයි කියතොත් ඔවුනගේ බෙල්ලේ බැඳි සීනුව කැඩී බිම වැටුණු කල්හි, ඈ ළඟට දුව ගොස් සීනුව වැටුණු තැනට ඇය කැටුව ගොස්, නැවතත් එය බෙල්ලේ බඳවා ගනී. සීනුව නැතිවීම ගවයන්ට නිදැල්ලේ හැසිරීමට ඉඩක් ලැබෙන කරුණක් වුවත් උන් ඇය සමඟ සෙනෙහෙබර එකමුතුකමක් ඇතිකර ගති.

කරුණු කෙසේ වෙතත් තම ස්වාමියාගෙන් හොඳ සැලකිලි ලැබුවත් ඔවුන් තිරිසන් ආත්මයන්හි උත්පත්තිය ලබන්නේ, කර්ම න්‍යායන්ට අනුකූලව දුක්ඛිත ජීවිත ගත කිරීම උරුම කර ගත් අය බව සිල් මාතා කායිව්ට රහසක් නො වී ය.

ක්‍රෝධය සහ පළිගැනීම දුගතිගාමී ව ඉපදීමට ප්‍රධාන හේතූන් බව සිල් මාතා කායිව් දැන සිටියා ය. ඇය ඉදිරියට පැමිණි අවාසනාවන්ත අමුත්තාගේ කෝපය විනිවිද දුටු සිල් මාතාව ක්‍රෝධය සහ පළිගැනීම කෙනෙකුගේ මනසට ඇතුළු කර ගත් විට එයින් ඇතිවන භයානක විපාක ගැන එම ගව වෙසින් ආ භූතයාට ඉගැන්නුවා ය. එවන් සිතිවිලි ඇතිවීම ඊළඟ භවයේ මිනිස් ආත්මයක් ලැබීමට බාධාවක් වන බව ද කියා දුණි. ඔහු මිනිස් ආත්මයක් ලැබීමට ඇත්තෙන් ම අපේක්ෂා කරන්නේ නම් එම විනාශකාරී කෙලෙස් පාලනය කරගත යුතු වේ.

ශිෂ්ට සම්පන්න මිනිසෙකුගේ ජීවිතයේ පදනම පංච ශීලය බව ඇය එම භූතයාට පහදා දුන්නා ය. මේ භූත ජීවියාට නැවත මිනිස් ආත්මයක් ලැබීමට කිසියම් ඉඩ ප්‍රස්තාවක් ඇත්තේ නම්, මෙම මූලික සිල් පද රකින බවට පොරොන්දු විය යුතු බැව් පහදා දුණි. ඔහු සතුන් නො මැරිය යුතුයි; සතුන්ට හිංසා නොකළ යුතුයි ; සොරකම් නොකළ යුතුයි, අන් අයට අයත් දේ නොගත යුතුයි ; මිනිසුන්ගේ ගෙවතුවල වගා කළ එළවළු වාගේ දේ; කාමය වරදවා නො හැසිරිය යුතුයි ; ඔහු බොරු නො කිය යුතුයි ; උවමනාවෙන් අනුන් නො රැවටිය යුතුය; මත්වන වෙරි වන කිසිවක් පානය නො කළ යුතුයි.

සතුන් මැරීමෙන්, සොරකම් කිරීමෙන්, කාමය වරදවා හැසිරීමෙන්, සහ බොරු කීමෙන් අනුනට වරදක් කරනවා සේ ම මිනිසුන් අතර අන්‍යෝන්‍ය සහයෝගය ඇති කිරීමේ අවංකභාවය සහ විවෘතභාවය ඉන් කඩ කෙරේ. මත් ද්‍රව්‍ය සහ රහමෙර ගැනීමෙන් පිරිසිදු මනස වසා දමයි. ඉහතින් කී වැරදි කිරීමට පහසු ආධාරකයක් වේ. කර්මානුකූලව බැලුවහොත් මෙම ක්‍රියාවන් තිරිසන් ආත්මවල, ප්‍රේත ආත්මවල නරකාදිවල උප්පත්ති ලැබීමට හේතු වේ. දුගතිගාමී ව ඉපදුණු කළ, විඳින දුක් අතිමහත් ය. ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනීමට ඇති අවස්ථා හීන කරවයි. සුගතිගාමී උත්පත්ති ලැබීමට අවශ්‍ය සංස්කාර ඇතිකර ගැනීම උගහට වේ. එමනිසා පංච ශීලය සමාදන් වී රැකීමෙන් අපායාදී දුගතිගාමී තලයන්හි ඉපදීමෙන් වැළකේ. මිනිස් ආත්මයක් ලැබීමට උදව් වේ. එනිසා ඔබ මෙසේ පංච ශීලය ශ්‍රද්ධාවන්ත ව රැකීමෙන් සහ වැරදි සිතිවිලි, වැරදි වචන, වැරදි ක්‍රියා, නොකර සිටීමෙන් මිනිස් ආත්මයක් ලැබිය හැකි යයි ඇත්තෙන් ම අපේක්ෂා කළ හැකිය. මෙම ආත්මයේ බැරි වුවහොත් ලබන ආත්මයේ හැකිවනු ඇත.

බලාපොරොත්තු සුන් වූ එමෙන් ම විනාශයට පත් වූ භූතයා ගැන මහත් වූ අනුකම්පාවකින් සිල් මාතා කායිවි එම භූතයාට ඇගේ පින් සහ කුසල් අනුමෝදන් කරවීමට සිතුවා ය. අවම වශයෙන් එම පුණ්‍ය බීජ මිනිස් ආත්මයක් ලබාගැනීමට යම් තරමින්වත් ඔහුට උපකාර වේ යයි ඇය සිතුවා ය.

"මා එකතු කර ගත් කුසල්දම්, පින් ඔබට අනුමෝදන් කරමි, අනුමෝදන් වේවා! ඒ හේතුවෙන් ඔබේ යහපත් ක්‍රියාවන් ආරක්ෂා කොට මෙම ආත්මය පෝෂණය කර, සුගතිගාමී ආත්මයක ඉපදීමට අවශ්‍ය ආධ්‍යාත්මික ගුණධර්ම වැඩෙන මාර්ගයට යොමු වීමට ඔබට හේතු වාසනා වේවා!"

සිල් මාතා කායිව්ගේ උත්තම ශීලය ගැන අතිශයින් උද්දාමයට පත් වූ මී ගවයාගේ හිස කඳින් වෙන් වූ අවතාරය, ඒ භූතාත්මය උන් සිතන පතන හොඳ ආත්මයක ඉපදීමට දැන් වාසනාව ලැබුණේ යයි සතුටු සිතින් ප්‍රබෝධවත් ව ඇගෙන් වෙන් වී නො පෙනී ගියේ ය.

පසු දින අලුයම ගම්මානයේ කෙනෙකු කැඳවා, පෙර දින රාත්‍රියේ ඈ අත් දුටු සංවාදය ගැන රහසේ ඔහුට විස්තර කොට අසල ගම්මානයක ටොං නැමැති පුද්ගලයෙකු සිටින්නේ දැයි විමසී ය. ඔහුට මී ගවයෙකු සිටියේ ද යන්නත්, උෆට කුමක් සිදුවී ද යන්නත් සොයා බලා දන්වන ලෙස ඔහුට දැන්වූවා ය. ටොං නමැත්තෙකු සිටියහොත් ඔහුට මෙම විමසීම ගැන කිසිවක් නො කියන ලෙස ද අවවාද කළා ය. එසේ ආරංචි වුවහොත් ඔහු අපකීර්තියට පත්වූයේ යයි සිතා, ඈ ගැන පාප සිතිවිලි ඇතිකර තවත් පව් ඔහු සිදුකර ගනු ඇතැයි ඇය බිය වූවා ය.

සිල් මාතාව එම ගම්වැසියාගෙන් අදාළ විස්තරය විමසූ වහා ම, ටොං නමැත්තෙකු තමා ජීවත්වන ගමේ සිටිනා බවත් ඔහු හොඳින් හඳුනන බවත් ඇයට කීවේ ය. ඊයේ රාත්‍රී මේ ටොං නැමැති මිනිසා ඔහුගේ මී ගවයා ගසක බැඳ මැරූ බවද ඔහු දන්නා බැව් කීවේ ය. ඒ අසරණ සතා මරණ වේදනාවෙන් කෑ ගැසූ විලාපය මුළු ගමට ම ඇසුණ බවත් ඔහු කීවේ ය. ගවයා මැරුවාට පසුව ඔහුගේ මිතුරන්ට ලොකු සාදයක් පවත්වා, උගේ හරක් මස් බැද සංග්‍රහ කළ බවත් පිළිකුලෙන් කීවේ ය. උදේ පාන්දර වන තුරුම ඒ සාදය තිබුණු බවත් සහභාගි වුණු මිනිස්සු මත් පැන් බීබී කෑ කෝ ගසමින් සිනාසෙමින් විනෝද වූ බවත් පැවසී ය.

මෙවන් පාපිෂ්ට ක්‍රියා සිල් මාතා කායිව්ගේ සිත ශෝකයෙන් සසල කරවී ය. දරා ගත නොහැකි තරමේ සිත් වේදනාව, ඇයට පෞද්ගලිකව ඇති වූ මානසික පීඩාවක් ලෙස ඇයට දැනුණි. මිනිස් වර්ගයා උරුම කොට ඇති සදාචාරාත්මක විශ්වාසයට ද්‍රෝහී වූ ඔහු ඇගේ ම පුතෙකු ලෙස ඇයට දැනුණේ ය. අපරාධකරුවා සහ මරණයට ලක් වූ සතා, තැනින් තැන වරින් වර මේ සංසාර චක්‍රයේ චෝදනාව සහ පළිගැනීම, කෲරත්වය සහ කෝපය යන කෙලෙස්හි ගැලෙමින්, ඉපිදෙමින් මැරෙමින් කැරකි කැරකී දුගතිගාමී අඳුරු ආත්මයන්හි සැරිසරනු ඇත. මරණයට ලක් වූ මී ගවයාට ඇති එකම පිළිසරණය, උගේ සිතෙහි හටගත් ක්‍රෝධය සහ වෛරය අතහැර අන් අයගේ

පුණ්‍ය ක්‍රියා දැක සතුටු වීමයි. භූත ප්‍රේත ආත්මයන්ට පුණ්‍යක්‍රියා කිරීමට හැකිකමක් නො තිබුණ ද අන් අයගේ පුණ්‍ය ක්‍රියා අනුමෝදනා වීමෙන් යහපතක් වන බවට තමා තුළ විශ්වාසයක් ඇති කරගෙන සතුටු විය හැක. මිය ගිය මී ගවයා සිල් මාතා කායිවි සමඟ සමීප සම්බන්ධතාවයක් ඇති කර වාසිදායක උපතකට මුල පිරුවේ ය. සංසාරයේ මෙතෙක් සැරිසරන සත්ත්වයෝ මේ සිද්ධීන් ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. ශීලය ප්‍රතික්ෂේප කරන, ශීලයේ නො පිහිටන, මූලික සංවර ශීලය රැකීම පැහැර හරින ඕනෑම කෙනෙකුට මෙවන් තත්ත්වයකට මුහුණ පෑමේ අවදානම ඇත.

සාමාන්‍ය තිරිසනෙකු වාගේ
නිකම් කාලා බීලා නිදා ගන්න එපා
ලෞකික ජීවිතයේ සැප සම්පත් විඳීමට ඇති ආශාවෙන්
ඒවා පසු පස නො දුවන්න හිතට ගන්න.
ඊළඟ ආත්මය, කෙසේ විය හැකිදැයි සාධාරණ සැකයක් ඇතිකර ගන්න.
ඔබේ ජීවිතයේ
අඳුරු යට ගින්දර මෙන් සෙමෙන් දැවී දැවී
නිබෙන ගිනි ගොඩ දෙස
අලස ව වාඩි වී නිකරුණේ බලා නොසිටින්න.

වල් ඉෆරා

සිල් මාතා කායිව් භූතයන් ප්‍රේතයන් සමඟ, එනම් මිනිස් ඇසට නො පෙනෙන ජීවීන් සමඟ මිනිසුන් කතා කරන භාෂාවෙන් නොව, සෑම සත්ත්වයෙකුට ම පොදුවේ උන්ගේ සිත්වලින් කතා කළ හැකි විඥාන භාෂාවෙන් කතා කිරීමට හැකිකමක් දැක්වූවා ය.

ඔවුනගේ විඥාන ධාරාව තුළින් ඔවුන් අපේක්ෂිත අරමුණ අඩංගු සිතිවිලි සහ හැඟීම් තව කෙනෙකුට දැන්වීමේ ශක්තිය ඇත. මෙය මිනිස් විඥානයෙන්, කෙනෙකුට දැන්විය යුතු අදහසට පරිවර්තනය වී එක්තරා විලාසයකින් සන්නිවේදනය වන ක්‍රමයකි. විඥාන ධාරාවකින් නික්මවන එක් සිතිවිලි තරංගයක් විශේෂිත අරුතක් හා අවශ්‍යතාවයක් සකසා ඇවැසි පුද්ගලයාට සන්නිවේදනය කරයි. එය නිවැරදි පිරිසිදු පණිවිඩයක් වනු ඇත. තව කෙනෙකුගේ දැනීම අඩංගු විඥාන ධාරාවක් සමඟ මෙම සිතිවිලි තරංගය ඡේදනය වූ විට, සන්නිවේදනය ලබා ගන්නා විඥානයට ඉඳුරා ම බුද්ධිමත් අදහසක් හෝ පණිවිඩයක් සම්පූර්ණයෙන් එමඟින් දන්වා සිටීමේ හැකියාව ඇත.

වාචික නොවන මෙම සංවාද ක්‍රමය, උපයෝගි කරගනිමින් සිල් මාතා කායිව් පියවි ඇසට නොපෙනෙන භූත අමුත්තන් සමඟ ඔවුනගේ කතාවලට

සවන් දෙමින් ඔවුනගේ අතීත සිද්ධීන් ගැන ප්‍රශ්න කළා ය. ඇයට වුවමනා කළේ ඔවුනට උදව් කිරීමයි ; ඇයට කළ හැකිව තිබුණේ ඇගේ ජීවිත කාලය තුළ ආධ්‍යාත්මික ව එකතු කරගත් සියලු පින් හා භාවනාවෙන් ලත් කුසල් ඔවුනට අනුමෝදන් කිරීමයි. එසේ පින් අනුමෝදන් වීමෙන් යහපත් ඵල නෙළා ගැනීම ඔවුන් සතු දෙයකි.

සිල් මාතා කායිවිගේ සමාධි සිත තුළින් තවත් අද්භූත දර්ශනයක් අත්දැකීමට ඇයට හැකි විය. මරණයට පත් හිස කඳින් වෙන් වූ වල් ඌරෙකුගේ විඤ්ඤානය භූත ස්වරූපයකින් ඇගේ භාවනා දර්ශන පථයට යොමු විය. පූ ගාඕ කන්දට තරමක් ඈතින් තනිව ම ආහාර සොයමින් වනයේ ඔබ මොබ හැසිරෙද්දී, ගමේ දඩයක්කාරයෙකු අතින් මේ ඌරා මරුමුවට පත් ව ඇත. වන සතුන් වතුර බීමට නිතරම එන යන දිය කඩිත්තක් සමීපයේ මේ දඩයක්කාරයා සැඟවී සිට එම සතා මරා ඇත.

දිනක් අලුයම, හිරු නැගීමට ප්‍රථම සිල් මාතා කායිවිගේ දර්ශන පථයට නිරායාසයෙන් ම වල් ඌරෙකුගේ භූත රුවක් මැවී පෙනුණි. මෙවන් දසුන් දැක පුරුදු ඇය වහාම ඇගේ විඤ්ඤාන ධාරාව ඌරා වෙත යොමු කොට තමා හමුවීමට පැමිණි හේතුව විමසුවා ය. තවමත් බියේ ගැහෙමින්, ගොත ගසමින් පැකිළෙමින් ඌ කතාකරන්නට විය. ඩුම් නමැති දඩයක්කාරයා, ඌ දිය කඩිත්ත දෙසට එද්දී මැරූ බව කීවේ ය. දිය කඩිත්ත ළඟට එද්දී දඩයක්කාරයෙකුගෙන් තමන්ට අනතුරක් වීමට ඉඩ කඩ ඇතැයි සැකයක් ඇති නොවූයේ මන්ද යන්නත් එමෙන් ම ප්‍රවේසම් නො වුණේ මන්ද යන්නත් ඇය උගෙන් ප්‍රශ්න කළා ය.

සෑම මොහොතක ම දඩයක්කාරයන්ගෙන් බෙහෙවින් ප්‍රවේසම් වීමට ඌ නිතර ම සෙවිල්ලෙන් ඉන්නා බව ඇයට බැගෑපත් වෙමින් කීවේ ය. උන්ගේ ජීවත් වීම රඳා පවතින්නේ එසේ විමසිල්ලෙන් සිටියහොත් පමණක් බව ඌරා කීවේ ය. වනසතුන්ගේ ජීවිත අතිශයෙන් දුෂ්කර වූ සිතිය නොහැකි තරම් ගැටලුවලට මුහුණ දෙන, දැරිය නො හැකි තරම් දුක්ඛිත වූ එකක් බව කී ය. ස්වභාවධර්මයේ දයානුකම්පාව මත පූර්ණ විශ්වාසය තබා, වනාන්තරයේ වාසය කරන වල් ඌරන් සෑම මොහොතක ම ජීවත් වූයේ බියෙන් හා සැකයෙනි. උන්ගේ ජීවිත ස්වභාව ධර්මයේ විපරියාසයන්ට නිරන්තරයෙන් ලක්වී විනාශ වන්නකි. දඩයක්කාරයන්ගේ සහ උගුල් අටවන්නන්ගේ මරණීය තර්ජනයන්ට

ද කොයි මොහොතේ ලක් වේදෝ යන බියෙන් සහ ත්‍රාසයෙන් මේ සතුන්ට ජීවත්වීමට සිදු වී ඇත. වසර ගණනාවක් තම ජීවිත රැකගනිමින් මේ උෆරා ජීවත් වුව ද අවසානයේ මේ දඩයක්කාරයාට ගොදුරු වීමට සිදු විය.

නැවත වරක් වන සතෙකු ව ඉපදීමට ඉඩකඩ ඇතැයි යන බිය තමාට ඇති බව වල් උෆරා සිල් මාතා කායිව් හට කීවේ ය. විශ්වාස කරන්නට බැරි තරම් නිරන්තර භයකින් හා සැකයකින් ද දැඩි දුක් වේදනා කන්දරාවකට මැදි වෙමින් ද නැවතත් වන සතෙකු සේ ජීවත් වන්න සිදු වේ යයි තමා අතිශය භයින් සිටින බව උෆරා වෙව්ලමින් කීවේ ය. උෆරෙකුට කිසිදිනක විවේකයෙන් සිටීමටවත් බියක් සැකක් නැති ව සිටීමටවත් නොහැක. නැවතත් තිරිසන් සතෙකු ව ඉපදීම නො වැළැක්විය හැකි යයි දැන බියට පත් උෆරා සිල් මාතා කායිව් හමුවට පැමිණියේ ඇගේ ශීලයේ සහ කුසල් බලයෙන් පින් අනුමෝදන් වී, මනුෂ්‍ය ආත්මයක් ලබා ගැනීම සඳහා මහන්සි වීමටයි. උෆරු වෙසින් මැවී සිටි භූතයා සුගතගාමී ආත්මයක් ලැබීමට උෆ සතුව ප්‍රමාණවත් කුසල් සහ පින් එකතු වී නොමැති බැව් දැඩි ශෝකයෙන් පැවසී ය. වටිනාකමින් යුත් කිසිවක් ඇයට දීම සඳහා උෆරා සන්තක ව නො තිබුණි. නමුත් ඊයේ රාත්‍රී වෙඩි කා මැරුණු උගේ අලුත් පිරිසිදු මස් පමණක් ඉතිරි ව ඇතිබැව් උෆ දැන සිටියේය. උෆරාගේ විඥාන ධාරාව තුළින්, උෆරා තම මස් වළඳන ලෙස සිල් මාතා කායිව්ගෙන් ඉල්ලා සිටියේ ය. එතුමියගේ උතුම් ආධ්‍යාත්මික ජීවන රටාව ඉදිරියට ගෙන යෑම සඳහා ශක්තිමත් ශරීරයක් ඇතිකර ගැනීමට ඒ මස් උෆ කෙරෙහි අනුකම්පාවෙන් වළඳන ලෙස ඉල්ලා සිටියේ ය. එසේ තම මස් දන් දීමෙන් උෆට කුසල් රැස් කර ගැනීමට හැකිවනු ඇතැයි ද දැන්වී ය.

පෙර දින තමාට වෙඩි තබා මැරූ දඩයක්කාරයාගේ, පවුලේ සාමාජිකයන් ඒ මස් පිළියෙල කරගෙන හීල් දානය සඳහා පසුදින උදෑසන ගෙන ඒමට නියමිත බව උෆරා ඇයට දැන්වූයේ ය. එසේ ගෙනෙන මස් උෆ කෙරෙහි අනුකම්පාවෙන් වළඳන ලෙසත්, එම මාංශ දානය මතු භවයේ මනුෂ්‍ය ආත්මයක් ලබා ගැනීමට තරම් කුසල් එක් රැස් කර ගැනීමට හැකි දානයක් වන බවට තමා තුළ විශ්වාසයක් ඇති බවත් දැන්වී ය. තමාට වුවමනා කරන්නේ තම ශරීරයේ හොඳ ම මස් ටික සිල් මාතාවට පූජා කිරීමට බවත්, නමුත් මිනිසුන් ස්වභාවයෙන් ම ලෝභ සහගත හෙයින් හොඳ මස් ටික දඩයක්කාරයාගේ ගෙදර තබා ඉතිරිය ආරණ්‍යයට ගෙන ඒමට ඉඩ ඇති බවත් උෆරා වැඩි දුරටත් ඇයට දැන්වී ය.

ඈ ඉදිරියට පැමිණි එම අමුත්තා කළ ඉල්ලීම අසා සිටි සිල් මාතා කායිව් විමතියෙන් වශී වූවා ය. වසර ගණනාවක් භාවනා කළ ද මිය ගිය තිරිසනෙකුගේ විඥානයක් තම ශරීර මාංශ පූජාකර පින් බලාපොරොත්තු වන අවස්ථාවකට ඇය කිසි දිනක මුහුණ පා නොමැත. ඌරා පත්වී ඇති අසරණ තත්ත්වය සලකා බලා හදවතේ උපන් දැඩි අනුකම්පාවෙන් මෛත්‍රී කිරණ එම භූත ස්වරූපය වෙත යොමු කොට නිශ්ශබ්ද ව එම දානය පිළිගන්නා බවට ඇඟෙව්වා ය. සිල් මාතා කායිව් වල් ඌරාට දානයේ ආනිශංස පහදා දී, යහපත් කුසල ක්‍රියාවන්ගෙන් ලබන යහපත් ප්‍රතිඵල ගැන සතුට පළ කළා ය. දුගතිගාමී ව උපදින සෑම සත්ත්වයෙකුට ම පංච ශීලයෙන් ලැබිය හැකි යහපත් විපාක පහදා දුන්නා ය. එම ශීලය මිනිස් ආත්මයක් ලැබීම සඳහා මූලික පදනම වන බවත්, සිත කය වචනය හික්මවා ගැනීම සඳහා මෙම පංච ශීලය සමාදන් වී රකින ලෙස ඇය, ඌරාට තරයේ අවවාද දුන්නා ය. වල් ඌරාගේ සිතෙහි ඇති මිනිස් ආත්මයක් ලැබීමේ ආශාව මල් පල ගැන්වීමට ඇය ඇගේ ශීලානිශංස සහ කුසල් අනුමෝදන් කරවන බව සන්නිවේදනය කළා ය. සිල් මාතාව තමා කෙරෙහි තැබූ විශ්වාසය ගැන අතිශයින් සතුටු වූ වල් ඌරා ඇගේ ආශීර්වාද හේතුවෙන් තමාට පිටුවහලක් වේය යන විශ්වාසයෙන් සහ ගෞරවයෙන් ඇගෙන් සමුගෙන නො පෙනී ගියේ ය.

පසුදින පාන්දර හිරු නැග එත් ම ප්‍රධාන ශාලාවට එක් රැස් වූ භික්ෂූන්ට සහ සිල් මාතාවන්ට එම විශ්මයජනක විස්තරය සන්සුන් ව කීවා ය. වල් ඌරාගේ සම්පූර්ණ කතාවත් උගේ කාරුණික ඉල්ලීමත් සිල් මාතාව ඔවුනට පැහැදිලි ව විස්තර කළා ය. ඒ අද්භූත ශෝකී කතාව අසා දඩයක්කාරයාගේ පවුලේ උදවිය ඌරු මස් හීල් දානයට ගෙන ආවොත්, එම තිරිසනාට අනුකම්පාවෙන් එම මස් පිළිගන්නා ලෙස ඉල්ලා සිටියා ය. තිරිසනාගේ උදාර මාංශ දානය ඌ කෙරෙහි ගෞරවයෙන් පිළිගෙන වළඳන ලෙසටත් එම ඌරාට මිනිස් ආත්මයක් ලබා ගැනීමට හැකි වේවා යයි ප්‍රාර්ථනා කරමින් පින් අනුමෝදන් කරන ලෙසත් ඇය රැස් වූ හැමගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටියා ය.

හීල් දානයට වේලාව ළංවෙද්දී දඩයක්කාර ඩුම් මහතාගේ බිරිඳ ආරණ්‍යය වෙත පැමිණ තෙලෙන් බැද සකස් කරන ලද ඌරු මස් ආචාර්ය කම්පාන් සහ අනෙක් භික්ෂූන් වහන්සේලාට ගෞරවයෙන් පිළිගැන්වූවා ය. උන්වහන්සේලා එම ඌරු මස් ලැබුණු ක්‍රමය ගැන විමසද්දී, දඩයක්කාරයාගේ බිරිඳ එම මස් ලැබුණු ආකාරය කිසිවක් නො සඟවා පැහැදිලි කළා ය. සිල් මාතා කායිව්

කළ විස්තරය අකුරටම නිවැරදි බව කාටත් වැටහුණි. එම අවාසනාවන්ත තිරිසනාගේ දුක් වේදනා යම් ආකාරයකින් හෝ තුනී වේවා යයි අනුකම්පාවෙන් හා මෛත්‍රියෙන් සිතා එම මාංශ දානය පිළිගත්හ.

තණ්හාව, මරණය හා නැවත ඉපදීමට සම්බන්ධ කරුණක් බවත් ඒ හේතුවෙන් නිමක් නැති දුක් වේදනා ජීවිතවලට ලබාදෙන බවත් සිල් මාතා කායිව් දැන ගත්තා ය.

ලෝභයෙන් මනස පුරවා ගත් මිනිස්සු ද්වේෂයෙන් පෙළඹුණු මිනිස්සු එසේ ම තම තමන්ගේ කර්මයන් නිසා මෝහය නමැති මහා සමුද්‍රයේ පිළිසරණක් හෝ අරමුණක් හෝ නැතිව පිහිනන මිනිස්සු ඇයට මුණගැසී ඇත. දුගතිගාමී පහළ විඤාන තලයන්හි සිරවී සිටින සත්ත්වයන් හට අවශ්‍ය වූ තන්හි, රැකගත් ශීලයක් නොමැත. රැස් කරගත් පිනක් නොමැත.

පෙර ආත්මයන්හි එම භූතයන් මිනිස් ආත්මයෙහි ඉපිද සිටිය දී පරාර්ථකාමී ව දන් දී නැත. ශීලයෙන් ලැබිය හැකි ආරක්ෂාව ගැන කිසිදු තැකීමක් කර නැත. මනුෂ්‍යාත්මයෙහි සිටිය දී ඔවුන් තම අනාගතය සඳහා පින් රැස් කර ගැනීමට අපොහොසත් ව ඇත. එනිසා මරණයත් සමඟ අඳුරු ආත්මයන්හි ඉපිද පින් රැස් කරගැනීමට අපොහොසත් ව දුක් විඳිති. මෙසේ පින් රැස් කර ගැනීමට නො හැකි ව අඳුරේ සිටිනා භූතයෝ, ප්‍රේතයෝ, පිසාචයෝ පිනක් කර කියා ගැනීමට නො හැකි ව අසරණ ව අන් අයගෙන් පිහිට පතති. මනුෂ්‍යාත්මයේ ජීවත් වන ශීලවන්ත මිනිසුන් තම සිත කය වචනය සංවර කර ගනිමින්, රැස් කරගන්නා පින් මෙම අමනුෂ්‍යයන් හට අනුමෝදන් කිරීමට අපොහොසත් වුවහොත්, ඔවුන් සුගතිගාමී තලයක ඉපදීමට නොහැකි ව අතරමං වනු ඇත. එම දුක්බිත ආත්මයේ අනේකවිධ දුක් වේදනා විඳිමින් ඔවුනගේ කර්ම ශක්තිය ගෙවී යන තුරු හෝ එම පිළිකුල් ආත්මභාවයේ ආයු කාලය නිම වන තුරු හෝ දුක් කන්දරාවකට මැදිවී ජීවත් වීමට සිදුවේ. මේ භූතයන් සිල් මාතා කායිව් හට පෙනුණේ, අයාලේ දිවෙන සත්ත්ව කොට්ඨාසයක් හැටියට ය. ගහක් කොළයක් නැති මහ පොළොවක් නැති අවකාශයක නිදැල්ලේ පාවි පාවී යන, කිසිදු හිමිකරුවෙක් නොමැති තමන් ඇතිකළ දුක් ගින්දරවල දැවෙමින් සැරිසරන භූත පිරිසක් හැටියට ය. තමා විසින් කරන ලද අකුසල ක්‍රියා හේතුවෙන් උදා කරගත් අවාසනාවන්ත තත්ත්වයන්හි දුකින් ජීවත් වෙද්දී ඔවුන් විඳින අනන්ත වූ දුක් වේදනා කම්කටොළු හමුවේ කොතැනක ඉපදුණත් කම් නැත යන හැඟීම ඇති වනු ඇත.

සියලු විඥාන විෂය පථයන් සහ
සියලු සත්ත්වයන් සිතෙන් ආරම්භ වේ.
එහෙයින් ඔබ ඔබේ සිත දෙස
දැඩි අවධානයක් යොමු කිරීම
ඉතාමත් ම යෝග්‍ය ය.
එතැන දී ඔබට මුළු විශ්වය ම හමුවනු ඇත.

කඳු වැටියේ භූතාත්ම

ආචාර්ය කම් පාන් හිමිගේ නායකත්වය යටතේ පූ ගාඕ කන්දෙහි ආරම්භ කළ ආරණ්‍යය ඉතා උසස් ආධ්‍යාත්මික පරිසරයකට පත් වී දියුණු විය. භික්ෂූන් වහන්සේලා සහ සිල් මාතාවෝ දැඩි කැපවීමකින් හා උනන්දුවකින් භාවනා පුහුණුවෙහි නිරත වූහ. ආචාර්ය කම් පාන් හිමි ඉතා ප්‍රසිද්ධ කම්මට්ඨානාචාර්යවරයෙක් වූ ආචාර්ය සාඕ යටතේ මහණ දම් පිරූ හිමි නමකි. තම ගුරුවරයා සේ ම ආරණ්‍යයේ එදිනෙදා කටයුතු දැඩි උනන්දුවකින් ඉටු කළේ ය. පූ ගාඕ කන්ද ආශ්‍රිත ව ජීවත් වූ හැමෝම සහෝදර බැම්මෙන් බැඳුණු සියල්ලෝ සමගි ව වාසය කරන පරිසරයකට උරුම කිවූහ. භික්ෂූන් වහන්සේලා සෑම උදෑසනක ම පිණ්ඩපාතය සඳහා වඩින දර්ශනය සිත් සනසන දසුනක් විය. සිල් මාතාවෝ ආරණ්‍යයේ නැවතී එළිමහන් කුස්සියේ හීල් දානයට ගැනීම සඳහා අමතර බත් ව්‍යංජන සුළු ප්‍රමාණයක් පිසුවෝය. ආරණ්‍යයට පිවිසෙන දොරටුව සමීපයේ දිග බංකුවක් ඉදිකර තිබුණි. සිල් මාතාවෝ ඒ අසල පෙළට සිට ගෙන ඔවුන් පිළියෙල කළ අමතර ආහාර පිණ්ඩපාතයේ ගොස් වඩින භික්ෂූන් වහන්සේලාගේ පාත්‍රවලට පිළිගැන්වූවෝය. ප්‍රධාන ශාලාවට එක්රැස් වන ස්වාමීන් වහන්සේලා නිහඬ ව තම ජ්‍යෙෂ්ඨත්වය අනුව අසුන් ගෙන හීල් දානය වළඳති. උන්වහන්සේලා දන් වළඳා අවසන් වූ පසු ව ආශීර්වාද ලබා සිල් මාතාවෝ තම අංශයේ දන් ශාලාවට ගොස් දන් වළඳති. භික්ෂූන් වහන්සේලා

දන් වැළඳූ පසු තම පාත්‍ර සෝදා පිරිසිදු කර හොඳින් වේලා රෙදි ආවරණයකින් වසා පසෙකින් තැන්පත් කරති. සිල් මාතාවෝ ද ආහාර පිළියෙල කළ භාජන සියල්ල සෝදා පිරිසිදු කර සකසා තැන්පත් කර කුස්සිය ද හොඳින් පිසදා පිරිසිදු කරති.

උදේ රාජකාරීන් නිම කළ පසු ආරණ්‍යයේ සැවොම තම තමන්ගේ කුටිවලට ගොස් හුදකලාව හිඳිමින් හෝ සක්මනින් හෝ තම භාවනා පුහුණු ආරම්භ කරති. සවස හතරට පැවතෙන බුද්ධ වන්දනාවන්ට කාලය එළඹෙන තුරු ඔවුනගේ කුටි ආශ්‍රිතව ඇති කැලයේ කාලය ගත කරති. කතිකා කරගත් වේලාවට ඉන් පිටතට එන ඔවුහු ආරණ්‍ය භූමිය අතුපතු ගා පිරිසිදු කරති. ඉන් පසු සාමූහික ව දිය කඩිති කරා ගොස් වතුර රැගෙන විත් කලින් පිලියෙල කරගත් තැන්හි තැබූ භාජනවලට වතුර පුරවති. මෙම වතුර බීමට, පා සේදීමට පාවිච්චි කරනු ලබයි. පාත්‍ර සේදීමට සහ ආහාර පිසීමට පාවිච්චි කරනු ලබයි. ඉක්මනින් දිය නා ගන්නා භික්ෂූන් සහ සිල් මාතාවෝ ඔවුනගේ භාවනාවන්ට යොමු වෙති. ධර්ම සාකච්ඡා නො කෙරෙන රාත්‍රීන්හි බොහෝ රෑ වන තුරු භාවනා කොට නින්දට යති.

සාමාන්‍යයෙන් සතියකට වරක් සතර පෝය වැටෙන දිනයන් හි ආචාර්ය කම් පාන් හිමි ආරණ්‍යයේ හැමෝම රැස් කර, එම දිනයන් හි හිරු බැස යත් ම බුද්ධ ධම්ම සංඝ, ත්‍රිවිධ රත්නයේ ගුණ අන්තර්ගත වන්දනා ගාථා සාමූහික ව සජ්ඣායනා කරති. බුද්ධ වන්දනා ගාථා හඬ කෙමෙන් තුනී වී යද්දී, ආචාර්ය කම් පාන් හිමි භාවනා පුහුණුව පිළිබඳ ව ආදර්ශවත් ධර්ම දේශනාවක් පවත්වන්නේ ය. එම ධර්මදේශනාවෙන් පසු භාවනා පුහුණුවේ ගැටලු සහිත තැන් සැක සහිත තැන් ගැන විමසා ඊට සුදුසු පිළිතුරු දී භාවනාව ඉදිරියට ගෙන යා යුතු අයුරු සිය ගෝලයනට උන්වහන්සේ කරුණාවෙන් පහදා දුන්හ. ගැඹුරු පෞද්ගලික ප්‍රශ්න මතු වූ විට උන්වහන්සේ ඕනෑම පහසු වේලාවක හමුවී ගැටලු නිරාකරණය කර ගැනීමට අවසර දී තිබුණි.

ආචාර්ය කම් පාන් හිමි පවත්වාගෙන ගිය භාවනා පිළිවෙත උන්වහන්සේ යටතේ සිටි කාගේත් සිත් ප්‍රබෝධවත් කළේ ය. උන්වහන්සේගේ කරුණු වටහා දීම ශාන්තය ; එමෙන්ම කාරුණික ය. අල්පේච්ඡ ගති ලක්ෂණ ඇති උන්වහන්සේ ඉතා සරල ව අවශ්‍ය කරුණු පහදා දුන්නේ ය. උන්වහන්සේ ගේ ආධ්‍යාත්මික පුහුණුව සහ උතුම් ශීලවන්තභාවය ස්වාමීන් වහන්සේගේ තැන්පත් ශාන්ත

මනස පිළිබිඹු කළේ ය. එමෙන් ම සමාධි භාවනාවේ විවිධ සිද්ධාන්ත ගැන මනා අවබෝධයක් උන්වහන්සේට තිබුණි. මේ හැකියාව හේතුකොට ගෙන උන්වහන්සේගේ මානසික දියුණුව සිල් මාතා කායිවිගේ අභ්‍යන්තර හැකියාවන් හා සංසන්දනය කළ හැකි විය. උන්වහන්සේගේ මනස ඉතා පහසුවෙන් ගැඹුරු සමාධියට යොමු වී භූත ලෝකයේ බොහෝ සත්ත්වයන් හා සම්බන්ධ වීමට හැකියාවක් තිබුණි. උන්වහන්සේගේ ගුරුහරුකම් සිල් මාතා කායිවිගේ කුසලතා දියුණුකර ගැනීමටත් සමාධි භාවනාවේ නොයෙකුත් ආශ්චර්යවත් සන්ධිස්ථාන හඳුනා ගැනීමටත් ප්‍රයෝජනවත් විය. ආචාර්ය කම් පාන් හිමිගේ මග පෙන්වීම පිළිබඳ ඇය උන්වහන්සේට කෘතඥ වූවා ය.

පූ ගාඕ කඳුකර ආරණ්‍යයේ ගත කළ අවුරුදු ගණන ඇයගේ භාවනා පුහුණුවේ ප්‍රතිඵල ලැබූ කාලයයි. අඳුරු භූත ලෝකයට පිවිසි සෑම අවස්ථාවක දී ම එම ප්‍රේත ආත්ම ගැන විශේෂිත දැනීමක් ඇය ලබාගති. ආචාර්ය කම් පාන් හිමිගේ උපකාරයෙන් දුගතිගාමී ප්‍රේතාත්ම සම්බන්ධිත විවිධ සිද්ධාන්තයන් ගැන මනුෂ්‍ය විඥාන පථයට අසු නොවන සීමාවන් කරා යාමට ද හැකි කුසලතාවයන් තව වැඩි දියුණු කර ගත්තා ය. මෙම අත්දැකීම් අතිවිශාලය. විවිධය. නමුත් මෙම ආධ්‍යාත්මික විශ්වය තරණය කිරීමෙන් ඇය කිසි දිනක වෙහෙසට පත් නො විණි. සමහරක් භූත සංවිධාන මිනිස් සංවිධාන මෙන් සකස් ව ඇති බැව් සොයාගත් සිල් මාතා කායිවි පුදුමයට පත් විය. ඉතා පැහැදිලි වෙනස්කම් ඇති මේ අයාලේ හැසිරෙන එක් එක් භූත සංවිධාන එක් නායකයෙක් යටතේ පාලනය වේ. ඔහු ඔවුන්ගේ සුභසාධක කටයුතු ගැන සොයා බලමින් උන් අතරේ සාමය පවත්වාගෙන යයි. බොහෝ කුසල් රැස්කළ මුත් පෙර අකුසල කර්මයක් හදිසියෙන් විපාක දී මෙම අඳුරු ප්‍රේත ලෝකයේ ඉපදී දුක් විඳින භූතයෝ ද දකින්නට ඇත. මෙම සිල්වන්ත භූතයෝ පවි රැස්කරගත් අනික් භූතයන් අතර ඔවුනගේ කුසලමය බලය පෙන්වති. භූත සමාජයේ යහපත් දේ කර ලැබෙන ඵල විපාක අයහපත් දේ කර ලැබෙන ඵල විපාකවලට වඩා බොහෝ බලසම්පන්න ය. එකෙකු සතු ශීලයේ බලයෙන් ම පමණක් විශාල භූත සමාගමක් පාලනය කළ හැක.

භූත සංවිධාන කුල මල භේදයන්ගෙන් වෙන් වී නොමැති බැව් ද සිල් මාතා හඳුනා ගත්තා ය. එක් එක් භූතයාගේ කර්ම විපාක ශක්තිය අනුව ඔවුනගේ උස් පහත්කම් බෙදුණු අතර එය ඔවුනගේ පාලන ව්‍යුහය තරයේ පිළිපදින

ක්‍රම වේදයකි. මනුෂ්‍යයන් සේ වෙන වෙන හේතූන් මත පූර්ව විනිශ්චයන් මත තීරණ නො ගනී. ප්‍රේත ලෝකයේ එක් එක්කෙනාගේ සමාජ මට්ටම් එකිනෙකාට වෙනස් වනුයේ ඔවුනගේ අතීත කර්ම ඵල විපාක අනුව ය.

සමහර දිනක භූත ලෝකයේ ප්‍රධානියා ප්‍රේතයන්ගේ ජීවන තත්ත්වයන් පෙන්වමින් සිල් මාතා කායිව් උන්ගේ ලොව වටා රැගෙන ගියේ ය. භූත ලෝකයේ ද රස්තියාදුකාරයන් සිටින බැව් ඇයට පැහැදිලි කළේ ය. කලකෝලාහල කරන නරක ප්‍රේතයෝ වටකර අල්ලා එක් කොටසක සිරකර තබති. මිනිසුන් එවැනි ස්ථානයකට සිරගෙය යයි නම් කර ඇත. සිරගෙට යැව් ප්‍රේතයෝ නීච හදවත් ඇත්තෝ බව භූත ප්‍රධානියා කීවේ ය. උන් කළ වරදට අනුව ඒ ඒ ප්‍රේතයා සිරකර තබන බැව් ද ඔහු කීවේ ය. හොඳ හැසිරීමක් ඇති අය ඔවුනගේ කර්ම විපාක නිම වනතුරු සාමාන්‍ය ජීවිත ගෙන ගියහ. මෙම භූත ප්‍රේත අවතාර යන නම් මිනිසුන් විසින් හදා ගත් නම් බවද මෙම භූත ප්‍රේත අවතාර යන නම්වලින් හඳුන්වන්නේ විශ්වයේ සිටින විවිධ ජීවීන් අතර එක්තරා විඥාන ස්වරූපයක් පමණක් බවද කී ය. එක් එක් භූත ප්‍රේත කොට්ඨාස එක් එක්කෙනාගේ කර්ම විපාක අනුව නා නා විඥාන ස්වරූපයන්ගෙන් සමන්විත ව පෙනී සිටී.

දේව විඥානය කාම භවයේ ජීවත් වන, කර්ම න්‍යාය අනුව පාලනය වන එක්තරා ජීව ස්වභාවයකි. සිල් මාතා කායිව්ගේ සමාධි භාවනාව වෙනත් උසස් ලෝකෝත්තර දර්ශන පථයන්ට ද ඇයව සම්බන්ධ කොට හඳුන්වා දුණි. සමහර විටක ඇගේ විඥානය කයෙන් ගිලිහී ඉවතට යයි. එසේ ඉවතට යන ඇගේ විඥානය නා නා දිව්‍ය ලෝක සහ විවිධ වර්ගයේ බ්‍රහ්ම ලෝක ආදී තලයන්හි ගවේශනයක යෙදෙයි. ඇය දේව නමින් හඳුන්වන ඉතා සියුම් ව සකස් වුණු විවිධ අද්භූත ජීවීන් හමුවීමට ද ගියා ය.

මෙම දේව නමින් හඳුන්වන ජීව කොට්ඨාසය, දිව්‍යමය ආධිපත්‍යයක අතිශයෙන් සියුම් වූ පිරිසිදු තත්ත්වයකින් පෙර යහපත් කර්ම විපාක හේතුවෙන් වාසනාවන්ත ව ප්‍රීතියෙන් වෙසෙන ජීව කොටසකි. ඇය භූමාට දෙව්වරු හමු වූවා ය. එනම්-ගස්වලට, වනාන්තරවලට තුරුවදුලුවලට අධිගෘහිත ආලෝකවත් දෙව්වරුය - මොවුන් පෘථිවි තලයට අතිශයෙන් ඇල්මෙන් සම්බන්ධ වූ ජීවීන් නිසා එසේ ඉපදී ඇත. මෙම දෙව්වරු සාමාන්‍ය මනුෂ්‍ය ඇසට නො පෙනුණ ද සිල් මාතා කායිව්ගේ දිවැසට ඔවුන් පැහැදිලි ව පෙනුණි. මෙම දේව කොට්ඨාසය හැම මොහොතකම ඉන්ද්‍රියයන් පිනවමින් සතුටින් තෘප්තිමත් ව හැසිරෙන ජීව

කොටසක් ලෙසින් සිල් මාතා කායිවි දුටුවා ය. මෙම අතිශය ප්‍රීතිමත් ස්ථාවරය ඔවුන් රැස් කළ පින් හේතුවෙන් ලද තත්ත්වයන් ය. මොවුන් මිනිසුන් ව සිටිය දී බොහෝ පින් රැස් කර සිල් රැක, භාවනා කර එකතු කරගත් කුසල්වල විපාක හේතුවෙන් ලද දිව්‍ය ආත්මයන් ය. මේ දේවතාවන්ගේ පින් මහිමය කෙසේ වුවත් එම දේවත්වයෙහි ම දිගින් දිගටම රැඳී සිටීමින් අලුතින් කර්ම රැස් කිරීමට ඇති අවස්ථා අල්ප විය. දේවත්වයේ රැඳී සිටීමට පාදක වූ මූලික කුසල් විපාක තුනී වී අහෝසි වූ පසු, නැවත මනුෂ්‍ය ලෝකයේ උපත ලැබ කුසල් රැස් කර ගැනීමට අවස්ථාව ඇත. ප්‍රේත භූත ලෝකවල ජීවීන් හා සසඳන කල, ඔවුන්ගේ අකුසල් විපාක හේතුවෙන් දුක් විඳිමින් අඳුරු දුගතීන්හි සැරිසරන අතර දේවාත්මයන්හි සිටිනා ජීවීන් ඔවුනගේ කුසල කර්ම ශක්තීන් හේතු කොට නැවත සුගතිගාමී වීමට ඇති අවකාශ බොහෝ ය. එනමුදු කාම භවයන්හි උපත ලබන සෑම සත්ත්වයෙකුම අත්විඳින එක් සිද්ධාන්තයක් දෙවියෝ ද අත් විඳිති. දැඩි ලෙස මනසේ ක්‍රියාත්මක වන "හැඟීම් බර ආශාවන්" සෑම කාම භෝගී සත්ත්වයෙකු ම කෙළවරක් නො පෙනෙන සසරේ මැරෙමින් ඉපදෙමින් රැගෙන යාමට හේතු වේ.

මෙම ලෝකයන් භෞතික තලයන්ගෙන් සමන්විත නොවන අතර ඒවා විඥාන තල වශයෙන් පැවැත්වෙන බැව් වටහා ගත යුතු යි. අභ්‍යාවකාශයේ පවතින මෙම තලයන් වර්ග කිරීමේදී ප්‍රගතිය අතින් දිව්‍යමය තලයන් "උසස්" ලෙස ද පවිත්‍ර ලෙසද, ප්‍රේත භූත ලෝක ඒ අනුව "පහත්" ලෙසද හඳුන්වති. උස් පහත් වෙනස ආධ්‍යාත්මික විඥානමය වෙනසක් පමණි. නමුත් අවාසනාවකට මෙම වෙනස තේරුම් කරද්දී එයට වැරදි සහගත අයුරින් භෞතික වූ ද්‍රව්‍යමය තත්ත්වයක් ඊට ආරෝපණය කර ඇත. "ඉහළට යෑම" සහ "පහළට යෑම" වශයෙන් අර්ථකථන කරද්දී සාම්ප්‍රදායික වශයෙන් භෞතික ශරීර ඉහළට යෑමක් හඟව යි. විඥාන ධාරාවන් ගැන කතා කරද්දී ඉහත දැක්වූ අර්ථකථනයන්ට ඇත්තේ ඉතා මඳ ඉඩක් පමණි. විඥාන ධාරාවේ සියුම් චලනය ලෞකික වශයෙන් කෙරෙන සංසන්දනයන්ගෙන් ඔබ්බට ගිය එකකි. භෞතික වශයෙන් ඉහළට පහළට යෑමට වෙහෙසක් ගත යුතු ය. වීර්යයක් ගත යුතු ය. නමුත් මනස ඉහළ පහළ විඥාන තලයන්ට විහිදුවීමේදී එවන් වීර්යයක් වෙහෙසක් අවශ්‍ය නො වේ. අවශ්‍ය දිශාවට සිත යොමු කිරීම පමණක් සෑහේ.

දිව්‍ය ලෝක සහ බ්‍රහ්ම ලෝක එකිනෙකට ඉහළින් සකස් වී ඇති දිව්‍යමය තලයන් යයි, වචනයේ අදහස පමණක් ගෙන තේරුම් නොගත යුතු යි. තට්ටු

කීපයකින් යුත් ප්‍රාසාදයක් යයි නොසිතිය යුතුයි. මෙම දිව්‍ය තලයන් පිහිටා ඇත්තේ විඥානමය ප්‍රභේද අනුව ය. ඉහළට යෑම ආධ්‍යාත්මික ගමනකි. සිතෙහි ඇතිවන විඥාන ධාරාව ඉතාමත් සියුම් විඥාන තරංගයන්ට පත් කර විහිදුවන ගමනකි. මෙම ඉහළට යන ගමන සිතෙහි ඇතිකර ගන්නා ආධ්‍යාත්මික බලයකින් යන ගමනකි : දාන ශීල භාවනා තුළින් මනාව සකස් කරගත් සිත ට මෙම හැකියාව ඇත. අපාය ඇත්තේ "යට" යි කීමෙන් පොළොව යට ගැඹුරු අගාධයකට යන ගමනක් අදහස් නො කෙරේ. ආධ්‍යාත්මික වශයෙන් හීන වූ විඥාන තලයකට යන ගමනක් අදහස් කෙරේ. දිව්‍යලෝක සහ නිරයන් දැකීමට හැකි අය එම හැකියාව ලබා ඇත්තේ ඔවුනගේ අභ්‍යන්තර ආධ්‍යාත්මික ඉන්ද්‍රියයන් ලබා ඇති දියුණුව පදනම් කරගෙන ය.

සමාධි භාවනාව ප්‍රගුණ කොට අද්භූත දෑ කිරීමට කුසලතා ඇති අයට මනෝමය වශයෙන් සන්නිවේදනය කිරීමට ඇති හැකියාව, සාමාන්‍ය මිනිසෙකුට සාමාන්‍ය දෙයක් කිරීමට ඇති හැකියාව හා සමාන වූ පහසු දෙයක් ය. යැවීමට අවශ්‍ය පණිවිඩය සිතෙන් පැනනගින විඥාන ධාරාව තුළින් "සිතිවිලි භාෂාව" උපයෝගී කොට සම්පූර්ණ අදහසක් මෙන් සන්නිවේදනය කරනු ලබයි. එම සිතිවිලි භාෂාවෙන් ලබාගන්නා පණිවිඩය, සාම්ප්‍රදායික භාෂාවකින් ලබාගන්නා පණිවිඩයක් සේ ලබාගනී. සෑම සිතිවිලි තරංගයක් ම හදවත තුළින් උත්පාදනය වේ. එය සිතෙහි පවතින සත්‍ය හැඟීම සන්නිවේදනය කරයි. නිවැරදි තේරුම සන්නිවේදනය කරයි. නැවත පැහැදිලි කිරීමක් අවශ්‍ය නොවේ. වාචික ව කෙරෙන දෙබස් ද සිත තුළින් අරඹා ඇති කරවන මාධ්‍යයකි. නමුත් වචනවලින් කෙරෙන සන්නිවේදනයක දී බොහෝ විට හදවතේ ඇති සත්‍ය හැඟීම් වටහා දීමට අපහසු වේ. එනිසා අපේක්ෂාවන් සන්නිවේදනය කරද්දී නොයෙක් අඩුපාඩුකම් ඉතා ලෙහෙසියෙන් සිදු වේ. මේ දුර්වලතාවය හදවතින් හදවතකට සෘජුව කෙරෙන සන්නිවේදනයක දී මග හරවා ගත හැක.

ඔබේ ක්‍රියා වචන සහ සිහිවිලි ගැන
දැඩි විමසිල්ලෙන් සිටිමින් හැම කල්හි ම
සංහිදියාවෙන් යුතුව හැසිරෙන්න.
ඔබ වැඩි පුර කතා කිරීමට ගොස්
කරදර වැඩි කරගන්න එපා
ඔබ කතාකරන ආකාරය ගැන
සැලකිලිමත් වන්න
සිනාසෙද්දී සංයමයෙන් සිනාසෙන්න

නොක් ක්‍රාබා ලෙන

වසරෙන් වසර ගතවෙද්දී සිල් මාතා කායිව්ගේ භාවනාව එක් දිශාවකට එමෙන්ම එක් රටාවකට වැඩිපුර දියුණු විය. භූත ලෝකයේ එක් එක් හමුවීම් ඇයගේ භාවනා වේගය තීව්‍ර කළේ ය. මේ ප්‍රේත ලෝකයන්හි සත්ත්වයන්ගේ දුක් වේදනා ගැන විමර්ශනය කරමින් ඇය පැය ගණන් කාලය ගත කළා ය. නමුත් ඇය, තමා දෙස බැලීම අතපසු කළා ය. මැරී මැරී උපදින සංසාරයේ මුල් බැස ඇති මනසේ උපාදානය ගැන සොයා බැලීම ඈ පසකට තැබුවා ය. ඇතුළට යොමු කළ අවධානයෙන් යුතුව ඈ මෙම දකින දර්ශන, මනසේ අභ්‍යන්තර ඉන්ද්‍රිය පථය හා සම්බන්ධ වීමක් වන හෙයින් ඇයට අධිමානසික හැකියාවක් ඇති බව ද, ඇය ඇගේ මනසේ ක්‍රියාකාරිත්වය ගවේෂණය කරන්නේ යයි සිතමින් ද කල්ගත කළා ය.

සමාධි භාවනාව තුළින් මතුවන සංසිද්ධීන් ගැන නිරීක්ෂණය කිරීමෙන් ඒවා ගැන සත්‍ය තොරතුරු දැනගැනීමට හැකි බවත් එමගින් මනසේ අවබෝධය ප්‍රත්‍යක්ෂ ව දැන ගැනීමට හැකි බවත් ඇය විශ්වාස කළා ය. නමුත් ඇයගේ භාවනා දර්ශන පථයට අසුවෙන මෙම ලෝක, මනුෂ්‍ය ලෝකය හා සමාන ව තාත්වික වූ නිශ්චිත වූ දර්ශන මෙන් පෙනුණ ද ඒවා ද භාවනා කරන්නාගේ දසුනට යොමු වන බාහිර දර්ශනයන් ය. මෙම දර්ශන පථයට අසුවන රූප ඝන

නොවන අතට නො දැනෙන රූප වුව ද එම සංසිද්ධීන් ඒවාට ම ආවේණික වූ සංඥා මාත්‍රයක් පමණි. එය, එම සංඥාව විසින් හඳුනාගත් දැනීමට පරිබාහිර ව ඇති වූවකි. මෙම දර්ශන ගැන විශේෂ අවධානයක් යොමු කළ සිල් මාතා කායිව් ඇගේ භාවනා ශක්තියෙන් බාහිර විශ්වය ගැන වැඩි සැලකිල්ලක් දැක්වූ නමුත්, ඇගේ හදවත සහ මනස තුළ පැවති විශ්මය ජනක අභ්‍යන්තර ලෝකය ගැන සෙවීම ඇය අතපසු කළා ය.

සිල් මාතා කායිව් ඇගේ භාවනා පුහුණුවේ දී මෙම මූලික වරද වටහා ගැනීමට අපොහොසත් වූවාය. ආචාර්ය කම්පාන් හිමිට ද එම අඩුපාඩුව පෙන්වා දෙන්නට තරම් ප්‍රඥාවක් නොවීය. උන්වහන්සේ සමාධියෙන් සහ එහි අතුරු ඵලවලින් ඔබ්බට භාවනාව දියුණු නො කළ කෙනෙකි. ඒ නිසා ඇයගේ මුලා වීමෙන් ගලවා ඉදිරියට ගෙන යෑමට උන්වහන්සේ අපොහොසත් විය. සමාධියේ මුල් බැස ගත් අතිවිශේෂ බලය මෙම ස්වාමීන් වහන්සේ අත්විඳිද්දත් මෙම ආධ්‍යාත්මික සංසිද්ධීන්හි ඇති අනිත්‍යතාවය සහ දුක නිවැරදිව දැන ගැනීමට තරම් ප්‍රඥාව දියුණු වී නො තිබුණි. සිල් මාතා කායිව්, ආචාර්ය කම් පාන් හිමි දක්ෂ කම්මට්ඨානාචාර්යවරයෙකු යයි විශ්වාස කළ ද ඇයට විශේෂිත ගුරුවරයෙකුගේ මඟ පෙන්වීම තිබිය යුතු යයි ඇයට නො වැටහිණි.

නා නා ප්‍රකාර විඥාන තලයන් සම්බන්ධව ඇගේ මුලාවීම එන්න එන්න ම වැඩි විය. අලුත් අත්දැකීම් සහ අලුත් අවබෝධයන් ඇතිකර ගැනීමට ඇයට දැඩි ආශාවක් තිබුණි. මෙම භූත ලෝකයේ සත්ත්වයන් නිමක් නැති සංසාරයේ සැරිසරන්නේ මේ ආශාව, තණ්හාව හේතුවෙනි. සිල් මාතා කායිව් හට දුක්ඛ සත්‍යය ගැනත් එහි මූලික හේතුව ගැනත් මේ වනතෙක් දැනගැනීමට අපහසු විය. ආචාර්ය කම් පාන් හිමි සමාධියේ ප්‍රබල ශක්තීන් උරුම කර සිටිය ද, ප්‍රඥාවට වඩා සමාධියට ඇලුම් කිරීමෙන් ඇතිවන භයානක ප්‍රතිඵල ගැන ඇයට උපදෙස් දීමට අපොහොසත් විය. මේ හේතුවෙන් ඇය සමාධියේ ශාන්ත නිසලභාවයේ ඇලී ගැලී ඉන් මත් වූවා ය. විවිධ සංඥාවන් හේතුවෙන් උපදවාගන්නා ආකර්ෂණීය ශක්තීන්වලට ඇය ඇබ්බැහි වී මුලා වූවා ය.

සිල් මාතා කායිව් පූ ගාඕ කඳුකර ආරණ්‍යයේ 1937 සිට 1945 දක්වා වාසය කළා ය. මේ කාලය තුළ ජපානය තායිලන්තය ආක්‍රමණය කොට යුද්ධයකට පොළඹවා දෙවන ලෝක සංග්‍රාමයේ ප්‍රධාන යුධ පිටියක් බවට පත් කළේ ය. යුධ අහස් යානා බෝම්බ හෙළීමේ අරමුණින් සේනාසනය පිහිටි වනාන්තරය

උඩින් පියාසර කරන්නට විය. ආසන්නයේ පිහිටි ගුවන් පථයට ගොඩ බැසීමට කලින් සමහරක් ගුවන් යානා ඔවුනගේ ඉතිරි බෝම්බ පූ ගාඕ කන්දට හෙළා යානා සැහැල්ලු කර ගත්හ. වරින් වර කන් බිහිරි කරවන බෝම්බ පිපුරුම් හඬ හේතු කොට භික්ෂූන් වහන්සේලා සහ සිල් මාතාවෝ ගල් ලෙන් තුළට සීමා වූහ. සිල් මාතා කායිව් පමණක් කිසිදු කැළඹීමක් නොමැති ව ශාන්ත ව භයක් හෝ පීඩාවක් නොමැති ව තම භාවනා පුහුණු කටයුතු කරගෙන ගියා ය. ධර්මය සොයා ගැනීමට ඇය ඇගේ සිත කය පරිත්‍යාග කර හෝ ඉදිරියට යෑමට අධිෂ්ඨාන කර සිටියා ය. මේ භවයේ දී ම දුකින් මිදීමට නම් එම ධර්ම මාර්ගයේ යෑමට අධිෂ්ඨාන කරගත යුතු බැව් ඇය දැන සිටියා ය.

එක් කලෙක පූ ගාඕ කඳු වැටියට නොකඩවා හෙළූ බෝම්බ වරුසාව නිසා සිල් මාතාවන්ගේ භාවනා පරිසරය විනාශ වී ගියේ ය. ඉන්පසු සිල් මාතා කායිව් සහ අන් සිල් මාතාවෝ වඩාත් හුදකලාව සිටිය හැකි ක්‍රාබා ලෙන වෙත ගියහ. එකකට එකක් බැඳි කඳු යායෙහි එක් එක් කන්ද පා ගමනින් තරණය කරමින්, ජපන් යුධ ගුවන් යානා දිවෙන ගුවන් මාර්ගයෙන් ඈත කන්දක් කරා සිල් මාතාවෝ පැමිණියහ. මෙම කන්දේ ගල් ලෙන් රාශියක් එක ළඟ එක පිහිටා තිබුණි. එක් සිල් මාතාවකට එක් ගල් ලෙන බැගින් වෙන් කොට තම භාවනා කටයුතු හුදකලාව කරගෙන යෑමට ඉඩ කඩ සකස් වුණි.

එහි ගිය පළමුවන රාත්‍රියේ දී ම සිල් මාතා කායිව්ට ඇගේ ගැඹුරු සමාධිය තුළින් විශාල නාගයෙකු වන් දේවතාවෙක් මුණ ගැසුණි. එම දර්ශනය දුටු වහා ම, ඒ නාග ලොවින් ආ නාග දේවතාවක් බැව් හඳුනා ගත්තා ය. ඔවුන් සාමාන්‍යයෙන් ගැවසෙන්නේ හුඹස් සහ ජලය ආශ්‍රිත භූමි අධිගෘහිත ව ය. නාගයින්ට උන් සිතන පරිදි නොයෙක් වෙස් ගැනීමේ හැකියාව ඇති හෙයින් සිල් මාතා කායිව් එම දසුන්වලට වශී වූවා ය. නාගයෝ බොහෝ විට වෙස්වලා ගන්නේ මනුෂ්‍යයන් හැටියට ය. නමුත් මෙහි සිටි විශාල නාගයා කිසිදු තැකීමක් නොමැතිව උගේ බියකරු දිගු ශරීරයෙන් ඇය තදින් වෙලා ගෙන පෙණය පුම්බා ඇගේ මුහුණ ඉදිරියට ගෙන, පිඹිමින් හිරු නැගීමට ප්‍රථම සියලුම සිල්මාතාවන් මරා කා දමන බවට තර්ජනය කළේ ය. සිල් මාතා කායිව් මරණයට බිය නොවී සිටීමේ ආධ්‍යාත්මික බලය ඇය තුළ ඇති හෙයින් ඊට බිය නො වූවා ය. මුහුණට මුහුණ ලා සිටි නාගයාට ඇය ඉතා සන්සුන් ව සදාචාර ධර්මයන්ට විරුද්ධව කෲර ක්‍රියා කළ විට ඉන් ඇතිවන ඵල විපාක

ගැන මතක් කර ගන්නා ලෙස දැඩි ලෙස දැන්වූවා ය. මෙහි සිටින සියලුම සිල් මාතාවන් බුදුරජාණන් වහන්සේගේ දරුවන් බවත්, ආධ්‍යාත්මික ගුණවගාවේ පරමාදර්ශය ඔවුන් බවත්, එවන් සිල් මාතාවන්ට කිසිවිටක හිංසා නොකළ යුතු බවත් ඇය නාගයාට කීවා ය. දෂ්ඨ කිරීමේ ඉරියව්වෙන් සිටි නාගයාට, ඌ ඇත්තෙන්ම උපාසිකාවන් මරා කෑමට සූදානම් වන්නේ නම්, නාගයා මුලින් ම මරා කා දැමිය යුත්තේ තමා බව සිල් මාතාව දැන්වී ය. නාගයා ඇගේ මුහුණ ඉදිරියේ උගේ පෙණය පුම්බා විශාල කට ඇර දෂ්ට කිරීමට සූදානම් විය. නමුත් සිල් මාතාවගේ ශීලයේ ආශ්චර්යවත් බලය හේතුකොටගෙන නාගයාගේ කට ගින්නෙන් දැවෙන්නට පටන් ගති. ගින්නෙන් කට දැවෙද්දී ඌ වේදනාවෙන් කෑගසන්නට විය. මොහොතකින් හික්මී සංවර වූ නාගයා ලජ්ජාවෙන් තරුණ පිරිමියෙකුගේ වෙස් ගෙන මිත්‍රශීලී ව අවනත විය.

තරුණ මිනිස් වෙසින් සිටි නාගයා මෙම ලෙන් සංකීර්ණය සිල් මාතාවන් හා සමගිව පරිහරණය කිරීමට එකඟ විය. නමුත් ඔහු දඟකාර කොල්ලෙකු සේ හැසිරෙමින් දඟලමින් තැනින් තැන දුවන්නට විය. මේ අරුම පුදුම නාග තරුණයා ලෙන් සංකීර්ණය මැද ගලක් මත වාඩිවී මහ හයියෙන් පිඹීමට පටන් ගත්තේ ය. ඔහු ඊට ප්‍රිය බවක් ඇති බව පෙනුණි. බටනලා හඬෙ දෝංකාරය ගල්ලෙන් සිසාරා විහිදී ගියේ ය. නමුත් ඔහු එම බටනලාව පිඹිමින් භාවනායෝගීව වාඩි වී සිටි කායිව් සිල් මාතාව සමීපයට එන සෑම අවස්ථාවකදී ම එහි ස්වරය, ශබ්දය හරිහැටි මතු නොවී නො ඇසී යයි. මේ අරුමය ඔහුට ප්‍රහේළිකාවක් වී ඉච්ඡාභංගත්වයට පැමිණියේ ය.

කාලය ටිකෙන් ටික ගෙවී යද්දී ඔහුගේ බටනලා නාදය සිල් මාතාවගේ යම් බලයකින් අහෝසි කිරීමට හැකිකමක් ඇති බැව් ඔහු වටහා ගත්තේ ය. ඒ සමග ම ඇගේ අසාමාන්‍ය ශක්තීන් ගැන ඔහු පුදුමයට පත් වූ අතර ඇයව පරාජය කිරීමට නොහැකිවීම ගැන කණගාටු විය.

දිනක් ඔහු බටනලාව ද රැගෙන එනු දුටු සිල් මාතා කායිව් ඔහු කොහි යන්නේ දැයි විමසුවා ය. ඇයට සරදම් කිරීමේ අටියෙන් තමා ගම්මානයේ ගැහැනියක සමග ආලබස් දොඩන්නට කලින් හිතාගෙන ආවත් පසුව ඇය සමග ආල රංගනයක යෙදෙන්න ආශාවක් පැමිණි බව කීවේ ය.

ඇය තර්ජනාත්මක බැල්මකින් ඔහු දෙස බලා ඇය සදාචාර ශීලයක් රකින කාන්තාවක් බවත් පිරිමි ගැන කිසිදු ආශාවක් ඈ තුළ නැති බවත් උස් ස්වරයකින් කීවා ය. ඇය, ඔහුට මූලික සදාචාරාත්මක චරිත ලක්ෂණ ඔහු තුළ වර්ධනය කරගැනීමට උපදෙස් දුන්නා ය. සෑම සත්ත්වයෙකුට ම පොදුවේ තිබිය යුතු චරිත ලක්ෂණයන්හි පදනම වන්නේ බුදුන් වදාළ සදාචාර ගුණ බවත් ඒවා ගෞරවයෙන් රැකිය යුතු බවත් පැවසුවා ය. මෙම සදාචාරාත්මක සංවරය එකිනෙකාගේ ආත්ම ගෞරවයන් රකින බවත් ඔවුනගේ භෞතික හා ආධ්‍යාත්මික වස්තූන් නොමනා ලෙස පාවිච්චි කිරීම වළකන බවත් පැවසුවා ය. සිත තුළින් ම බාධකයන් ගොඩ නගා ඔවුන් සංවර කරන බව ඇය ඔහුට පහදා දුන්නා ය. එමෙන් ම කෙනෙකුගේ අභ්‍යන්තර ශික්ෂණය ඔපවත් කරන බව ද කීවේ ය. ශීලය නිවැරදි ව ආරක්ෂා කිරීම නැති තැන අතපසුවීම් සහ නොසැලකිලිමත් වීම් අසීමිත ලෙස ව්‍යාප්ත වේ.

එසේ ව්‍යාප්ත වූ ලෝකයේ සාමය සහ ආරක්ෂාව පවතින රටක් සොයාගත නොහැකි වනු ඇත. ආධ්‍යාත්මික ගුණ වගාවන් ගැන ඔහු තුළ පවතින පහත් නොසැලකිල්ල වහා ම දුරු කර ගන්නා ලෙසත් බුද්ධ ධර්මයේ විනය ප්‍රතිපත්තීන්ට අනුව ඔහුගේ සදාචාරාත්මක ආකල්ප වර්ධනය කරගැනීමටත් සිල් මාතාව නාගයාට උපදෙස් දුන්නා ය. ඔහුගේ හදවත තුළ ඇති එම පහත් පළිබෝධයන් ඉවත් කරගත හොත් ඔහුටත් අන් හැමෝටත් ඉතා සංවර ව සතුටින් වාසය කිරීමට හැකිවනු ඇති බව වැඩිදුරටත් පැවසී ය.

සිල් මාතාවගේ තර්කානුකූල ව කළ විස්තරය අසා තරුණ නාගයා ඔහුගේ වැරදි පිළිගෙන ඇගෙන් ඊට සමාව අයැදී ය. ඔහුගේ හදවතේ සන්සුන් බව දුටු සිල් මාතා කායිවි පංචශීලය සමාදන් වන ලෙස අනුශාසනා කළා ය.

පළමුව ඔබ පණ ඇති සතුන්ට හිංසා කිරීමෙන් වැළකෙන්න ඕනෑ. එසේ කිරීමෙන් ඔබට ඔබේ කෝපය වලක්වා ගැනීමට හැකි වී, අනුනට මෛත්‍රිය වඩන්න උනන්දුව ඔබට ඇති වෙනවා.

අනුනට අයත් දෙයක් ඔවුනගේ අවසරයක් නොමැතිව ගැනීමෙන් වළකින්න ඕනෑ. සොරෙකුට ඇතිවන මානසිකත්වය බැහැර කිරීමෙන් ලෝභය පාලනය වී අතහැරීමේ ගුණය වර්ධනය වීමට මග පෑදේ.

සියලු නුසුදුසු කාම සේවනයන්ගෙන් වැළකී එම හැසිරීම් අතහරින්න ඕනෑ. ඒ ඇයිදැයි කියහොත් කාමය වරදවා හැසිරීමෙන් වැළකී සිටීම කාමාශාවන් මැඩලීමට උපකාරී වී සෑහීමකට පත්වන ගුණය වර්ධනය වේ.

බොරු කීමෙන් වැළකීම සහ හැම කල්හි ඇත්ත කතාකිරීම, බොරුකීම සඳහා ඇති නැඹුරුව පාලනය කරයි. එසේම ඔබේ සෑම කටයුත්තකදී ම සත්‍යවාදී ව ක්‍රියා කිරීමට සිත පුරුදු වේ. ඇත්ත කීමට උනන්දු කරවයි.

මත්ද්‍රව්‍ය ගැනීමෙන් වැළකීමෙන් අනතුරුදායක සිතුවිලි ඉස්මතු වීමට ඉඩ නොදී එම උත්තේජන මර්දනය කරයි. නිවැරදි සිහිය වර්ධනය කරයි. මෙය රැකීමෙන් අන් සියලු ශික්ෂාපද කිසිදු බාධාවක් රහිතව පහසුවෙන් රැක ගැනීමට අවශ්‍ය මූලික පදනම ඇති කරයි.

මෙම මූලික ශික්ෂාපද පිළිගැනීමට නාග තරුණයා එකඟ වූ පසු සිල් මාතා කායිව් දානය සහ භාවනාව මීට අමතරව අතිශයෙන් වැදගත් ධර්ම කරුණු බව පැහැදිලි කළා ය. මේ දෑ මෙම ජීවිතයේ ද මතු ජීවිතයේ ද ආධ්‍යාත්මික ආත්මවිශ්වාසය ගොඩ නගා ගැනීමට අඩිතාලමක් වනු ඇතැයි ද පැවසුවා ය. සියලු සත්ත්වයෝ තම තමන්ගේ කර්මයන්හි ප්‍රතිඵල හේතුවෙන් උපන් හෙයින් ඒවායේ ඵල විපාක ගැන පූර්ණ වගකීම ඔවුන් සතුවන අතර අන් කිසිවකු ඊට වග කිව යුතු නොවන බව ද පැවසුවා ය.

නොක් ක්‍රාබා ලෙන් සංකීර්ණයේ වාසය කළ සිල් මාතාවෝ අසල ගම්මානයක ගම් වැසියන් කීප දෙනෙකුගෙන් සහල් සහ ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට හැකි යයි විශ්වාසය තබා සිටියහ. ඔවුන් වනාන්තරයේ ඇවිද කැලෑ පලා වර්ග, ආහාරයට ගත හැකි අල වර්ග සහ කැලෑ හතු ඔවුනගේ ආහාර සඳහා අමතරව සොයා දුණි. නමුත් සහල් සහ කරවල ග්‍රාමීය වෙළඳුන් ගෙන් ලබා ගැනීමට ඔවුනට සිදු විය. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආරණ්‍යයට ගෙන ආ කාන්තාවෝ ශ්‍රද්ධාවන්ත දායිකාවෝ වූහ. ඔවුන්ගේ භක්තිමත් කැපවීම අගය කරමින් සිල් මාතා කායිව් ඇගේ භාවනා අත්දැකීම් ආදර්ශවත් පාඩම් හැටියට කියාදෙමින් ශීලයේ උතුම් වටිනාකම ද කියා දුන්නා ය. නමුත් නාගයෙකු මෙල්ල කළ ඇගේ බලය ගැන විස්තර ගම් වැසියන් අතර පැතිර යද්දී ඔව්හු අස්ථාන බියටත් එමෙන් ම අසහනයටත් පත් වූහ. අතීතයේ සිට, සජීව අජීව සෑම වස්තුවක ම ආත්මයක් ඇතැයි යන මිත්‍යා විශ්වාසයන්හි එල්බ සිටි මෙම

ගම් වැසියෝ එම ප්‍රදේශයට අරක් ගත් දෙවියන් අභිභවා යන ඕනෑම කෙනෙකු ගැන අවිචාර බියක් සහ සැකයක් ඇතිකර ගත්හ. සිල් මාතා කායිව් මැජික් බලයකින් නාගයා මෙල්ල කිරීම ඔවුනගේ විස්මයටත් බියටත් හේතු විය. නොක් ක්‍රාබා ගල් ලෙන් පිහිටි වනාන්තරය දඩයම් කිරීමට සහ පලා වර්ග එකතු කර ගැනීමට ගම්මුන් හට පිහිට වූ කැලයකි. සිල් මාතා කායිව්ගේ චිත්ත බලය ගැන ආරංචි වූ ගම් වැසියෝ ඒ ගැන බිය වී සැක උපදවා කැලයට ඇතුළුවීමට අකමැති වූහ. මේ ගැන නොයෙක් විකෘති පැමිණිලි මතුවෙන්නට පටන් ගති. මෙම කාලයේදී ම කාලගුණික විපර්යාසයක් සිදු වී, දිවා රෑ මුළුල්ලේ මහ වැසි වැටී පහළ ගම්මාන ජලයෙන් යට විය. අකාලයේ මහ වැසි වැටීම ගැනත් ජල ගැල්ම ගැනත් ගම් වැසියෝ සිල් මාතා කායිව් හට චෝදනා කළෝ ය.

අස්ථාන චෝදනා වැල නොකැඩී ගලා ආ නිසා මේ ප්‍රදේශය අතහැර වෙනත් පෙදෙසකට යා යුතු යයි සිල් මාතා කායිව් තීරණය කළා ය. නොක් ක්‍රාබා ලෙන් සංකීර්ණය හුදකලා වාසයට බොහෝ සෙයින් යෝග්‍ය වුව ද අවට පරිසරයෙන් ගොඩ නැගුණු වාතාවරණය එතරම් හිතකර නො වී ය. ඈ ගැන ගම් වැසියන් ඇතිකරගෙන සිටින වැරදි අවබෝධය නිසා තව දුරටත් මෙහි රැඳීමෙන් අනෙක් සිල් මාතාවන්ට අවැඩක් හිරිහැරයක් වනු ඇතැයි ඇය සිතුවා ය. එනිසා ඇගේ සිල් මාතා කණ්ඩායම ද කැටුව නැවත පූ ගාඕ කඳුකරයට යෑමට තීරණය කළා ය.

ඔබ උත්පත්තියෙන් උරුම කර ගෙන ආ
සතිය සහ ප්‍රඥාව
වැඩි දියුණු කරගැනීම අතපසු කරන්න එපා
උදාසීන ව භාවනා පුහුණුවෙහි නිරත වුව හොත්
ඔබ යන මාර්ගයේ බාධක එන්න එන්න ම වැඩි වී
නිවන් මග සම්පූර්ණයෙන් ම අඳුරු කර
ගමනේ කෙළවර සදාකාලිකව ම අඳුරෙහි ම ගිල්වා තබනු ඇත.

ආධ්‍යාත්මික ශක්තියේ පරිහාණිය

ආචාර්ය කම් පාන් හිමි පූ ගාඕ ආරණ්‍යයේ ප්‍රාණනාලිය විය. සිල් මාතාවන් හට ධර්මාවවාද දී ඔවුන් ආර්ය මාර්ගය තුළ සකස් කිරීම උන්වහන්සේගේ වගකීම විය. එනිසා ගිහිගෙය අතැර ආ සිල්මාතාවන් වරින් වර මුණ ගැසී ඔවුනගේ අත්දැකීම් හා ගැටලු සමූහ වශයෙන් සහ පෞද්ගලික සාකච්ඡා කොට ඔවුනට අවශ්‍ය අවවාද අනුශාසනා ලබා දෙන්නේය. උන්වහන්සේගේ වයස සහ ජ්‍යේෂ්ඨත්වය, උන්වහන්සේගෙන් ගුරුහරුකම් ගත් කාන්තාවන් හා ලෞකික බැඳීම් ඇතිකර ගැනීම වළක්වා ලීය.

අහෝ !

මස් ගොඩක දුර්වලතාවය සහ ආධ්‍යාත්මික ශක්තියක පිරිහීම

සිල් මාතා කායිව් සහ පිරිස නොක් ක්‍රාබා ලෙනට ගිය පසු ආරණ්‍යයේ සිල් මාතාවන් කීප දෙනෙක් පමණක් ඉතිරි විය මේ කාලයේ තමා ගුරුවරයෙක් බව අමතක කොට ඔහුගේ තත්ත්වය ගැනවත් කිසිදු තැකීමක් නොමැති ව ආරණ්‍යයේ රැඳුණු එක් සිල් මාතාවක් සමග ඔහු නොමනා සෙනෙහසක් ඇතිකර ගෙන ඇත. උන්වහන්සේගේ සමාධි භාවනා මට්ටම අනෙක් පිටස්තර ලෝකයන්හි ජීවීන් ගැන සෙවීමට තරම් ප්‍රබල වුවද සති ඉන්ද්‍රිය සහ ප්‍රඥා

ඉන්ද්‍රිය උන්වහන්සේ නිසියාකාරව නො වැඩූ හෙයින් තම සිත විනිවිද දැකීම අතපසු විය. බුදුරජාණන් වහන්සේ ඉගැන්වූ මූලික විනයානුකූල චර්යා ධර්මයන් අනුගමනය කිරීම උන්වහන්සේ මග හැරියේ ය. තම සිතෙහි සහ කයෙහි ක්‍රියාත්මක වන උපාදානයන් ගැන ඔහු ගැඹුරින් නිරීක්ෂණය කළේ නැත. උපාදානයන් වහ වහා වෙනස් වන බවත් එය දුක්ඛිත තත්ත්වයක් ඇතිකරන බවත්, මම මගේ කියා ගන්නට කිසිවක් නොමැති බවත් දැනගැනීමට උන්වහන්සේට නොහැකි විය.

සමාධි භාවනාවේයෙදී ගැඹුරු ඒකාග්‍රතාවයකට පැමිණි පසු සිතත් කයත් විඥානමය වශයෙන් ඒකාබද්ධ වී එක සංයුතියකට පත්වේ : සිතෙහි ස්වභාවයෙන් ම පවතින "දැන ගැනීමේ හැකියාව" පිරිසිදුය, සරලය, නිහඬය, එමෙන්ම නො සැලෙන්නේය. මෙම ඒකාබද්ධ සංයුතිය, කෙනෙකු පිරිසිදු සමතුලිතතාවයකින් යුත් සත්ත්වයෙකු ඇත්තේ යයි හැඟීම් උත්පාදනය කරයි. එය වචනින් විස්තර කිරීමට අපහසු අතිශයින් විශ්මිත වූ සතුට දනවන ඇලෙන සුලු ස්වභාවයකි. මෙම ගැඹුරු සමාධි තත්ත්වය උසස් මානසික තත්වයක් යයි පෙනුන ද එය තණ්හාව ද්වේශය හා මෝහය යන කෙලෙස්වලින් යුක්ත ය. මෙවන් සමාධි අත්දැකීම් ලෞකික ස්වභාවයක් මිස වෙනකක් නොවේ. මෙම ස්වභාවය ඇති මනසකින් ලබාගන්නා ආධ්‍යාත්මික ඥානය කෙලෙස්වලින් බර වූ ලෞකික ප්‍රඥාවකි.

සමාධි භාවනාව තුළින් සියුම් ඒකාග්‍රතාවයකට ගෙනා සිත ගැඹුරු පිරිසිදු ශක්තිමත් සිතකි. ලෝකෝත්තර ප්‍රඥාව කරා එලඹිය හැක්කේ මෙසේ එකඟ කරගත් සිත අරමුණෙහි තීක්ෂණ ව මෙහෙයවීමෙනි. තණ්හාව ක්‍රෝධය සහ මෝහයෙන් වන විපත්ති උදුරා දැමිය හැක්කේ සිත කය වේදනා ගැන තීව්‍ර විදර්ශනාවකින් විමර්ශනය කළොත් පමණි. මෙම සියලු සංසිද්ධීන් හි ශූන්‍ය බව අවබෝධ කර තණ්හාව ප්‍රහීණ කොට මැරි මැරී උපදින සංසාරයෙන් ගැලවීමක් ලැබිය හැක්කේ එවන් තීව්‍ර විදර්ශනා භාවනාවකින් පමණි. සමාධිය සහ ප්‍රඥාව භාවනාවේ අවසාන අරමුණ කරා ගෙන යන තුරු එකට බැඳී ක්‍රියා කළ යුතු වේ. කරත්තයක රෝද දෙක ක්‍රියා කරන්නාක් මෙනි. සමාධියෙන් ලබන සිතේ එකඟකම සහ සංසිඳීම ප්‍රඥාව අවදි කරයි. සිතේ ගැඹුරේ ඇති කෙලෙස් ඉන් දුරු කිරීමට විශේෂිත භාවනා ක්‍රමයක් උපයෝගි කරගනී. මෙම දරුණු කෙලෙස් මුලිනුපුටා දැමීමෙන් පසු ප්‍රඥාව සිතේ සන්සුන් බව තවත්

වැඩි කරයි. එනිසා සමාධිය සහ ප්‍රඥාව එකිනෙකා පසුපස යමින් බුදුන් වදාළ මගෙහි නිවන කරා භාවනානුයෝගියා මෙහෙයවයි. සමාධියෙන් ලත් සිතේ ඒකාග්‍රතාවය සහ සංසිඳීමෙන් ආචාර්ය කම් පාන් හිමිහට ළං වීමට හැකිවූයේ ආධ්‍යාත්මික ශක්තීන් පිරී ඇති බාහිර ලෝකයේ දොරටුව සමීපයට පමණි. එසේ ලද ගැඹුරු සමාධිය තම අභ්‍යන්තරය විමර්ශනය කිරීමට උන්වහන්සේ ප්‍රයෝජනයට නොගත්තේ ය. ඒ වෙනුවට හෙතෙම පිට සක්වල සියුම් විඥාන ධාරාවන් කරා පමණක් යොමු කිරීමට තම භාවනා ශක්තිය උපයෝගි කර ගත්තේය. මෙම බාල ආශාවන්ගෙන් තම සිත ආරක්ෂා කර විමුක්තිය කරා ප්‍රඥාව දියුණු නොකොට රාගයට අසුවෙමින් ඉන්ද්‍රියයන් පිනවමින් මෝහයෙන් පිරි සසරේ අතරමං වුණි.

නොක් ක්‍රාබා ලෙනේ සිට ආරණ්‍යයට ආපසු එන කාලය වන විට ආචාර්ය කම් පාන් සහ කණිෂ්ඨ සිල් මාතාවගේ නොමනා සම්බන්ධතාවය දුරදිග ගොස් තිබුණි. උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨත්වය නායකත්වය සහ භාවනා ගුරුවරයෙකු වශයෙන් ලත් කීර්තිනාමය ගැන සලකා බලා මෙම අයථා ක්‍රියාව ගැන කිසිවෙක් කතා කිරීමටවත් අකමැති වූහ. ආරණ්‍යයේ භික්ෂූහු සහ සිල් මාතාවෝ මෙම අශෝභන තත්ත්වය නිසා ආරණ්‍යය පිරිහෙන බව සිතූහ. නමුත් එක් දිනක් හදිසියේ ම කම් පාන් හිමි ඔහුත් තරුණ සිල්මාතාවත් සිවුරු හැර විවාහ වී ගිහි ජීවිතයක් ගත කිරීමට තීරණය කළ බැව් ප්‍රකාශ කළේ ය. මෙම ආරංචිය කාගේත් සිත් සසල කරවී ය. කාටත් අදහා ගන්නට බැරි කරුණක් විය. සිල් මාතා කායිව් ඔහුගේ පරිහාණිය ගැන ශෝක වූවා ය. ඇයත් අනෙක් සිල් මාතාවනුත් ඔහු කෙරෙහි තැබූ විශ්වාසය ඔහු බිඳ දැමූ හෙයින් ඔහු කෙරෙහි පිළිකුලක් ද ඇතිකර ගති. මොහු සිවුරු හැර පිටවී යන කාලය වන විට ආරණ්‍යයේ ඔහුගේ ගෝල පිරිස වසර අටක් ඔහුගෙන් උපදෙස් ලබා තිබුණි. ඔහුගේ මෙම අපකීර්තිමත් හැසිරීම අතිශයින් පිළිකුල් සහගත එකක් විය. ආරණ්‍යයට ගුරුවරයෙකු නැති විය. ආරණ්‍යයේ ඉතිරි භික්ෂූන් වහන්සේලා සහ සිල් මාතාවෝ වෙනත් සුදුසු පරිසරයකට යෑම වඩාත් යෝග්‍ය බැව් කතිකා කර ගත් හ. සිල් මාතාවන්ගේ නායිකාවන් වූ සිල් මාතා ඩැං සහ සිල් මාතා යිං ඔවුනතර හදිසි රැස්වීමක් කැඳවා හැමගේම කැමැත්ත අනුව තමන්ගේ උපන් ගම සමීපයට වහාම යායුතු බවත් ඒ අසල වනාන්තරයේ සිල් මාතාවන්ට පමණක් වාසය සඳහා සුදුසු ආරණ්‍යයක් සකස් කරගත යුතු බවත් තීරණය කර ගත්හ.

එම අරමුණු සිත්හි දරාගෙන සිල් මාතා කායිව් සහ තවත් සිල් මාතාවන් හය දෙනෙකු 1945 වර්ෂයේ වසන්ත සමයේ බාන් හුආයි සායි ගම්මානය සමීපයට ගියහ. සිල් මාතාවන් මුහුණ පෑ අකරතැබ්බය වටහා ගත් ගමේ වැදගත් වැඩිහිටියන් දෙදෙනෙක් ඔවුනට කැපකරුවන් වීමට එකඟ වී ඔවුනගේ ගමේ සිට දකුණු දෙසට සැතපුමක් පමණ දුරින් අක්කර 20 ක පමණ භූමි භාගයක් සිල් මාතාවන්ගේ ආරණ්‍ය සාදා ගැනීමට පූජා කළහ. එම ඉඩම ගමේ කුඹුරුවලට ඉහළින් පිහිටි, කලින් අතුරු භෝග වගා කළ ඉඩමකි. විශාල උණබම්බු පඳුරුවලින් වටවූ සෙවණ දෙන විශාල ගස් වැවී තිබූ මෙම භූමිභාගය නුදකලාව භාවනා කටයුතු කරගෙන යෑමට ඉතාමත් යෝග්‍ය වූ ඉඩමක් විය. සිල් මාතාවෝ ඔවුනගේ පූජාව ඉතා ගෞරවයෙන් සහ පුණ්‍යානුමෝදනාවෙන් භාර ගෙන වහ වහා සිල්මාතා ආරණ්‍යයක් ගොඩනැගීමේ කටයුතු ආරම්භ කළහ.

ගම්මානයේ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම උදව් උපකාරයෙන් ඝන ව වැවී තිබූ පඳුරු කපා ශුද්ධ කර අවශ්‍ය පරිදි බිම් සකස් කර සිල් මාතාවන්ට සුදුසු තාවකාලික කුටි ඉදි කෙරිණි. උණබම්බු පලා එම පතුරුවලින් ඔවුනට හිඳීමට සහ සැතපීමට පොළොවෙන් අඩි එකහමාරක් පමණ උස්වූ මැසි සකස් කර දුන්හ. ගම අවට බොහෝ සෙයින් වැඩුණු උස තණ මිටි වශයෙන් බැඳ වහල සෙවිලි කළහ. එකකට එකක් ඇත් වනසේ සිල් මාතාවන්ට කුටි ගොඩ නගා එම කුටි ඉදිරියෙන් සක්මන් භාවනාව සඳහා සක්මන් මලු සකස් කර දුන්හ.

ආරණ්‍යයේ විවෘත භූමිභාගයක උණබම්බු උපයෝගි කොට කුඩා ශාලාවක් ද ඉදිකර දුන්හ. පොළොවෙන් උස්වන සේ ලී කොට සිටුවා ලෑලිවලින් ශාලාවේ බිම සකස් කර දුන් අතර ආහාර පිළියෙල කර ගැනීමට මැටිවලින් ලිප් බැඳ කුඩා කුස්සියක් ද පිළියෙල කර දුණි. එදිනෙදා ජීවත් වීමට අවශ්‍ය උපකරණ හිඟයක් තිබූ හෙයින් සිල් මාතාවෝ උණබම්බුවලින් කෝප්ප හැඳි ආදිය සකස් කර ගත්හ. අලුත් ආරණ්‍යයට අවශ්‍ය ජලය දිනපතා අසල ඔයකින් රැගෙන ආහ. අවශ්‍ය සෙරෙප්පු නොතිබූ නිසා ඔවුන් පුවක් හනසු වේලා චාම් සෙරෙප්පු සාදා ගත්හ. කැති උදලු සවල ආදී උපකරණ වරින් වර ගමෙන් අවශ්‍ය පරිදි ඉල්ලා ගත් අතර ගම්වාසීන්ට කරදරයක් නොවන සේ සිල්මාතාවෝ දුෂ්කර ජීවිතයක් ගෙන ගියහ. ඒ හැම හිරිහැරයක් ම ඔවුන් ධර්මයේ නාමයෙන් ඉවසා දරාගෙන ධෛර්ය සම්පන්න ව තම පුහුණු කටයුතු නොකඩවා ගෙන ගියහ.

බාන් හුඅයි සායි සිල් මාතා ආරණ්‍යය කුඩා චාම් අරණකි. භාවනා පුහුණුව සඳහා අවනත විය යුතු විනය සරල නමුත් දැඩි ය. ඔවුනගේ ජීවත්වීම සඳහා අත්‍යවශ්‍ය දේ එහි නො වී ය. සිල් මාතාවෝ දවසේ වැඩි කාලය භාවනාව සඳහා වෙන් කළහ. සෑම සැන්දෑවක දී ම චාම් ව ඉදි වූ ධර්ම ශාලාවට එක් රැස් වන සිල් මාතාවෝ බුද්ධ වන්දනා ගාථා එක්ව සජ්ඣායනා කරමින් බුදුන් දහම් සඟ ගුණ මෙනෙහි කරති.

තම භාවනා ගැටලු විසඳා ගැනීමට නුසුදුසු ගුරුවරයෙකු සිටිනවාට වඩා මෙසේ ශාරීරික දුක් වේදනා විඳිමින් තමන් ම ධර්මයේ ගැඹුර සෙවීම යෙහෙකැයි සිල් මාතා කායිව් කීවා ය. කම් පාන් හිමි රාගයට ගොදුරු වූ අයුරු ඇය ඉතා කණගාටුවෙන් සිහි කළ අතර එම සිද්ධිය ඇගේ හදවතට මහා බරක් විය. එදිනෙදා මිනිසාට මතු වෙවී පැන නගින කාමාශාවන් මෙල්ල කිරීමට ඔහුගේ භාවනාවට හුරු මනස අපොහොසත් වූයේ කෙසේ දැයි ඇයට වටහා ගැනීමට අසීරු විය. මෙම කරුණ ඇගේ සැකයටත් මහත් කනස්සල්ලකටත් භාජනය වූ කරුණක් විය. ඇගේ භාවනාව නියමිත පිරිසිදු මාර්ගයේ යන්නේ දැයි වරෙක ඇයට සැකයක් උපනි. ඇය ඇගේ භාවනාවේ වැදගත් කොටසක් අතපසු කර ඇද්ද? පිළිතුරක් නොමැති මෙවන් ගැටළු මැද්දේ අසරණ වූ සිල් මාතා කායිව් සත්‍ය වශයෙන් ම සුදුසුකම් ඇති කම්මට්ඨානාචාර්ය හිමි නමක් සොයා ගත යුතු යයි තීරණය කළා ය.

ජ්‍යේෂ්ඨ සිල් මාතා ඩැං සහ යිං ආරණ්‍යයේ එදිනෙදා පාලන කටයුතුවල නිරත වූහ. අවුරුදු අටක් එකට ජීවත් වූ සිල් මාතාවෝ අතහැර, නමුත් ඔවුනගේ ආශීර්වාදය ලබා ආරණ්‍යය අතහැර ඇගේ අධිෂ්ඨානය ඉටුකර ගැනීම සඳහා ගුරුවරයෙකු සොයා පිටත්ව ගියා ය. වස් කාලය නිමවූ වහාම සිල් මාතා කායිව් තව එක් කනිෂ්ඨ සිල් මාතාවක ද කැටුව පූ පාන් කඳු වැටිය තරණය කොට, උතුරු දෙසට වැටී ඇති අඩිපාරවල් ඔස්සේ දුෂ්කර පර්වත තරණය කරමින් දැවැන්ත මිටියාවත් හරහා පයින් ම ආචාර්ය කොංග්මා චීරපඤ්ඤෝ තෙරුන්ගේ අසපුවට පැමිණියා ය.

මනුෂ්‍ය ශරීරය
තණ්හාව සහ ඇලීම
ඇතිකර්වන දැවැන්ත කාමගුණයකි.
දුක එහි නො වැළැක්විය හැකි ප්‍රතිවිපාකයකි.
ශරීරය දෙස බලන්න එය හැම මොහොතක ම වෙනස් වන
අඩි දෙකක් පළල අඩි හයක් දිග
මස් ලේ ගොඩකි.

කායගතා සතිය

ආරණ්‍යයේ ප්‍රධාන ශාලාව තුළ දී සිල් මාතා කායිව් ආචාර්ය කොංග් මා හිමි මුණ ගැසුණා ය. උන්වහන්සේට වැඳ නමස්කාර කර භාවනාව තුළ දී ඇය මුහුණපාන ගැටලු පැහැදිලි කළා ය. ඇගේ සිතෙහි සමාධිය සහ ශාන්තභාවය තුරන්කර කනස්සලු ස්වභාවයක් ඇති කරමින් ඇගේ ඇතුළත චිත්ත ස්වභාවය වලා පටලයකින් වැසී යාමට තුඩු දුන් හේතූන් ඇයට හැකි පරිද්දෙන් උන්වහන්සේට විස්තර කළා ය. කම් පාන් හිමි සිවුරු හැරීමත් සමග ඇගේ භාවනා පුහුණුව ක්‍රමවත්ව නො කෙරුණේ ය. සිල් මාතා කායිව්ගේ තීව්‍ර චිත්ත ඒකාග්‍රතාවය බාහිර රූප වෙත ඇලෙන බවත් එය අන් අතකට යොමු කළ යුතු බවත් විශේෂයෙන් කායගතා සති භාවනාව ආරම්භ කළ යුතු බවටත් උන්වහන්සේ ඇයට පිළිතුරු වශයෙන් කී ය. එසේම තම ශරීරයේ පිළිකුල් කොටස් දෙස ද උප්පත්තියෙන් ම මිනිස් ශරීරයේ ඇති කුණුපයන් දෙස ද අවධානය යොමු කරවමින් භාවනා පුහුණුව ඉදිරියට ගෙන යන ලෙස ඇයට අවවාද දුන්නේ ය. පළමුව, කෙස් ලොම් නිය දත් සහ හම ගැන ද පසුව ශරීරය තුළට අවධානය යොමු කොට මස් - නහර - ඇට - ඇටමිදුළු - වකුගඩුව - හෘදයමාංශය - අක්මාව - බඩදිව - පපුව - බඩවැල - අතුණුබහන - උදරය - අසූචි - පිත - සෙම - සැරව - ලේ - දහදිය - මේධ - කඳුලු - වුරුණු තෙල් - කෙළ - සොටු - සඳමිදුළු මුත්‍රා යනාදියට යොමු කරන ලෙස කීවේ ය.

ඈ මෙතෙක් ආස්වාදයක් ලැබූ බාහිර සංසිද්ධීන් ගැන යොමුකළ සිතේ අවධානය දැඩි ආයාසයක් ගෙන තම ශරීරය තුළට යොමු කර එහි කුණුප කොටස් ගැන විමර්ශනය කරමින් මගේ ශරීරයයි කියමින් හඳුනා ගත් ශරීරය දෙසට ම යොමු කිරීමට උපදෙස් දුණි.

ගෞරවයෙන් නමුත් දෙගිඩියාවෙන් එම උපදෙස් සිල් මාතා කායිව් විරුද්ධත්වයක් නො පා භාර ගත්තා ය. නමුත් ඇය සෑහීමකට පත් නො වූවා ය. "ඇතුළතට අවධානය යොමු කිරීම" යනුවෙන් ඈ දැන සිටියේ බුද්ධෝ යන මන්ත්‍රය දිගින් දිගට ම මැතිරීමේදී මනස ගැඹුරු නිසලතාවයකට පත්වන බව පමණි. ආචාර්ය මුන් මහා ස්ථවිරයන් අවුරුදු ගණනාවකට පෙර කියා දුන් එම සරළ ක්‍රමය වෙනස් කළ යුතු නැතැයි ඇගේ මුරණ්ඩු සිත කියා සිටියේ ය. ඇයට භාවනාව ගැන තරමක දැනීමක් තිබූ බව ඇත්ත ය. නමුත් ආචාර්ය කොංග්මා හිමිගේ භාවනා උපදේශය විග්‍රහ කර බැලීමට ඇය සූදානම් වූයේ නැත. ඇයට ලැබුණු නව උපදෙස් ගැන නොසලකා ඇයට හුරු පුරුදු භාවනාව ම ඇය කරගෙන ගියා ය. එයින් අසාර්ථක ප්‍රතිඵල ලැබුණ ද, දියුණුවක් නො පෙනුණ ද ඇය ඇගේ පරණ භාවනා ක්‍රමයෙහි ම රැඳී පුහුණු කටයුතු කරගෙන ගියා ය. ආචාර්ය කොංග්මා හිමිට අවනත නොවී සිටි තාක් ඇයට ඇගේ සිත ගැඹුරු සමාධියට පත්කර ගැනීමට අපහසු විය. මාස ගණනාවක් යන තුරු ම ඇගේ මුරණ්ඩුකම, ඇයට සමාධි ගත සිතක් ඇති කර ගැනීමට අපහසු තත්ත්වයක් ඇති කළේ ය.

භාවනාවේ ප්‍රගතියක් නොදුටු සිල් මාතා කායිව් අධිකලෙස අසහනයට පත් වූවා ය. ඇගේ බුද්ධියේ කෙලවර කරා පැමිණ ඇතැයි ඈ දුක් වූවා ය. එක් රාත්‍රියක සක්මන් භාවනාවේ යෙදී සිටිය දී ඇය ඇයට තදින් දෝෂාරෝපණය කර ගත්තා ය. මුළු රාත්‍රිය පුරා තද වැසි වැස්සේ ය. නමුත් ඇය කුටියට යෑම ප්‍රතික්ෂේප කළා ය. ඇයට පාඩමක් උගැන්වීමට කාලය පැමිණ ඇත. මුළු රාත්‍රියේ ම ඉහළට පහළට සක්මන් කරමින් ඇගේ මුරණ්ඩු මානාධික ආකල්පය හික්මවා ගැනීමට අතිශයින් වෙහෙස දැරුවා ය. ඇගේ වැරදි ගැන ඈ නැවත නැවත සිහි කරමින් ඉන් ගැලවෙන තුරු දැඩි අධිෂ්ඨානයකින් ඇගේ මනසේ නො නැමෙන ගතිය ගැන විමසිලිමත් වූවා ය. ආචාර්ය කොංග්මා හිමි ඇගේ භාවනා දියුණුව සඳහා ඇයව කොපමණ සකස් කළ ද ඊට අවනත වීමට ඇගේ සිත නොනැමුණේ ය. ඇය ඉන්නා ස්ථාවරය අසාධාරණ

බවත් එය සකස් කර ගත යුතු බවත් අවසානයේ ඇයට වැටහුණි. ඇය ඇගෙන් ම ප්‍රශ්න කළා ය. මම සත්‍යය නිවැරදි ව ම දැනගන්නේ කෙසේ ද? වරක් සත්‍යය අනුමත කළ මෙම සිත ම මේ තරම් මෝහයෙන් වෙළී සිටිය දී මම කෙසේ සත්‍යය සොයම් ද?

පසුදින අලුයම ඇගේ දුර්වලකම් මනාව අවබෝධ කර ඇගේ අකීකරු ස්වභාවය වෙනස් කර ගැනීමට අධිෂ්ඨාන කර ගත්තා ය. බුදුරුව අබියස අතිගෞරවයෙන් වැඳ වැටී ආචාර්ය කොංග්මා තෙරුන් වහන්සේගෙන් නිහඬව හදවත පතුලෙන් ම සමාව අයැදී ය. බුද්ධ වන්දනා නිම කළ පසු බුදුරුව ඉදිරියේ ඇය උනන්දුවෙන් මිනිස් කයේ ස්වභාවය ගැන භාවනා කිරීමට පටන් ගත්තා ය. කයේ ස්වභාවයෙන් ම පිහිටා ඇති පිළිකුල්භාවය මෙනෙහි කරමින් ඇය භාවනා කළා ය. ජීවත්ව සිටියදී ශරීරයේ පිළිකුලට භාජනය වන, පැහැදිලිව ජරාවට යන කොටස් ගැන ඇය මුලදී තම සතිය පිහිටුවාය. නාසය සොටුවලින් පිරේ ; කන් කලාඳුරුවලින් වැසේ ; සම දහදියෙන් සහ තෙලින් තෙත් වේ : ශරීරය නොකඩවා මල මූත්‍රා පිට කරයි: මේ දෑ නිතරම සෝදා පිරිසිදු නොකළ හොත් ඉවසා දරා සිටීමට බැරි තරම් දුර්ගන්ධයක් වහනය වේ.

ඇය නිතර දෙවේලේ කායගතා සතිය වැඩුවා ය. මෙම කුණු ශරීරය මගේය යනුවෙන් තදින් අල්ලා ගත් නිසා ඇයට ඇතිවූ සියලු අසහනයන් ආරම්භ වූ බැව් මැනවින් වැටහුණි. කය ජීවිතයේ හරය බවත් "මම" යන්නා එහි මැද සිටින කෙනා ලෙස කලින් පිළිගෙන සිටි බැවින් මෙම අසහනකාරී තත්ත්වය ඇතිවූ බැව් ඇයට වැටහුණි. මෙය ඇගේ සාමාන්‍ය මනසට නොවැටහුන ද මෙම මූලික විශ්වාසය හදවතේ පතුලට ම බැස ක්‍රියාත්මක වූ හෙයින් ඈ කරන කියන සෑම දෙයකම තද බල ලෙස "මම මගේ මට" යන හැඟීම් තදින් ම ක්‍රියාත්මක විය. කෙනෙකුගේ ජීවිතයේ සියල්ල හිතා මතාම සැලසුම් කරනුයේ ශරීරය සම්බන්ධ ආශාවන් පදනම් කරගෙන බව ඇයට වැටහුණි. තමා අනුනට පෙනෙන ආකාරය සම්බන්ධ ව නිතර හිතට එන හැඟීම, විලාසිතා, ආත්මාභිමානය, සහ පෞද්ගලික සැප සම්පත් සහ පහසුකම් යනාදිය ආත්මයක් ඇතැයි යන විශ්වාසය මත ගොඩ නැගුණු දෑ බැව් වැටහුණා ය.

කයේ පිළිකුල ගැන භාවනා කළ සිල් මාතා කායිවි හට මිනිස් ශරීරයේ අපිරිසිදු බව, නො පවතින බව, ආකර්ෂණයට වඩා එහි පිළිකුල ඇති බව ඇය

අත්දැකීමට පටන් ගත්තා ය. දිනපතා කායගතා සතිය වැඩීමෙන් තණ්හාව තුනී කර ගත්තා ය. තණ්හාව තුනී වෙත් ම, කයට බද්ධ වී ඇති "ආත්ම" නමැති දැඩි විශ්වාසය ද ඇයට තුනී කරගත හැකි විය.

ඇය දිනපතා භාවනා පුහුණුවේ දී ඇගේ ශරීරය කොටසෙන් කොටස තට්ටුවෙන් තට්ටුව වෙන් කළා ය. තම විමර්ශනය කරද්දී, සම ශරීරයේ මස් සහ අභ්‍යන්තර කොටස් ආවරණය කළ සියුම් පටකයක් බව ඇය දුටුවා ය. බැලූ බැල්මට පිරිසිදුව මන බඳින දෙයක් ලෙස සම පෙනුණ ද සමීප ව පරීක්ෂා කරද්දී එය කොරපොතු සහිත හැකිලුණු නිතරම දහදිය සහ තෙල් වගුරුවන පටලයක් බැව් පෙනුණි. හම තමාටත් අනුන්ටත් පිළිකුලෙන් තොර ව තබා ගැනීමට නම් නිතරම සෝදමින් පිරිසිදු කර තබා ගැනීමට අවශ්‍ය දෙයක් බව ද වැටහුණි. හිසකේ පීරා හැඩ දමා එහි මන බඳින ස්වරූපය නිසා ආඩම්බර වේ: නමුත් කෑම පිඟානට හිසකේ කීපයක් වැටීමට සැලැස්සුවහොත් එය බඩගිනි පවා නැති කිරීමට තරම් පිළිකුලක් උත්පාදනය කරයි. හිසකේ සහ ලෝම උපතින් ම පිළිකුල් සහගත ය. එනිසා නිතරම ඒවා නහවා සෝදා පිරිසිදු කළ යුතු වේ. මනුෂ්‍ය ශරීරයේ ඕනෑ ම කොටසක් සම්බන්ධ වූ දෙයක් වැඩි වේලාවක් පිරිසිදු ව පවතින්නේ ද නැත. මේ ශරීරයේ ස්වභාවය ජරාවට පත් වීමය. අපේ ශරීරයේ ඇති අපිරිසිදුභාවය සහ දුගඳ හේතු කොට අපේ ඇඳුම් ඇඳ ඇතිරිලි නිතර නිතර සෝදා පිරිසිදු කළ යුතු වේ. අප ආශාවෙන් කන ආහාර ද කට තුළට ගෙන කෙළ සමග මිශ්‍ර වූ පසු එය අතිශයින් පිළිකුල් සහගත ය. මුළු ශරීරය ම මෙම පිළිකුල් ලක්ෂණ ස්වභාව කොට ඇත්තේ ය.

ශරීරයේ බාහිර කොටස්හි ඇති ස්වාභාවික පිළිකුල ගැන මෙනෙහි කළ සිල් මාතා කායිව් ශරීරයේ අභ්‍යන්තර කොටස්හි ද ශ්‍රාවයන් සහ දුගඳ අසූචි මලමූත්‍ර ගැන මෙනෙහි කිරීම ආරම්භ කළා ය.

කෙස් ලොම් නිය දත් සහ සම ඉතා තියුණු නිරීක්ෂණයකට භාජනය කළ පසු, එතුළින් ඇගේ පිළිකුල් සිතිවිලි වර්ධනය වත් ම සිල් මාතා කායිව් ඇගේ ශරීරය වසා තිබූ සම මනසින් ගලවා එයින් වැසී තිබූ ලේ මිශ්‍ර අමු මස් දෙස මනසින් බැලුවා ය. ලේ මිශ්‍ර දිලිසෙන සම් පටලය දෙස බැලූ ඇයට වමනය යන තරම් පිළිකුලක් ඇති විය. මේ දර්ශනය මුලාවක් නොවන බවත් තම ජීවිත කාලයේ දී ම ශරීරයේ තිබූ සත්‍ය තත්ත්වය මෙය බවත් ඇය වටහා ගත්තා ය. එසේ වැටහෙත් ම ඇය තම මනස නහර දක්වා ද ඇට සහ අභ්‍යන්තර කොටස්

දක්වා ද විනිවිද යවා බැලුවා ය. මාංශ පේශීන් ඇට කටුවලට අමු මස් කුට්ටි මෙන් බැඳී ඇති සැටි ඇය දුටුවා ය. ඇගේ මනස ඉන්පසු විහිදුණේ උකුල් ඇටයෙන් ඉහළ ඉලඇට කුඩුවෙන් වට වූ පෙදෙසට ය. හෘදය වස්තුව, අක්මාව, වකුගඩු, ප්ලීහාව, පෙනහලු, ආමාශය, අතුණුබහන්, බඩවැල්. යන මේ සියල්ල උකුල්ඇටයට උඩින් ඉලඇට කුඩුව තුළ මේද සෙම් සොටු ආදියෙන් මිශ්‍රව පිහිටා තිබුණි. කෙඳි සහිත තුනී සිවිවලින් වට වී තිබුණි. එම කොටස් එකින් එක ක්‍රමානුකූල ව ඇගේ නිරීක්ෂණයට භාජනය කළා ය. මේද තට්ටු සමග ලේ විසුරුවමින් උකු ශ්‍රාව්‍යයන්ගෙන් වටවී එක එකක් ජරා අසූචි මූත්‍රා සමග එක් ව කිනම් මොහොතේ හෝ පිට කිරීමට සූදානම් ව ගොඩගැසී තිබුණි.

ඇගේ ඉතාමත් බලසම්පන්න වූ මානසික බලය ශරීරය තුළට විනිවිද යවා ශරීරයේ අභ්‍යන්තර ශරීරාංගවල සත්‍ය තත්ත්වය පළමු වතාවට විදර්ශනා ඥානයෙන් දුටුවා ය. මේ දෑ ප්‍රඥාවෙන් විමර්ශනය කොට ශරීරයේ සියලු ම කොටස් එකම ස්වභාවයක් ගන්නා බව ඇය දුටුවා ය. මුළු ශරීරය ම ජරාවෙන් පිළිකුලෙන් පිරුණු දෙයක් බවත් එහි නිත්‍ය වූ කිසිවක් නොමැති බවත්, සෑහීමකට පත් විය හැකි කිසිවක් නොමැති බවත්, එසේ නම් ආත්මයක් කියා ගැනීමට කිසිවක් නොමැති බවත් ඇයට තහවුරු විය. එම ගම්භීර අවබෝධයත් සමග ම ක්ෂණයකින් ඇගේ සිත දැඩි නිසලතාවයකට වැටුණි. ඉතා සියුම් ආලෝක ලක්ෂයක් හදවත පතුලේ නිවී නිවී ආලෝකමත් වෙමින් ටිකෙන් ටික වර්ධනය විය. ස්පන්දනය වෙමින් විශාල වූ ආලෝකය දීප්තිමත් ව බබළමින් පවිත්‍ර ව නම්‍ය ව පාවෙන ආලෝක කදම්බයකින් ඇගේ විඥානය සම්පූර්ණයෙන් වෙලා ගත්තා සේ ඇයට දැනුණි.

පාන්දර භාවනාවෙන් පිබිදුණු ඇය බුද්ධ වන්දනා නිම කළා ය. සෑම මොහොතක ම ඉතා සියුම් සුසංයමයක් තමා හාත්පස ඇතිවී තිබෙන බවක් ඇයට හැඟුණි. සාමාන්‍ය ජීවිතයේ ඇයට මීට කලින් තිබූ දෙගිඩියාව කුලෑටිකම, සැකමුසු බව සම්පූර්ණයෙන් ම නැති වී ගියේ ය. උදේ හීල් දානය භික්ෂූන් වහන්සේලාට පිළිගන්වද්දී ඇය ඉතා ප්‍රබෝධවත් ව සතුටින් එය ඉටු කළා ය. ඇගේ වෙනස මොහොතකින් හඳුනා ගත් ආචාර්ය කොංග්මා හිමි කාටත් ඇසෙන සේ ;

"සිල් මාතා කායිවි ඔබ නිවැරදි මාර්ගයට වැටුණා. නොසැලී ඉදිරියට යන්න."

නිවැරදි මාර්ගයට වැටුණු සිල් මාතා කායිව් ආචාර්ය කොංග්මා හිමි වසන එම අසපුවෙහි මාස කීපයක් රැඳී භාවනා කළා ය. හොඳ ආචාර්යවරයෙකුගේ උපදෙස් ලබමින් ඇගේ සතිය සහ ප්‍රඥාව වැඩි දියුණු කරගැනීමේ භාග්‍යය ඇය උදා කර ගත්තා ය. කම් පාන් හිමි රූපයට ඇලී තණ්හාවට වාල් වී සිත ආරක්ෂා කර ගැනීමට අපහසු වූ හේතුව ඇයට හොඳාකාර ව වැටහුණි. භයානක කාමච්ඡන්දයේ ඇලීමත්, එය අකර්මක කරන ක්‍රමයත් ඇය වටහා ගත්තා ය.

ඇය ඇගේ භාවනාවේ ප්‍රගතිය ගැන, එනම් සවිමත් අඩිතාලමක පිහිටි බවට දැඩි ආත්ම විශ්වාසයක් ඇති වූ පසු බාන් හුආයි සායි සිල් මාතා ආරණ්‍යයේ මාතාවන්ට උදව් කිරීම සඳහා යෑමට තීරණය කළා ය. ඔවුනට සුදුසු ගුරුවරයෙකුගේ මග පෙන්වීම නොමැතිකම ගැන ඇය සැලකිලිමත් වූවා ය. එම අඩුව සිල් මාතාවන් වෙනුවෙන් ඇයට සපුරාලිය හැකි බැව් ඇය විශ්වාස කළා ය.

අපට සිල් මාතාවන් හැටියට
අපේ වාම් ජීවිතයේ නො වැළැක්විය හැකි
හිඟපාඩු කරදර බාධක බොහෝ විට හමු වේ.
අලස නොවී අසහනයට පත් නොවී
ඒ හැම ඉවසීමෙන් විඳ දරා ගත යුතුයි
එවන් සෑම අවස්ථාවක දී ම ඔබේ ක්ෂණික ප්‍රතිචාරය විය යුත්තේ
මෛත්‍රිය සහ කරුණාව දැක්වීමයි.

පරමාදර්ශී බෞද්ධ සිල් මාතාව

යහපත් ආධ්‍යාත්මික පරිසරයක් ඇති බාන් හුඅායි සායි සිල් මාතා ආරණ්‍යය වෙත කායිව් සිල් මාතාව නැවත පැමිණියා ය. ඇය ආරණ්‍යයේ නො සිටි කාලයේ දී ගිහියන් මෙම ආරණ්‍යය දෙස බැලුවේ තම ගමට අයත් වැදගත් සමාජයීය ආයතනයක් ලෙස ය. ඔවුහු එසේ සිතමින් ආරණ්‍යය සමග සමීප ව බැඳී සිටියහ. පරිත්‍යාගය සහ ශීලය සම්බන්ධ ව බුදුරජාණන් වහන්සේ ලොවට දුන් උපදෙස් ප්‍රජා වර්ධනය සඳහා මෙත් සිතින් කරන ලද ආරාධනාවක් ලෙස ඔවුහු සැලකූහ. විශේෂයෙන් ගිහිගෙය අත හැර සසුන්ගත වූ පිරිස රැක බලා ගනිමින් ඔවුනට උදව් කිරීමට එම පාඩම් ඔස්සේ ඔවුන් ආරාධනා ලබන බව තේරුම් ගති. භාවනායෝගී සිල් මාතාවන් පූ තායි ගම්මානයේ සිටීම සදාචාර සම්පන්න සමාජයක් බිහි කිරීමේ ප්‍රබල ආයතනයක් හැටියට ඔවුහු සැලකූහ. එය ඔවුන් ලත් "පින් කෙතක්" සේ සතුටින් පිළිගති.

නිවන් මග සොයා යන කාන්තාවන් ධර්මයේ පොළඹවා පරමාදර්ශී බෞද්ධ සිල් මාතාවකගේ ජීවන රටාව හැඩගස්වන විශිෂ්ට ආයතනයක් වශයෙන් බාන් හුඅායි සායි ආරණ්‍යය ප්‍රසිද්ධ විය. සිල් මාතාව සාමන්‍ය ජන ජීවිතයෙන් බැහැර වූ, තම ස්වාමියා දරුවන් සහ පවුල අතහැර මෛථුන සේවනයෙන් වැළකී සිටීමට පොරොන්දුවක් ගත්තා වූ පින්බර කාන්තාවකි.

සිල්මාතාවක් සේ ඇය පෙනී සිටින විට ඇගේ ආධ්‍යාත්මික ස්වරූපය ඉන් පෙන්නුම් කරයි ඈ හිස මුඩු කළා ය. ඇය සුදු සිල් රෙදි පෙරෙව්වා ය. ගිහි ජීවන රටාව සම්පූර්ණයෙන් අතහැර ඇය පූර්ණ ආධ්‍යාත්මික ජීවන මගක් ගත්තා ය. තමාගේ සීමිත අවශ්‍යතා දානමය වශයෙන් ලබාගෙන අනුන්ගෙන් යැපෙන සිල්වත් ගැහැනියක් වූවා ය.

ගිහිගෙය හැරදා පැමිණි සිල් මාතාවකගේ ජීවය රඳා පවතින්නේ කෙනෙකු කැපවීමෙන් රකින ශීලය සහ දැඩි භාවනා පුහුණුව මත ය. ශීලය සහ පුහුණුව ඇයව නිවන් මගට යොමු කර ඇගේ ආධ්‍යාත්මික විමුක්තිය කරා ගෙන යන්නකි. ආධ්‍යාත්මික ගුණවගාවේ අභිවෘද්ධිය රඳා පවතින්නේ ඇය රකින ශික්ෂා පද මත ය. සසුන් ගතව ධර්මයේ හැසිරෙන ඇත්තෝ මෙම ශික්ෂාපද රැකීමේ වටිනාකම සම්බන්ධව ඉතා දැඩි සැලකිල්ලක් දක්වති. සත්ත්වයා සංසාර චක්‍රයට බැඳ තබන කර්ම විපාක සහ සංස්කාර අහෝසි කිරීමේ බලයක් මෙම ශීලයේ ඇත. එහි වටිනාකම එයයි. වේදනා ගෙන දෙන කර්ම විපාක සකස් කරවන ක්‍රියාවලින් වැළකීමේ අඩිතාලම මෙම ශික්ෂාපද රැකීමෙන් ශක්තිමත් කරයි. ඒ සමග ම දුකින් මිදීම සඳහා ඇති කරගත යුතු කායික සහ මානසික ක්‍රියාවන්හි පිරිසිදුකම ශීලයෙන් පරිපූර්ණ කරයි. ආරණ්‍යයක උසස් පවිත්‍රත්වය රකිමින් එහි යහපත් ප්‍රගතිය සඳහා කටයුතු කරමින් ගිහි සමාජයට පරමාදර්ශී වූ සිල් මාතාවක් සකස් වීම ද ශික්ෂාපද රැකීමෙන් අයත් වන විශේෂිත ප්‍රතිලාභයකි.

බාන් හුආයි සායි සිල් මාතා ආරණ්‍යයෙහි සිල් මාතාවකගේ අෂ්ඨාංගික ශීලය දැඩිව රැකීම සම්බන්ධ ව විශේෂ අවධානයක් යොමු වෙයි. ඇය සතුන්ට හිංසා කරන්නේ නැත; ඇය නුදුන් දෙයක් ගන්නේ නැත ; ඇය පූර්ණ බ්‍රහ්මචර්යාව රකී ; ඇය බොරු කේලාම් පරුෂ වචන සම්පප්‍රලාප නො කියයි: මත් ද්‍රව්‍ය නොගනී ; ඇය නැටුම් ගැයුම් විනෝද වීම් උසුළු විසුළු දර්ශන, මල් මාලා පැළඳීම් සුවඳ විලවුන් ගැල්වීම් නොකරයි ; උස් අසුන් මහ අසුන් පරිහරණය නො කරයි. කෙටියෙන් කියතොත් මෙම සරල සංවර විනය නීති, සියල්ල අතහැරීමේ සහ ප්‍රඥාව වැඩි දියුණු කිරීමේ හැකියාව ඇතිකරන අතර උසස් චරිත වර්ධනයක් ද ඇති කරයි.

ආරණ්‍යගත ජීවිතයක ශීලයේ පදනම නිරූපණය කරනුයේ ශික්ෂාපදයන් හි මුල් සිල් පද සතරෙනි. සත්ත්ව හිංසාවෙන් වැළකීම, සොරකම් කිරීමෙන්

වැළකීම, බොරු කීමෙන් වැළකීම්, කාමය වරදවා හැසිරීමෙන් වැළකීම ය. අනෙක් සිල් පද සතර ආධ්‍යාත්මික පුහුණුව වර්ධනය කිරීමෙහි ලා සිත කය හික්මවා ගැනීමට උපකාරී වේ. එනිසා මෙම සිල්පද සතර මූලික ශික්ෂා පද සතරේ විකාශනයකි. සිල් මාතාවක් පිරිසිදු ව මුල් ශික්ෂාපද සතර සමාදන් වී ගෞරවයෙන් එය ආරක්ෂා කරන විට අනෙක් සිල් පද රැකීම ඇයට පහසු වේ. ඒවා උල්ලංඝනය කිරීම ඉතා බරපතල වරදක් සේ පිළිගැනේ. දුකින් නිදහස් වීමේ ගැටලුව විසඳීම සඳහා අන් සතුන්ට මොනයම් ආකාරයකින් හෝ හිංසා කිරීම ද්වේශයෙන් සහ මෝහයෙන් පැන නැගුණ නොමග යැවීමකි. නුදුන් දෙයක් ගැනීමෙන් සිල් මාතාවන් අතර පැවතිය යුතු මූලික අන්‍යෝන්‍ය විශ්වාසය බිඳ වැටේ. බ්‍රහ්මචර්යා ප්‍රතිපත්තිය රැකීමට ජීවිතය කැප කළ සිල් මාතාවන්ගේ සහ ඔවුනට දයාවෙන් දානමාන පිළිගන්වන අයගේ ද විශ්වාසය සොරකම් කිරීමෙන් බිඳ වැටේ. බ්‍රහ්මචර්යාව නොරැකීම සිල් මාතාවකගේ මූලික චරිත ලක්ෂණය විනාශ කරන්නකි. ගිහිගෙය අතහැර යෑමේ උතුම් ලක්ෂණය උල්ලංඝනය කරන්නෙකි. මෛථුන සේවනයෙන් බැහැර වීමෙන් ඔවුනගේ ශක්තීන් ආධ්‍යාත්මික චිත්ත වර්ධනය සඳහා යෙදවිය හැකි වනු ඇත. බොරු කීමෙන් සහ කේළාම් කීමෙන් කාගේත් විශ්වාසය පළුදු වනවා සේ ම ප්‍රධාන වශයෙන් තමාගේ ම සිත ගැන තැබූ විශ්වාසය ද විනාශ වේ.

සදාචාර සම්පන්න බව උද්දීපනය කරන ශීලය ඉතා සියුම් වූ ද සංකීර්ණ වූ ද ධර්මතාවයකි. එය ශික්ෂාපදවලට සහ විනයට පමණක් සීමා නොවූවකි. ශීලය බාහිර නීතිවලින් මැනිය නොහැක්කකි. ශීලය මනසේ පවිත්‍රතාවය පිළිබිඹු කරන්නකි. බුදු මගෙහි මූලික අරමුණ සිතේ පවතින කෙලෙස් දුරු කිරීමයි. එනිසා පාරිශුද්ධ ශීලය රැකිය හැක්කේ ලෝභ දෝෂ මෝහ මුලිනුපුටා දැමීමට හැකි මාර්ගයක ගමන් කිරීමෙනි. ආධ්‍යාත්මක පුහුණුවේ දී ශික්ෂාපද අනිවාර්ය අංශයකි. ශීලයෙන් බලාපොරොත්තු වන අවසාන ප්‍රතිඵල භාවනා පුහුණුවට යොමු නොවී ලබා ගත නොහැක. ශීලයේ පවිත්‍රත්වයේ පෝෂණය ලබමින් පිරිසිදු චේතනා ඇතිව පවත්වාගෙන යන මනස පැහැදිලි ශාන්ත තත්ත්වයකට පත් වනු ඇත. එනිසා ශීලයේ පරිපූර්ණත්වයක් ඇති සිල් මාතාව නිකැලැල් හදවතකින් සිත පුරාම පැතිරුණු සතුටක් විඳිනු ඇත.

බාන් හුආයි සායි සිල් මාතා ආරණ්‍යයේ එදිනෙදා කටයුතු නිශ්චල ව චාම් ලෙස කෙරීගෙන ගියේ ය. දවසේ වැඩි කාලයක් "සතිය" දියුණු කිරීමේ

පුහුණුවට සිල් මාතාවන් යොමු කෙරිණි. සිල් මාතා කායිව්ගේ භාවනා කුසලතා සහ අත්දැකීම් හමුවේ කනිෂ්ඨ සිල් මාතාවන්ට භාවනා උපදෙස් දෙමින් ආරණ්‍යයේ නායකත්වයට ඉබේ ම පත්වුවා ය. ඇය අන් සිල් මාතාවන්ට ආදර්ශවත් ව නිහතමානී ව තම සොහොයුරියන් සමග කල්ගත කළා ය. අලුයම තුනට පිබිදෙන ඇය පාන්දර පහ වන තුරු සක්මන් භාවනාවෙහි යෙදුණා ය. හිරු එළිය යාන්තමින් ආරණ්‍යභූමියට වැටෙද්දී හීල් දානය පිළියෙල කරන අනෙක් සිල් මාතාවන්ට උදව් කිරීම සඳහා ඇය එලිමහන් කුස්සිය වෙත ගියා ය. පිළියෙල කරන ආහාරවල සුවඳ අළුයම හමන මන්දමාරුතය හා වෙළී ආරණ්‍යය පුරාම විහිදී පැතුරුණි. සකස් කළ ආහාරවලින් වැඩි කොටස පිණ්ඩපාතය සඳහා වඩින භික්ෂු ආරණ්‍යයේ වැඩ වසන හිමිවරුන් සඳහා වෙන් කර තැබිණි. භික්ෂූන් වහන්සේලාට දන් පිළිගැන්වූ පසු ප්‍රධාන ශාලාවට එක් රැස් වන සිල් මාතාවෝ නිශ්ශබ්ද ව ඔවුනගේ හීල් දානය වැළඳූහ. සිල් මාතාවෝ ආහාර ගැනීමට ප්‍රථම චාරිත්‍රානුකූලව ප්‍රත්‍යවේක්ෂා කළහ. ලද ආහාරය බ්‍රහ්මචරියාව රැකීමට පමණක් අවශ්‍ය පරිදි එම ආහාර වළඳින බවට ඔවූහු ප්‍රත්‍යවේක්ෂා කළහ. හීල් දානයෙන් පසුව භාජන සෝදා පිරිසිදු කර තම තමන්ගේ කුටිවලට ගොස් භාවනා පුහුණුව ආරම්භ කළෝ ය. දවසට එක් වේලක් පමණක් වැළඳූ මෙම සිල් මාතාවන් හට ඔවුනගේ ආධ්‍යාත්මික දියුණුව වෙනුවෙන් පමණක් දවසේ ඉතිරි කාලය වෙන් කර ගැනීමට හැකිවුණි.

අලුයම බුද්ධ වන්දනාවෙන් පසු සිල් මාතා කායිව් ඇගේ පූර්ණ අවධානය භාවනාව වෙත යොමු කළා ය. විශාල තේක්ක සහ මහෝගනි ගස්වලින් ද උසට වැඩුණු විශාල උණ පඳුරුවලින් ද වට වූ, ඇගේ කුඩා කුටිය වෙත ගොස් මනස වෙනතක නො යැවෙන නිසල වූ ශාන්ත පරිසරයක දවසේ ඉතිරි කාලය කිසිදු බාධාවකින් තොර ව හුදකලා ව ගත කළා ය.

වනයේ තුරු හිස් යට බිම සමතලා කොට ගම්වාසීන් විසින් සක්මන් මලුවක් සකස් කර තිබුණි. සක්මන් පථය අතුගා පිරිසිදු කර සිල්මාතා කායිව් එක් කොනක ඍජු ව සීරුවෙන් සිට ගත්තා ය. ඉදිරියට ගත් දෑත් ඉණට පහළින් දකුණු පිටි අල්ල මත වම් අල්ල බුරුලෙන් තබා අල්ලා ගත්තා ය. බිමට හෙළූ දෑස් ඇතිව සිත එකඟ කොට සක්මන් මළුවේ එක් කොනක සිට අනික් කොනට ශාන්ත සංවර ගමනින් සක්මන් කළා ය. සක්මන් පථයේ එක් කොනකට පැමිණි පසු සන්සුන් ලාලිත්‍යයෙන් ආපසු හැරී නැවත ඉදිරියට සක්මන් කළා ය. මෙසේ දිගින් දිගට කරන සක්මන් භාවනාව, අලසකම,

කෑමෙන් පසු ඇතිවන මතය, එමෙන් ම නිදිමත නැති කරන්නක් බැව් ඇයට වැටහිණි. පාදය පොළොවට වදිනවාත් සමග ම බුද්ධෝ වචනය නො ඇසෙන සේ කියමින් ශාන්ත රිද්මයකින් පැය කීපයක් සෑම උදැසනක ම ඇය සක්මන් භාවනාවෙහි යෙදුණා ය. සිතේ සමාධියත් බුද්ධෝ යන්න සිත පතුලේ ගිලීමත් හේතුකොටගෙන සක්මනෙහි රිද්මය කෙමෙන් වෙනස් විය. එම වෙනසත් සමගම සතිය දියුණු විය. සතියත් සමාධියත් ඉතා සාර්ථක ලෙස එක් වී තිබෙන මෙම අවස්ථාවේ දී ඇගේ මුළු ශරීරය ම අතිශයින් සැහැල්ලු බවක් ඇඟ වීය. තම ගත අහසේ පාවෙමින් යන්නක් ලෙස ද ඇයට දැනුණි.

නව පණක් නව ප්‍රබෝධයක් ලැබුවා සේ ඇයට දැනුණි. තැන්පත් වූ සිතකින් හා සැහැල්ලු කයකින් යුතුව සිල් මාතා කායිව්, අලංකාර ලෙස අතු විහිදුණු පයෝම් ගසක් යට හිඳ ගත්තා ය. මෙම ගස ඇගේ සක්මන් මළුව අසලම තිබූ ගසකි. එසේ වාඩි වූ ඇය සවස තුන වන තුරු භාවනා කළා ය. ඒ අනෙක් සිල් මාතාවන් බුද්ධ වන්දනා කරන වේලාවයි. සියල්ලෝ එකතු වී ආරණ්‍ය භූමිය අතුගා පිරිසිදු කර අවශ්‍ය තැන්වලට, අසල ළිඳෙන් වතුර ඇද පිරවූහ. ඉන්පසු ඔවුහු අසල කැලයට ගොස් ආහාරයට සුදුසු පලා වර්ග හතු, උණ මොටෙයියන් ආදිය එකතු කර ගෙන එති. සවස් යාමයේ දිය නා ගන්නා සිල් මාතාවෝ නැවත ප්‍රධාන ධර්ම ශාලාවට බුද්ධ වන්දනා සඳහා එක් වෙති. ඉන්පසු තම තමන්ගේ කුටිවලට නැවත යන ඔවුහු අවට කැලයේ හුදකලාව උරුම කරනිමින් භාවනා පුහුණු කටයුතුවල නිරත වූහ. සිල් මාතා කායිව් නැවත සක්මන් භාවනාවෙහි පැය කීපයක් රැඳී සිට පසුව ඇගේ කුටිය තුළට විත් මධ්‍යම රාත්‍රිය තෙක් හිඳ භාවනා කරන්නී ය.

ආචාර්ය කොංග්මා යටතේ සිට මෙම ආරණ්‍යයට පැමිණි මාස කීපය තුළ සිල් මාතා කායිව් ඉතා උනන්දුවෙන් කායගතාසති භාවනාවෙහි නිරත වූවා ය. නමුත් කය ගැන සෙවීමේ උනන්දුව ටිකෙන් ටික ඇයගෙන් ගිලිහී ගොස්, බාහිර ශක්තීන් ගැන ඇයට මීට පෙර තිබූ උනන්දුව නැවත ඉස්මතු වී ආවේ ය. කායගතාසති භාවනාව ඇයගේ ආවේණික ආධ්‍යාත්මික නැඹුරුවට ප්‍රතිවිරුද්ධ ව ක්‍රියා කිරීමට පටන් ගති. අවසානයේ ඇය ඇගේ ප්‍රබල අන්තරායකාරී චිත්ත අධිවේගයට ගොදුරු විය. දැස් පියවෙනවාත් සමග ම ඇය ප්‍රපාතයකට වැටෙන්නා සේ ඇයට දැනෙන්නට පටන් ගති විශ්වයට තවත් කවුළුවක් විවෘත වූවා සේ ය. මොහොතකින් ඇය තවත් අවදානම් ගවේෂණයකට නො දැනුවත් ව ම යොමු වූවා ය.

ඉපදුණ සෑම මිනිසෙකු ම මැරෙනවා ; නැවත උපදිනවා.
දුක් කන්දරාවක් ඇති මේ සංසාර චක්‍රයේ
නැවත නැවත උපදිනවා ; මැරෙනවා.
සමහර විට අප උදේ වෙනකොට මැරෙන්න පුළුවන්
සමහර විට සවස මැරෙන්න පුළුවන්
අපි දන්නෙ නැහැ නමුත් නිසි වේලාව ආ විට
මරණය අප කරා පැමිණෙන බව නම් ස්ථිරයි.

වන්දනා ගමන

ශීත කාලය නිම වෙත් ම දකුණු අහසේ හිරු ඉහළට ම නගිමින් දවසේ උණුසුම් කාලය දිගු කරයි. මේ කාලයේ සිල් මාතා කායිව් කනිෂ්ඨ සිල් මාතාවන් කණ්ඩායමක් ද කැටුව සකෝන් නකෝන් නමැති යාබද දිස්ත්‍රික්කයේ ඒ වන විට වාසය කළ ආචාර්ය මුන් භූරිදත්ත හිමි බැහැ දැකීමට වන්දනා ගමනක් සැලසුම් කළා ය. මේ වන විට ශීත කාලයේ ඇද හැළුණු අවසාන වැස්සත් නිම වී තිබුණි. අඹ ගස්වල පොකුරු පොකුරු පීදුණ මල් වටා මල් පැණි බීමට බඩගින්නේ ගුමු ගුමු නද දෙමින් මී මැසි පොදි මුළු ප්‍රදේශය පුරා ම පැතිර පියාසර කරති. වන්දනා ගමන දින දොළහක් පයින් යා යුතු දිගු ගමනකි. පූ පාන් කඳු වැටිය තරණය කර සකෝන් නකෝන් පළාතට බැස නාය ගිය කඳු අතරින් බාන් පියු නා නායි නම් වූ විශාල මිටියාවතකට යාමට නියමිත ව තිබුණි. ගමනට අවශ්‍ය ආහාර බරින් වැඩි වූ හෙයින් ප්‍රධාන කඳු තරණය කිරීමට පමණක් සෑහෙන ආහාර ගෙන යෑමට සැලසුම් කෙරුණි. කඳුකරයේ ගම්මාන පිහිටියේ නැත. මිටියාවත් සමීපයේ ඇතින් ඇතින් ගම්මාන පිහිටා තිබූ අතර එකකට එකක් දවසක ගමනකින් යා හැකි වන සේ පිහිටා තිබුණි. එම ගම් වැසියන්ගේ පරිත්‍යාගශීලීභාවය කරණ කොට ඔවුනගේ හීල් දානය පිරිමසා ගැනීමට හැකිවනු ඇතැයි ඔවුහු කල්පනා කළහ. උණපතුරුවලින් සෑදූ මලුවල සහල් හසුරා ගති. මැටි ජෝගුවල කට දන මාළු අච්චාරු බහා

මී ඉටිවලින් තදින් පියන් අලවා වසා සකස් කරගත් අතර වියළි මස් සහ මාළු, ආහාර වේල් කීපයක් සකසා ගැනීමට තරම් පිළියෙල කර ගත්හ. ගමන අතරමග දී පලා ආදිය එකතු කර ගැනීමට සිතා ගත්හ.

සිල් මාතාවෝ එකිනෙකා පිටුපස තනි පේළියකට සිල් මාතා කායිවි මූලික ව බාන් හුඅායි සායි ආරණ්‍යයෙන් පිටත් වූහ. එක් එක් සිල් මාතාවන් ගමනට අත්‍යාවශ්‍ය වන සුළු සුළු උපකරණ ද ආහාරවලට අමතරව රැගෙන ගිය අතර කුඩයක් ආකාරයට සැකැසූ කුඩා දැල් කුඩාරමක් ද එක් එක් මාතාවකගේ උරහිස් බෑගයේ ගෙන ගියහ. එම කුඩා මදුරු දැල් කුඩාරම රාත්‍රී කාලයේ මදුරුවන්ගෙන් ආරක්ෂා වීම සඳහා ය. අතින් මැසූ සෙරෙප්පු දුෂ්කර අඩිපාරවල් ඔස්සේ ගමන් කිරීමට ප්‍රමාණවත් විය. තද හිරු අව්වෙන් ආරක්ෂාවීම සඳහා ඔවුනගේ හිස් සුදු රෙදි කැල්ලකින් ඔතා වසා ගත්හ.

මුල් දවස ගෙවී යද්දී ඔවුන් පූ පාන් කඳු පාමුලට සමීප වූහ. වනාන්තරය කොටි වලසුන් ගෙන් හා සර්පයන්ගෙන් ගහන වූවකි. නිසරු හේන් ගොවිතැන් කළ කුඩා ගම්මාන ඇතින් ඇතින් පිහිටා තිබුණි. දේශගුණය බලාපොරොත්තු නොවූ අයුරින් වෙනස් විය. එසේ වුව ද පරිසරය ඉතා රමණීය විය. විශාල නිල් උණ බම්බු පඳුරු සහ මහෝගනි ගස්වලින් ද උස තණ පඳුරුවලින් ද පරිසරය තවත් අලංකාර විය. අතරින් පතර පිපී තිබෙන කැලෑ මල්වලින් අවට පරිසරය වර්ණවත් විය. කඳු ගැට අතරින් සෑදුණු කපොලු විශාල ගස්වලින් ආවරණය වී බිංගෙයක හැඩය ගත්තේ ය. තැනින් තැන එල්ලී වැටුණු වැල් සහිත කැලෑ රොදවල් කෙනෙකු ලෙහෙසියෙන් ම අතරමං කිරීමට සමත් විය. සිල් මාතාවන්ගේ ගමන් මාර්ගය වැටී තිබුනේ මෙවන් පරිසරයක ය.

අතිශයින් තෙහෙට්ටු වී කඳු නගිමින් බසිමින් ගමන් කරන සිල් මාතාවන්ට කුඩා ගම්මානයක් හමු වූ කළ ගම්වාසීන් ඔවුනට ආහාර දන් දීමට යුහුසුලු වනබව ඔවුන්ගේ කතා බසින් වැටහුණි. සෙනෙහසින් පිරි එම ගම්වැසියන්ට අනුකම්පාවෙන් ඔවුන් පිරිනමන සුළු දේ වුවද පිං දීමෙන් බාර ගත්හ. එම ගමේ සුදුසු දිය කඩිත්තක් සොයා දිය නා එම දිනයන්හි රාත්‍රිය ද එහි ගත කළේ ය. කුඩයක් සේ අතින් මසා සාදා ගත් ආවරණය සිනිදු කපු රෙද්දකින් වට කර කුඩා කුඩාරමක් සේ නිමවා, එය ගසක අත්තක එල්ලා එක් එක් සිල් මාතාවට ඇවැසි නිදන කුඩාරම සකස් කර ගත්හ. පිදුරු ඔබ්බවා සාදා ගත් කොට්ටය භාවනා කිරීමටත් නිදා ගැනීමටත් ප්‍රයෝජනයට ගත්හ.

සමහර රාත්‍රීන්හි සිල් මාතා කායිව් ආචාර්ය මුන් තෙරුන් වහන්සේව සිහිනෙන් දුටුවා ය. උන්වහන්සේ ඈ දෙස ඉතා උනන්දුවෙන් සහ කුතුහලයෙන් යුතු ව බලා මෙසේ විමසන බවක් හැඟවී ය.

"ඔබ මෙතෙක් කල් කොහේ ද හිටියේ? මා හමුවෙන්න මෙච්චර කල් ගත්තේ ඇයි ? මම දවසින් දවස මහලු වන බව ඔබට පේන්නෙ නැද්ද ?"

ඇයට මේ අදහස් තේරුණා සේ ඇය උරහිස් ගැස්සුවා ය. උන්වහන්සේ ඉතා ඉක්මනින් හමුවිය යුතු බැව් එම හඬ ඇයට හැඟවී ය. සෑම උදෑසනක ම සිල් මාතාවෝ ඔවුනගේ දවසේ එකම ආහාර වේල අනුභව කළහ. බත් සමග කැලෑවෙන් සොයා ගත් පලා වර්ග සහ අල වර්ග එම ආහාර වේලට ඇතුළත් විය. ඔවුනගේ මෙම ආහාර වේල ශරීරය සහ මනස පවත්වා ගැනීම සඳහා පමණක් ප්‍රමාණවත් ව සකස් කර ගති. ගමනේ දී සිල් මාතාවෝ පියවරෙන් පියවර මොහොතින් මොහොත සතිය පිහිටුවා ගෙන සංවර ව ගමන් කළෝ ය.

දුෂ්කර කඳු නගිමින් බසිමින් මිටියාවත් හරහා සිල් මාතා කායිව් සහ කණ්ඩායම වන්දනා ගමන පිටත් වී දොළොස්වන දින වන විට ආචාර්ය මුන් හිමි වෙසෙන ආරණ්‍යය පෙනෙන තෙක් මානයට පැමිණියහ. ඔවුන් මුලින් ම මුණ ගැසුණේ නොං පියු ගම්මානයේ ගම් වැසියන් ය. එහි කාන්තාවෝ ආගන්තුක සත්කාරයෙන් පිරි ඉතා කරුණාවන්ත පිරිසක් වූහ. සිල් මාතාවන්ට දිය නා ගැනීමට සහ සිල් රෙදි සෝදා ගැනීමට ඔවුහු බෙහෙවින් උපකාර කළහ. දිය නා වෙහෙස නිවා ගත් සිල් මාතාවෝ කන්දේ අවසාන කොටස තරණය කොට ආචාර්ය මුන් ස්වාමීන් වහන්සේ වැඩ සිටි ආරණ්‍යයට පිය නැගුහ.

ආචාර්ය මුන් හිමිගේ අසපුව පිහිටියේ ඝන වනාන්තරය වට කර ගත් විශාල මිටියාවතක කෙළවර ය. කඳු පිහිටා ඇති ආකාරය ධුතාංගධාරී හිමිවරුන්ට අවශ්‍ය හුදකලාව සහ විවේකය සඳහා ම ස්වාභාවික ව ගොඩ නැගුණු පරිසරයක් මෙන් විය. කඳු වැටියේ තැනින් තැන තණකොල සෙවිලි කළ කුඩා ගෙවල් පහක් හයක් පමණ පිහිටා තිබුණි. ඔවුන් හේන් ගොවිතැන් කළ අතර සමහරු දඩයමින් ජීවත් වූවෝ ය. ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා පිණ්ඩපාතය සඳහා වැඩියේ මේ කුඩා ගෙවල් කුටිටිය වෙත ය. සිල් මාතා

කායිව් සහ ඇගේ පිරිස ද මේ ගමන එද්දී බොහෝ විට යැපුණේ එවන් කුඩා නිවාස කුට්ටිවල ජීවත් වූ වැසියන්ගෙන් ය.

ආචාර්ය මුන් හිමි බණමඩුවේ මැද පුවක් කෑල්ලක් හපමින් වැඩ සිටිනු සිල් මාතාවෝ අසපුවට ඇතුළු වෙත් ම දුටුවෝ ය. හනි හනිකට සෙරෙප්පු ගලවා පා සෝදන භාජනයෙන් පා සෝදා, කුඩා ලී පිය ගැටපෙල නැග බණමඩුවට ඇතුළු වූහ. සිල් මාතා කායිව් දැකීම ආචාර්ය මුන් හිමි හට කවදත් සතුටට කරුණක් විය. මෙදින ද ඇය දුටු මොහොතේ පූ තායි ගැමි වහරෙන් ඇයට ආශීර්වාද කොට හිස පසෙකට හරවා සිනාසුණේ ය. සිල් මාතාවෝ සියල්ලෝ ම එකට තුන් වරක් ඉතා ගරුසරු ව උන්වහන්සේට වැඳ නමස්කාර කළහ. ඔවුන්ගේ පාද පසකට නමා ගෞරවනීය ලෙස මඳ සිනහ පාමින් පසෙකින් වාඩි වූහ. උන්වහන්සේගේ දැඩි විනයධර චරිතය දන්නා හැමෝම උන්වහන්සේ ඉදිරියේ ඉතා ප්‍රවේසම් වූහ.

ආචාර්ය මුන් හිමි ද සිල් මාතාවන් ගෞරවයෙන් පිළිගෙන සතුටු සාමීචි කතාවන්ගෙන් පසු එදින රාත්‍රියට ආරණ්‍යයේ කෙළවර උණපඳුරු ගොමුවක ඔවුන් ගෙනා කුඩා කුඩාරම් ඉදිකර විවේක ගන්නාලෙස දන්වා, පසුදින ස්ථීර කුටි සාදා දෙන බවට ඔවුනට පොරොන්දු විය. සිල් මාතා කායිව් හට කැමති කාලයක් එහි රැඳී සිටීමට අවසරය ද ලබා දුන්නේ ය. පොරොන්දු වූ පරිදි පසු දින ගම් වැසියෝ සිල් මාතාවන්ට සුදුසු කුඩා මැසි සහිත කුටි උණ බම්බුවලින් සාදා දුන්හ. සිල් මාතා කායිව් තම පවුලේ ම සොහොයුරියක සේ නායක හිමි සැලකුවේ ය.

උදෑසන හීල් දානයෙන් පසු ආචාර්ය මුන් හිමි භික්ෂූන් වහන්සේලා සහ සිල් මාතාවන් ඔහු වටා හිඳුවා ගෙන, ටික වේලාවක් ඔවුනට සුදුසු ධර්ම අවවාදයක් දුන්නේ ය. බොහෝ විට ඔවුනගේ අලසකම් ගැන වීර්ය නොමැති කම සහ අධිෂ්ඨාන ශක්තිය ඇති නො කර ගැනීම ගැන ඔවුනට බැණ වැදුණේය. ඒ හැම සාකච්ඡාවක් ම ඉතා ඵලදායි විය. සිල් මාතා කායිව්ගේ භාවනා අත්දැකීම් ගැනත් බාහිර ලෝකයන් හා ඇතිකර ගත් විඥානමය සම්බන්ධතා ගැනත් විස්තර දැන ගැනීමට නායක හිමි කැමැත්ත පළ කළේ ය. නමුත් ඒ හැම අවස්ථාවක දී ම එම බාහිර දර්ශනයන්ගේ නිවැරදිතාවය ගැන විරුද්ධත්වයක් නො පෑ අතර එම ප්‍රඥා ඇස බාහිර දර්ශනවලට නොව තම හදවත තුළට යොමු කරගන්නා ලෙස උන්වහන්සේ ඇයට කරුණාවෙන් අවවාද දී උනන්දු

කළහ. සිල් මාතා කායිව් හට තම විශිෂ්ට හැකියාවන් අනුනට පෙන්වීමට ආශාවක් තිබූ අතර ඒ ගැන ඇය ආඩම්බරකමක් ද දැක්වූවා ය.

ආචාර්ය මුන් තෙරුන් වහන්සේ දුටු නුදුටු එමෙන්ම දත් නොදත් සියලු ලෝකයන් පිළිබඳ විස්තර දන්නා ගුරුවරයෙකි. ඊටත් වඩා අතිපිරිසිදු විශිෂ්ට මනසක් ඇති ගුරුවරයෙක් ද විය : ඇගේ හැකියාවන් ගැන උන්වහන්සේ සතුටු වුව ද එම හැකියාවන්ගෙන් ඇයට විය හැකි අනතුරු ගැන ද සැලකිලිමත් වූයේය. කාටත් වඩා එම දර්ශනයන්හි ඇති අනතුරුදායක බව සහ එමගින් ලබන දැනීමේ මුලාව ගැන ද උන්වහන්සේ දැන සිටියේ ය. පිරිසිදු මනස සියල්ල ඒ ආකාරයෙන් ම පැහැදිලිව දකී. නමුත් ඉන් එකකටවු නො ඇලේ. ආචාර්ය මුන් හිමි ඇය දකින දර්ශන ගැන සහ අත්දැකීම් ගැන ඇය දක්වන අදහස් වෙනස් කර ගැනීමට නොයෙක් ක්‍රම සහ පිළිවෙත් කියා දුන්නේ ය. කෙසේ වුවද පුරුද්දෙන් සිතට තදින් කා වැදුණු ප්‍රවණතාවයන් ඒ ඇබ්බැහි වීම් නිසා ම සිත තුළ අධිවේගයක් ඇති කරයි. අවුරුදු ගණනාවකට ප්‍රථම සිල් මාතා කායිව් නිසි මගෙහි යැවීමට බලවත් වූ ක්‍රියාශීලී ගුරුවරයෙකු අනාගතයේ හමුවන බව ආචාර්ය මුන් හිමි දැන සිටියේ ය. අවසානයේ එයට නිසි කාලය දෛවයට භාර දී තිබූ අතර ඇගේ පූර්ණ පිබිදීම සඳහා කරුණු සකස් වීම ද දෛවයට භාර දී තිබුණි.

වසරෙන් වසර සිල් මාතා කායිව් අනිත්‍යය අවබෝධයෙන් දුටුවා ය. – නිරන්තරයෙන් වෙනස් වන ස්වභාවය – ආචාර්ය මුන් ස්ථවිරයන්ගේ කායික ස්වභාවය දුර්වල වෙමින් වෙනස් වන අයුරු ඇය දුටුවාය. උන්වහන්සේගේ ශරීරය ඉක්මනින් වයසට යන අයුරු ද ඇයට පෙනුණි. නමුත් උන්වහන්සේගේ මනස අතිශයින් බැබළෙන දියමන්තියක් සේ විය. සිල් මාතා කායිව් උන්වහන්සේ සමග ආගමික වූත් ආධ්‍යාත්මික වූත් සමීප සබැඳියාවක් ඇති ව ගෞරවයෙන් ඇසුරු කළා ය. ඇගේ සිල් මාතා ආරණ්‍යය කඳුවැටිවලින් මිටියාවත්වලින් ඈත පිහිටිය ද ඇගේ රාත්‍රී භාවනාවන්හි දී උන්වහන්සේ ඊට සම්බන්ධ වී මනසින් රැඳී සිටින බැව් ඇය දැන සිටියා ය. උන්වහන්සේගේ දර්ශනය ප්‍රභාස්වර වූ ආකර්ෂණීය දසුනකි. නමුත් එම දර්ශනයේ ඇය පසුගිය වසන්තයේ උන්වහන්සේගෙන් සමුගෙන ආ පසු ඉතා අසාධ්‍ය අසනීපයකට ගොදුරු වූ බවක් දැක්වෙන දසුනක් නො පෙනුණි.

කාලය ගෙවී යත් ම රෝගාතුර ව සිටි මුන් තෙරුන් වහන්සේ ගේ අසනීප තත්ත්වය උග්‍ර වන්නට විය. ඇගේ රාත්‍රී දසුන්හි උන්වහන්සේ පෙනී සිටීමේ ස්වභාවය වෙනස් විය. එක් රාත්‍රියක දුටු දසුනක් තුළ ඇය ඉදිරියෙන් පෙනී සිටීමින් පමා වීමට කලින් එක් වතාවක් උන්වහන්සේ හමුවීමට එන ලෙසට සිත් සසල කරවන අනුවේදනීය ස්වරයකින් ඇයට කතා කළේ ය. ස්වභාව ධර්මයේ සත්‍ය තත්ත්වය ඇය දැන සිටිය ද උන්වහන්සේ මරණයට පත් වන්නේ යයි සිතීමට ඇය බිය වූවා ය. – ජීවත් වීමේත් මරණයේත් ස්වභාවය හා ඒවායේ නො වැළැක්විය හැකි අස්ථාවර ස්වභාවයයි – එවන් ඉල්ලීමක් මනසට ලැබුණද ඇය උන්වහන්සේ දැකීමට යෑම කල් දැමුවා ය. කීප වාරයක් ම ඇගේ දර්ශන තුළින් පමා නොවී උන්වහන්සේ හමුවීමට එන ලෙසට පණිවිඩ ලැබුණි. උන්වහන්සේගේ අසනීපය උග්‍ර වීම එමෙන් ම මරණයට ආසන්න වීම ගැන නොතකා එම අසනීපය සුව අතට හැරේවිය යන බලාපොරොත්තුව ඇය තුළ වර්ධනය විය. එනිසා උන්වහන්සේ බැහැදැකීමට යෑම ඇය කල් දැමුවා ය. ඇගේ ආධ්‍යාත්මික විමර්ශනයන් හේතුවෙන් ද උන්වහන්සේ ඇගේ දර්ශන තුළ නිතර පෙනී සිටින හෙයින් ද ඇය එම ගමන කල් දැමුවා ය. ඇය සමහර විට කම්මැලිවන්නට ද ඇත. කරුණු කෙසේ වුවද උන්වහන්සේ හමුවීම ඇගෙන් අතපසු විය. ඇය නොයෙක් වර තම සිල් මාතාවන්ට ආයෙත් දිගු වන්දනා ගමනකට සූදානම් වන ලෙසට දැන්වුව ද, ඊට නියමිත දිනයක් ඇය ඔවුනට දැන්වූයේ නැත.

මධ්‍යම රාත්‍රිය පසුවී එක් හෝරාවක් ගත වුණි. අඳුරු වැටුණු මොහොතේ සිට ඇය භාවනා කළේ හිඳි ඉරියව්වෙන් ය. මොහොතකින් ගැඹුරු නො සෙල්වෙන නිසලතාවයක් ඇතිව තිබිය දී ආචාර්ය මුන් හිමිගේ දීප්තිමත් දර්ශනය ඇගේ භාවනා දසුනට අන්තිම වරට පෙනුණි. උන්වහන්සේගේ දර්ශනය ප්‍රභාස්වර ය. ගිගුරුම් හඬකින් ඇයට කතා කළ ස්වභාවය දැක ඇය වෙව්ලුවා ය. ඇගේ නොසැලකිලිමත්කම ගැන උන්වහන්සේ උස් හඬින් ඇයට චෝදනා කළහ. දයාබර පියෙක් ආදරණීය දියණියකට ලෙඩ ඇඳ සමීපයට එන ලෙස වරින් වර කළ ආයාචනා ඇය බැහැර කළ බව උන්වහන්සේ දෙදරුම් හඬකින් කීවේ ය. දැන් ඊට පමා වැඩි ය. තව මොහොතකින් උන්වහන්සේ පිරිනිවන් පානු ඇත. ලෝකයෙන් සදාකාලිකව ම සමු ගනු ඇත. ඇය උන්වහන්සේ දැකීමට ගියහොත් උන්වහන්සේගේ මෘතදේහය පමණක් දැකිය හැකි වනු ඇත. ඇය පිළිගැනීමට එහි විඥානයක් නො පවතිනු ඇත. නොසැලකිලිමත් බව හා අලසකම නිසා වාසනාවන්ත අවස්ථාවක් ගිලිහීම සිදු විය.

"සිල් මාතා කායිව් කෙලෙස් සහිත හැඟීම්වලට ඔබව යට කර ගන්න ඉඩ දෙන්න එපා ඒවා මැරි මැරී උපදින නිමක් නැති පෙරහැරකට මුල පිරීමට හේතුවන දේවල් ය. මානසික කෙලෙස් වැඩි අනතුරක් නැති සුළු දේවල් හැටියට කිසි දිනක සිතන්නට එපා. ඒ ප්‍රයෝගකාරී රැවටිලි පරාජය කළ හැක්කේ ධෛර්යය අධිෂ්ඨානය ඇති හදවතකට පමණි. සිත තුළට එබී බලන්න. ධර්මය ඔබේ මග පෙන්වන්නා කර ගන්න."

"පඨවි ආපෝ තේජෝ වායු ; පොළොව අහස කඳු ගස් ; දිව්‍යලෝක, අපාය සහ ප්‍රේතයෝ යන මේවා මාර්ග ඵල හෝ නිර්වාණය නොවේ. මේවා ඔබට සත්‍ය හෙළිදරව් කරන්නේ නැත. ඒ තැන්වල නිවන ඇතැයි බලාපොරොත්තු වන්න එපා. ඒවාට අයත් සාමාන්‍ය විෂය ක්ෂේත්‍රය තුළ සත්‍ය බවක් පෙනුණ ද ඔබ සොයන සත්‍යය එහි නොමැත. ඒවාට ඇලීමෙන් නිමක් නැති මේ කුරිරු සංසාරයේ ඔබ ව රැගෙන යනු ඇත. එක තැන කැරකෙන්න එපා. හදවත තුළට එබී බලන්න. ධර්මයේ යථාර්ථය ඉස්මතු වී එන්නේ හදවත තුළින් පමණි. එය දීප්තිමත් ව බැබළෙන්නේ හදවත තුළ පමණි. වලාකුළු නොමැති අහසක බැබළෙන පුර හඳ මෙනි."

අලුයම හිරු එළිය වැටීමටත් ප්‍රථම සිල් මාතා කායිව් සමාධි භාවනාවෙන් නැගී සිටියා ය. ශීතල දහදියකින් ඇගේ සුදු සිල් රෙදි ඇඟට ඇලුණා සේ දැනුණි. ඇගේ සිතටත් කයටත් වෙහෙසක් කළකිරීමක් දැනුණි. හදවත පතුලේ වේදනාකාරී සිදුරක් ඇති බවක් හදවතට තේරුණි. ඇය ටිකක් හාන්සි වුව ද නිදා ගැනීමට නම් අපහසු විය.

මතුවී ආ හැඟීම්වල ශක්තිය ඉතා ප්‍රබල ය. ඇය සෙමින් හුස්ම ගනිමින් තනිවම හඬන්නට වූවා ය. වේදනාව තුරන් කර ගැනීමට වෙහෙස දැරුවා ය. හිරු එළිය තම කුටියට වැටෙත් ම සිල් මාතා කායිව් නැගිට සිතට දිරි ගෙන කඩිසර ගමනින් අනික් සිල් මාතාවන් මුණ ගැසීමට ධර්ම ශාලාව වෙත ගියා ය. කතා කිරීමට කට අරිනවාත් සමග ම ඇගේ දෙනෙතින් කඳුළු කඩා හැළුණි. උන්වහන්සේගේ දැනමුතුකම්, ඉගැන්වීම් සහ මරණය ගොනු කර ගත්, ආචාර්ය මුන් මහා තෙරුන් වහන්සේගේ අවසාන දර්ශනය ඇගේ තොල් අතරින් හා කම්මුල් දිගේ ගලා ගෙන ගිය කඳුළු සමග දිය වී ගියේ ය. සිල් මාතා කායිව්ගේ දුර දක්නා ඥාන ශක්තීන් ගැන අන් සියලු සිල් මාතාවෝ දැන සිටිය ද මේ ශෝකී පුවත එසැණින් ම භාර ගැනීමට ඔවුන් සූදානම් වූයේ නැත.

සිල් මාතා කායිව්ගේ දුක් මුසු කතාව නිම වත් ම සියලු සිල් මාතාවෝ එක පොදියක් වී එක එක අදහස් කියවන්නට වූහ. එවේලෙහි ශාලාවේ පිය ගැට පෙළ අසලට පැමිණි ගම් මුලාදැනියා "කුම් මායි, තවම ඔබලාට ආරංචි නැද්ද? ඔබලාට ආරංචිය ලැබුණේ නැද්ද?" යි අසමින් ඔහු දිග සුසුමක් හෙළා සිහින් ස්වරයෙන් "ආචාර්ය මුන් ස්වාමීන් වහන්සේ ඊයේ රාත්‍රි සකොන් නකොන්හි දී පිරිනිවන් පෑ බැව් මම විනාඩි කීපයකට කලින් රේඩියෝවෙන් අසා දැන ගත්තා. රාත්‍රි 2.23 ට උන්වහන්සේ පිරිනිවී බව ඔවුන් දැනුම් දුන්නා." යි කීවේ ය.

සිල් මාතාවෝ දැඩි ශෝකයෙන් හඬන්නට වූහ. ගම් මුලාදැණියා සමාව අයදිමින් "කුන් මායි, - මට සමාවෙන්න මම හිතුවා ඔබලා මේ ආරංචිය දැනගත යුතුයි කියලා." යි දුකින් පැවසුවේ ය. ආචාර්ය මුන් මහ තෙරුන් වහන්සේ 1949 නොවැම්බර් මස 10 වැනි දින පිරිනිවී සේක. ඒ සිල් මාතා කායිව්ගේ හතලිස් අටවෙනි ජන්ම දිනය පසුවී දින දෙකකට පසුව ය. උන්වහන්සේගේ අවසන් ආදාහන කටයුතු ජනවාරි මස අගට යෙදී තිබුණි. ඒ වන විට සිල් මාතා කායිව් එක් වරක් ඇගේ අවසන් ගෞරවය පුද කිරීම සඳහා සකොන් නකොන් වෙත ගොස් තිබුණි. සිල් මාතා කායිව් දේහය තැන්පත් කර තිබූ දෙණ ඉදිරියේ දණ ගැසුවා ය. මූණත වීදුරුවෙන් සාදා නිම කළ මිනීපෙට්ටිය තුළ බහා තිබූ උන්වහන්සේගේ අප්‍රාණික නිසල දේහය දුටු ඇගේ වේදනාව දරාගත නොහැකි තරම් වැඩි විය. කාටත් නො ඇසෙන සේ ඇගේ සියලු වැරදිවලට උන්වහන්සේගෙන් සමාව අයැදී ය.

"මහා තෙරෙ පමාදෙන ....." යි අයැද අනාගතයේ නො සැලකිලිමත් නොවීමටත් අලස නො වීමටත් කම්පා නො වීමටත් නිහඬ ව පොරොන්දු වූවා ය.

ආදාහන දිනය ළං වෙත් ම සිල් මාතා කායිව් සහ පිරිස නැවත වරක් සකොන් නකොන් බලා පිටත් ව ගියහ. භික්ෂූන් වහන්සේලා දෙණ ඔසවාගෙන චිතකය වෙත යන මොහොතේ ඔවුහු ආදාහන භූමියට පැමිණියහ. සිල් මාතා කායිව් ඇතුළු සියල්ලෝ දේහය රැගත් දෙන ඔවුන් පසුකර යද්දී හඬන්නට වූහ.

උන්වහන්සේ මීට කලකට පෙර නිවන් අවබෝධ කළ උත්තම හිමි නමකි. උන්වහන්සේට නැවත ඉපදීමක් නොමැත. ශෝක පරිදේව දුක් දොම්නස් උන්වහන්සේ පසුපස නො එනු ඇත. මැදියම් රැයෙහි දී චිතකයට ගිනි දැල් වුණි. සිල් මාතා කායිව් ගල් ගැසී බලා සිටියා ය. සඳළුළිය, දැල්වෙන චිතකය මත වැටෙද්දී උන්වහන්සේ ඇයට සමීප ව සිටින්නා සේ ඇයට හැඟුණි.

යථාර්ථය දැකීමේ
ශක්තිය අඩංගු මනසේ
අතිපාරිශුද්ධ සාරය

තමන්ගේ මුරණ්ඩුකම දැක බුද්ධිමත්හු
මුරණ්ඩුකම හදුනාගනිති.
සිතෙහි කනස්සල්ල දැක
කනස්සල්ල හදුනාගනිති.
මෝහය දැක එය ද හරි හැටි හදුනා ගනිති.
නුවණැත්තෝ ඔවුනගේ අඩු ලුහුඬුකම් දැක හදුනාගනිති.
අනුන්ගේ අඩු පාඩු සෙවීමට නො යති.

කර්ම පථ විච්ඡේදනය

සිල් මාතා කායිව් තම වීර්ය දෙගුණ කළා ය. ඇය භාවනා කරන හැම අවස්ථාවක ම තම අවධානය හදවත තුළට යොමු කර එහි රඳවා තබා ගැනීමට අධිෂ්ඨාන කළා ය. නමුත් හදවත තුළ සිත රඳවා ගැනීමට තැත් කළ හැම අවස්ථාවක දී ම ඇය මානසික අගාධයකට ඇද වැටුණි. ඇය ඇස් පිය වූ හැම අවස්ථාවක දී ම ඇයට හැඟුණේ මහා උස කන්දක් උඩ සිට හිස් අවකාශයකට වැටෙන්නා සේ ය. රූප සංඥා කෑලි කෑලි මනසට වරින් වර සුළු මොහොතක් දර්ශනය විය ; ඉන්පසු නිසල බවෙකි. ශාන්ත තැන්පත් බවෙකි ; ..... නිසල සතුටෙකි. නමුත් මෙම නිසලතාවයේ ඇතුළත සිට පැණ නගින ඇගේ විඥාන ධාරාව ක්ෂණික ව වේගයෙන් ආපස්සට පැන, නා නා රූප සංඥා ඇති තලයක රැඳුණි. මෙම පාවෙන අවකාශයට ඇතුල් වූ පසු සිල් මාතා කායිව් නැවත තමාට හුරු පුරුදු නිවසට පැමිණියාක් සේ හැඟෙන්නට විය. මෙම අභිරහස් මං මාවත් ඔස්සේ නිදහසේ හැසිරීමට ඇය දැන සිටියා ය. මොහොතකින් ඇය තවත් ලෝකයක් හඳුනා එහි රැඳුණා ය. හැඟීමක්, යොමුවීමක්, ශරීරයක් නැති විඥාන සංඥා ගණනාවක් ඇති, ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වයක් පමණක් ඇති ආශ්චර්යවත් තලයක ඇගේ විඥානය පිහිටයි.

අතීතයේ සත්‍යය අවබෝධ කිරීමට ඇය තුළ තිබූ ආශාව සංසාරයේ සැරිසරන වෙනත් සත්ව ලෝක දැක ගැනීම සඳහා යොමු විය. නිතර නිතර ම මෙම දර්ශන දැක බලා ගැනීමේ පුරුද්දක් තිබූ ඇය, එම ලෝකයන්හි ජීවත් වන ජීවීන්ගේ අදහස් හුවමාරු කරගන්නා ක්‍රම, ඔවුනගේ සිරිත් විරිත් සහ විශ්වාසයන් දැන ගත්තා ය. මෙම දිව්‍යඥානය ඇය ආධ්‍යාත්මික වශයෙන් විශ්වය පුරා විහිදුවමින් බුදුරජාණන් වහන්සේ ඉගැන්වූ ප්‍රඥාව සහ සත්‍යය පිළිබඳ හෝඩුවාවන් සොයා ගැනීමට හැකි දැයි සොයා බැලුවා ය. මෙසේ ඇය නැවත වාරයක් බාහිර ලෝකයට තම සිත යොමු කරමින් අනතුරට ලක් වෙමින් සිටියා ය.

සිල් මාතා කායිවි මෙසේ තම භාවනා පුහුණුවේ අතරමං වී දඟලන කාලයේ දී ආචාර්ය මුන් තෙරුන් වහන්සේගේ ඉතා සමීප ගෝල නමක් ධර්මාවබෝධයේ අවසාන පියවර කරා එළඹ සිටි බව ඇය දැන නො සිටියා ය. එසේ ම උන්වහන්සේගේත් ඇයගේත් කර්ම පථ එකිනෙකට අනාගතයේ හරස් වන බව ද ඇය නොදැන සිටියා ය.

ආචාර්ය මුන් හිමිගේ ආදාහනයෙන් පසු ආචාර්ය මහා බෝවා ඥානසම්පන්නො හිමියෝ පූ පාන් කඳුකර ආරණ්‍යය කරා පැමිණෙමින් සිටියේ ය. දින ගණනාවක් පා ගමනින් වැඩි උන්වහන්සේ ආචාර්ය කොංග්මා හිමි වැඩ සිටි වට් ඩෝයි ධම්මචෙති ආරණ්‍යයට ළඟා වූයේ ය. මෙම ආරණ්‍යය අවුරුදු කීපයකට පෙර සිල් මාතා කායිවි තම අහංකාර සිතිවිලි සමග සටන් කරමින් ආධ්‍යාත්මික සැනසුම සෙවූ ආරණ්‍යයයි. ආචාර්ය මහා බෝවා හිමි මනසේ කෙලෙස් සතුරන් ආක්‍රමණය කළ පරිපූර්ණ ආධ්‍යාත්මික රණ විරුවෙකි. උන්වහන්සේ කෙලෙස් සතුරන් දෙස බැලුවේ තමා මැරීමට එන සතුරන් ලෙස ය. එවන් සතුරන් විනාශ කිරීම විනා ඉන් මෙහා කිසිවකට උන්වහන්සේගෙන් ඉඩක් නො ලැබුණි. උන්වහන්සේගේ අවුරුදු ගණනාවක භාවනා පුහුණුව සම්පූර්ණයෙන් ම යුධ සංග්‍රාමයක් මෙන් විය. පර්යංකයෙන් හිඳ කළ සෑම භාවනාවක් ම සතුරන් හා අතින් පයින් කළ සටනක් බඳු විය. සක්මනින් කළ සෑම භාවනාවක් ම ජීවිතයත් මරණයත් අතර වූ සටනෙකි. හදවත ඇතුළේ සිටි ප්‍රතිවාදීන් එක් එක්කෙනා පසු බැසීමට ලක් කළ අතර උන් හට කිසිදු කරුණාවක් නො දැක්වී ය. කිසිදු යුධ සිරකරුවෙකු රඳවා ගත්තේ ද නැත. නිර්දය ලෙස කෙලෙස් පසුපස ලුහුබැඳ යමින් උන්ගේ බලය

රැඳී ඇති තැන් සෙවීමට උත්සුක වූයේ ය. පහසුවෙන් හඳුනාගත හැකි නිතර ම මතු වෙවී එන කෙලෙස් මුලින් ම හඳුනා ගැනීමට වීර්ය ගත්තේ ය. සංග්‍රාමයක පාබල සෙබළුන් මතු වෙවී එද්දී උන් සමග සටන් කරමින්, මාර්ගය පිරිසිදු කරගනිමින්, විශිෂ්ට හැකියාවන් ඇති සෙබළුන් සිටි භූමියට ඇතුළු විය. සියුම් ලෙස සැලසුම් කරන කපටිකම්වලින් රවටමින් මායාකාරී ලෙස, පැන යාමට මාන බලමින් සිටින සෙබළුන් ඉදිරියට මුහුණට මුහුණ ලා ආවේ ය. ඒ සතුරු සෙන්පතියා, උගේ සිත තුළ ඇති සත්‍ය තත්ත්වය එනම් මෝහය නො පෙන්නා අන් කෙලෙස් හසුරුවන්නෙකි.

රාගය සහ ද්වේෂය උත්පාදනය කරවන ප්‍රධාන කෙලෙස වන මෝහය හදවත පතුලේ සෑම වේලේ ම කපටි ලෙස සැඟවී සිටී. කෙලවරක් නැති සංසාර ගමනේ දී ප්‍රධාන පාලකයා වන මෝහය මැරෙන තුරා කෙලෙස් නමැති හමුදාවෙන් ආරක්ෂා කරනු ලබයි. මෙම පීඩාකාරී අනතුරෙන් මනස බේරා ගැනීමට නම් මෝහයේ රැකවරණයට ඉන්නා කෙලෙස් සෙබළුන් නිරායුධ කර ඔවුන්ගේ ප්‍රයෝගකාරී බලය මුළුමනින් ම විනාශ කර දැමිය යුතු ය. ප්‍රධාන බලකොටුව වන මෝහය විනාශ කිරීම සඳහා ආචාර්ය මහා බෝවා හිමි ඔහුගේ විශේෂ පුහුණු ලද හමුදාවන් වූ සතිය සහ ප්‍රඥාව එක් රැස් කර, මෝහය ලැගුම් ගෙන ඇති සතුරු බලකොටුව වටලා කොටු කරන ලදී. සතුරු ආරක්ෂක බලමුළු "සති" සේනාවෙන් මුහුණට මුහුණ හමුවෙමින්, "ප්‍රඥා" බලයෙන් අක්‍රිය කරමින් ක්‍රම ක්‍රමයෙන් ප්‍රධාන බලකොටුවේ සීමා තෙක් පැමිණියහ. සියලු කෙලෙස් ප්‍රහාණය කළ පසු හදවත නැමැති බලකොටුව තුළ අන්තිමට ඉතිරිවූයේ කෙලෙස් හමුදාවට අණදුන් ප්‍රධාන සෙන්පතියා පමණි. ඒ අපව මර මරා උපදවමින් සංසාර ගමන සකස් කරවන මෝහයයි.

අවසාන ආක්‍රමණය පටන් ගති. විදුලිය බඳු වේගයෙන් සහ අවට බබුළුවන බලයකින් මෝහයේ අවසන් මූලස්ථානය සහමුලින් ම විනාශකර දමන ලදී. ඒ සමග ම සසර ගමන නමැති මහා බලකොටුව කිසිවක් ඉතිරි නොවී කඩා වැටී බිමට ම සමතලා වී නො පෙනී ගියේ ය. ඉතිරි වූයේ කෙලෙස් වලින් තොර, යථාර්ථය දැකීමේ ශක්තිය අඩංගු මනසේ අතිපාරිශුද්ධ සාරය පමණි.

තවත් මහ රහතන් වහන්සේ නමක් ලොව පහළ වූ වගයි.

එම වසරේ වස් විසීම නිම වනවාත් සමග ම සිල් මාතා කායිව්, ඇගේ භාවනා දර්ශන තුළින් එක් දිනක අහසේ දිලිසෙමින් තිබූ තාරකාවන්

බිමට වැටෙනු දැක ඇත. එම දසුනට ඇගේ අර්ථකථනය වූයේ අතිවිශේෂ කම්මට්ඨානාචාර්යයන් වහන්සේ නමක් සහ පින්වන්ත ශිෂ්‍ය පිරිසක් බාන් හුආයි සායි වෙත ළඟ දී ම එන බවයි. එම දර්ශනයේ ස්වභාවය ගැන අතිශයින් ප්‍රබෝධවත් වූ ඇය, අවුරුදු ගණනාවකට පෙර ආචාර්ය මුන් තෙරුන් වහන්සේ ඇයට සඳහන් කළ ගුරුවරයා මෙම දර්ශනයෙන් ඉඟි කළ ආචාර්යවරයා විය හැකි බවට දැඩි විශ්වාසයක් ඇති කර ගත්තා ය.

සිල් මාතා කායිව් අනෙක් සිල් මාතාවන්ට මෙම ආරංචිය පැහැදිලි කළා ය. ලබන වසරේ අතිවිශේෂ කමටහන් ගුරුතුමෙක් සමග ධුතාංගධාරී භික්ෂූන් කණ්ඩායමක් මේ පෙදෙසට වඩින බැව් දැඩි විශ්වාසයකින් යුතු ව ඇය ඔවුනට දැන්වූවා ය. සිල් මාතා කායිව් ඇය බලාපොරොත්තු වූ ස්වාමීන් වහන්සේ කව්රුන් දැයි නිශ්චිත වශයෙන් දැන නො සිටිය ද ඇය දුටු දර්ශනයේ අඩංගු සංඥාවෙහි කිසිදු සැකයක් ඇයට නො තිබුණි. ඇය කුඩා දැරියක ව සිටිය දී එවැනි ම සංඥාවක් දැක මාස කීපයකට පසු ආචාර්ය මුන් හිමි සහ පිරිස තම ගම ආසන්නයට පැමිණි අතීත සිද්ධිය ඇයට සිහි විය. මෙවර දර්ශනය දැක මාසයකට පමණ පසු සංචාරක භික්ෂූන් කණ්ඩායම් කීපයක් එහි පැමිණිය ද, පැමිණි කිසිවෙකු ඇය බලාපොරොත්තු වූ විශේෂිත හිමිනම නො වී ය. කීප විටක් එසේ බලාපොරොත්තු සුන් වී ඇය සාංකාවෙන් තම අරණට ගියා ය.

1951 වර්ෂයේ ජනවාරි මාසයේ දී ආචාර්ය මහා බෝවා මහා තෙරුන් වහන්සේ තවත් ධුතාංගධාරී හිමිවරු කණ්ඩායමක් ද කැටුව පූ පාන් කඳු වැටිය බැස බාන් හුආයි සායි ගම්මානයට උතුරින් ඇති කැලයේ ලැගුම් ගත්හ. උන්වහන්සේලා එම කැලයේ ගල් ලෙන්වල, පර්වත කුහර තුළ ගස් යට තම කුඩා කුඩාරම් ඉදිකර ගත්හ. ඔවුන් ධුතාංග භික්ෂූන් අනුගමනය කරන භාවනා ක්‍රම පුහුණු වෙමින් චාම් ජීවිත ගෙන ගියහ. ආචාර්ය මහා බෝවා හිමි වාසය සඳහා එක් ගල් ලෙනක් තෝරා ගත් අතර එය ගම්මානයේ එක් කොනක සිට සැතපුමකට වඩා මඳක් දුරින් පිහිටියේ ය. උන්වහන්සේ තෝරා ගත් ලෙන "නොක් අන්" නම් විය. එක් සාමණේර හිමි නමක් උන් වහන්සේට ආවතේවකම් කිරීමට නම් කර තිබුණි. එය පළල් ව දිගටි ව පිහිටා තිබූ අතර ලෙන ඉදිරිය කළුගල් අතුළ සේ ස්වභාවික ව සකස් වී තිබුණි. ලෙන ඇතුළතට සිසිල් බව සහ වාතාශ්‍රය යහමින් ලැබුණි. මෙම රමණීය ස්වභාවය හුදකලා ජීවිතයක් ගෙන යෑමට අතිශයින් උචිත පරිසරයක් විය.

ආචාර්ය මහා බෝවා තෙරුන් වහන්සේගේ පැමිණීම ආරංචි වූ වහා ම තවත් සිල් මාතාවන් කීපදෙනෙකුත් සමග සිල් මාතා කායිව් උන්වහන්සේ බැහැ දැකීමට ගියා ය. තරමක් දුෂ්කර කන්දක් නැග අඩි පාරක් ඔස්සේ උන්වහන්සේ වැඩ සිටි ලෙන අසලට යන විට ඈත දී ම කුඩා ගල් පරයක් උඩ ශාන්ත ව වාඩි වී සිටි හිමි නමක් දුටුවා ය. එම දර්ශනයෙන් ඉවසාගත නො හැකි සතුටක් ඇගේ සිත තුළින් මතු වී ආවේ ය. ඇය තමාට ම මෙසේ කියා ගත්තා ය.

"මේ වැඩ ඉන්නේ උන්වහන්සේ තමයි. මට ලැබෙනවා යයි කී ඒ විශිෂ්ට කමටහන් ගුරුවරයා."

ඈත සිට ම මහත් වූ ගෞරවයකින් හිස නමා ගෙන උන්වහන්සේ සමීපයට පැමිණි සිල් මාතාවෝ දණින් වැටී තුන් වරක් ආචාර්ය මහා බෝවා හිමිට වන්දනා කළහ. මූලික සතුටු සාමීචි කතාවලින් පසු ඇය කුඩා අවදියේ දී මුල්වරට ආචාර්ය මුන් මහා තෙරුන් වහන්සේ ඇයට මුණ ගැසුණු අයුරු කීවා ය. ඉන්පසු ටිකෙන් ටික උන්වහන්සේ යටතේ භාවනාව ඉගෙන ගත් අයුරුත් පසුව උන්වහන්සේ ප්‍රදේශය අතහැර යද්දී ඇයට භාවනාව නවතන ලෙසට දුන් අවවාදය ඇතුළු විස්තර ඇය මහා බෝවා හිමි ඉදිරියේ නො සඟවා කීවා ය. ඉන්පසු අවුරුදු ගණනාවක් භාවනා නොකර සිට සිල් මාතාවක් ව සසුන් ගත වූ පසු නැවත භාවනාව ආරම්භ කළ බවත් ඇය පැවසුවා ය.

ආචාර්ය මුන් හිමිගේ ඉතා සමීප ගෝල හිමි නමක් වූ මහාබෝවා හිමි ඇගේ කතාව අසා කුතුහලයට පත්විය. ඇය භාවනා කිරීම නැවැත්වූයේ ඇයි? සිල් මාතා කායිව් ඇගේ භාවනා ප්‍රගතිය සමග විවිධ දර්ශන දකින විස්තර කියද්දී උන් වහන්සේට එම ප්‍රශ්නයට පිළිතුරු ලැබී තිබුණි. එසේ කීමට හේතුව උන්වහන්සේට වැටහුණි. ආචාර්ය මහා බෝවා හිමි මුණ ගැසෙන කාලය වන විට සිල් මාතා කායිව් ඇගේ සමාධි භාවනාව තුළින් වසර දහයක් පමණ කාලයක් විවිධ විෂම සංසිද්ධීන් මිශ්‍රව දැකීමට පුරුදු ව සිටියා ය. ඇය එම දර්ශන නුදුටු අවස්ථාවන්හි දී භාවනාව හොඳින් නො කෙරුණේ යයි ඇයට සිතුණි. එම බාහිර දර්ශනයන්ට ඇය කොයි තරම් ඇබ්බැහි වීද කියතොත් දුක නිම කිරීමේ නිවැරදි මග එය බැව් ඇයට තද විශ්වාසයක් ඇති විය. ආචාර්ය මහා බෝවා ඇගේ වරද ඒ මොහොතේ ම වටහා ගත්තේ ය. පළපුරුදුකම් ඇති දක්ෂ කමටහන් ගුරුවරයෙකු නොමැති ව, ඇය සීමාවන් ඉක්මවා ගොස් ය. ඇගේ ප්‍රබල මානසික හැකියාවන් මගින් ඇයව වැරදි ඉලක්කයන් වෙත

රැගෙන ගොස් ඇති බැව් උන්වහන්සේට වැටහුණි. එසේම ඇය වැනි ප්‍රබල මානසික ශක්තියක් ඇති තැනැත්තියකට නිවැරදි මග කියා දී පුහුණු කළහොත් ධර්මය නිවැරදි ව වටහා ගත හැකි මාර්ගයට පිවිසිය හැකි බැව් උන්වහන්සේ වටහා ගත් සේක. ආචාර්ය මුත් හිමි සිතුවා සේ ම මහා බෝවා හිමි ද ඇය සතු ප්‍රබල මානසික හැකියාවන් නිවැරදි ව හසුරුවන අයුරු ඇයට පහදා දුනහොත්, ඇයට ඉක්මණින් දුකින් නිදහස් වීමට හැකි බවත්, අන් අය ද දුකින් නිදහස් කිරීමට හැකිවන බවත් උන්වහන්සේට පෙනුණි.

ඇතින් සිටි සිල් මාතා කායිවි වරින් වර ආචාර්ය බෝවා වැඩ සිටි ආරණ්‍යයට යෑම සිරිතක් කර ගත්තා ය. සතියකට වරක්, සතර පොහොය දිනවල ඇය ඇගේ සහෝදර සිල් මාතාවන් ද කැටුව කන්ද නගිමින් සවස් වන විට උන්වහන්සේ වැඳ ගෞරව දැක්වීම සඳහා එම ආරණ්‍යයට ගියා ය. එම දිනයන්හි රාත්‍රී කාලයේ උන්වහන්සේ විසින් සිදු කරන සිත්ගන්නාසුලු අසන්නන්ගේ උද්‍යෝගය වැඩි කරවන අනර්ඝ ධර්ම දේශනාවකට සවන් දීමට ද අමතක නො කළා ය. ධර්ම දේශනාව නිම වූ විට සිල් මාතා කායිවිගේ භාවනා ප්‍රගතිය ගැන උන්වහන්සේ ඇගෙන් විමසූහ. එසේ විමසූ හැම අවස්ථාවක දී ම සිල් මාතා කායිවි ඇගේ මනස බාහිර ලෝකයට යන අයුරුත් ප්‍රේත භූත ජීවීන්ගේ දර්ශන දැකීම පමණක් පිළිබඳවත් විස්තර උන්වහන්සේට දැන්වූවා ය. ඇගේ දිව්‍ය ලෝක ප්‍රේත ලෝක තරණය කිරීම සහ එම දර්ශන දැකීමෙන් එම සත්ත්වයන්ගේ ජීවන රටාව ගැන අවබෝධයක් ඇතිකර ගැනීමට ද ඇයට හැකි බැව් දැන්වූවා ය. ඇයට ප්‍රේතයන්ගේ මානසික තත්ත්වය ගැන කීමට හැකියාවක් තිබුණි. එම ප්‍රේතයන් භූතයන්ගේ පැරණි කර්ම විපාක හේතුවෙන් එම අවාසනාවන්ත ආත්ම භාවයන් ලැබූ අයුරු විස්තරාත්මක ව කීමට ඇයට හැකියාවක් තිබුණි. මෙම අද්භූත දර්ශන සහ ඒ අනුසාරයෙන් ඇ ලත් දැනුම හේතු කොටගෙන ඇය ඇගේ එම හැකියාවන්ට වශී වී වාල් වී සිටි බවක් පැහැදිලිවම පෙනුණි. මෙම කරුණ ආචාර්ය මහා බෝවා හිමිගේ කනස්සල්ලට හේතු විය. බාහිර ලෝකයන් වෙත ඇගේ මනස මෙහෙයවීමේ විශිෂ්ට හැකියාවන් ගැන උන්වහන්සේ මහත් සේ පුදුම වූ නමුත්, ඇගේ මනස නිසි සේ පාලනය කර ගනිමින් භාවනාව ඉදිරියට ගෙන යා නොහැකි බැව් උන්වහන්සේට වැටහුණි. සිත බාහිර අරමුණු කරා නො යවා එකඟ කර ගත් මනස තම කය දෙසටත් සිත දෙසටත් යොමු කරවන අයුරු ඉගෙන ගැනීමට උන්වහන්සේ ඇයට අවවාද දුන්හ. උසස් මානසික දියුණුවක් කරා යෑමට ඇගේ

සිත පතුලේ තිබූ කෙලෙස් ඉඩ නොදෙන හෙයින් නිවැරදි සතිය පිහිටුවා ගැනීමෙන් පමණක් එය සකස් කරගත හැකි බැව් ද පහදා දුන්හ.

භාවනාවේ මූලික අරමුණ විය යුත්තේ සම්මා සමාධිය දියුණුකර ගැනීම බව ආචාර්ය බෝවා හිමි පහදා දුන්නේ ය. සමාධිය හරිහැටි පුහුණු කිරීමට නම් ඇගේ සිත තදින් බැඳී තිබෙන එමෙන් ම සතිය නොමග යවන ඇගේ සිතිවිලි සහ සංඥා අතහැරිය යුතු බවට අවවාද කළේ ය. පුරුද්දක් සේ ඇගේ සිත බෙහෙවින් ම එම බාහිර සංඥා සහ දර්ශනවලට ඇදී යාමක් පෙනුණි. සමාධිය නිවැරදි ව පුහුණු කිරීමේ දී සිතෙහි පවතින යථාභූත ඥානයේ ස්වභාවය දැන ගැනීමට හැකි වන අතර එම දැනීම භෞතික හා මානසික වස්තූන් කෙරෙහි කිසිදු ඇලීමකින් තොරව එම දෑ වටහා ගැනීමට උපකාර වනු ඇත. යථාභූත ඥානය මනසේ පහළ වන සංඥා, දර්ශන, සිතිවිලි සහ හැඟීම්වලට වඩා පුළුල් වූ දැනීමකි. එය බාධකවලින් තොර ව සියල්ල දරා ගන්නා නමුත් කිසිවක් නොරඳවා ගන්නා මනසේ අභ්‍යන්තර නිසල තැනකි. මෙම මානසික පිබිදීමේ බලය ඇතිකර ගතහොත් එය අසීමිත ගැඹුරකට විහිදුවීමට හැකි වනු ඇත. මෙම අවස්ථාවට ළඟාවීමට ප්‍රථම බාහිර අරමුණු කරා සිත යොමු වීම වෙනතකට යොමු කරයි.

මුලදී සිල් මාතා කායිව්, ඈ දකින බාහිර ලෝකයන්හි අද්භූත දර්ශන ගැන විස්තර කියද්දී ආචාර්ය බෝවා හිමි එම කතා අසා සිටියා පමණි. ඇගේ මනසේ ආධ්‍යාත්මික ශක්තියේ ප්‍රබලතාවය උන්වහන්සේ දැන සිටියහ. එසේ දැන ඇය සතු විඥානය සිත තුළ ම එය ආරම්භ වූ තැනට යොමු කරවන ලෙස ඉතා සන්සුන් ව ඉල්ලා සිටි සේක. විඥානය සිතෙහි පවතින ක්‍රියාකාරිත්වයක් පමණක් බවත් සිතෙහි පවිත්‍ර වූ සාරය එය නොවන බවත් උන්වහන්සේ ඇයට බොහෝ අවස්ථාවල දන්වා ඇත. ඇය විඥානය අත හැරිය යුතුයි, එමෙන් ම සංස්කාර මගින් සකස් කළ දැනීම ද අත හැරිය යුතුයි. එවිට මනසේ සත්‍ය වූ යථා තත්ත්වය ඉතිරි වනු ඇත.

සති කීපයක් පසු වුව ද උන්වහන්සේගේ අවවාද ඇය නොසලකා සිටින බව පෙනුණ හෙයින් ඇයට තරයේ අවවාද දෙමින්, භාවනාව තුළ දී මනස තමා තුළට යොමු කරගන්නා ලෙසටත් බාහිර අරමුණු වෙත යොමු නොකරන ලෙසටත් දැඩි ලෙස කීහ. ඉඳහිට බාහිර අරමුණු කරා සිත යොමු කළත් සිත ඇතුළට යොමු කිරීම ගැන වඩාත් ම සැලකිය යුතු බැව් ඇයට තරයේ කියා

සිටියහ. තම සිත ඇතුළට හා පිටතට යොමු කරන ක්‍රමය ඉගෙන ගන්නා හැටියට ද උන්වහන්සේ ඇයට අවවාද දුන් සේක.

බාහිර ව ඈ දකින දසුන් ඇගේ සිතෙහි අභ්‍යන්තර මනෝ ඉන්ද්‍රියත් සමග එක්වන හෙයින් සිල් මාතා කායිව් ඒවා තම සිත විසින් කරනු ලබන පිරිසිදු ගවේෂණයන් යයි වරදවා තේරුම් ගත්තා ය. ඇගේ සමාධි භාවනාවෙන් ලබන සංසිද්ධීන් ගැන විමර්ශනය කිරීමෙන්, සංඥාවන් විසින් හඳුනා වටහා දුන් විඥානයේ යථා තත්ත්වය දැනගත හැකි යයි ඇය විශ්වාස කළා ය. ඇගේ මුරණ්ඩුකම ඉස්මතු වී, ඇය පුහුණු කළ මාර්ගය වෙනස් කිරීමට ඇය සූදානම් වූයේ නැත. උසස් තත්ත්වයකින් පවතින ඇගේ දැනීම සහ ප්‍රඥාව ඈ තම භවනා තුළින් ලබන බැව් කියමින් තර්ක කළා ය. එය වෙනස් කිරීමට කිසිදු හේතුවක් ඇය නුදුටුවා ය.

ආචාර්ය මහා බෝවා හිමි, ඇය දකින දර්ශන විශ්වයේ සාමාන්‍යයෙන් පවතින දේවල් බව ඉතාමත් ඉවසීමකින් ඇයට පහදා දුන්නේ ය. පියවි ඇසින් දකින දේවල් හා සමාන ව ඒවායේ කිසිදු විශේෂත්වයක් නොමැති බැව් ද වැඩි දුරටත් පහදා දුන්නේය. ඇය දකින බාහිර ලෝකයන්හි ජීවීන් හා සත්ත්වයන් මනුෂ්‍ය ලෝකයේ ඇය දකින සත්ත්වයන් හා සමාන වේ. ඒ දර්ශන දෙකෙහි වෙනසක් නොමැත. බාහිර ලෝකවලට අයත් සත්ත්වයන් මනුෂ්‍ය ලෝකයේ සත්ත්වයන් මෙන් අතින් ඇල්ලිය නොහැකි ගොරෝසු නො වන රූප වුව ද, ඒවා තමන්ගේ දැනීමෙන් පරිබාහිර වූ දෑ ය. ඇත්ත වශයෙන් ම මේ දර්ශන දකින තැනැත්තාගේ පැත්තෙන් සිතතොත් භෞතික දේ දැකීමේත් බාහිර වූ සත්වලෝක මනසින් දැකීමේත් කිසිදු වෙනසක් නොමැත. මේ අවස්ථා දෙකෙහි දී ම දකින්නේ බාහිර ලෝකයක ඇති බාහිර අරමුණු ය. මෙසේ පිටට විහිදෙන අවධානය නවතා දිශාව වෙනස් කර එම විඥානය තමා දෙසට හරවා මනසේ සත්‍ය වූ ස්වභාවය, හරය, සාරය දැන ගන්නැයි උන්වහන්සේ ඇයට දැඩි ව උපදෙස් දුන්හ. යථාභූත ඥානයේ උල්පත හඳුනා ගන්නැයි කීහ.

සිල් මාතා කායිව් දිගින් දිගට ම උන්වහන්සේ දුන් එම අදහස්වලට විරුද්ධ වූවාය. මසින් සෑදුණු ඇසින් දකින රූප මෙන් නොව දිවැසින් අස්වාභාවික පුදුම දේ දැකිය හැක. දිවැසට ප්‍රේතයන් භූතයන් දැකීමට හැකියාවක් ඇත. දිවැසට සියලු දිව්‍ය ලෝකයන් හා සම්බන්ධ වී දෙවිවරුන් දැක ඔවුන් හා සමීපතාවයක් ඇතිකර ගත හැකි ය. දිවැසට පෙර ආත්ම දැකිය හැකි ය.

නිවැරදි ව අනාගත සිද්ධීන් දැකිය හැක. මෙසේ ලබන දැනීම සහ දකින දර්ශන සාමාන්‍ය ඉන්ද්‍රියන්ගෙන් දැන හඳුනා ගන්නා දැයට වඩා උසස් යයි සිතන ස්ථාවරයේ ඇය සිටියා ය.

ආචාර්ය මහා බෝවා දිගින් දිගට ම සිදුවෙමින් පවතින ඇගේ මුරණ්ඩුකම ඉවසා සිටීමට සූදානම් වූයේ නැත. ඇයට අවවාද දුන් සන්සුන් ක්‍රමය වෙනස් කර සැරෙන් හා උස් හඬින් කතා කොට බාහිර ලෝකයන්හි දර්ශන වෙත තම මනස යොමු නො කරන ලෙස උපදෙස් දුන්නේ ය. වැරදි දිශාවට යොමු කළ මනසින් ලබන දැනීමෙන් ඇයට ඉපදීම, ජරාවට යෑම, ව්‍යාධිය සහ මරණය සම්බන්ධිත මූලික හේතු ප්‍රහීණ කිරීමට නොහැකි බව දැඩි ලෙස ඇයට කියා සිටියේ ය. ඇගේ ම යහපතට මෙම අවවාද දෙන බවත් උන්වහන්සේගේ අවවාදයන්ට කීකරු වීම ඇගෙන් බලාපොරොත්තු වන බවත් තරයේ කියා සිටියේ ය.

ආචර්ය මහා බෝවා හිමිගේ අවවාද නො සැලකූ ඇය ඇගේ දැනීම හා වැටහීම ගැන විශ්වාසයෙන් පෙර පරිදි ම ඇගේ භාවනා පුහුණුව කරගෙන ගිය අතර එහි නිරවද්‍යතාවය සහ වටිනාකම පිළිබඳ නැවතත් තර්ක කිරීමට පෙළඹුණා ය. ඇගේ නො නැමෙන දරදඬු ස්වභාවය ගැන වෙහෙසට පත්වී කුපිත වූ මහා බෝවා හිමි දරුණු ආකල්පයක් ඈ කෙරෙහි පෙන්වමින් උස් හඬින් ඇයට බැණ වැදුණේය. නැවතත් බාහිර සංසිද්ධීන් කෙරෙහි ඇගේ මනස යොමු නො කරන ලෙස සැරෙන් අවවාද දුන්නේ ය. ඇගේ අදහස්වලට උන්වහන්සේ කිසිදු ප්‍රතිචාරයක් නො දැක්වූහ. ගුරුවරයාගේ අවවාද පිළිගෙන තම භාවනා කටයුතු උනන්දුවෙන් කරගෙන ගිය හොත් ඇගේ මනස වසා ගෙන සිටින කෙලෙස් ඉවත් කර ගත හැකි වනු ඇතැයි උන්වහන්සේ ඇයට දැඩි ලෙස කියා සිටිසේක.

එක් දහවලක දී සිල් මාතා කායිව් මුරණ්ඩුවෙන් තම අදහස් ගැන තර්ක කරන්නට සූදානම් වූවා ය. ආචාර්ය මහා බෝවා හිමියෝ එම සංවාදය හිටි අඩියේ නවතා දමා වචනෙන් දෙකෙන් එතැනින් පිටවී යන ලෙසට තර්ජන ස්වරයෙන් බැණ වැදී ඇයව පිටමං කළහ. වහා ම ලෙනෙන් පිට වී යන ලෙසත් නැවත කිසි දිනක මෙම ආරණ්‍යයට නො එන ලෙසටත් කෑ ගසා කීවේ ය. සිතට කා වදින දැඩි වචනෙන් බැණ වැදී අනෙක් සිල් මාතාවන් ඉදිරියේ ආරණ්‍යයෙන් පලවා හැරියේ ය. සිල් මාතා කායිව් උන්වහන්සේගේ

වචනවල බියකරු බව සහ බිහිසුණු බව දැක තැති ගත්තා ය. තම ජීවිතය තුළ එවැන්නකට ඇය මුහුණ පා නොමැත. කඳුළු පිරි දෙනෙතින් යුතුව සියලු බලාපොරොත්තු සුන් වී ඉවසා දරා ගත නොහැකි ශෝකයෙන් ඇය උන්වහන්සේගේ ආරණ්‍යයෙන් හඬ හඬා පිටත් ව ගියා ය. ආචාර්ය මහා බෝවා හිමිගේ දැඩි දෝෂාරෝපණය කන් අග දෝංකාර දෙමින් කැලෑව මැදින් වැටුණු අඩි පාර දිගේ අසිහියෙන් මෙන් තම ආරණ්‍යයට පිය නැගුවා ය. මින් පසු කවරදාකවත් උන්වහන්සේ හමුවීමට නොයෑමට ද ඇය තීරණය කළා ය. උභතෝකෝටික ගැටලුවක පැටළුණු ඇය දැඩි කලකිරීමකට පත් වූවා ය. ආචාර්ය මහා බෝවා හමු වූ පළමු දිනයේ දී ඇගේ භාවනා දියුණුව ගැන සුදුසු ම ගුරුවරයා හමුවූවා යයි සිතමින් සතුටු වූ අයුරු ඇයට සිහි විය. එසේ බලාපොරොත්තු තැබූ ගුරුවරයා ඇයව අගෞරවනීය ලෙස පලවා හැරීම ඉවසා දරා ගත නොහැකි විය. දැන් ඇය මොන ගුරුවරයා ගැන විශ්වාසයක් තබන්න ද? අවුරුදු ගණනාවක් ඇගේ භවනා පුහුණුව දියුණු කර ගැනීමට සුදුසු කම්මට්ඨානාචාර්යයන් වහන්සේ නමක් ඇය සොයමින් සිටිය ද ඒ සියලු බලාපොරොත්තු අද වන විට විනාශ වී ගොස් ය.

ඔබේ සිත
පතුලෙහි තැන්පත් ව ඇති
යථාභූත ඥානයේ මල් පිබිදෙද්දී
දුක් විදිමින් මෙතෙක් දුර පැමිණි අතිදීර්ඝ මාවතේ
කෙළවර විකෙන් වික
පෙනෙන්නට පටන් ගනී.

ධර්මයේ පෙර නිමිත්ත

සිල් මාතා අසපුවට ඇතුළු වූ ඇය උණ බම්බුවලින් තැනූ ඇගේ කුඩා කුටිය තුළට ගියා ය. ඇයට ටික වේලාවක් තනි වී සිටින්නට වුවමනා විය. අද දින ඇයට හෙණ පහරක් ගැසුවා සේ පැමිණි චිත්ත පීඩාව ගැන තනි ව ම සිතන්නට කාලය අවශ්‍ය ව ඇත. නමුත් කුටිය තුළට ඇතුළු වූ ඇයට හැඟුණේ ඇගේ ම කුටිය තුළ සිටියත් ඇය එහි අමුත්තෙකු බව ය. හද කකියවන ශෝකයෙන් දවස ගෙවෙද්දී අඳුර ද කෙමෙන් කෙමෙන් ඈ වටා දැවටෙන්නට විය. සඳත් තරුත් වෙනදා මෙන් සුන්දර ව නො පෙනුණි. වෙහෙස වූ ගතින් හා සසල වූ සිතින් කුමක් කරම් දෝ යයි සිතමින් සිටිද්දී, වහාම වෙනසක් කර බැලුවහොත් හොඳ නේදැයි අමුතු ම සිතිවිල්ලක් ඇගේ මනස තුළට රිංගා එහි තදින් නැවතුණේ ය.

ඇය පත් වූ අසීරු තත්ත්වය ගැන නැවත නැවත ආවර්ජනය කරද්දී ආචාර්ය මහා බෝවා හිමිට ඇයව ආරණ්‍යයෙන් එලවා දැමීමට සාධාරණ හේතුවක් තිබිය හැකි නොවේදැයි ඇයට සිතුණි. ඇය සිතා මතා ම උන්වහන්සේගේ අවවාද පැහැර හැරියා ය. ඇගේ අදහස් වෙනස් කිරීමට කිසිදු ඕනෑකමක් මහන්සියක් ඇය ගත්තේ ද නැත. මේ කරුණු ගැන දිගින් දිගට සිතත් ම ඇගේ පුහු මානය නිසා මේ සියල්ල සිදු වූ බව ඇයට වැටහෙන්නට පටන් ගති. ඇගේ

භාවනා ක්‍රමය අනුමත නො කර වෙනත් මගකට හැරවීමට, උන්වහන්සේට සාධාරණ හේතුවක් තිබිය හැකි බව ඇගේ මනසට තදින් වැටහෙන්නට පටන් ගත්තේ ය. නමුත් උන්වහන්සේගේ ඉගැන්වීම ඇය පිළිනොගත්තේ ඇයි ? ඇගේ ඇබ්බැහිවීම්වලට යට වී උන්වහන්සේගේ අවවාදවලට පිටුපෑමෙන් ඇයට ලැබුණු ප්‍රතිලාභයක් ද නොමැත. උන්වහන්සේ දුන් අවවාද අනුව භාවනා කටයුතු වෙනස් කර බැලුවෝතින් නරක ද? සෑම අවස්ථාවක දී ම අකීකරු නොවී එක් වරක් හෝ උන්වහන්සේ කී අයුරින් කටයුතු කිරීම ශිෂ්‍ය සිල් මාතාවක් හැටියට ඇගේ යුතුකම බව ඇයට වැටහුණේ ය. ඇගේ වරද ඇයට වැටහෙන්නට විය. ඇය තමාට ම දෝෂාරෝපණය කර ගත්තා ය. උන්වහන්සේ ඔබේ ගුරුවරයා ලෙස ඔබ පිළිගත්තා. එය එසේ නම් උන්වහන්සේ දෙන උපදෙස් පිළිගන්න බැරි ඇයි ? ගුරුවරයා කියන දේ කරන්න. උන්වහන්සේගේ ගුරුහරුකම් ගැන සත්‍ය තත්ත්වය එවිට ඔබට වැටහේවි. මුළු රාත්‍රී කාලය තුළ ම ඇය මෙම කරුණ ගැන යහපත් සේ විමර්ශනයක යෙදුණා ය. අලුයම ළඟා වෙද්දී සිතට වද දුන් දෙගිඩියාව ටිකෙන් ටික තුනී වන්නට විය. ඇය මුහුණ පෑ ගැටලුවෙන් වහාම මිදිය යුතු යයි තීරණය කළා ය. උන්වහන්සේගේ උපදෙස්වලට අවනත විය යුතු බවට ඇගේ මනස ඇයට බල කළේ ය. ගුරුවරයා දෙන අවවාද අනුව ලැබෙන ඵල විපාක කැමැත්තෙන් භාර ගත යුතු යයි ඇය සිතා ගත්තා ය.

පසුව දා අලුයම හීල් දානයෙන් මඳ වෙලාවකට පසු සිල් මාතා කායිවි දවසේ අනික් රාජකාරිවලින් ඇය මුදවන ලෙස ඉල්ලා, හනි හනිකට ඇගේ කුටිය වෙත ගියා ය. කුටියට ඇතුල් වූ වහාම ඇය භාවනා ඉරියව්වෙන් වාඩි වූවා ය. ඇගේ චිත්ත වීර්ය ශක්තීන් පිටත සැරිසැරීමට ඉඩ නොදී තම සිත කය වෙත පමණක් යොමු කිරීමට තරයේ ඉටා ගත්තා ය. බාහිර සංසිද්ධීන් කෙරෙහි සිත යොමු වීමට ඉඩ නො දීමට ඇය තරයේ අධිෂ්ඨාන කර ගත්තාය. අතීතයේ භූතයන් ප්‍රේතයන් දෙවියන් දැක ගැනීමට සිත බැහැරට යොමු කිරීමෙන් විශේෂ ලාභයක් නො වූ බැව් ඇයට මේ වන විට වැටහී තිබිණි. මනුෂ්‍ය ලෝකයේ මිනිසෙකු පියවි ඇසින් රූප දකින්නේ කෙසේ ද? මෙය ද එවැනි ම සාමාන්‍ය සංසිද්ධියකි. එහි කිසිදු මානසික දියුණුවක් දකින්නට නොමැත. ඇයට ද එය දැන් දැන් වැටහෙන්නට පටන් ගති. කෙලෙස් ඇගේ සිත දූෂණය කරමින්, කෙලෙස්වලට කිසිදු ආපදාවක් නොකර ගනිමින් හිතුමනාපේ හැසිරුණි. එම කෙලෙස් දැක ඒවා ප්‍රහීණ කිරීමට නම් සිත තුළට එබී බලා එහි ක්‍රියාකාරිත්වය විමසා බැලිය යුතු වේ.

මෙම ප්‍රතිපත්තිය ගැන පූර්ණ විශ්වාසය තබා ඇගේ අවධානය සිත අභ්‍යන්තරයේ ඇති "බුද්ධෝ" යන්න ගැන පමණක් යොමු කොට සියලු මනසිකාරයන් අහෝසි කර සිත ඒකාග්‍රතාවයකට ගෙන හදවත පතුලේ ගැඹුරු සමාධියකට සිත පත් කර ගත්තා ය. ඈ අලුතෙන් හඳුනා ගත් චිත්ත බලය පාවිච්චි කොට භෞතික ශරීරය සම්පූර්ණයෙන් නැති වී යන තුරු යෝනිසො මනසිකාරයේ රැඳී සිටි විට ඇගේ මනස නොසෙල් වී සිටින අවස්ථාවකට පෙරළිණි. ගැඹුරු සමාධියෙන් තරමක් ගිලිහෙද්දී ඇය තවත් දර්ශනයක් දුටුවා ය. මෙවර දුටුවේ භාවනා නිමිත්තක් ය. අභ්‍යන්තර ප්‍රඥා ඇස විවර වෙද්දී ආචාර්ය මහා බෝවා හිමි ඈ දෙසට එමින් සිටිනවා ඇය දුටුවා ය. උන්වහන්සේගේ අතක දිලිසෙන පිහියක් ඇති බව ද ඇයට පෙනිණි. තියුණු පිහිය ඈ වෙත දික් කළ උන්වහන්සේ ඈ දෙස බලා, අපේ ශරීරය හරියට ම සෝදිසි කරන අයුරු පෙන්වා දෙන්නම් යයි කීහ. එසේ කියමින් ඇගේ ශරීරය කැල්ලෙන් කැල්ල කැපීමට පටන් ගත්තේ ය. ඇගේ ශරීරයේ කොටස් කැල්ලෙන් කැල්ල කැපී ඈ ඉදිරියේ වැටී ගොඩ ගැසුණි. සිල් මාතා කායිව් ඇගේ ශරීර කැබලි එකින් එක ඈ ඉදිරියේ වැටෙන අයුරු බිරාන්ත ව බලා සිටියා ය. මහා බෝවා හිමියන් ඇගේ ශරීර කොටස් ඉතා කුඩා කොටස් වන තුරු කප කපා ගොඩ ගැසුවේ ය. ඈ ඉදිරියේ මස්, කටු, පේශීන් විශාල ප්‍රමාණයක් ගොඩ ගැසුණි. ඇගේ අභ්‍යන්තර මනස තුළින් මහා බෝවා හිමි "මොන කැල්ලෙද ඔබ ඉන්නෙ? මොන කැල්ලෙ ද පුද්ගලයෙක් ඉන්නෙ? හැම කැල්ලක් දිහා ම බලන්න. ඒ කැලි සංසන්දනය කර බලන්න. මොන කැල්ලෙ ද ගැහැනියෙක් ඉන්නෙ? මොන කැල්ලද පිරිමියා? මොන කැල්ල ද ලස්සන? මොන කැල්ලට ද ඔබ ආශා කරන්නෙ ?" යනුවෙන් ඇසුවේ ය.

ඒ මොහොත වන විට ඇය ලේ විලක් මැද, විසිරුණු ඇට මස් නහර ගොඩක් මැද සිටගෙන සිටියා ය. ඒ දර්ශනය අතිශයින් පිළිකුල් සහගත ය. මෙච්චර කලක් මේ ජරාවෙන් පිරි කොටස් ඇගේ එල්ලා ගෙන තමා සිටියේ දැයි මහත් වූ පිළිකුලක් ඇති වුණි. ඇගේ ශරීරයේ කැලි එකින් එක විසිරී පැතිරී කුඩා වී ගොස් අවසානයේ කිසිවක් නො පෙනී ගියේ ය. ඒ මොහොතේ ඇගේ මනස ඇතුළට ඇදී යන බවක් ඇයට දැනිණි. විඥාන ධාරාවේ දිශාව වෙනස් වී ඇගේ හදවතේ ගැඹුරුම තැනක නැවතුණා සේ ඇයට දැනුණි. ඉතා සියුම් අවබෝධ ඥානයක් පමණක් ඉතිරි වූවා සේ ය. එම දැනීම ඉතා පිරිසිදු ය. වචනින් විස්තර කිරීමට අපහසු ය. එය ඇති තතු ඒ ආකාරයෙන් ම දනී. මෙම ඇත්ත

ඇති සැටියේ දැනීම, හාත්පස විහිදී ගිය, පිරිසිදු සියුම් ව කරුණු දැනගන්නා ඥානයකි.

දැඩි අධිෂ්ඨානයකින් තම විඥාන ධාරාව තම සිත තුළට යොමු කිරීමෙන් සිල් මාතා කායිවි යථාභූත ඥානය හඳුනා ගත්තා ය. අවබෝධයේ උල්පත නැතහොත් අවබෝධයේ සත්‍ය තත්ත්වය හදවතේ මධ්‍යම ලක්ෂ්‍යයේ, ග්‍රහණය කිරීමට බැරි තරම්, නිමක් නැති අවකාශයක පැතිරුණු ඥාන ශක්තියක් වන් අවබෝධයක් ඇති බව අත්දුටුවා ය. රූපයක් නොමැති විස්මිත අවබෝධයේ නිධානය දුටුවා ය. මෙසේ තම අවධානය ඇතුළට යොමු කර සිටි ඇයට, එම අවධානය සිහියෙන් ඉවත් වී, ඇගේ සිත ඉතා ශාන්ත නිවුණු අවස්ථාවකට මොහොතකින් ඇතුළු විය. කිසිදු මනසිකාරයක් සිතුවිල්ලක් මතුවූයේ නැත. සෑම දෙයක් ම නිහඬ වූ ශූන්‍ය තත්වයකි. සිතත් කයත් අරමුණු සියල්ලත් අතිශයින් නිදහස් වූවා සේ ය. ඇගේ ශරීරයත් සොයා ගැනීමට නොහැකි අයුරින් අතුරුදහන් විය. එම හුදකලා ශාන්ත නිසල නිවුණු තැන ඇයගේ සිත පැය ගණනාවක් රැඳී සිටියේ ය.

ගැඹුරු සමාධියෙන් සිත තරමක් ඉවත් වෙද්දී විඥානයේ සියුම් සෙලවීමක් ගැන ඇගේ අවධානය යොමු විය. මුලින් එය හඳුනා ගැනීමට බැරි තරම් සියුම් විය. එම සෙලවීම මනසේ ගැඹුරු ලක්ෂ්‍යයක් තුළින් ආරම්භ වී යයි ඇයට සියුම් දැනීමක් ඇති විය. එය ටිකෙන් ටික වර්ධනය වී බාහිර අරමුණ කරා යෑමට වේගය වැඩි කළ බැව් ඇයට වැටහුණි. එසේම බාහිර සංඥා බැලීමේ ඕනෑකමක් ඒ තුළින් වැඩි වී ගෙන එන බැව් ද ඇයට වැටහුණි. මීට කලින් වතාවල්වල දී මේ අත්දුටු "බාහිර දර්ශන කරා යෑමේ ඕනෑකම" කොයිතරම් සාමාන්‍ය සිද්ධියක් ව තිබුණා ද කියතොත් මෙවර එය හඳුනා ගැනීමට බැරි තරම් සියුම් විය. ඒ මොහොතේ ම ඉහතින් කී ඕනෑකම, දැනට මනසේ වැඩී ඇති ඇත්ත ඇති සැටියේ දැනීම හමුවේ පැහැදිලි ව පිහිටියේ ය. බාහිර අරමුණු කරා සිත ඇදී යාමට දරන ප්‍රයත්නය මර්දනය කර සිත, හරි මැද නො සෙල්වී තබා ගැනීමට ඇයට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදු විය. ආචාර්ය මහා බෝවා හිමි ගේ තර්ජනාත්මක අවවාද ඇගේ සිහියට ආවේ ය. උන්වහන්සේ ඇයට දැඩිලෙස දුන් අවවාදයේ සත්‍යතාවය ඇයට දැන් වැටහුණි. මනස පිටතට යොමු කිරීමට ඕනෑ කමක් ඇත්තේ මනසට ම බව ඇයට වැටහී, එසේ ඉඩ නො දීමට අධිෂ්ඨාන කර ගත්තා ය.

මීළඟ දින කීපය තුළ මනස අභ්‍යන්තරයේ ම රඳවා ගැනීමට සුදුසු ක්‍රමයක් ගැන සෙවීමට ඇය සිත යොමු කළා ය. ගැඹුරු සමාධියෙන් පිබිදී සිත බාහිර අරමුණු කරා යොමු වීමේ ආශාවන් සිත් තුළින් ඉස්මතු වී නැගී එද්දී එය වහා ම හඳුනා, වළක්වා ගන්නා අයුරු ඇයට සිත තුළින් ම වැටහිණි. එසේ අවබෝධ කර සිත අයාලේ යෑම සාර්ථක ව වළකා ගැනීමට ඇය සමත් වූවා ය. සිත බාහිර අරමුණු කරා ඇදී යාම සිත තුළින් ම උපදිනා සිතිවිලි හා මනසිකාරයන්ගේ පරිකල්පනා ක්‍රියාකාරිත්වයන් හේතු කොට ගෙන සිදුවන්නකි. එසේ බාහිර ව ඇදී යන විඥාන ධාරාව සචේතනික විශ්වයක් නිර්මාණය කර පවත්වාගෙන යයි. නමුත් එවන් සිතුවිල්ලක් පහළ නොවූ විට ඒ ක්ෂණයෙන් ම සතිය නැවත උපදී. මෙම පිරිසිදු දැනීමේ මොහොතක් රැඳී සිටින විට වර්තමානයේ පමණක් පිහිටන එම දැනීම, සුපරීක්ෂාකාරී තියුණු නිවුණු දැනීමක් වේ. එම දැනීම නාම රූපයන්ගෙන් පරිබාහිර වූ භෞතික රූප හා මනෝසංඥා විසින් මුලා නො කරන දැනීමකි. අතීතයේදී ගැඹුරු සමාධියෙන් පිබිදෙන විට, බැහැරට සිත යොමු කරවමින් කිසිදු හේතුවක් නො මැතිව නා නා විධ සංඥා මැවී පෙනුණි. එම දර්ශන පෙනීම නැවැත්විය නොහැකි බව ඇයට වැටහුණු අතර එහි රැඳී සිටීම සුවදායක බව ද ඇයට හැඟුණි. නමුත් සම්මා සතියේ රැඳී සිටින විට අසීමිත සංඥා සහ මනසිකාරයන් ඇති වී නැති වී යන අයුරු ඇය දුටුවා ය. එම දර්ශන ගැන කිසිදු හැඟීමක් හෝ ඇලීමක් ඇති නො කළා ය. යථාභූත ඥානයට සිත යොමු කළ පසු ඇතිවන වෙනස ගැන දැනගත් ඇය හොඳ ගුරුවරයෙකු යටතේ භාවනා ඉගෙනීමේ වටිනාකම හඳුනා ගත්තා ය.

සිත අයාලේ යා නොදී වර්තමානයේ රඳවා ගෙන සිටීමට හැකිබව දත් සිල් මාතා කායිව්, ආචාර්ය මහා බෝවා හිමිගේ අසතුට පිළිබඳ ගෞරවයෙන් කරුණු පැහැදිලි කර ඈ ලඳ දියුණුව ගැන විස්තර කීමට සිතා නොක් අන්ලෙනට යෑමට තීරණය කළා ය. උන්වහන්සේ වැඩ සිටි ලෙන ඉදිරියට යද්දී ඇය පිළිගැනීමට අකමැති බවක් පෙන්වමින් ඈ දෙස රවා ගෙන මෙන් සිටි මහා බෝවා හිමිගේ මුහුණ ඇය දුටුවා ය.

"මොකට ද නුඹ ආපහු ආවේ ?" උන්වහන්සේ මහ හයියෙන් ඇසූහ.

"මම නුඹට කීවේ මෙහෙන් ඈත් වෙලා ඉන්නයි. මෙතැන මහා ඉසිවරියන්ට සුදුසු තැනක් නොවෙයි"

ඇය ඉතා ඉවසීමෙන් කාරුණික ව ඇයට කතා කිරීමට ඉඩ දෙන ලෙසත්, ඇයට අනුකම්පාවෙන් ඇහුම්කන් දෙන ලෙසටත් බැගෑපත් වූවා ය. එදා ඈ පලවා හැරියාට පසු මනසේ අවධානය තම මනස තුළට යොමු කළ බවත් එසේ කළ ඇයට ඇගේ වරද වැටහුණු බවත් උන්වහන්සේගේ වටිනා උපදෙස් අනුව ඉදිරියේ දී තමා දැඩි උනන්දුවකින් කටයුතු කිරීමට තීරණය කළ බවත් ඈ නොා නවත්වා කියාගෙන ගියා ය. ඇය තම භාවනාවේ දී මෑතක අත්දුටු නව අත්දැකීම් උන්වහන්සේට පැහැදිලි කළා ය. කිසිවකට නොා ඇලී සිත පවත්වාගෙන යෑමට ඇය ඉගෙන ගත් බව ද කීවා ය. බාහිර සංසිද්ධීන් ගැන සෙවීමට යෑමෙන් ඇයට භාවනාවේ කිසිදු දියුණුවක් ඇති නොා වූ බව වැටහුණු බව ද පැහැදිලි කළා ය. එම වරද ඇයට පෙනී ගිය බව ද තේරුම් කළා ය. ඇය දින කීපයක් ඉතා මහන්සි වී බාහිර අරමුණු කරා ඇදී යාමට ඇති සිතෙහි ඇති වන ප්‍රබල ඕනෑකම පාලනය කර ගත් අයුරුත්, එසේ පාලනය කර ගත් සිත හදවත මැද තබාගෙන රැක ගැනීමටත් ඇය දැන ගත් බව තේරුම් කළා ය. භාවනාවෙන් ප්‍රගතියක් ලබා කෘතඥතාපූර්වක ව තම ආචාර්යයන් වහන්සේට ගෞරවයෙන් කරුණු පහදා දී වැඳ නමස්කාර කොට සමාව අයැදීමට පැමිණි බව සිල් මාතා කායිවි සන්සුන් ව කියා සිටියා ය.

ආධ්‍යාත්මික නිවැරදි මාර්ගය හරිහැටි හඳුනා ගත්තේ භාවනාවේ යෙදුණු අය පමණි. නිවැරදි ව භාවනාව ඉගෙන ගැනීමට නම් සුවිශේෂ කුසලතාවයන් ඇති ගුරුවරයෙක් අවශ්‍ය ය. විශේෂයෙන් ශිෂ්‍යයා ඉතා උසස් මට්ටමකට පැමිණ භාවනා පුහුණු වෙද්දී ගුරු උපදෙස් අනුව යතොත් සුළු වරදක් හෝ වීමට ඉඩකඩක් නොමැත. ගුරුවරයාගේ අවවාද අනුව ශිෂ්‍යයා ඉදිරියට යෑමට නම් ගුරුවරයා ශිෂ්‍යයාට වඩා භාවනාවෙන් දැන උගත් විය යුතු ය. තමාගේ දැනීම් ශක්තියට වඩා ඉහළින් ඇති දේ ඉගැන්වීමට යෑම ගුරුවරයෙකු නොා කළ යුත්තකි. ශිෂ්‍යයා එසේ ලබන උපදෙස්වලින් කිසිදු දියුණුවක් නොා ලබනු ඇත. විදර්ශන ප්‍රඥාවෙන් විනිවිද දුටු සත්‍යය කරුණු පාදක කොට උපදෙස් දෙන විට දක්ෂ ශිෂ්‍යයාට නිවන් මග යමින් ප්‍රඥාව දියුණු කරගත හැක.

ඇගේ භාවනාව දැන් නිසි මගට වැටී ඇති බැව් පෙනුණු ආචාර්ය මහා බෝවා හිමි ඈ කෙරෙහි අනුකම්පාවෙන් නැවත ආරණ්‍යයට භාර ගත්තේ ය. මනසේ අවතාර සමග ඈ බොහෝ කල් ගතකර ඇති බැව් උන්වහන්සේ ඇයට දැන්වූහ. අනිවාර්යයෙන් බැහැරට යොමු කළ විඥාන ධාරාව ඔස්සේ ගමන්කර

ප්‍රේත භූතයන්ගේ ඕනෑ එපාකම් අනුව වාසය කරමින් තම මනස විසින් ම සකස් කළ මායාකාරී දෘෂ්ටිවල පැටලී සිටීමට ඇයට සිදු විය. විඤ්ඤාණ ධාරාව තම මනස තුළට ආ පස්සට ගෙන ඒමෙන් කලින් තිබූ අධිවේගය තාවකාලික ව නවතා ඇත්ත ඇති සැටියේ දැකීමේ ඥානය ඇති තැන ඇය සිත රඳවා ගත්තා ය. ඇය අත් දුටුවේ යථාභූත ඥානයයි. මනසේ නෛසර්ගික බව දැන ගැනීමේ ස්වභාවයයි. විඤ්ඤාණය මනසේ යථා ස්වභාවයේ ක්‍රියාදාමයකි. නමුත් විඤ්ඤාණයේ ක්‍රියාකාරිත්වය වහා වෙනස් වන සුලු ය. ඇත්ත ඇති සැටියේ දකින ඥානයෙන් තොර ය. ඒ ඒ විඤ්ඤාණයන්ගේ පැවැත්ම ඒවා දැන හඳුනා ගැනීමත් සමග පවතින්නකි. යථාභූත ඥානය යනු එම දැන හඳුනා ගැනීමේ, මූල ධාතුවයි. විඤ්ඤාන ධාරාව ඇති වෙවී නැති වෙවී යන, සකස් වෙමින් පවතින සංසිද්ධියකි. නමුත් යථාභූත ඥානය කිසිවකින් සකස් නොවන ස්ථිර ධර්මතාවයකි.

සිත පතුලේ ලක්ෂ්‍යයක සිට මනසේ පවිත්‍ර වූ සාරය තුළින් විඤ්ඤාණය මතුපිටට ගලා එයි. එවිට දරුණු ලෙස හමනා රාග දෝෂ මෝහ සුළි සුළං හේතුවෙන් එසේ මතුපිටට පැමිණි මතුපිට විඤ්ඤාණය මොහොතින් මොහොත එහි ස්වභාවය, හැඩය, තත්ත්වය වෙනස් කරයි. නමුත් යථාභූත ඥානය එවන් ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන්නේ නැත. සංස්කාර ගොඩ නගන්නේ ද නැත. පවිත්‍ර වූ දැනීමක් පමණක් එහි ඇති හෙයින්, ඇත්තේ අවබෝධය පමණි.

මොහොතින් මොහොත සකස් වෙමින් මතුපිටට එන විඤ්ඤාණයෙන් ලෞකික ලෝක සහ ලෝකෝත්තර ලෝක පිළිබඳ දැනීමක් ලබද්දී, එම දැනීම ඇති වෙමින් නැති වෙමින් ලබා දෙන දැනීමක් වේ. එනිසා එම දැනීම අස්ථිර ය. එම දැනීම කෙරෙහි විශ්වාසයක් තැබිය නොහැක. පිටතට විහිදෙන විඤ්ඤාන ධාරාවන් ඉන්ද්‍රියන් විසින් ගැටෙන බාහිර අරමුණු හා සම්බන්ධ වූ විට එයින් ලබන දැනීම, බාහිර සංඥා සමග මිශ්‍ර වූවෙකි. ඇස රූපයක් හා සම්බන්ධ වූ විට දකින බවට දැනීමක් ඇති වේ. (චක්ඛුවිඤ්ඤාණය) එම දැනීම රූප සංඥාව හා මොහොතින් මොහොත එක් වන විට මොහොතින් මොහොත විඤ්ඤාණය ද ස්කස් කරයි. එවිට විඤ්ඤාණය

'දකිනවා' බවට පත් වේ.

විඤ්ඤාණය කන සමග සම්බන්ධ වූ විට ශබ්දය විඤ්ඤාණය සකස් කරයි. එවිට එම විඤ්ඤාණය 'ඇසෙනවා' බවට පත් වේ.

අනෙක් ඉන්ද්‍රියන්ට ද එසේ ම ය. එම නිසා ඉන්ද්‍රියක් ඔස්සේ විඥානයක් උපදින විට යථාභූත ඥානය සැඟ වේ. සොයා ගැනීමට උගහට ය. නමුත් එය අන්තර්ධාන වූවා නො වේ. මෙම දැන ගැනීමේ ස්වභාවය විඥානයකට වෙනස් වීමකි. සාමාන්‍ය ජීවිතයේ දී මිනිසුන් තම ඇස් කන් රූප ශබ්ද හඹා ගොස් ඔවුන් දකින අසන දේ ගැන නා නා හැඟීම්වලට නතු වී, පසුව එම අරමුණු නැති වූ කල නැවතත් පෙර පැවති නො කැළඹුණු තත්ත්වයට පෙරළේ. නිමක් නැති බාහිර භූත ප්‍රේත රූපයන් සාමාන්‍ය නුවණින් දකිමින් යථාභූත ඥානය මුළුමනින් ම මග හරවා ගෙන සිටී.

විඥාන ධාරාව ආ පස්සට හරවා ගත් කල බාහිර සිතිවිලි අත්හිටුවා නවතී. සිතිවිලි නැවතුණු කල විඥානය ඇතුළට යොමු වී සිත තුළ පවිත්‍ර ව පවතින යථාභූත ව දැන ගැනීමේ ශක්තිය හා එක් වේ. මෙය නිතර නිතර පුරුදු කළ විට අසන දකින විඳින හැම අවස්ථාවන්හි දී ම, (සිත නොමග නො යවන) නො සෙල්වෙන අඩිතාලමක් බවට පත් වේ. තව ද මෙසේ පුරුදු පුහුණු වූ පසු ගැඹුරු සමාධියෙන් මිදුණාට පසුව ද සිතෙහි ඇතුළත අවධානය ඉතා ශක්තිමත් ව පවතිනු ඇත. මෙම සමාධිය තුළින් කෙනෙකු දුකින් මුදවාලිය නො හැකි වුව ද මෙම අඩිතාලම දුකට හේතුවන සියලු ම කෙලෙස් විනාශ කිරීමට උපකාරී වනු ඇත. තම නිරීක්ෂණයන් ස්වභාවයෙන් ම නිවැරදි ව කෙරෙන අතර නිතරම සම්මා සතියෙන් පිහිටුවන තත්ත්වයකට පමුණුවනු ඇත. මෙම අවස්ථාව තියුණු ප්‍රඥාවක් ඇති කරවන අවස්ථාවයි. මෙම අතිශය තීව්‍ර වූ සමාධියෙන් ගොඩ නැගුණු නිසලභාවය සහ ඒකාග්‍රතාවය ස්වභාවධර්මය ගැන යථා තත්ත්වය අවබෝධ කර ගැනීමේ තියුණු විදර්ශනාව ගොඩ නගා ගැනීමට පහසු වන අඩිතාලමක් වේ.

සංස්කාරයක (සිතිවිල්ලක) ක්‍රියාකාරිත්වය නවතාලීමට අරමුණු දෙකක් ඇත. පළමුව සිතිවිල්ලේ ස්වභාවය දැන ගැනීම සඳහා අවශ්‍ය ඉඩ කඩ ලබා ගැනීමයි. මෙය සාමාන්‍යයෙන් කෙරෙන සිතීම හා දැඩි වුවමනාවකින් කෙරෙන සිතීමත් අතර වෙනස අත්‍යවශ්‍යයෙන් පෙන්වා දෙයි. දෙවනුව සංඥා විරහිත විදර්ශනාව ඇතිකර ගැනීමට අවශ්‍ය සිතිවිලිවලට ඉඩකඩ සලසා ගැනීමයි. මෙම අවස්ථා දෙක ම ප්‍රඥාවේ වැදගත් අත්‍යවශ්‍ය කොටස් දෙකකි.

නිවැරදි ව පුහුණු වුවහොත් සමාධිය තුළින් සිතිවිල්ලක් මනසිකාරයක් තාවකාලික ව නවතා දැමිය හැකි ය. නමුත් හේතුව විකෘති නොකරයි. මෙය,

කෙනෙකු ස්වභාවික ව කල්පනා කරනු වෙනුවට ඕනෑකමකින් සිතීමට යොමු කරවයි. මෙවන් මනස ඇලීමකින් තොරව නිරීක්ෂණය කිරීමට හැකි සිතිවිලිවලට විශාල පෙදෙසක් විවෘත කර දෙන්නේ ය. ඉඳුරා ම යමක් හඳුනා ගැනීමෙන් සිතිවිලි ධාරාවේ අරමුණ පහසුවෙන් දැක ගත හැක. ස්වයං විදර්ශනාව තුළින් අනවශ්‍ය සිතිවිලි බැහැර කර අවශ්‍ය සිතිවිලි රඳවා ගැනීමට හැකි වනු ඇත. මෙයින් ලෝකෝත්තර ප්‍රඥා වර්ධනය සඳහා ශක්තිමත් අඩිතාලමක් වැටෙනු ඇත.

සිත උච්චතම නිසලතාවයට පත්වන තුරු එයට නිවැරදි ව සිතීමට බැරි ය. නිතර දෙවේලේ නො නවත්වා දිවෙන විඥානය පදනම් කර ඇතිවන කල්පනා අක්‍රමික ව සැදුණු ඒවා ය. අත්‍යාවශ්‍ය පිරිසිදු කල්පනාවන් නො වේ. සංඥාවක් මත ඇතිකරගත් සිතිවිල්ලකින් අඟවන දැනීම හරයක් නැති දැනීමකි. එවන් අවබෝධයක් කෙරෙහි විශ්වාසයක් තැබිය නොහැකි ය. ගැඹුරු ප්‍රඥාවකින් ලබා ගන්නා විදර්ශනා ඥානය එහි නොමැත.

වටපිට සිතිවිලිවලින් සහ හැඟීම්වලින් වික්ෂිප්ත නො වූ සිත සුවිශේෂ පිරිසිදු සිහියෙහි (සති සම්පඤ්ඤයෙහි) පිහිටයි. එය අනුමාන වශයෙන් ලබන දැනීමක් නොව සත්‍ය විමර්ශනය කොට ලබන අවබෝධයකි. මෙය වැදගත් සිද්ධාන්තයකි. විදර්ශනාව නිවැරදි ව ක්‍රමවත් ව කෙරෙනු ඇත. වෙනත් විතර්ක මති මතාන්තරවලට වැටී නොමග නො යයි. පිරිසිදු ප්‍රඥාවෙන් විමර්ශනය කරයි. ගැඹුරු භාවනාමය මනසකින් අවබෝධ කර ගනී.

සාමාන්‍ය විඥානයේ අන්තරායකර අතුරු ඵලයන් හා බද්ධ වෙමින් බොහෝ කල්ගත කළ සිල් මාතා කායිව් හට මනසේ සත්‍ය තත්ත්වය වටහා ගෙන යථාභූත ඥානය අත්දැකීම සඳහා කටයුතු කිරීම මීට පෙර කළ යුතු ව තිබුණි. මෙම අත්දැකීම ගමනක අවසානය නො ව එක්තරා උපක්‍රමයකි. නීවරණ ධර්මයන්ගෙන් සිත මුදවා ගැනීමේ උපක්‍රමයකි. සිතේ ප්‍රගතිය සඳහා තැබූ ශක්තිමත් අඩිතාලමකි. සංඥාවන් මත සකස් වන විඥානය පාදක කොට ඇතිවන අවබෝධය, යථාභූත ඥානයෙන් අත්දකින අවබෝධය යයි විශ්වාස කර නොමග යාමට හැකි බව ආචාර්ය මහා බෝවා හිමි ඇයට කීවේ ය. එනිසා සිත තුළින් මතුවන සෑම සිතුවිල්ලක් ම ගැඹුරින් විමර්ශනය කළ යුතු බැව් මෙයින් අවධාරණය විය. ගැඹුරු සමාධියෙන් නැගී සිටි සෑම අවස්ථාවක දී ම විඥානයේ ක්‍රියාකාරිත්වය විමර්ශනය කිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි.

භෞතික රූපයන්ට මනොපවිචාරයන්ට සහ මනෝ සංස්කාරයන්ට ඇලෙමින් ක්‍රියාකාරී වන විඥානය ඇය විමර්ශනයට ලක් කළා ය.

මේ ආකාරයෙන් හදවත පතුලේ ඇති කෙලෙස් මුලිනුපුටා දමන අයුරු මහා බෝවා තෙරුන් වහන්සේ සිල් මාතා කායිවි හට පහදා දුන්හ. සම්මත ලෝකයේ පවතින අසීමිත සංඥා බෞද්ධ පටිපදාවේ සාරය නොවන බව උන්වහන්සේ නැවත නැවත කියා සිටි සේක. ඇගේ මානසික ශක්තිය තුළින් ප්‍රථමයෙන් ඇගේ ශරීරය සකස් වී ඇති අභිරහස් තත්ත්වය ගැන සිත යොමු කර, ඉන් අනතුරු ව සිත එම රූපයන්ට ඇලී ඇති සැටි විමසා බලන ක්‍රමය ඇයට වටහා දුන්නේ ය. ප්‍රඥාව දියුණු කිරීම ආරම්භ වන්නේ මිනිස් ශරීරයෙන් බව කියා දී එසේ කළ යුත්තේ ශරීරයේ සත්‍ය තත්ත්වය විනිවිද දැකීමෙන් බවත් එය කළ හැකි දෙයක් බවත් කියා දුන්නේ ය.

කායගතා සති භාවනාවේ දී, එනම් කය ගැන විමර්ශනය කරද්දී නිරායාසයෙන් ම මතු කෙරෙන විදර්ශනා බලය උපයෝගි කරගන්නා අයුරු උන්වහන්සේ ඇයට කියා දුන් සේක. එය සකස් වෙමින් මතුවෙන සිතුවිලිවලට අසු නොවී කෙරෙන භාවනාවකි. එම භාවනාව, සුපුරුදු අර්ථකථන දෙමින්, මතිමතාන්තරවලට යට වෙමින්, උපකල්පනය කරමින් සිදුකෙරෙන භාවනාවක් නො වේ. සිතෙහි පවිත්‍ර සත්‍ය වූ සාරය ගැබ්ගත් නිධානයෙන් මතුවෙන විඥානය දෙස සම්මා සතිය උපයෝගී කර බලන භාවනාව ඇය ප්‍රගුණ කළ යුතු ව ඇත. ක්ෂණික ව විදර්ශනා ප්‍රඥාව ඇතිකර ගැනීමට නම් එදිනෙදා සිතන ක්‍රමය, අනුමාන ව සිතන ක්‍රමය යටපත් කළ යුතුයි. අරමුණු දෙස බල බලා ඒවාට එක් එක් අර්ථකථන නොදී අරමුණු සියල්ල තම සිතට පෙනෙන ආකාරයෙන් ම නිරීක්ෂණය කළ යුතු වේ. පිරිසිදු සිතින් දකින මෙම සංස්කාරයන් අසාධාරණ ලෙස හඳුන්වා දීමටත් ලේබල් ඇලවීමටත් සිත යොමු කළහොත් ලෞකික වශයෙන් ස්වභාවික ව සකස් වන සිතිවිලි සකස් වී සිත ව්‍යාකුල තත්ත්වයකට පත් කරයි. මෙය සත්‍ය පිවිතුරු විදර්ශනාවේ අර්ථ විපර්යාසයකි. නිරන්තර ව සම්මා සතියෙන් අරමුණු දෙස බැලීමෙන් ඇය හඳුනා ගන්නා දේවලින් යම් නිදහසක් ලබනවා මෙන් ම ප්‍රඥාවේ විශේෂිත පවිත්‍රභාවය ද ලබනු ඇත.

තම කයට
ඇලුම් කිරීමේ හේතුවෙන්
ඇතිවන දුක දැකීම
ඇත්ත ඇති සැටියෙන් දැකීම
කෙනෙකුගේ සිත ධර්මයට යොමු කිරීමේ
මූලික ප්‍රඥාවයි. තම කය විනිවිද දකින ඇත්තෝ
වහා වහා ධර්මය අවබෝධ කරති.

කය තුළ මළමිනිය

මහා බෝවා හිමි මුණ ගැසීමෙන් පසු කායිව් සිල් මාතාව එදින සවස තම සිල් මාතා ආරණ්‍යයට පිය නගද්දී, ඇගේ සිතටත් කයටත් අමුතුම ප්‍රබෝධයක් සැහැල්ලුවක් දැනුණි. අඳුර වැටෙත් ම තම කුටිය වෙත ගිය ඇය සුපුරුදු පරිදි භාවනාවට වාඩි වී ඇගේ භාවනා පුහුණුව ගැන ගැඹුරින් සමාලෝචනය කරන්නට වූවා ය. සමාධි භාවනාවේ ඵල සිල් මාතා කායිව් හට ඉතා පහසුවෙන් ලබාගත හැකි ව තිබුණි: මේ වන විට ඇගේ සිත පහසුවෙන්ම ඒකාග්‍රතාවයට පත් වේ. අතිවිශාල විශ්වයේ පවතින ආධ්‍යාත්මික ශක්තීන් අත්දැකීමට හැකි වනුයේ එවන් ඒකාග්‍රතාවයකට පත් වූ මනසකට පමණි. ඇගේ විඥාන ධාරාව සිතෙහි ගැඹුරට යොමු වී, යථාභූත ඥානය නිධාන ගත ලක්ෂ්‍යයේ මොහොතකට රැඳුණි. ඒ ක්ෂණයෙන් ම සිත නැවත එළියට පැන, මීට කලින් විඥානය හැසුරුණු ස්වාභාවික පිළිවෙතට ම ක්‍රියාකාරී විය. සිත එසේ රැඳුණු මොහොතේ ඇය ලත් අත්දැකීම, ඉතා සුවිශේෂී අවස්ථාවකි. නමුත් ඇය එම සුවිශේෂ අවස්ථාව හරි හැටි අවබෝධ නො කර ගෙන, ඉන් පසුව ඇතිවූ සංඥා හේතුවෙන් හටගත් විඥානය ක්‍රියාකාරී වූ අයුර, සිතේ ඇතිවූ ප්‍රගතියක් යයි වරදවා පිළිගත්තා ය.

ඇගේ සිත පත් වූ නිසල ඒකාග්‍රතාවයෙන් නිසි ප්‍රයෝජන ගනිමින්, සිතෙහි වහා වෙනස් වන සුලු තත්ත්වය (අනිත්‍යය) ගැන අවධානය යොමු නො කොට,

විඥානය විසින් සකස් කරන දර්ශන තුළ ජීවත්වෙමින් දකින දකින දර්ශනවලට අර්ථකථන දෙමින් භාවනා කිරීමට ඇය යොමු වූවා ය. මෙසේ ලබන දැනීම වෙනස් වෙවී පැවතෙන සංඥා මත ගොඩ නැගුණු විඥානයෙන් ලද දැනීමක් බව ඇයට නො තේරුණි. එය මායාකාරී දැනීමකි. යථාභූත ඥානයෙන් ලැබිය හැකි ඇලීමෙන් තොර යථාර්ථවාදී දැනීමක් ඇයට නො ලැබුණි. එසේ ඈ ලත් විඥානමය දැනීම ඇය ව හැඟීම් බර සිතුවිලි කරා ගෙන ගියේ ය. ඇත්ත ඇති සැටියේ දැකීමේ අවස්ථාව එමඟින් ඇයට අහිමි වී මගහැරී ගියේ ය. සිල් මාතා කායිව්ගේ සිත පුරුදුව සිටියේ මෙම අනර්ථකාරී ක්‍රියා පිළිවෙත ඔස්සේ නිතර නිතර හැසිරීමට ය. තම සිත වැරදි මාර්ගයේ යමින් තමා මුලා කරන බැව් ඇයට නො වැටහුණි.

ආචාර්ය මහා බෝවා හිමිගේ දැඩි අනපේක්ෂිත බලපෑම, ඇගේ ඒ මුලා වීම වෙනස් කරවීමට හේතු විය නමුත් එය දැන් වෙනස් වී ඇත. ඇගේ විඥාන ධාරාව හදවත මධ්‍යයට යොමු වෙද්දී සිතේ "ඇත්ත ඇති සැටියේ දැනීම" පවතින සිතෙහි සාරය සමග එකතු වී පවිත්‍ර වූ සතිය ඇති නො කැළඹුණු තැනක සිත තැන්පත් වේ. එතැන දී කය ඇති බවක් නො දැනේ. එය අහෝසි වී ඇතැයි හැඟේ. විඥානය ද අහෝසි ය. වචනෙන් විස්තර කිරීමට අපහසු සියුම් සම්මා සතිය පමණක් ඉතිරි වේ. එහි යන්තමින්වත් සෙලවීමක් නොමැත. විඥානයෙහි ද මද වූ සෙලවීමක් නැත. ඇගේ මනස එම නිසලතාවයේ තරමක වේලාවක් රැඳී සිටිය පසු, ඉතා සියුම් රැල්ලක් සේ හදවත මධ්‍යයෙන් ඉවත්වීම ආරම්භ වේ. විඥානය සිහින් රැල්ලක් සේ මතු වී නැති වී යන්නට පටන් ගනී. මෙසේ රැලි ආකාරයෙන් ස්වාභාවික ව මතු වී නැති වී යයි. මෙය සිතා මතා කරන්නක් නො වේ. ඉතා සියුම් සෙලවීමකින් පසු වහාම නැවත නිශ්චල තත්ත්වයකට පත් වේ. චිත්තක්ෂණ ඇති වෙමින් නැති වෙමින් ටිකෙන් ටික එහි වේගය වැඩි කරමින් විඥාන ධාරාවේ සාමාන්‍ය ශීඝ්‍රතාවය කරා පැමිණ ක්‍රියාකාරී වේ.

බාහිර වස්තූන් ගැන ඇගේ සතිය නැවත ලබාගත්ත ද සංඥාවන් මත සිතිවිලි උත්පාදනය වීම අක්‍රිය වී ඇත. සාමාන්‍යයෙන් සිතෙහි, සිතිවිලි ඇතිවන ස්වභාවය මර්දනය කරමින් ඇත්ත ඇති සැටියේ අවබෝධ වන නිරායාසයෙන් ක්‍රියාත්මක වන සිහිය පමණක් ඉතිරි ව ඇති දියාරු තත්ත්වයකට ඇගේ සිත වැටුණි. මෙම තත්ත්වය විශේෂිත සංඥාවක් මත පමණක් ක්‍රියාත්මක වන, කිසිදු

තැනක නො ඇලුණු ස්වභාවයකි. ඇගේ සිත කය ගැඹුරු වූ විදර්ශනාවකින් දැක අවබෝධ කරගත හැකි තත්ත්වයකි. යථාභූත ඥානය ක්‍රියාත්මක වන්නේ මෙම අවස්ථාවේ බවත්, සිත මෙතැන ම රඳවා තබා ගත යුතු බවත් ඇයට වැටහුණේ ය. නාම රූප ධර්මතා විදර්ශනා ඥානයෙන් වටහා ගත හැකි තත්ත්වය මෙතැන බව ඇයට අවබෝධ විය. සංසිද්ධීන් විමර්ශනය කරද්දී සිත මෙතැන රඳවා තැබීමෙන් පිරිසිදු ප්‍රඥාව ඉස්මතු වන බව ඇයට අවබෝධ විය. මෙම අවස්ථාව ප්‍රඥාව ඉතා පිරිසිදු ව ක්‍රියාත්මක වන අවස්ථාවයි. සාමාන්‍ය විඥාන ධාරාව තුළ ම ප්‍රඥාවට ඵලදායී ලෙස ක්‍රියාත්මක වීමට හැකිකමක් මෙහි ඇත. තවත් සියුම් ඉන්ද්‍රියකින් ලබන ප්‍රතිභා ඥානයෙන් ලබන අවබෝධයකට අවහිරයක් නොමැත.

එදින මධ්‍යම රාත්‍රියේ ගැඹුරු සමාධියෙන් නැගී සිටිද්දී සිල් මාතා කායිව්ගේ විඥාන ධාරාව කෙමෙන් කෙමෙන් ඇගේ ශරීරයේ සෑම කොටසක් කෙරෙහි ම යොමු වී ක්ෂණයකින් ඇගේ මුළු ශරීරය ම ඈ ඉදිරියේ මැවී පෙනුණි. ශරීරය ගැන ඈ තුළ තිබූ පූර්ව සංකල්පයන් ඇගේ මෙම අවබෝධයට බාධාවක් නොවීය. ඇය භාවනාවේ වාඩි වී සිටිය දී ම ඇගේ ශරීරයේ රූප කොටස්හි ඇත්ත තත්ත්වය ඇයට දිස් විය. පිරිසිදු සිහිය (සතිසම්පඤ්ඤය) ඇගේ ශරීරයේ සත්‍ය ස්වභාවය ඇයට වටහා දුන්නේ ය. මොහොතින් මොහොත ජරාවට පත් වී, මරණයට පත් වී විනාශ වන අයුරු ඇය දුටුවා ය. ඇගේ පවිත්‍ර මනසින් එම දර්ශනය දුටු ඇය එම යථාර්ථයට නැවත නැවත සිත් යොමු කළා ය. සෑම මොහොතක ම සිදු වෙමින් පවතින ජරාවට යෑමේ සිට නො වැළැක්විය හැකි මරණය දක්වා දිව යන ස්වභාව ධර්මයේ ක්‍රියාවලිය දෙස බලා සිටියා ය. ජරාවට යමින් කුණුවීම ශරීරයේ අභ්‍යන්තර කොටස්වලින් ආරම්භ වී ශරීරයේ අන් සෑම කොටසකට ම සෙමින් සෙමින් පැතිරී ගියේ ය. ඇය එම ක්‍රියාවලිය දෙස අවබෝධයෙන් බලා සිටියා පමණි. ඒ ගැන වැඩිදුර සිතීමට, කල්පනා කිරීමට නොගියා ය. ඇගේ එම අවධානය තුළ ම ඇගේ ශරීරය කොටස්වලට බිඳී යෑමට ඉඩ හැර එදෙස බලා සිටියා ය. ඇගේ මළමිනිය මොහොතෙන් මොහොත දවසින් දවස නිරන්තරයෙන් ජරාවට යමින් කුණුවීම, ඇය බලා සිටිය දී ම වේගවත් ව ක්‍රියාත්මක වන්නට විය.

සිල් මාතා කායිව් තම මළසිරුර දෙස හිසේ සිට පහළට සෙමින් අවධානය යොමු කර බලමින් එහි රූප කොටස් ජරාවට යන අයුරු පැහැදිලි ව දකින

තෙක් බලා සිටියා ය. ජරාවට ගොස් මරණය දක්වා රැගෙන යන ස්වභාවය ප්‍රඥාවෙන් බලා සිටි හෙයින් නො නවත්වා ම මෙම ජරාවට යන ස්වභාවය දෙස ඇය දැඩි අවධානයකින් බලා සිටියා ය. මුලින් ම ඇගේ මළසිරුර ඇතුළතින් ඉදිමෙන්නට පටන් ගෙන කහ පාට ගැන්වී පසු ව නිල්වන් ව කළුපාට වර්ණයකට වෙනස් විය. ඉදිමුණු මළමිනියේ හම ටිකෙන් ටික ඇදී ගොස් තැනින් තැන පුපුරන්නට විය. එසේ පිපිරූ තැන්වලින් කුණු මාංශ කොටස් ද පුපුරා ඒ තුළින් ඕජස් ගලන්නට විය. ඕජස ගලත් ම නිලමැස්සෝ කුණු වී දුගඳ හමන මළමිනිය පුරා වසන්නට විය. කුණු වූ මළසිරුරෙන් හැමූ දුර්ගන්ධය ඇගේ අභ්‍යන්තර ඉඳුරන්ට දරාගත නොහැකි තරම් වමනය එන තරම් වූ දුගඳකි. නිලමැස්සෝ කුණු වී දිය වෙන මස් අතරේ බිත්තර දැමූහ. පැලුණු මස් අතරින් මතු වූ පණුවෝ මළසිරුර පුරා ඇඹරී ඇඹරී ඇදෙමින් දකින්නට බැරි තරම් පිළිකුලක් ඇති කර වී ය. පණුවෝ මළසිරුරේ හම කා දමා හමාර වන විට ඇතුළත කණ්ඩරා මගින් හා අස්ථි මගින් ගොනු කර තිබූ මාංශ පේශීන් ද දියවී විනාශ වී ඇට සැකිල්ල පමණක් ඉතිරි ව දර්ශනය විය. පසුව කිසිවක් ඉතිරි නොවන සේ මස් නහර දිය වී ගොස් ඇට සැකිල්ලේ කොටස් ද තැනින් තැන ගැලවී ගියේ ය.

කාලය ගෙවී යත් ම කාලගුණය සහ වැස්ස ඉතිරි වූ කුඩා මස් වැදලි කණ්ඩරා සෝදා ඉවතට විසුරුවා සුදු පාටින් දිලිසෙන ඇට කටු සමූහය පමණක් ඉතිරි කළේ ය. පසුව සැකිල්ලේ ද ඇට තැනින් තැන විසිරී ගොඩවල් ගැසුණි. හිස් කබල එක තැනක ය. උකුල් ඇටය තවත් තැනක ය. අවසානයේ මෙම ඇට කැලි ද ගෙවී ගොස් කුඩා කැබලිවලට බිඳී, මේ පඨවි ධාතු ආරම්භ වූ පොළොවට ම එක් වී නො පෙනී ගියේ ය. ක්ෂණයකින් මහ පොළොව ද අන්තර්ධාන විය. ඉතිරිවූයේ අතිශයින් පිරිසිදුව හැම දිශාවකට ම විහිදෙමින්, දිලිසෙන සම්මා සති ය පමණි. ටිකෙන් ටික ආත්මයක් ඇතැයි යන හැඟීම එම ප්‍රබෝධවත් සතිය තුළ අහෝසි විය. ඒ සමගම මම මගේ මට යයි කියන හැම සංසිද්ධියක් ම අන්තර්ධාන විය.

සිල් මාතා කායිවි මේ ආකාරයෙන් දිනපතා ම භාවනා කළා ය. ඇය, ඇගේ මළසිරුරේ අභ්‍යන්තරය බලමින්, ජරාව මරණය යන ස්වභාවික ධර්මතා ඇයට සාමාන්‍ය දර්ශන බවට පත්වන තුරු නො කඩවා භාවනා කළා ය. මෙසේ දින ගණනාවක් ම තම දේහය ජරාවට ගොස් කුණු වී විනාශ වී මහ පොළොවට

එක්වන ක්‍රියාවලිය දෙස විදර්ශනා ඥානයෙන් බලමින් ඇගේ භාවනාව ප්‍රගුණ කළා ය. අවසානයේ මහ පොළොවට එක් වන්නේ පඨවි ධාතුව හෙයින් සිල් මාතා කායිව් පසුව මෙම කය සෑදී ඇති මූල ධාතු ගැන අවබෝධය යොමු කළා ය. සියලු රූප කොටස් පඨවි ආපෝ තෙජෝ වායු යන ප්‍රධාන ධාතුවලින් සමන්විත ය. මස් ඇට දත් නියපොතු කෙස් සහ ලෝමවල, පඨවි ධාතුවේ ඇති තද ගතිය ඒවායේ ද ඇත. ලේ මුත්‍රා සෙම් සොටු සහ අනෙක් ශ්‍රාවයන්වල ආපෝ ධාතුවේ ලක්ෂණ අන්තර්ගත ය. ශරීරයේ ඇති උෂ්ණය ශක්තිය ජවය තේජෝ ධාතු ලක්ෂණය ය. වායෝ ධාතු ලක්ෂණ අප හුස්ම ගැනීමෙන් හා ශරීරය තුළින් හා අත පය හැසිර වීමෙන් දැන ගත හැක.

ජරාවට යෑමේ ධර්මතාවය ශරීරයේ පඨවි ධාතුවෙන් සෑදුණු කොටස් සිඳ බිඳ දමා නැවත එම මූලික තත්වයට ම පත් කරවන අයුරු සිල් මාතා දැඩි අවධානයෙන් යුතු ව බලා සිටියා ය. මරණයත් සමග, එනම් විඥානය සිරුරෙන් බැහැර වූ පසු ජීවය ගෙන දුන් තාපය සහ වාතය ඒ ඒ මූලධාතූන් හා එක් වේ. එම ක්‍රියාවලිය ද ඇය විමර්ශනය කළා ය. ශරීරයේ ද්‍රව කොටස් පොළොවට කාන්දු වී හෝ වාෂ්ප වී හෝ ගොස් නැති වී ගිය පසු ශරීරයේ ඉතිරි කොටස් වේලී, ඇට පමණක් ඉතිරිවන තත්ත්වයට පත් වන අයුරු ද ඇය බලා සිටියා ය. එම ඇට කැබිලි ද කාලයාගේ ඇවෑමෙන් පොළොවට පස් වේ. එය සිදු වන අයුරු ද ඇය අවබෝධයෙන් බලා සිටියා ය.

සිල් මාතා කායිව් මිනිස් ඇට සහ මහපොළොව එකට එකතු වී එකම ධාතු කොටසක් බවට පත්වන අයුරු ඉතා ප්‍රබෝධවත් ලෙස අවබෝධයෙන් බලා සිටියා ය. මිනිස් ඇට කුඩු බවට පත්වී පොළොවේ පස් හා එක් වී එකම ධාතු කොටසකට පත් වෙද්දී මනුෂ්‍ය ශරීරය යථාභූත නොවන මායාකාරී ස්වභාවයක් බව ඇගේ හදවත පතුලෙන් මතු වී ආ යථාභූත ඥානයෙන් අවබෝධ කර ගත්තා ය. මිනිස් සිරුර සෑදී ඇති සියලු ම කොටස් පඨවි ආපෝ තෙජෝ වායෝ යන සතර මහා භූත කොටස්වලින් සමන්විත බැව් ඇයට ස්ථිර ව දැනීමේ අවබෝධය පහළ විය. එමෙන් ම එම ශරීර කොටස් අවසානයේ සතර මහා භූතයන්ට ම පරිවර්තනය වන බව ද ඇයට වැටහුණි. ක්ෂණයකින් ඇගේ විදර්ශනා දර්ශන පථයෙන් හා දැනීමෙන් මහ පොළොව ද නො පෙනී ගොස්, ඇගේ 'ඇත්ත ඇති සැටියේ දැන ගැනීමේ හැකියාව' සෑම දිශාවට ම පැතුරුණු ආලෝකයක් බවට පත් විය. ඒ ක්ෂණයෙන් ම ඇගේ අවබෝධ ඥානය නුහුරු

නුපුරුදු තැනක් හා ඒකාබද්ධ වී, එතැනම එසේ රැඳෙත් ම කලින් තිබූ දීප්තිමත් ආලෝකය නැති වී ගියේ ය.

වචනෙන් පැහැදිලි කිරීමට අපහසු ශූන්‍යතාවයකට පත් වුණි. එය ස්ථිර ඒකාග්‍රතාවයකි. ද්විත්ව ක්‍රියාකාරිත්වයකින් පරිබාහිර වූ ඒකීය තත්ත්වයකි. පවිත්‍ර අවබෝධයක් පමණි. උත්කෘෂ්ට වූ ලෝකෝත්තර නිසලභාවයකි. හඳුනා ගැනීමේ සංඥා කිසිවක් නොමැති ලෝකෝත්තර ශූන්‍ය තලයකි. එය සිතෙහි පැහැදිලි යථාභූත සාරය පවතින තැනකි.

ඇගේ ශරීරය, පඨවි ආපෝ තෙජෝ වායු යන ධාතු කොටස්වලට බෙදී යන අයුරු සිල් මාතා කායිව් විදර්ශනා වැඩූ සෑම අවස්ථාවක දී ම පැහැදිලි ව අවබෝධ විය. මහා භූත කිසිවක් නො මැරෙන බව ඇයට වැටහුණි. හිසකේ, නියපොතු, දත්, හම, මස්, ඇට ; ඒවායේ මූල ධාතුවට නැවත පෙරළේ. මේ හැම පඨවි ධාතුවයි. පඨවි ධාතුව කවදද මැරුණේ? පඨවි ධාතුව ජරාවට ගොස් විනාශ වූ පසු කුමන තත්ත්වයකට ද පෙරළෙන්නේ? පඨවි ආපෝ තෙජෝ වායු යන සතර මහා භූතයෝ ඒවායේ ජාති ලක්ෂණයන්ට නැවතත් පෙරළේ. කිසිවක් විනාශ වී නැත. මෙම ධාතූන් එක ගොඩකට ඒකරාශී වූ තැන විඥානය එහි පදිංචි වේ. රූප කලාප ගොඩකට බද්ධ වූ සිත එය පණ ගන්වා ඒ වටා ආත්ම සංකල්පයක් ගොඩ නංවා පීඩාකාරී තත්ත්වයකට ගෙන යයි. මෙම භෞතික ශරීරයට පෞද්ගලිකත්වයක් ආරෝපණය කර, මනස අසීමිත දුක් වේදනා විඳීමට පටන් ගනී.

සිත කිසි දිනක මැරුණේ ද නැත. මෙතෙක් තිබුණේ වෙනස් වෙවී යන ක්‍රියාවලියකි. නිමක් නැති සංසාර චක්‍රයේ සෑම විඥාන මොහොතක් ඇති වී නැතිවී යන මොහොතක දී මැරි මැරී උපදින ඇති වී නැති වී යන ක්‍රියාවලියක් පමණක් දක්නට තිබුණි. මහා භූත සතරේ ක්‍රියාවලිය දෙස සතියෙන් බලන අවස්ථාවන්හි දී, සිල් මාතා කායිව් හට එම ධාතූන් මූලික ධාතූන්ට නැවත නැවත පත්වන අයුරු මනාව සිතට වැටහුණි. එසේ නම් මරණය කොතැනකින් සොයා ගන්න ද? මැරුණු දේ කුමක් ද? ධාතු සතර ය. පඨවි ආපෝ තෙජෝ වායු මොවුන් මැරුණේ නැත. සිත ගැන බැලුවහොත් සිත කෙසේ මැරෙන්න ද? මෙසේ අවබෝධ වෙද්දී ඇගේ සිත ප්‍රකට ව පෙනෙන්නට විය. වැඩි දැනීමක් සහ වැඩි විමසිලි නුවණක් ඇති විය.

උච්චතම නිසලභාවයෙන් නැඟී සිටි සිල් මාතා කායිව් රූපකායක් ඇති ව සිටීමේ අවුල් සහගත තත්වය විදර්ශනා භාවනාවෙන් විමර්ශනය කළා ය. රූපකාය තුළ ආත්මයක් ඇතැයි තමා තුළ ප්‍රබල හැඟීමක් ඇති කරවීම එක් බලයක් වශයෙන් ඇය හඳුනා ගත්තා ය. උපන් දා සිට ඇය ඇගේ ලෝකය සකසා ගත්තේ මෙම රූපය යන සංඥාව මත ය. මෙම ආත්මීය හැඟීම නිසා, රූපය එනම් ශරීරය ආරක්ෂා කර ගැනීම සඳහා නොයෙකුත් දේ කිරීමට ඇය පෙළඹුණා ය. කයට අවශ්‍යය දෑ සපයා දීමට බොහෝ සේ පෙළඹුණාය. කය නිසා ඇති කර ගන්නා සිතුවිලි ඇයව ඉපදෙමින් මැරෙමින් රැගෙන යන සංසාරයේ රඳවා තැබීමට හේතුවන කර්ම බව ඇයට වැටහුණි. කයේ මතුපිටින් පෙනෙන අපිරිසිදු පිළිකුල් ස්වභාවයට වඩා මෙම රූපය සමග සහජයෙන් ම පවතින අපවිත්‍රතාවය වඩා වැඩි බැව් ඇයට ඒත්තු ගියේ ය. මෙම කයෙහි ඇති අපිරිසිදුකමට වඩා කය දක්වන ආකල්ප සහ කයෙන් සිදුකරන ක්‍රියා භයානක වන අවස්ථා ද බොහෝ ය. කය හේතුවෙන් මානය හටගනී. කය හේතුවෙන් කාමාස්වාදය, රාගය ඇතිවී එමඟින් ආරවුල් ඇතිවේ. කයෙන් කෙරෙන නොයෙකුත් පාප ක්‍රියා සහ ශරීරය හේතුවෙන් සිදු කෙරෙන අසත්පුරුෂ ක්‍රියා ද බොහෝ ය. ශරීරය නිසා ඇතිකර ගන්නා නිමක් නැති සිතුවිලි සංසාරය තුළ කෙනෙකු සිරකර තබනු ලබයි. රූපයට ඇලීමේ හේතුව සොයා ගැනීමට නම් ඊට අනුරූප වූ කෙලෙස් සිතිවිලි ගැන විමසිලිමත් විය යුතු බැව් ද ඇය වටහා ගත්තා ය.

පීරිසිදු ජලය ඇති
නිසල පොකුණක පතුලේ ඇති සියල්ල
අපට පැහැදිලි ව පෙනේ.
විවේකී හදවත නිසල ය. නිසල හදවත තුළින්
ප්‍රඥාව පහසුවෙන් මතු වී
ඝුගම ව ගලා යයි. ප්‍රඥාව ගලායද්දී
පවිත්‍ර අවබෝධය ඒ පාෂ්පය එන්නේ ය.

ක්ෂණික අවබෝධය

සිල් මාතා කායිව් ඇගේ උග්‍ර භාවනා පුහුණුවෙහි යෙදෙමින් තැන්පත් මනසකින් යුතුව මාස කීපයක් ගත කළා ය. උදේ හීල් දානයෙන් පසු ඇය ඇගේ හුදකලා කුටිය වෙත ගොස් පැය කීපයක් කුටිය අබියස තනා ඇති සක්මන් මළුවෙහි සක්මන් භාවනාවෙහි යෙදුණා ය. ඇගේ සක්මන් මළුව ඇයට සසර දුක් නැතිකිරීමට උපකාර වන සංග්‍රාම භූමියක් විය. සිල්මාතා කායිව් යෝනිසො මනසිකාරයෙන් යුතුව සක්මන් භාවනාවෙහි යෙදෙද්දී ඇගේ ශරීරය ගැනවත් පොළොවේ ගෑවෙන ඇගේ දෙපා ගැනවත් ඇයට කල්පනාවක් නො වී ය. ඇගේ භාවනා අරමුණු සිත, මොනතරම් සිතෙහි පතුලට කිඳා බැස්සේ දැයි කියතොත් සමහර අවස්ථාවන්හි දී ඈ සක්මන් පථය ඉක්මවා ගොස් වනයට නො දැන ම ඇතුළු වූ අවස්ථා ද විය. එවන් අවස්ථාවන්හි දී, සිතෙහි සමාධියට හානියක් නො වන සේ යෝනිසෝ මනසිකාරයේ ම පිහිටා ඇය නැවතත් සක්මන් මළුවට පිවිස පෙර පරිදි සතියෙන් යුතුව භාවනාවෙහි යෙදුණා ය.

ඇගේ සක්මන් භාවනා පථය, අහස් කුස සිසාරා පැතිරුණු මහා වෘක්ෂයන්ගේ සෙවණ යට ඉදි වූවකි. එක් පැත්තකින් විශාල උණ පඳුරු නැමී ඊට ආවරණයක් ලබා දුණි. සක්මන් මළුවේ එක් කොනක සිහින් ව උසට වැඩුණු පයෝම් ගසේ සෙවණ යට අඩි තුන හතරක් උසට උණ බම්බුවලින්

තැනූ කුඩා මැස්සකි. එම මැස්ස සිල් මාතා කායිව් විසින් තනා ගත්තෙකි. ග්‍රීෂ්ම කාලයේ දහවල මඳ වේලාවක් හාන්සි වී විවේක ගැනීම සඳහා ඇය එම මැස්ස පාවිච්චි කළා ය. එසේ ම සක්මන් භාවනාවෙන් පසු එළිමහනේ හිඳි ඉරියව්වෙන් භාවනා කිරීමට ද එම උණ බට මැස්ස ප්‍රයෝජනයට ගත්තා ය. පයෝම් ගස මහෝගනි දැව පවුලට අයත් කැලෑ ගසකි. එහි පිපෙන මල් කහ පාටින් යුක්ත ය. මේ කාලයේ එම ගසේ මල් පිපී වනාන්තරය අලංකාර කරයි. කහපාට මල් පෙති ගිලිහී වැටී, කහ පාට තිත් තිත්වලින් සිල් මාතා කායිව්ගේ සක්මන් මළුව ද රමණීය ලෙස අලංකාර කළේ ය. මහෝගනි ගසේ ශක්තියත් එහි සෙවණ සහ අලංකාර මල් වරුසාවත් පරිසරයට එකතු කළ මනස්කාන්ත බව, සිල් මාතා කායිව්ගේ මනසෙහි මනස්කාන්ත ස්වභාවය කියාපාන්නක් විය.

එක් සැන්දෑවක ඇය භාවනා යෝගී ව සිටිද්දී එක් දර්ශනයක් දුටුවා ය. ඇය මනසින් දුටුවේ දර්ශනීය පොකුණකි. එහි රන්වන් පාටින් නෙළුම් මල් පිපී තිබුණි. එම මල් මතු පිට පාවෙමින් තිබුණි. මතු පිට පාවුණු එම නෙළුම් මල් කරත්ත රෝදයක් පමණ විශාල ය. රන්වන් පාට පෙති සිහින් පිහාටු කෙඳිවලින් සෑදුණා සේ අතිශයින් රමණීය විය. අනික් නෙළුම් මල් පෙති හැකිළුණු, අහසට විහිදුණු, රන්වන් පාට දේවස්ථානවල මුදුන් කොත් සේ දිස් වුණි. අනෙක් මල් පිරිසිදු ජලයේ ගිලී තිබුණි. ඒ මල්වලින් ගිලිහුණු දිස්නය පොකුණ පුරා රන්වන් රැලි ආකාරයෙන් විහිදුණි. පොකුණෙහි ජලය කොතරම් පවිත්‍ර ද කියතොත් පතුලේ මඩ ඉතා පැහැදිලි ව පෙනුණි. මල්වලින් ගිලිහුණු සමහරක් නෙළුම් පෙති වතුරේ පාවෙමින් තිබුණි. ඒ තෙත් නෙළුම් පත්‍ර ජලය මත දිලිසෙමින් අනර්ඝ සුවඳක් දස අතම පැතුරුවේ ය. සිල් මාතා කායිව් පොකුණ දෙස ගෞරව සම්ප්‍රයුක්ත බියකින් බලා සිටියා ය. ඒ මොහොතේ රන්වන් පාට හංසයෙකු අහසේ සිට පියාඹා පාවී අවුත්, පොකුණට පාත් වී පොකුණේ මල් අතරින් ඒ මේ අත සතුටින් පිහිනන්නට විය. පාවෙන නෙළුම් කොළවලට හොටින් කොටමින් කුඩා පෙති කෑලි කා දමමින් සුකුමාල ලෙස පොකුණේ එහා මෙහා පිහිණුවේ ය. මල් පෙති හතරක් කෑ හංසයා ඉන් තෘප්තියට පත් ව නිසල ව සිටියේ ය. පොකුණේ ඉවුර අද්දරට වී සිල් මාතා කායිව් එදෙස බලා සිටිද්දී ඇය වලාකුළක් සේ ඉහළට පාවී ගොස් ජලය මත පාවී යන්නා සේ ඇයට හැඟුණි. රන්වන් හංසයා සමීපයට ළං වෙද්දී ඇගේ දෙපා දෙපසට විහිදා, හංසයා මත වාඩිවීමට සූදානම් වූවා ය. හංසයාගේ පිට මත වාඩිවෙනවාත්

සමග ම සිල් මාතාවත් හංසයාත් එකෙක් විය. ඒ ක්ෂණයෙන් ම රන්වන් හංසයා තමා බව ඇයට වැටහුණි. වහාම සමාධි භාවනාවෙන් පිබිදුණු ඇය පියවි සිහියට පැමිණියා ය.

සිල් මාතා කායිවි ඈ දුටු දර්ශනයේ තේරුම ගැන දින කීපයක් කල්පනා කරමින් කල්ගත කළා ය. රන්වන් හංසයා – රන්වන් නෙළුම් මල් කෑම – බුදුන් වහන්සේ දෙසූ ආර්ය මාර්ගයේ සාරය වූ ධර්මය සරණ යමින් කෙරෙන පුද පූජා නෙළුම් මල්වලින් අර්ථවත් කරයි. රන්වන් පාටින් ආලෝකය පිළිබිඹු කරයි, එනම් මනසේ ආලෝකයයි ; මනසේ ආලෝකවත් පිබිදීම පිපුණු නෙළුම් මල් අර්ථවත් කරයි. නෙළුම් පෙති සතර චතුරාර්ය සත්‍යය බවත් රහත් ඵලය කරා ගෙන යන මගෙහි ප්‍රධාන මග සලකුණු සතර බවත් ඇය වටහා ගත්තා ය. රන්වන් හංසයා සුවඳ විහිදූ සේ සිල් මාතා කායිවි ද ප්‍රඥාවේ ආලෝකය දසත විහිදුවාය ; මෙම ආත්මයේ දී ම එම ගමන සම්පූර්ණ කොට ඇය එම ප්‍රඥා ආලෝකය ලබනු ඇත.

අභ්‍යන්තරවත් බාහිරවත් විහිදෙන විඥානය, දැනීම ඇති කරවමින් දිගින් දිගට ම ගෙන යන ධර්මතාවයක් බව සිල් මාතා කායිවි දැන සිටියා ය. ඇය අත්දුටු කිසිවක් විඥානයෙන් බැහැර නො වූවකි. සෑම සංසිද්ධියක් ම විඥානයෙන් ග්‍රහණය කොට මනසින් අත්දකින්නේ මේ අනුවය. මෙසේ ගත් කල කය ගැන අවබෝධය විඥානයේ ස්වාභාවික ක්‍රියාදාමයකින් ලබන්නක් බැව් ඇයට වැටහුණි. කෙටියෙන් කියතොත් ඇය කයෙහි අභ්‍යන්තරය විමර්ශනය කළේ කය ගැන මනසින් සකස් කරගත් සංඥා මත ය. විඥානය ශරීරය පුරා පැතුරුණු දෙයකි. එය ඉන්ද්‍රියයන් ප්‍රාණවත් කරමින් ඉන්ද්‍රියයන් විසින් ලබන දැනීම් ක්‍රියාත්මක කරවමින් සෑම තැනක ම විහිදී ක්‍රියා කරයි. කය නමැති මූර්තිය අත්දැකීම - කය මම ලෙස - ඉන්ද්‍රියයන් විසින් හඳුනා ගත් විශේෂිත සංඥා මගින් දන්වන පරිදි ශරීරය ඇගේ බවත් එයට තදින් ඇලී කය 'මගේ' යයි පිළිගැනීමත් සිදු වේ. නිරායාසයෙන් ම සිතෙහි පහළ වූ අතහැරීමේ චේතනාවකින් යුතු ව මනෝමය වශයෙන් මේ ශරීරය සකස් වූවෙකැ යි සලකා එමෙන් ම විඥානය හේතුවෙන් ද සකස් වූවක් යැයි දැන, ඒ අනුව සිල් මාතා කායිවි ඇගේ කය දෙසට අවධානය යොමු කළා ය. කය ධාතූන්ගෙන් සකස් වූ තාවකාලික සංයුතියක් නම්, මගේ කය යන හැඟීම මතු වූයේ කොතැනකින් ද? එමෙන් ම ශරීරය ගැන අප්‍රසන්න සිතිවිල්ල ආරම්භ වූයේ කුමක් නිසා ද?

ස්වාභාවික ව ජරාවට පත් වී විනාශ වන ශරීරයේ ක්‍රියාවලිය දැක පිළිකුල් සහගත හැඟීම් මතු වී පැමිණියේ කුමක් නිසා ද?

ශරීරය ජරාවට පත්වෙමින් විනාශ වන අභ්‍යන්තර සංඥා ගැන සිත යොමු කරමින්, සිල් මාතා කායිව් ඒ එක් එක් සංඥාවන්හි දී තමාට ඇතිවන මනාපය හෝ අමනාපය ගැන හෝ විශේෂ සැලකිල්ලක් දැක්වූවා ය. ඇලීමෙන් ඈත් වූ අපක්ෂපාතී සාක්ෂිකරුවෙකු හැටියට මනසේ වෙනස්කම් හඳුනා ගැනීමට ඇයට හැකි විය. මනසට එම මනෝමය සංඥා හඳුනා ගැනීමටත් ඒ අනුව ඒවාට දෙන අර්ථකථන ඔස්සේ ප්‍රතික්‍රියා දැක්වීමටත් ඇය ඇගේ සිතට ඕනෑතරම් නිදහස දුන්නා ය. ඇය ඇගේ කයේ තත්ත්වය ගැන දැන ගත්තේ ඉන්ද්‍රියයන් විසින් හා සංඥා මගින් හඳුන්වා දෙන ආකාරයට ය. නමුත් එසේ ලබා ගත් දැනීම ඇය නිත්‍ය හා මනාප වශයෙන් හෝ අනිත්‍ය අමනාප වශයෙන් හෝ අත්දුටුවා ය. ඇයට දැන ගැනීමට අවශ්‍ය වූයේ, මනස එම සංඥා නිර්මාණය කළේ ඇයි ද යන්නත් මනස, ඊට අර්ථයක් ලබා දී හාත්පස පැතුරුවේ කෙසේ ද යන්නත් ගැන ය.

කායගතා සති භාවනාව වඩද්දී ඇගේ මනසට නිරායාසයෙන් නැගී ආ හැඟීම් ගැන විශේෂ අවධානයක් සිල් මාතා කායිව් දැක්වූවා ය. විඥාන ධාරාව ගලා යෑම නවතා නැවත ආ පස්සට එහි ආරම්භය කරා ගෙන යෑමට ඇයට හැකියාවක් තිබුණි. එනිසා එම ක්‍රමය පාවිච්චි කරමින් උද්ගත වන සිතිවිලි සහ හැඟීම් එහි මූලාරම්භය වෙත යවා විමර්ශනය කිරීමට ඇය පෙළඹුණා ය. ඇය, ජරාවට පත් කලක් ගතවූ ශරීරයක් ගෙන, කොටස් කොටස් වශයෙන් සංඥා නො ගෙන මුළු කය ම එක් සංඥාවක් වශයෙන් ගෙන ඒ ගැන අවධානය යොමු කළා ය. නිරායාසයෙන් එකට ක්‍රියාත්මක වන අවබෝධ ඥානය සහ හඳුනා ගැනීම, සිතේ පතුලෙන් ම පැන නගින පිළිකුලක් ක්ෂණික ව එම එක් එක් ශරීර සංඥාව විනිවිද යවමින් මතු වන බව ඇය වටහා ගත්තා ය. අරමුණ සහ අරමුණ බලන්නා එක් සංයුතියක් වනතුරු, ඇය එම අරමුණ ඇගේ අවධානයේ රඳවා ගත්තා ය. ඒ මොහොතේ දී සංඥාව සහ හැඟීම ටිකෙන් ටික හැකිලී සිත පතුළට කිඳා බැස විඥානයෙන් මේ දෙකම උරාගන්නා තුරු පැවතුණි. ඒ සමග ම එම තත්ත්වය අතුරුදහන් විය. මෙසේ දුටු වහාම ඇය නැවතත් ශරීර සංඥාව දෙසත් එයට ඇලුණු පිළිකුල් හැඟීමටත් තම අවධානය යොමු කළා ය ; නැවතත් ඇය එසේ කළා ය. එවර ද සංඥාව, හැඟීම් සිතිවිල්ලත් සමග මිරිකී

එකක් වී, එය ආරම්භ වූ තැනට ගොස් විඥානය අභ්‍යන්තරයේ අතුරුදහන් විය. මෙසේ දිගින් දිගට ම කරගෙන යද්දී, ඒ හැම අවස්ථාවක දී ම සංඥාව සහ හැඟීම ආපස්සට අවුත් අතුරුදහන් විය. මින් අනතුරු ව කිසිදු පරිශ්‍රමයකින් තොර ව සංඥා සහ හැඟීම් මනස තුළ ආරම්භක ස්ථානයට ආපසු අවුත් ක්ෂණයකින් අතුරුදහන් වීමට ඇගේ මනස සකස් විය.

සිල් මාතා කායිවිගේ කාය ගතා සති භාවනාව තීරණාත්මක අවස්ථාවකට එළඹුණේ ය. රූපය කෙරෙහි, කය කෙරෙහි සිතෙහි ඇලීමට ඇති මූලික හේතුව පැහැදිලි ව අනාවරණය විය. ක්ෂණයකින් මතු වන පිළිකුල් හැඟීම එහි මූලික හේතුව සමග නැවත සම්බන්ධ වූ විට ඉතා පැහැදිලි අවබෝධයක් ඒ ක්ෂණයෙන් ම උදා විය ; පිළිකුල සහ ආකර්ෂණය යන හැඟීම් දෙකම උත්පාදනය කළේ මනසයි ; ප්‍රසන්න බව සහ අප්‍රසන්න බව යන සංඥා දෙකම මනස විසින් නිර්මාණය කරන ලද්දේ ය. එම ලක්ෂණ බාහිර අරමුණෙහි නොතිබුණි. ලස්සන අවලස්සන බැව් ඇතිකර ඇත්තේ මනස ය. බාහිර අරමුණට එය ඇති කිරීමට හැකියාවක් නොමැත. සත්‍ය වශයෙන් ම සිදුවන්නේ විඥානය මොහොතෙන් මොහොත සංඥාවන් හා සම්බන්ධ වෙමින් ඒ ඒ අනුව හැඟීම් ඇති කිරීමයි. ඇගේ මනස හැම මොහොතක ම අපූර්ව චිත්‍ර මැව්වේ ය. - ඈ ගැන චිත්‍ර සහ බාහිර ලෝකය ගැන චිත්‍ර - මේ චිත්‍ර පසුව විශ්වාසයක් ඇතිකරවන සත්‍ය දේ බවට රවටා ඇත.

මෙම අවස්ථාව එළඹෙද්දී අනන්ත වූ අවකාශයේ පැතුරුණු සිතෙහි යෝනිසො මනසිකාරය සහ සංඥාවේ සවිස්තරත්වය එකවර ක්‍රියා කරන්නට පටන් ගත්තේ ය. එමෙන් ම මනොසංඥාවන් හි පැවති මායාව ටිකෙන් ටික සිඳී බිඳී යන්නට විය. විඥාන ධාරාව තුළ හැඩයක් නැති සංඥා අසීමිත සංඛ්‍යාවක් එකතු වෙමින් ඒ ක්ෂණයෙන් ම එය අහෝසි වී ගියේ ය. රූප සංඥාව ඇතිවූ මොහොතේ ම ඊට ආශාවක් හෝ හැඟීමක් ඇතිකර ගැනීමට ප්‍රථම යෝනිසො මනසිකාරය එය වටලාගෙන අන්තර්ධාන කොට ශූන්‍ය තත්ත්වයක් ඇති කළේ ය. ගිණිය නොහැකි තරම් කයේ කොටස් (රූප) හා සිතුවිලි (නාම) කිසිදු පිළිවෙලක් නොමැති ව එකක් පසුපස එකක් මතු වෙවී නැති වෙවී ශූන්‍යයට යෑමට පටන් ගත්තේ ය.

මීට පෙර කය සම්බන්ධ ව සංඥා මතු වූ විට, ඊට කැමැත්තක් දක්වා ආත්ම සංඥාව තහවුරු කළේ ය. නමුත් අද එම සංඥා මනසට ඇතුළු වෙත් ම

අහෝසි වී යන තත්ත්වයක් උදා වී ඇති හෙයින් එහි 'ආත්ම' සංඥාවක් ගොඩ නැගීමට කිසිසේත් ඉඩක් නැත.

මෙම සංඥාවන්ගේ ඇතිවීම නැතිවීම ඉතා ශීඝ්‍රයෙන් සිදුවන හෙයින් හඳුනා ගත් සංඥා අභ්‍යන්තර ඒවා ද බාහිර ඒවා දැයි දැන ගැනීමට අවශ්‍යතාවයක්, ඕනෑකමක් සිත තුළ ඇති නො වේ. අවසානයේ විඥානය තුළ මෙම රූප කලාප ඉපිද ඉපිද නැති වෙවී අතිමහත් වේගයකින් ක්‍රියාත්මක වන හෙයින් ඒවා තේරුම් ගැනීමට නොහැකි තත්ත්වයක් උදා වුණි. සංඥාවක් අතුරුදහන් වූ වහාම එතැන ඇති වූයේ ශූන්‍ය තත්ත්වයකි. - සංඥාවන්ගේ ශූන්‍ය තත්ත්වයකි. - රූපයට නො ඇලෙන ශූන්‍ය තත්ත්වයකි. අතිශයෙන් පරිශුද්ධ වූ අවබෝධ ඥානයක් පමණක් සිතෙහි ඉතිරි විය. සංඥාවක් විදුලි සැරයක් සේ ඇති වී නැති වී යන ක්ෂණයෙන් ම ශූන්‍ය තත්වයක් ඇතිවන බව මනාව අවබෝධ විය. මෙම මොහොතේ සිට සිල් මාතා කායිව්ගේ මනස ආශ්චර්යවත් අතිපිරිසිදු තත්ත්වයකට පත් වුණි. කය පැවතුණ ද, දැනීම ශූන්‍ය ය. කිසිදු සංඥාවකට ඇගේ සිතෙහි රැඳී සිටීමට නොහැකි විය.

මෙම ප්‍රඥාව සිල් මාතා කායිව්ගේ ජීවිතයේ මහත් පෙරළියක් ඇති කළේ ය. ඇය සත්‍යය ඇති සැටියෙන් ම දැන ගත්තා ය. විඥාන ධාරාව ඇති කරන සංඥා මායාකාරී බව ද එම මායාකාරී තත්ත්වය මත සකස් වන පිළිකුල් සහගත සහ ආකර්ෂණීය හැඟීම් මිත්‍යාවන් බවද ඇයට වැටහුණි. මනාප අමනාප සිතිවිලි දෙක ම සිතෙහි පතුලෙහි අව්‍යක්තව නාමරූපයන් විකෘති කර විඥාන ධාරාව ඔස්සේ පැන නැගුණු සංඥා බව ඇයට වැටහුණි.

එම සංඥාවන්හි සත්‍ය තත්ත්වය වැටහුණු කල එම සංඥාවන්හි කිසිදු වටිනාකමක් ද නැති බැව් අවබෝධ විය. එවිට සංඥාවන්හි මතුපිටින් පෙනෙන ලෝකය විනාශ වී යයි. ඒවාට ඈ තුළ තිබූ ඇල්ම ද ඒ සමග ම නැති වී ගියේ ය. මනස විසින් නිර්මාණය කළ සියලු සංඥාවන් නැති වූ කල එම රූපයන්ට තිබූ ඇලීම ද නැති වී ගියේ ය. ඉන්ද්‍රියන්ගෙන් ඇතිකරන සෑම තත්ත්වයන්ගෙන් ම ඇගේ මනස ඈත් වූ කළ ඇගේ මානසික තත්ත්වය ගම්භීර වූ ශාන්ත වූ අවස්ථාවකට පත්වූ බවක් ඇයට වැටහුණි.

අවසානයේ ශරීර සංඥා නග්න ඒවා වුව ද ඇගේ මනසේ විඥාන වපසරියේ පැවතුණේ නැත. ඇගේ මනසේ කිසිදු රූපයක් හැඩයක් තදින් අල්ලා ගැනීම

සඳහා නො රැඳුණු හෙයින් ඇය රූප ඇති තලයක කිසිදා නො උපදින බවට සිල් මාතා කායිව් වටහා අවබෝධ කර ගත්තා ය. සාමාන්‍ය මනසක පවත්නා භෞතික රූප සංඥා සහ රූප සම්බන්ධිත සීමා සම්පූර්ණයෙන් අහෝසි වී ගොස් ය. ඇයට ඇය දිය වී ගියාක් මෙන් දැනුණි. ප්‍රසාරණය වී අන් හැම වස්තුවක් සමග මිශ්‍ර වූවා සේ හැඟුණි. විශ්වයත් සමග එක්වූවා හා සමාන හැඟීමකි ; ඇතුළත තැන්පත් ය ; ශාන්ත ය ; බාධාවන්ගෙන් තොර ය ; කිසිවකට යටත් ව නො පවතින බවකි ; උත්තරීතර ශූන්‍යතාවයකි ; පිරිසිදු ය; ප්‍රභාස්වර ය ; නිසල ය.

පාරිශුද්ධත්වය
කුළුදුල් මනසේ සත්‍යය ස්වභාවයයි
එය දුබල වනුයේ බලහත්කාරයෙන් ඇතුළු වන
බාහිර අරමුණු මනස පිළිගන්නා හෙයිනි.
දොම්නස් සොම්නස් හැඟීම් උපදවා
ඒ මත නව නවත් සිතිවිලි ගොඩ නංවා
මනසෙහි සත්‍ය ස්වභාවය අන්ධ කරවන තුරු පවත්වාගෙන යයි.

මනසේ ප්‍රභාස්වර පවිත්‍රත්වය

සිල් මාතා කායිව්ට අයත් කුටිය, සක්මන් මළුව, මහෝගනි ගස යට තැනූ කුඩා මැස්ස වසර පුරා ඇගේ නොවෙනස් මිතුරෝ වූහ. අනෙක් සිල් මාතාවන් සමහර සතර පොහොය දිනයන්හි දී ආචාර්ය මහා බෝවා හිමි බැහැ දැකීමට ගිය ද, සිල් මාතා කායිව් ඔවුනට එක් නො වූවා ය. එම දින වකවානු තුළ දී ද ඇගේ භාවනා පුහුණුව තීව්‍ර කර ගනිමින් වැඩි දියුණු කළා ය. භාවනා පුහුණුව සඳහා දවසේ වැඩි කාලයක් කැප වීමෙන් යෙදෙව්ව ද ආචාර්ය මහා බෝවා හිමිට ඈ තුළ තිබූ අතිමහත් කෘතඥතා පූර්වක ගෞරවය බිඳක් වත් අඩු නො වී ය. සෑම දිනක ම උදෑසන ඇය උන්වහන්සේ වෙනුවෙන් කුඩා බත් මුලක් සහ බුලත් පුවක් මල්ලක් සකසා පිළියෙල කළා ය. දිනපතා උන්වහන්සේට දානය රැගෙන ගොස් පිළිගැන්වීමට එක් සිල් මාතාවක් නම් කළා ය. මහා බෝවා හිමිට දානය ඇය පෞද්ගලික ව රැගෙන ගියේ ඉතා කලාතුරකිනි. එසේ ගිය දිනවල දී පවා උන්වහන්සේ සමග සාකච්ඡා කිරීමට ගත කළේ ඉතා ටික වේලාවකි.

ආචාර්ය මහා බෝවා හිමිගේ ආරණ්‍යය පිහිටා තිබුණේ නගරයට ඊසාන දෙසිනි. සිල් මාතා කායිව්ගේ ආරණ්‍යය ඊට සැතපුම් දෙකක් ඈතින් පිහිටා තිබුණි. බාන් හුආයි සායි පිහිටියේ හරි මැද ය. ආචාර්ය මහා බෝවා

උන්වහන්සේගේ හුදකලා චාරිකා ගැන කිසිවෙකුට නො කීව ද සිල් මාතා කායිව් උන්වහන්සේගේ ගමන් බිමන් ගැන ඇගේ ආධ්‍යාත්මික ශක්තිය තුළින් දැන සිටියා ය. උන්වහන්සේ ආරණ්‍යයෙන් පිට ව ගිය දිනය සහ නැවත ආරණ්‍යයට ඒමට නියමිත දිනය ඇය හොඳින් දැන සිටියා ය. ආචාර්ය මහා බෝවා හිමි, අරණින් පිට වූ කළ අවට පරිසරය අමුතු ශීතලකින් පිරෙන බව ඇයට හැඟෙන බව ද මාස ගණනක් උන්වහන්සේ පිටව සිටියත් නැවත පැමිණෙන විට පරිසරය අවට අමුතු උෂ්ණත්වයක් පැතිරෙන බව ද ඇය පැවසුවා ය. ශීතල සහ උණුසුම ඇයට හැඟුණේ බාහිර ව ඇති වූ සංඥා හේතුවෙනි ; නමුත් අවබෝධය පැන නැගුණේ හදවත තුළින් ය.

ආචාර්ය මහා බෝවා හිමි ආරණ්‍යයෙන් පිටව ගොස් ඇති බැව් දැනගත් වහා ම සිල් මාතා කායිව් උන්වහන්සේ වෙනුවෙන් බත් සහ බුලත් පුවක් සූදානම් නො කරන ලෙසට අනෙක් සිල් මාතාවන්ට දැන්වූවා ය. මාස කීපයක් පසු වුව ද බෝවා හිමි නැවත එන බැව් දැන ගත් වහා ම ඇය එම දෑ පිළියෙල කරන ලෙසට සොහොයුරි සිල් මාතාවන්ට උපදෙස් දුන්නා ය. ආචාර්ය මහා බෝවා තෙරුන් වහන්සේ ආරණ්‍යයේ වැඩ සිටින අවස්ථාවන්හි බෙරි වූ බත් සාමාන්‍යයෙන් උන්වහන්සේ සඳහා පිළියෙල කෙරිණි.

නමුත් චාරිකාවන් නිම වී උන්වහන්සේ නැවත ආරණ්‍යයට එන දිනයේ දී බෙරි නො කර විශේෂ ක්‍රමයකට බත් පිළියෙල කිරීමට ඔවුනට උපදෙස් දුන්නා ය. එවන් දිනයන්හි පාන්දරින් බත් බුලත් රැගෙන යන සිල් මාතාවන්ගෙන් තමන් ආරණ්‍යයට එන දිනය දැන ගත්තේ කෙසේ දැයි උන්වහන්සේ විමසූහ. පෙර දින රාත්‍රියේ උන්වහන්සේ ආරණ්‍යයට පැමිණි බව දැන ගැනීමට කිසිවෙකුට කාලයක් නැති බැව් උන්වහන්සේ දන්නා හෙයින් එසේ විමසූහ. සිල් මාතාවෝ උන්වහන්සේගේ පැමිණීම ගැන සිල් මාතා කායිව් ඔවුනට දැන්වූ බවත් එබැවින් සුපුරුදු ආහාර ගෙන ඒමට උපදෙස් ලද බවත් දැන්වූහ. මෙය බොහෝ අවස්ථාවල සිදු විය. උන්වහන්සේ යන එන දිනයන් දැනගැනීමේ හැකියාවක් ඇයට තිබුණි. එය කිසි දිනක වැරදුණේ නැත.

මනසේ නෛසර්ගික ව පවත්නා පවිත්‍රත්වය උපයෝගි කොටගෙන, එකක් පසුපස එකක් දිව යන විශේෂිත විඥානමය සංඥා මගින්, විවිධ මානසික සිද්ධීන් විමර්ශනය කරන ආකාරය කායිව් සිල් මාතාව දැන සිටියා ය. පවිත්‍ර මනසක් තුළින් නිරායාසයෙන් ම ගලා යන විඥානය සංඥා බිහි කිරීමේ ක්‍රියාකාරිත්වය

සිදු කරන බැව් ඇය දැන සිටියා ය. එම ක්‍රියාවලියේ දී එක් එක් සංඥාවන් හඳුන්වා දෙමින්, ඒවාට අර්ථකථන දෙමින් ක්‍රියාකාරී වේ. එහි මූලාරම්භය වූයේ නිසල පවිත්‍ර මනස ය. එනිසා සිත පතුලේ ගැඹුරු නිසල පවිත්‍ර නිධානයේ සිට, යන්තමින් සෙලවී ආරම්භ වන විඥානය, මතුවන මොහොතට ඇය අවධානය යොමු කළා ය.

සෑම චිත්තක්ෂණයක් හෝ හැඟීමක් හෝ දැනෙන ක්ෂණික මොහොතේ දී, මනස තුළ සිහින් තරංගයක් සිහින් ව මතුකර, ඒක්ෂණයෙන් ම අතුරුදහන් වේ. මෙම එක් එක් තරංගයන් වෙන වෙන ම ගත් කල ඒවායේ කිසිදු අර්ථයක් නොමැත. එම තරංග විදුලි සැරයක් සේ 'දැනීමක්' ඇතිකර, සලකුණක් නො තබා අතුරුදහන් වේ. අසම්පූර්ණ අදහස්, සංස්ඛාර මූල ධාතු, ක්ෂණයක් ක්ෂණයක් පාසා මතු වෙමින් ආරම්භයක් සහ අවසානයක් පැහැදිලි ව පෙන්වමින් ගිනි පුපුරු සේ ක්‍රියාත්මක වේ. නමුත් එක් එක් චිත්තක්ෂණයෙන් දනවන හැඳින්වීම මනස තුළ සෙමින් ක්‍රියාත්මක වේ. පූර්ණ සංකල්පමය සංඥාවක් ගොඩ නැගීමට ප්‍රථම විඥාන ධාරාව මෙසේ මීදුමක් ලෙසින් මොහොතින් මොහොත සකස් වේ. මෙසේ ඇති වෙවී නැති වෙවී ක්‍රියාත්මක වන මතකය සහ චිත්තක්ෂණ පුද්ගලයෙකුගේ පැවැත්මක් ඇති බව මවා පායි.

ස්වාභාවික ව මොහොතින් මොහොත සිතක ඇතිවන නැතිවන මානසික සංසිද්ධීන් සංකල්පමය සංඥා ඇති කරයි. මෙම මානසික සංසිද්ධීන් හට අවබෝධ ඥානයක් නොමැත. එනමුදු මෙම සංසිද්ධීන් ගැන නිවැරදි අවබෝධයක් ලබා ගත හැක්කේ මනසේ පවිත්‍රතාවය තුළින් ය. මෙය යථා තත්ත්වය විනිවිද දැක ඇතිවන අවබෝධයයි. පවිත්‍ර මනස ද්විත්ව ක්‍රියාවලියක් නො වේ ; එය එක ම සක්‍රීය යථාර්ථයකි. හදවත පතුලෙන් ආරම්භවන විඥාන ධාරාව ද්විසංකල්පයක් මායාකාරී ව මතු කරයි - ඇතුළත සහ පිටත - දැනගන්නා දෙය සහ දැනගන්නා පුද්ගලයා.

රූප සහ සංකල්ප සංසිද්ධීන් සකස් වනුයේ විඥාන ධාරාවේ ක්‍රියාකාරිත්වය හේතු කොට ගෙන ය. සෑම සත්ත්වයෙකුගේ ම සිතක පවතින සියුම් මෝහය හේතු කොට ගෙන රූප සහ සංකල්ප හඳුනා ගැනීමේ අවබෝධය විඥානයේ නිර්මාණයන්ට ආකර්ෂණයෙන් ඇලේ. පුද්ගලයෙක් ය, සත්ත්වයෙක් ය, යනුවෙන් තදින් අල්ලා ගන්නා මනස ඔහු තුළ ආත්ම සංකල්පය ඇති කරයි. නමුත් සිතිවිලි සහ හැඟීම් මනසේ සකස් වූ ධර්මතාවයන් ය ; මනසේ පවිත්‍ර

සාරය නො වේ. මනසේ පවිත්‍රත්වය විඥාන ධාරාවට එක් වූ කල අපිරිසිදු සංඥාමය සංසිද්ධියක් ගොඩ නගයි. ආත්ම යන සංඥාමය ධර්මතාවය දැඩි ව ග්‍රහණය කර ගැනීමේ අරමුණ හේතුවෙන් පැන නැගුණකි.

පවිත්‍ර මනස, රූපයන්ගෙන් සමන්විත නො වන බවත් සංඥාවන් වර්ධනය නො කරන බවත්, සිල් මාතා කායිව් දැන ගත්තා ය. පවිත්‍ර මනසින්, එනම් සම්මා සතියෙන් සිතෙහි පහළවන සංසිද්ධීන් දෙස නිරායාසයෙන් බලා සිටින කල්හි සංඥා පාදක කොට ඇතිවන සංස්කාරවලින් ඇය නිදහස් වූවා ය. සංස්කාර ඇතිකර මනස තුළ ස්ථීර පැවැත්මක් ඇති කිරීමට පෙර ඇය ඉන් නිදහස් වූවා ය. සංඥා මත සංකල්පනාවන් හෝ සිතිවිලි සම්පූර්ණ ව සකස් වීමට පෙර යෝනිසො මනසිකාරය යොදවා මතුවීමට ආ සිතිවිලි අත හැර ශූන්‍ය තත්ත්වයකට යෑමට ඉඩ හැරියා ය. අවසානයේ, අත හැරීමේ ගුණාංගය වර්ධනය වූ පවිත්‍ර මනසේ ක්‍රියාකාරිත්වය ඉතා ප්‍රබල ව ක්‍රියාකරන්නට විය. එසේ ක්‍රියාකරමින් සිත තුළ තදින් කා වැදීමට යත්න දරන සිතිවිලි, මනසිකාර ඒ ඒ මොහොතේ ම අහෝසි කරමින් හැඟීම් නැති ශූන්‍ය තත්ත්වයකට සිත ගෙන යෑමට හැකි විය.

මෙම අවස්ථාව එළඹුණු කළ සිල් මාතා කායිව්ගේ මනස සංග්‍රාම භූමියකට පරිවර්තනය විය. විඥාන බලසේනා බොහොමයක් ඇලීම් සහිත ව වටකර ගෙන ඇත. ඒවා මර්දනය කරමින් මනස තුළ කිසිවක් ඉතිරි නො වන සේ වනසා ශුද්ධ කළා ය. අසීමිත රූප කලාප මතු වෙවී එද්දී, ගැඹුරු ශූන්‍යතාවය ඒවා දියකර හැරියේ ය. එසේ හෙයින් මනසේ යථාභූත ඥානය සෑම මොහොතක දී ම පවිත්‍ර ව ප්‍රභාශ්වර ව ඉදිරියෙන් සිටියේ ය.

මෝහයෙන් වටවූ මානසික සංසිද්ධීන් ප්‍රඥාවෙන් විනිවිද දකිද්දී පවිත්‍ර දැනීම සියලු සංකල්පයන් අත හැර දැමී ය. ඒ හැම සංකල්පනාවක් ම මනසෙහි ඇතිවූ අනර්ථ සංඥා තරංගයන් පමණකි. මානසික වශයෙන් එම සංඥා කෙසේ මතු වී පැමිණියත් ඒ හැම රූපයක් ම සංඛත ය, සකස් වූ රූපයන් ය. ශූන්‍ය කරා යන මනසේ සම්මත ක්‍රියාවලිය ය. විශේෂත්වයක් නොමැත.

කල්ප ගණනක් සංසාරය පුරා ඈ සමග පැමිණි සංකල්පනා නිර්මාණය වූ ක්‍රමය ඇගේ භාවනාව තුළින් සිල් මාතා කායිව් විනාශ කර දැමුවා ය. නිරායාසයෙන් උපදින සිහිය යනුවෙන් දක්වන කිසිදු සිතිවිල්ලකට නැගී සිටීමට

හෝ සකස් වීමට හෝ ඉඩක් නො ලද්දේ ය. ඇගේ සිත තුළ මේ වන විට නිරායාසයෙන් ක්‍රියාත්මක වන යථාභූත ඥානය පිරිසිදු ය. මායාකාරී නොවන අවධානයකි. පිරිසිදු ව ප්‍රඥාව ඉස්මතු කර දුන්නකි. ඇත්ත ඇති සැටියේ දකින ප්‍රඥාවෙන් මනස තුළ සකස් වන මනසිකාරයන්හි ආත්ම සංකල්පයක් නොමැති බැව් දැන ගන්නා විට එම සිත ඇලීමක් නොමැති විමුක්තියක් කරා සිත ම මෙහෙයවයි. සිතෙහි අවධානය කෙටිවන විට සිතෙන් උත්පාදනය වන තරංග ද අඩු වී සීමිත වේ. සිල් මාතා කායිව් තම සිත තුළින් උපදින සංඥාමය සංසිද්ධීන් ඇත්ත වශයෙන් ක්‍රියාත්මක වන අයුරු විමර්ශනය කොට හොඳාකාර ව දැන ගත්තා ය. පවිත්‍ර ප්‍රභාස්වර සිත එසේ උපදින සංඥා සමග කිසිදු සම්බන්ධතාවයක් ඇති නො කර ගන්නා බව ඇය තරයේ දැන ගත්තා ය. සිතිවිලි සහ සංකල්පනා සිත තුළින් මතුවීම සම්පූර්ණයෙන් ම නතර විය. යථා භූත ඥානයෙහි පමණක් සිත රඳවා තැබිණ.

අතිශයින් සියුම් පවිත්‍ර අවබෝධයක් හැර මුළු විශ්වයේ ම පැතුරුණු සම්මා සතියකි. කිසිවක් පෙනෙන්නට නොමැත. කාලය සහ අවකාශය සකස් වීම අබබවා ගිය මනසකි. මුළු විශ්වය ම විනිවිද දකින ඇලීමකින් තොර දීප්තිමත් වූ විශ්මිත ශූන්‍ය වූ පවිත්‍රත්වයකි. කිසිවක් නො පැවතෙන බව හඟවන එහෙත් සියුම් දැනීමක් පමණක් පවතින්නකි. සිතෙහි පවිත්‍රත්වය මෙතෙක් කල් වසා සිටි සියල්ලෙන් පිරිසිදු වූ ඇගේ මනස සත්‍ය වූ චිත්ත බලය අනාවරණය කර දුණි.

මෝහය දනවන කෙලෙස් සම්පූර්ණයෙන් ම විනාශ කළ විට ඇගේ මනස අතිශයින් දීප්තිමත් වූ න්‍යෂ්ටියකට එකතු විය. කෙනෙකු මෝහනයකට පත්කරවන තරම් වූ මනසේ ඇතිවූ එම ප්‍රබල ප්‍රභාස්වර අතිඋත්කෘෂ්ට තත්ත්වය, දුක් නැතිකිරීම සඳහා ඇය මෙතෙක් කල් විඳි දුෂ්කර කාලය නිම වූයේ යයි හඟවන පණිවිඩය ස්ථිර වශයෙන් ම ලැබුණේ යයි ඇයට වැටහුණි. ආත්ම සංකල්පය සකස් කිරීමට බලපාන සියලු ම කරුණු අත හැරියාට පසුව ඇගේ සිත මැද ඉතිරි වූයේ අතිශයින් ප්‍රභාස්වර වූ තත්ත්වයක් පමණි. වචනින් තේරුම් කර විග්‍රහ කිරීමට නොහැකි තරම් ඇයගේ යථාභූත ඥානය තීව්‍ර ව සියුම් ව ක්‍රියාත්මක විය. අතිශයින් සියුම් දීප්තිමත් ප්‍රඥාවකි. මෙම අවස්ථාවේ පෙර අත් නො දුටු විශ්මයජනක ප්‍රීතියක් ඇගේ මනස පුරා පැතුරුණි. එම සතුට සංසිද්ධීන් සකස් කරවමින් ජීවීන් උපද්දවන තත්ත්වයෙන් ඇය අත්මිදුණු බව

හඟවන ප්‍රීතිමත් අවස්ථාව මෙය බව අවබෝධ විය. එම ප්‍රඥාලෝකය කිසිදු අවදානමකට ලක් නොවන ඇගේ මනස පුරාම වැස්සුණු තත්ත්වයකි. කිසිවකට බලපෑමක් කළ නොහැකි උත්තම තලයකි. සිල් මාතා කායිව් හට ඇය නිවන් මගෙහි අවසන් හිණි පෙත්තට නැගි බව සක්සුදක් සේ අවබෝධ විය.

ක්ෂණික විදර්ශනා විදුලි සැරයකින්
මෝහය පැහැදිලි ව දුටු කල
මෙසේ දුක් කන්දරාවකට යට වී ඇලී ගැලී සිටීම ගැන කළකිරී
දැඩි ව අල්ලාගෙන සිටීම ලිහිල් කරනු ඇත.
එම සිසිල් මොහොත තුළ දී අප හදවත්වල දැවෙන ගින්දර අඩු වී යයි.
එවිට හදවත තුළින් ස්වාභාවිකව ම
දුකින් මිදීම මතු වේ.

මලින් පිරුණු මහොගනි

1952 ඔක්තෝබර් මස මැද භාගයේ ඇගේ සක්මන් මළුව ඉස්මත්තේ ඇති දැවැන්ත මහොගනි ගස පුරාම මල් පිපී අවට පරිසරය ම දීප්තිමත් කරවන දර්ශනයක් මවා පෑවේ ය. එක් සැන්දෑවක, එම මලින් පිරුණු ගස යට ඉදිකර තිබූ මැස්ස මත, සිල් මාතා කායිව් වාඩි වී සිටිද්දී ඇගේ කාන්තිමත් මනසට අදහසක් මතු වී ආයේ ය. ඇය මුහුණ දුන් අභියෝගය ගැන ආචාර්ය මහා බෝවා ස්වාමීන් වහන්සේට දැන්වීමට සුදුසු කාලය පැමිණ ඇතැයි සිතුවිල්ලක් මතුවී ය. ඇයට මෙවන් ප්‍රභාස්වර මනසක් ලබා ගැනීමට ධෛර්ය දී ඇයව උනන්දු කළේ උන්වහන්සේ ය.

උන්වහන්සේ ඈ කෙරෙහි තැබූ විශ්වාසය මත, ඇය ලද ජයග්‍රහණයේ මල්පලවලින් තම ආචාර්යවරයාට කෘතගුණ සැලකීමේ කාලය පැමිණ ඇති බැව් ඇයට වැටහිණි. සතර පොහොය දිනයන්ගෙන් එක් පොහොය දිනයක් වූ එදින, සවස් යාමයේ සිල් මාතා කායිව් තවත් සිල් මාතාවන් කිහිප දෙනෙකුත් සමග තම ආරණ්‍යයෙන් පිට වූවා ය. කුඹුරු යාය අද්දරට පැමිණි සිල් මාතා කණ්ඩායම දුෂ්කර බෑවුම් සහිත කන්ද නැග ආචාර්ය මහා බෝවා හිමි වැඩ සිටි ගල් ලෙන වෙත පැමිණියහ.

ගල් ලෙන ඉදිරියේ වාඩි වී සිටි මහා බෝවා හිමි දුටු සිල් මාතා කායිවි තම ආචාර්යන් වහන්සේගේ පාමුල දණින් වැටී මහත් ගෞරවයකින් වන්දනා කළා ය. අනතුරුව සතුටු සාමීචි කතාවෙහි යෙදුණා ය. සුහද කෙටි සාකච්ඡාවකින් පසු, දෑත් එක්කොට තම ආචාර්යයන් වහන්සේට හිස නමා වැඳ ගෙන ම පාපොච්චාරණයකට අවසර පැතුවා ය. පසුගිය වසර තුළ ඈ ලද ප්‍රගතිය පියවරෙන් පියවර ඉතා ප්‍රවේසමෙන් විස්තර කළා ය. සංඛත වස්තූන් ගෙන් පරිබාහිර වූ මුළු විශ්වය ම විනිවිද දැකිය හැකි දීප්තිමත් ශූන්‍යත්වයක් කරා ගිය ඇගේ මනස ගැන ඇය 'සිංහ නාද' කළා ය.

ඇගේ සවිස්තර දේශනයට සවන් දීමෙන් අනතුරුව ආචාර්ය මහා බෝවා හිමි හිස ඔසවා තැන්පත් ස්වරයෙන් "එච්චර ද ?" යි ඇසුවේ ය.

සිල් මාතා කායිවි හිස සැලුවා ය.

ආචාර්ය මහා බෝවා මද වේලාවක් නිහඬ ව සිට අනුශාසනාව ආරම්භ කළේ ය.

"මානසික සංසිද්ධීන් විමර්ශනය කරද්දී, ඔබ ඉන් සම්පූර්ණයෙන් ම ඔබ්බට යමින් විමර්ශනය මෙහෙයවද්දී, කෙලෙස් අංශු ඉතිරි ව ඇති විඥානය, දීප්තිමත් අවබෝධය පිහිටා ඇති නාෂ්ටිය කරා ගෙන ගොස් පවිත්‍ර මනසේ ස්වභාවයෙන් ම පවතින ප්‍රභාස්වරය හා එක් වී මිශ්‍ර වේ. මෙසේ ඇතිවන ප්‍රභාස්වරය කොයිතරම් වශී කරවන ප්‍රබල එකක් දැයි කියතොත් නිරන්තරයෙන් ක්‍රියාත්මක වන සති ඉන්ද්‍රිය සහ ප්‍රඥා ඉන්ද්‍රිය පවා ඊට වශී වේ. එවිට මනසේ ඇතිවන දීප්තිය, පැහැදිලි බව අන් කිසිවක් හා සංසන්දනය කිරීමට බැරි තරම් ගරු ගාම්භීර දීප්තිමත් පැහැදිලි බවකි. මෙම දීප්තිමත් පවිත්‍රත්වය උතුම් ශීලය හා උසස් චරිතවත් බව සංකේතවත් කරන ආධ්‍යාත්මික උච්චතම ප්‍රීතියයි. ඒ ඔබේ මුල් ම ආත්මීය හැඟීමේ ආරම්භයයි. ඔබගේ පුද්ගල භාවය දනවන නාෂ්ටිය යි.

නමුත් මේ සියුම් ආත්මීය හැඟීම ඇති වෙමින් නැති වෙමින් දිවෙන සංසාරයට ඇලීම ඇති කරවන මූලික නිධානය ද වේ. මේ මොහොත වනවිට මනසේ පහළ වී ඇති ප්‍රභාස්වරය වෙත කෙනෙකු පොලඹවා ඇද ගැනීම, එම සත්ත්වයා අනන්ත වූ සංසාර චක්‍රයේ ඉපදීම උපාදාන කරමින් මරණය ඉවසා

දරා ගනිමින් නො නවත්වා රැගෙන යාමට හේතු වේ. මෙම මූලික ඇලීම ඔබට ආත්මීය සංකල්පය රෝපණය කරන මුලාවයි, මෝහයයි. විඥානයේ අඩංගු වන සියලු ම කෙලෙස්වලට වග කිව යුත්තේ මෝහයයි. ඉන් ගැලවී පලා යා හැක්කේ ද විඥාන ධාරාව ක්‍රියාත්මක වන වේගය තුළින් ම ය. මේ ක්ෂේත්‍රයේ දී මෝහය අතිප්‍රබල ව පාලනය කරයි. නමුත් සතිය සහ ප්‍රඥාව, විඥාන ක්‍රියාකාරිත්වය අහෝසි කිරීමට දක්ෂ වන්නේ නම්, මෙම පිටතට පලා යෑම වසා දැමිය හැක. එනම් සංකල්පනා මගින් ඇතිකරන මෝහය අක්‍රිය වී නවතී. මෙසේ පිටතට ගලා යන සියලු මාර්ග කපා විනාශකොට අක්‍රිය කළ පසු, සිත අභ්‍යන්තරයේ ක්‍රියාකාරී වීමට මෝහයට අවකාශයක් නො ලැබේ. නමුත් සියල්ල දන්නා ඥානය පවතින එම දීප්තිමත් නාෂ්ටියට බලෙන් එකතු වේ. මෙම සියල්ල දන්නා නාෂ්ටිය ශූන්‍ය වූ දීප්තිමත් තැනකි. මවිතයට පත් කරවන ප්‍රබල තැනකි.

නමුත් මෙම දීප්තිමත් ශූන්‍යතාවය නිර්වාණයේ අත්දකින ශූන්‍යතාව යයි වරදවා නො සිතිය යුතුයි.

මෙම අවස්ථා දෙක දහවල සහ රාත්‍රිය මෙන් ලොකු වෙනසක් ඇත. දීප්තිමත් මනස, නිරන්තරයෙන් ඇති වීමේ චක්‍රය ක්‍රියාත්මක කරන ආරම්භක මනසයි. නමුත් ඉපදීම සහ මරණයෙන් නිදහස් වූ අතිපිරිසිදු මනසේ සාරය එය නොවේ. එම දීප්තිය ඉතා සියුම් වූ ස්වාභාවික තත්ත්වයකි. ඒකාකාර ව පවතින පැහැදිලි දීප්තිය, ශූන්‍ය තත්ත්වයක් ඇතැයි යන හැඟීම ඇති කරයි. මෙම තත්ත්වය නාම රූප ස්වභාවය ඇති වීමට ප්‍රථම ඔබගේ ස්වභාවයයි.

නමුත් ඔබ තවම නිවනට පැමිණ නැත.

මෙය යථාභූත අවබෝධය පමණක් ප්‍රකට ව ඇති අතිශයින් පිරිසිදු මනසේ එක් විශ්මයජනක, උතුම් අවස්ථාවකි. අවසානයේ දී මනස සියලු රූප සහ සංඥාවන්ට ඇති ඇලීම අත්හැරිය පසු, යථාභූත ඥානය අතිපිරිසිදු තත්ත්වයන් ඇතිකර ගනී. එය සියල්ල අතහැර ඇත. නමුත් එය. අත් හැර නැත.

විනිවිද ගිය මෝහය ඇති ව එහි සත්‍ය තත්ත්වය නො දැන 'එය' එහි ම රැඳී සිටී. මේ හේතු කොට ගෙන මෙම දීප්තිමත් යථාභූත සාරය, ඉතා සියුම් ආත්මීය තත්ත්වයකට ඔබ නො දැන ම වැටී ඇත.

මෙම අවස්ථාවේ අත්දකින ප්‍රීතිය සහ දීප්තිය, මනසේ අසංඛත සාරයක් යයි විශ්වාස කිරීමට ඔබ නො දැනුවත් ව ම පෙළඹේ. මෝහය හේතුවෙන් මෙසේ සෑදුණු 'සංඛත සාරය' මෝහය ගැන තැකීමක් නො කර, ඔබ මෙම ශක්තිමත් මනස අවසාන ප්‍රතිඵලය යයි වරදවා පිළිගනී.

ඔබ මෙම අවස්ථාව නිවන යයි විශ්වාස කරයි.

සියල්ල ප්‍රහීණ කළ පාරිශුද්ධ මනසේ ශූන්‍යතාව යයි ඔබ වරදවා පිළිගනී.

නමුත් ඔබ මෙසේ අත් විඳින ශූන්‍යතාවය දීප්තිය පැහැදිලි බව සහ ප්‍රීතිය යනාදිය තවමත් මෝහයෙන් බැඳි ඉතා සියුම් අවස්ථාවන් ය. ඔබ මෙම ශූන්‍යතාවය ඉතා ප්‍රවේශමෙන් විදර්ශනාවෙන් ලත් පිරිසිදු අවධානය එහි ම රඳවා තීව්‍ර ව බලා සිටියහොත් එය, (මනස එවකට පත්ව ඇති තත්ත්වය) ඇත්ත වශයෙන් ම ඒකාකාර ව නො තිබෙන බවත් ස්ථිර ව පවතින්නක් නො වන බවත් පෙනෙනු ඇත. මෙම තත්ත්වය මෝහයේ මූල බීජ ඇතිකරන, ඉතා සියුම් සංස්කාරයන්ගේ ක්‍රියාකාරිත්වයක් හේතුවෙන් ඇති කරවන ශූන්‍යතාවයකි. සමහර විටක එහි යාන්තමට සෙලවීමක් ඇති කර වෙනස් වීමක් ඇති කරන බවක් පෙනේ. මනසේ මෙම තත්ත්වය ද වහා වෙනස් වන සුලු තත්ත්වයක් බව ඔබට වැටහීමට එම සෙලවීම ප්‍රමාණවත් ය. සියල්ල සංඛත සංසිද්ධීන් හෙයින් ඉතා සියුම් වෙනස්වීම් පවා අනාවරණය කර ගත හැක. මොන තරම් සියුම් දීප්තිමත් ගම්භීර තත්ත්වයක් ඇති වුවත් එහි අස්ථිර වූ අනිත්‍ය වූ ලක්ෂණ අනිවාර්යයෙන් පහළ කරයි.

මෙය නිර්වාණය නම්, මනසේ ඇති වූ මෙම පිරිසිදු ආකර්ෂණීය තත්ත්වය වෙනස්වීම්වලට භාජන වන බව පෙන්නුම් කරන්නේ කුමකට ද ? එය නිත්‍ය ව පවතින සත්‍ය වූ තත්ත්වයක් නො වේ. දීප්තිමත් ආලෝකය විහිදෙන නිෂ්ටිය දෙස අවධානය යොමු කරන්න. මෙම දීප්තිමත් ආලෝකයට ඇත්තේ ද අනිත්‍ය ලක්ෂණයන්ම ය. වහ වහා වෙනස් වන අසම්පූර්ණ අස්ථිර තත්ත්වයකි. නිවන් මග එද්දී ඔබ වරින් වර අත හැර දැමූ අන් සෑම මානසික සංසිද්ධියක් මෙනි. වෙනසකට ඇත්තේ ඔබ එහි දකින කාවදින දීප්තිය, අන් සෑම ආලෝකයකට ම වඩා ප්‍රභාස්වර බව පමණකි.

කිසිවක් නැති හිස් කාමරයක හරි මැද ඔබ සිටගෙන සිටිනවා යයි සිතන්න. ඔබ වට පිට බලද්දී ඔබට පෙනෙන්නේ හැම අතින් ම හිස් වූ කාමරයකි. හැම තැන ම හිස් ය. ඔබ හැර අන් සෑම තැන ම හිස් ය. ඔබ වටා ඇති මුළු කාමරය ම හි හිස් ය. කාමරයේ හරි මැද ඔබ සිටගෙන අවට ඇති හිස් බව අගයමින් සිටී. නමුත් ඔබ එහි සිටින බව ඔබට අමතක විය. කාමරයේ හරි මැද ඇති ඉඩෙහි ඔබ සිටගෙන සිටී. එවිට කාමරය හිස් වන්නේ කෙසේ ද? කව්රු හෝ එම කාමරයේ රැඳී සිටින තාක් ඒ කාමරය හිස් නැත. ඇත්තෙන් ම හිස් කාමරයක් බවට පත් වනුයේ ඔබ කාමරයෙන් පිට වූවාට පසු ව බව ඔබට වැටහිය යුතු ය. ඔබ තුළ ඇති මෝහාධික ආත්මීය සංකල්පය ප්‍රහීණ වන්නේ මෙසේ ඇත්වූ මොහොතෙහි දී ය. වීතමෝහ වූ, පවිත්‍ර වූ නිදහස් මනසක් ඇතිවන්නේ මේ මොහොතෙහි දී ය. සිත, සෑම මානසික සංසිද්ධියක් ම අත හැර උත්තරීතර ශූන්‍යතාවට ගෙන ආ කල, එම ශූන්‍යතාවයේ විස්මිත බව අගය කරමින් සතුටු වන්නා තවමත් නො නැසී ජීවත් වේ.

මෙම ආත්ම සංඥාව මෝහයේ ප්‍රාථමික අවස්ථාවයි.
මෙම පැවැත්ම,
දීප්තිමත් සියුම් ශූන්‍ය මනසක
සහ
වීතමෝහී වූ ලෝකෝත්තර ශූන්‍ය මනසක
වෙනස පැහැදිලි ව නිරූපණය කරයි.

මම මගේ යන ආත්මීය සිතිවිල්ල මහා පළිබෝධයකි. එය සිදී බිඳී අතුරුදහන් වූවාට පසු කිසිදු පළිබෝධයක් ඉතිරි නොවේ. ලෝකෝත්තර ශූන්‍යතාවය දිස් වේ. හිස් කාමරයක් තුළ සිටින මිනිසා සේම, සිත සත්‍ය වශයෙන් ම ශූන්‍ය වනුයේ 'ආත්ම' සංකල්පය සදහට ම තුරන් වූ පසුව ය. මෙම ලෝකෝත්තර ශූන්‍යතාවය පූර්ණ, ස්ථීර ශූන්‍යතාවයකි. සියල්ල ස්ථීර ව අතහැරි අවස්ථාවයි. එම තත්ත්වය ඒ ආකාරයෙන් ම ඉදිරියට පවත්වාගෙන යෑමට කිසිදු වෙහෙසක් ගත යුතු නැත.

මෝහයේ නෛසර්ගික ලක්ෂණය, අන්ධ අසත්‍ය අවබෝධයක් ලබා දීමයි. මෝහය දීප්තිමත් ව පෙනී සිටිමින්, පැහැදිලි ලෙස සහ ප්‍රීතිමත් ව පෙනීසිටිමින් අප සැම ම රවටයි. ව්‍යාජ ව පෙනී සිටී. එනිසා මෝහයට,

'ආත්ම' සංකල්පයෙහි රැඳෙමින්, ආරක්ෂා සහගත ව පැවතීමේ දිව්‍ය ලෝකය එයයි. මෙම වැදගත් අවස්ථාවේ පවතින සියලුම වටිනා ලක්ෂණ ද, ඉතා සියුම් ව ක්‍රියාකාරී වන හේතු ඵල ක්‍රියාවලියක තවත් ප්‍රතිඵලයකි. විමුක්තියේ සත්‍ය වූ ශූන්‍යතාවය පවතිනුයේ සියලුම සංඛත ධර්මයන් අහෝසි වූ විට ය.

ඔබ නැවත හැරී පැහැදිලි අවබෝධයෙන් එදෙස බලා වටහා ගත් විට මිථ්‍යා අවබෝධය එකෙණෙහි ම අතුරුදහන් වේ. මෝහය, ඔබව ප්‍රබෝධවත් කරමින් දීප්තිමත් ව පෙනී සිටිමින්, ඔබේ නිවැරදි දැක්ම අනාදිමත් කාලයක් වලාකුළකින් වසාගෙන සිටිමින් ඔබව රවටා ඇත."

සිල් මාතා කායිවි තම ආරණ්‍යයට පැමිණි පසු එදින සවස භාවනාවට යොමු වූවා ය. මනසේ දීප්තිමත් බව ලැබුවාට පසු එම මනස ඇදි ඇදී ඇයට ඇලීමක් ඇති කළ අයුරු විමර්ශනය කළා ය. මනසේ දීප්තිය ඇය අගය කළා ය. එමෙන් ම ආරක්ෂා කළා ය. ඊට බාධා කිරීමට ඇය සතුටු නො වූවා ය. ඇයගේ මුළු කයත් සිතත් ගත් කල මනසේ ඇතිවූ දීප්තිය තරම් අතිශයින් වැදගත් දෙයක් ඇයට නොතිබුණි. ඇගේ සිත, අභ්‍යන්තරයේ විස්මිත තත්ත්වයක් පවත්වා ගෙන යෑමට උනන්දු කර වී ය. එයට තදින් ඇලී සිටීම ආරක්ෂිත සුන්දර හැඟීමකි. අන් කිසිවක් එයට බාධා කිරීම ගැන ඇය අසතුටු වූවා ය.

සියල්ල දන්නා ඥානය පවතී යයි, මෝහය නිසා රැවටී සිටි සිල් මාතා කායිවිට එම දීප්තිමත් මනසේ ක්‍රියාත්මක වන ඇත්ත තත්ත්වය ගැන විමසා බැලීමට අමතක විය. මනසේ විෂය ධාරාව, සිත තුළට යොමු වූ විට දැඩි දීප්තිමත් නාෂ්ටියක ඒකරාශී විය. එය රැස් විහිදුවන ආලෝකයකි, සතුට දනවන දීප්තියකි, පැහැදිලි ය. සෑම චිත්ත සංස්කාරයක් ම ආරම්භ වූයේ මෙම කේන්ද්‍රයෙන් ය. චෛතසික සකස් වූයේ එතැන ය. හැම සතුටක් ම එතැනට ඒකරාශී වූ බවක් ඇයට හැඟුණි. එනිසා හැම කල්හි ම දීප්තිමත් ව පැහැදිලි ව පෙනුණු ඇගේ හදවත් කේන්ද්‍රය නිර්වාණය යයි ඇය වරදවා විශ්වාස කළා ය.

නමුත් එම නාෂ්ටිය සත්‍ය වශයෙන් ම දුක් හට ගැනීමේ කේන්ද්‍රය බව ඇය දැන් ස්ථිර ව වටහා ගත්තා ය.

එඩිතර ව නොසැලී භාවනාවට නැවත වාඩිවූ සිල් මාතා කායිවි ඉතා සූක්ෂම ලෙස ඇගේ මනසේ පහළ වන විශ්මිත දීප්තිය ගැන විමර්ශනයක

යෙදුණා ය. එම දීප්තිය අස්ථිර දැයි ගැඹුරින් විමසුවා ය. මුලදී එම දීප්තිය නිකැලැල්, බාධා රහිත අතිශයින් පවිත්‍ර බවක් පෙන්වී ය. නමුත් තීව්‍ර ව එදෙස දැඩි අවධානයෙන් බලා සිටිද්දී වරින් වර ඒ හා සමාන සියුම් අඳුරක් ද මතු වී අවුත් එම දීප්තිය තුළින් ලබා දුන් අවබෝධ ඔපය කෙලසන බව ඇය දුටුවා ය. මෙම අක්‍රමවත් සෙලවෙන තත්ත්වය, සෑහීමකට පත් නොවන අස්ථිර බවක් මතු කරන බව ඇයට වැටහුණි. හද පතුලේ දීප්තිය දෙස තව දුරටත් දැඩි අවධානයෙන් බලා සිටිද්දී එම සියුම් සෙලවීම ඇයට අසු විය. එයින් ඇයගේ සැකය තහවුරු වූ අතර දැඩි අධිෂ්ඨානයකින් තවත් ඉදිරියට යෑමට ඇයව උනන්දු කළේ ය. ඉන් පසුව ඇය එකී සෙලවීම ගැන විශේෂ අවධානයක් දැක්වූ අතර ඒ සඳහා ගතවන කාලය ගැන කිසිදු හැඟීමක් ඇයට නොවී ය. ඇයට දිවා කාලය ගැන අමතක විය. නිදා ගන්නා වේලාව අමතක විය. තවද, ඇය කොතරම් වෙහෙසී සිටියේ ද යන්න ගැනවත් කල්පනාවක් නො වී ය. මෙසේ ඇය දින ගණනාවක් වෙහෙසුණා ය. ඇය අත්දුටු දීප්තිමත් අවබෝධය ක්ෂය වී නැති වී යන තුරු, එහි යාන්තමින් සිදුවන සියුම් සෙලවීම ගැන ඉතා දැඩි සුපරීක්ෂාවෙන් කාලය ගත කළා ය.

1952 නොවැම්බර් මස 1 වෙනි දින අලුයම හිරු නැඟ එද්දී සිල් මාතා කායිව් හට ඇගේ කය වෙහෙසට පත් වූ බවක් දැනුණි. සම්මා සතියෙන් යුතුව ඇය පැය ගණනාවක් ඇයගේ සක්මන් පථයේ පාවහන් නැතිව සක්මන් භාවනාවෙහි යෙදී ඇත. භික්ෂූන් වහන්සේලාට ආහාර පිළියෙල කිරීමට කුස්සියට යෑමට ප්‍රථම ටික වේලාවක් විවේක ගතහොත් හොඳ යයි ඈ සිතුවා ය. අලුයම හිරු නැඟී එනවාත් සමගම විහිදී එන මුල්ම හිරු කිරණ මහෝග නි ගස මුදුනට වැටී කහ පාට මල් නහවා පුබුදු කළේ ය. ඇය සෙමින් සෙමින් මහොගනි ගස යට තැනූ උණබම්බු මැස්ස වෙත පා නගා, ඒ මත වාඩි වී කිසිදු සෙලවීමක් නැතිව සැහෙන වේලාවක් සිටියා ය. කිසිදු අරමුණකට සිත යොමු නො කළ ද ඇත්තේ ශාන්ත බවකි. නිසල ය. ගැඹුරු ය. මෙම මොහොතේ කිසිවක් ඉදිරියට ගියේ නැත. කිසිවක් ආපස්සට ආවේ ද නැත. කිසිවක් ස්ථිර ව පිහිටියේ ද නැත. ඊට පසුව සිහිය ඇති බවෙකි, නමුත් විශේෂ දෙයක් නො දනී. ශූන්‍යතාවයක රැඳී සිටී. මෙතෙක් කල් ඇය සුරැකි සිතෙහි දීප්තිය ක්ෂණයෙන් මතු වී නැතිවී ගියේ ය. හදවත පුරා සියල්ල දන්නා අතිපාරිශුද්ධ දැනීමක්, අවබෝධයක් මතු වී පැතිරී විශ්වය පුරා විසිරී ගියේ ය. අවබෝධ කරන්නා සෑම තැනක ම ඉන්නා බවෙකි : නමුත් දැනගත් දෙයක් නැත : කිසිදු ලක්ෂණයක්

නොමැත ; මූලාශ්‍රයක් නොමැත ; නිධානයක් නොමැත ; විශේෂිත වූ තැනකින් පටන් ගැන්මක් ද නොමැත ; මුළු විශ්වයේ ම නිරන්තරයෙන් පැතිර පවතින අවබෝධයක් පමණි. දීප්තිමත් ව පැවති සවිඥානය මොහොතකින් දිය වී අතුරුදහන් ව ඇත. මනසේ පවිත්‍රත්වය ඉතිරිව ඇත. පාරිශුද්ධ ධර්මයේ සාරය සහ නිදහස පමණක් ඉතිරි කර ඇත. මොනයම් අයුරකින් හෝ සකස් වීමකට යටත් නො වුණු දැනීමක් පමණි. මොනම ආකාරයක මනුෂ්‍ය සංකල්පනයකින් උපාදානයකින් තොර ප්‍රතිසන්ධියකින් බැහැර වූ දැන ගැනීමකි.

අවබෝධයකි.

සිත කය සහ යථාභූත ඥානය යන හැම
පැහැදිලි යථාර්ථයන් ය.
ඒකාන්තයෙන් සියල්ල ම දනී.
පඨවි-පොළොව, ආපෝ-ජලය, තෙජෝ-උණුසුම, වායෝ-වාතය
රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන ;
රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, හැඟීම් ;
ලෝභ, ද්වේෂ, මෝහ
මේ සියල්ල දනී.
මේ සෑම ධර්මතාවයක් ම යථාභූත ව පවතින අයුරු
මම දනිමි.
නමුත් ඔවුන් සමග මා මොනතරම් ගැටුන ද,
ඔවුනට මුහුණ දුන්න ද,
ඔවුනට මගේ හදවතට බලපෑම් කිරීමට
හැකි එක් මොහොතකුදු මට සොයා ගත නොහැක.
ඔවුන් ඇති වේ. ඔවුන් නැති වේ.
හැම කල්හි ම ඔවුන් වෙනස් වේ.
නමුත් ඔවුන් පවතින බවට ඇති දැනීම
කිසිවිටක මොහොතකුදු වෙනස් නො වේ.
එය සදාකාලික ව නූපදී. එමෙන් ම කිසිදාක නො මැරේ.
මේ දුක් කන්දරාවක කෙළවර ය.

පවිත්‍රත්වය

විනිස්සු නිවන් දකින්න ඕනෑය කියමින්
බෙල්ල රිදුම් දෙන තුරු
නිමක් නැති අභාවාකාශය දෙස බලා සිටිති.
කොපමණ වෙහෙස මහන්සි වී ඇත බලා සිටියත්
නිවන එසේ සොයා ගත නොහැකි බව
ඔවුන් දැන ගන්නේ නැත. කෙටියෙන් කියනොත්
නිවන සම්මත විෂය පථය තුළ සොයා ගත නොහැක.

ගංගාව සහ සමුද්‍රය

ගංගාවෝ නො නවත්වා ම මුහුදු දෙසට ම ගලා බසිති. ඔවුනට ආවේණික හැඩ තල සහ එක් එක් ගංගාව හඳුන්වන නම් ද ඇත. මේ හැම ගංගාවක් ම මුහුදට ගලා ගොස් මුහුදු ජලය හා එකට එක්වූ කළ ඔවුනට පෙර පැවති පෞද්ගලික හැඳින්වීම් ලක්ෂණ කිසිවක් නො පවතී. ගංගා ජලය මහ මුහුදට වැටුණ ද, ඔවුනගේ ලක්ෂණ මුහුදේ නොමැත. ගඟත් මුහුදත් එකක් නො වේ. ගංගා ජලය මුහුදේ ඇති බැවින්, වෙනස් වූවක් ද නො වේ. එමෙන් සිල් මාතා කායිච්ගේ පවිත්‍ර වූ සත්ත්ව පුද්ගල පැවැත්ම, නිමක් නැති බැඳීමක් නැති මහා සාගරය වන් නිර්වාණය සමග සංයෝග විය. පවිත්‍ර පැවැත්ම පෙර තිබූ පරිදි ම ය. එය වෙනස් වූයේ නැත. නමුත් නිවනෙහි අඩංගු පවිත්‍ර ධර්මයෙහි මූල ධාතුව සමග වෙන් කොට හඳුනා ගත නො හැක. මුහුදට එක්වූ ගංගා ජලය නැවත ගංගාව හා එක් වීමට නො හැක්කා සේ නිවන හා මිශ්‍ර වූ මනසේ පවිත්‍ර වූ සාරය, පෙර පැවති මෝහාධික ආත්මීය සංකල්පයට ජීවය දුන් විඥානමය සංසිද්ධීන් සමග නැවත එක් නො වෙනු ඇත.

කාලයක් නොමැති වර්තමානයෙහි පමණක් ජීවත් වෙමින්, අතීතයක් හා අනාගතයක් නැති, පැරණි කර්ම විපාක නො විඳින පවිත්‍ර සාරයකින් යුත්, නව කර්මයන් සඳහා බීජ නො වපුරන පැවැත්මකි. එහි පැවැත්ම සනිටුහන් කිරීමට සියුම් වූ සලකුණකුදු නො රඳනු ඇත.

දින ගණනක් යන තුරු මෙම උතුම් අර්හත් ඵල චිත්ත ස්වභාවය සිල් මාතා කායිව්ගේ අවධානයෙන් බැහැර නොවී ය. මෙතෙක් කල් ඉතා අගනේ යයි සිතූ මනසේ දීප්තිය අර්හත් ඵල සිත හා සසඳන කළ කොයි තරම් රළු දුර්වර්ණ ස්වභාවයක් දැයි ඇයට වැටහුණි. රන් සහ ගොම වැනි ය.

අවසානයේ දී ස්වභාවික විඥාන ක්‍රියාවලිය තුළින් මනසේ පවිත්‍ර පැවැත්මේ සාරය, නැවත ඉන්ද්‍රියයන් ගෙන් ලබන දැනීම සමග සහ ඇගේ භෞතික කය සමග සම්බන්ධ වීම ආරම්භ කෙරුණි. ලෞකික ලෝකයේ ඇයව ඉපදීම සහ මරණය සමග මේ වන විටත් බඳවා තබන සාධක සමග සම්බන්ධ වී නැවත ආරම්භ විය

සිල් මාතා කායිව්ගේ විඥානය සහ භෞතික ශරීරය, කල්ප ගණනාවක් මුළුල්ලේ ගෙන ආ පැරණි කර්ම විපාක හේතු කොට ගෙන මෙතෙක් පවතින අවසන් ශේෂය ය. ඇයගේ කය සහ විඥානය මේ ආත්මයේ මරණයෙන් විනාශ වනතුරු පැරණි කර්ම විපාක අත් විඳිනු ඇත. මේවාට ඇති සියලු ම ඇලීම් නිර්වාණය නමැති මහා සාගරය හා මිශ්‍ර වුව ද කය සහ මනස ඒවායේ වපසරිය තුළ සාමාන්‍ය ලෙස දිගට ම ක්‍රියාකාරී වේ. එනමුදු මනසේ පැවැත්ම අතිපිරිසිදු හෙයින් සෑම සංස්කාරයක් ම වීත මෝහය පෙන්වන්නකි. සෑම චේතනාවක් ම ප්‍රබුද්ධ අර්හත්වය කියාපාන්නකි. ඇය සාමාන්‍ය ලෝකයේ ජීවත් වන්නියකි, නමුත් ලෝකයෙන් ජීවත් වන්නියක නොවේ. සිල් මාතා කායිව්ගේ මනස ලෞකික ආශාවන්ට කිසිදු අයුරකින් නො ඇලෙන මනසකි.

ඇගේ සිතත් කයත් පැරණි කර්ම විපාක හේතුවෙන් ඇදී ඇදී පැමිණ සකස් වූවක් හෙයින් ඒ අවුල ලිහා ඇගේ පෙර ආත්ම මොන මොන තැන්වලට ගෙන ගොස් ඇති දැයි සොයා බැලීමට ඇය සිතුවා ය. ඇගේ දිවැස් බලය පාවිච්චි කොට මුලක් නොපෙනෙන ඇගේ පෙර ආත්ම ඉතිහාසය දෙස සිත යොමු කළා ය. කොතරම් වාරයක් ඇය ඉපදී ඇද්ද, කොතරම් වාරයක් ඇය මැරී ඇද්ද යන්න සොයා බලද්දී ඇය මවිතයට පත් විය. ගණන් කිරීමට නොහැකි තරම් අසීමිත වාරයක් කාම භවයේ ඇය සැරිසරා ඇත. සිල් මාතා කායිව් අත හැර දැමූ මළසිරුරු තම රටෙහි අතුරුවා බැලුවහොත් හිස් ඉඩක් සොයා ගත නොහැකි වනු ඇත. එපමණ වාරයක් ඉපදෙමින් මැරෙමින් මේ ගමන යෑමට කොපමණ කාලයක් ගත වෙන්නට ඇද් ද? ඉපදුණු වාර ගණන හෝ මැරුණු වාර ගණන හෝ ගණන් කිරීම කිසිසේත් කිරීමට අපහසු කාර්යයකි. එසේ කිරීමට වෙර දැරීම ද නිෂ්ඵල ක්‍රියාවකි. ඇගේ අතීතය සොයා බලද්දී ඇයට දැඩි සන්තාපයක් දැනුණි.

ඇයි මම මේ තරම් වාර ගණනක් දුක් විඳින්න ඉපදුණේ ?

නැවත නැවත ඉපදෙන්නට ඇයි මම මේ තරම් මහන්සියක් දැරුවේ ?

ඉන්පසු ඇය ලෝකයේ මිනිසුන් අතහැර දැමූ අනන්ත වූ මළසිරුරු දෙස අවධානය යොමු කළා ය. බැලූ බැලූ හැම අතම ඇයට දිස් වූයේ එකම දර්ශනයකි. ස්ත්‍රී වේවා පුරුෂ වේවා සැමටම අත්වී තිබුණු එකම ඉරණම ඉපදීම සහ මරණයයි. සැවොම මෙම කුරිරු සංසාර චක්‍රයට අසුවී ඇත. ඒ අතින් හැමෝම එක සමාන ය. කිසිවෙකුට අසාධාරණයක් අයුක්තියක් සිදුවී නැත. කර්ම හේතු ඵල ක්‍රියාදාමය ඔවුන් විවිධ ආත්මවල උපද්දවමින් මරවමින් ක්‍රියාත්මක කර ඇත. බොහෝ ඈතට මනස විහිදූ ඇයට කාම භවයේ සත්ත්වයන් ජරාව සහ මරණය ඉදිරියේ පෙළ ගැසී ඒකරාශී වී සිටින අයුරු ඇයට පෙනුණි. එය අමතක නොවන දර්ශනයකි.

සිල් මාතා කායිව් නිරන්තරයෙන් කරුණාවන්ත ය. ඇගේ සහෝදර මනුෂ්‍ය ප්‍රජාව ආධ්‍යාත්මික වශයෙන් මුහුණ පා ඇති ඉරණම පිළිබඳ අනුකම්පා කළා ය. නමුත් මේ වන විට ඇගේ හදවත සත්‍ය වූ උතුම් ධර්මයෙන් පිරී පැවති හෙයින් ඇය සියලු ම මානුෂික සංඥා මගින් සංස්කාර උත්පාදනය වීමෙන් ඔබ්බට ගිය තැනැත්තියකි.

මේ සත්‍ය ධර්මය ඇය අනුනට කෙසේ පහදා දෙන්න ද? ඇය ධර්මය පහදා දීමට මහන්සි ගත්ත ද, මිනිසුන් මෝහයෙන් අන්ධ වී සිටිය දී එවන් උතුම් පවිත්‍ර මනසක් ඔවුන් කෙසේ අවබෝධ කර ගන්න ද ? මෙම ධර්මයේ වටිනාකම තේරුම් ගෙන ඊට ඇහුම්කන් දීමට කැමති කීප දෙනෙකු වත් සොයා ගැනීමට අපහසු වනු ඇත. ඇගේ අත්දැකීම ගැන අනුනට කීමට මුල දී ඇය තරමක් පෙළඹුණා ය. ගැලවීමට මාර්ගයක් සොයා ගොස් ඇයට තනිව ම බේරීමට හැකි වූ බව අනුනට කීමට ඇයට සිත් විය. එනමුදු ඇයට ඉදිරි වසර කීපය තුළ උතුම් හුදකලාවෙන් යුතුව වාසය කිරීමට නිදහස ලැබුණේ ය. මුළු ජීවිතය පුරා ම ඇය පෙරුම් පුරමින් සිටි නිවන සාක්ෂාත් කිරීමෙන් ඇය සෑහීමකට පත් වූවා ය. අනුනට උගැන්වීමේ දුෂ්කර කාර්යයට උර දී ඒ බර ඉසිලීමට හේතුවක් ඇය නුදුටුවා ය.

තව දුරටත් මේ ගැන සිත යොමු කළ සිල් මාතා කායිව් හට බුදුන් වහන්සේත්, දුකින් මිදීමට ගත යුතු මාර්ගය කියා දීමට උන්වහන්සේ දුන්

පරමාදර්ශයත් සිහි විය. ලෝකෝත්තර ධර්මයත්, එය වටහා ගැනීමට ඇය ගත් මාර්ගයත් නැවත සලකා බැලූ ඇයට, ඇයගේ අතීතය අනෙක් අයගේ ජීවිත හා සංසන්දනය කර බැලීමට ඉඩක් ලැබුණි. ඇය කලින් සිටියේ ද අන් අය වාගේ ය. ඔවුන ද ඈ මෙන් ධෛර්යවත් ව ආධ්‍යාත්මික දියුණුව කරා මනස මෙහෙය වන්නේ නම් ඒ ඇත්තන්ට ද ධර්මයේ ප්‍රතිඵල නෙළාගත හැකි වනු ඇත. ගෞරවනීය ලෙස බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය නැවත නැවත සිහි කළ සිල් මාතා කායිවි හට මුළු ලොව පුරාම ජීවත්වන මිනිසුන්ට මෙම ධර්මයේ අත්‍යවශ්‍යතාව පැහැදිලි ව තේරුම් ගියේ ය. නිවැරදි ව ධර්මානුකූල ප්‍රතිපත්තියකට අනුව පුහුණුවන්නාගේ සාර්ථක අවසාන ප්‍රතිඵල ද ඇයට පෙනුණි. මෙම ප්‍රඥාවන්ත සිතිවිලි ඇයව උනන්දු කළේ ය. ඇහුම්කන් දීමට කැමති අයට උදව් කිරීමට ඇය තීරණය කළා ය.

විමුක්තිය කරා යෑමට සිල් මාතා කායිවි අවුරුදු දෙකක් පමණ, බොහෝ විට හුදකලා ව සිටිමින්, එකම අධිෂ්ඨාන සිතකින් යුතුව අඛණ්ඩ ප්‍රයත්නයක යෙදුණා ය. නමුත් දැනට, ඇය සිල් මාතා ආරණ්‍යයේ එදිනෙදා වැඩපලවලට වෙනදාට වඩා කාලය යොදවමින් සහභාගි වූවා ය. ඇගේ ආධ්‍යාත්මික හැකියාවන් ආරණ්‍යයේ අනෙක් සිල් මාතාවන් ද දියුණු කරගනු ඇතැයි ඇය බලාපොරොත්තු වූ අතර ඔවුනට හැකි අයුරින් මග පෙන්වීමට ඇය සූදානම් වූවා ය. සිල් මාතා කායිවි උගැන්වීමේ හැකියාවන් අතින් දුර්වල වූවා ය. ඇය ගිහි කල, ඈත ගමක විසූ සාමාන්‍ය ගෙවිලියකි. පාසැල් නො ගිය නූගත් දිළිඳු ගෘහණියකි. දක්ෂ ගුරුවරයෙකු මෙන් අනුනට උගැන්වීමේ කුසලතාවය ඇයට නො තිබුණි. ඇය කථිකත්වයෙන් දුර්වල ය. පැහැදිලි ලෙස උච්චාරණය කරමින් තම අදහස් අනුනට ඒත්තු ගැනෙන සේ කියා දීමට ඇය අපොහොසත් වූවා ය. කර්මානුකූල ව ඇය ලෝකෝත්තර තලයකට පත් වුව ද, සාමාන්‍ය ගැමි කතකගේ චරිත ලක්ෂණ ඒ ආකාරයෙන් ම ඇය රැක ගත්තා ය. ඇය බොහෝ විට තම අදහස් ප්‍රකාශ කළේ පූ තායි ප්‍රදේශයේ භාවිතා කළ ප්‍රාදේශීය ගැමි වහරෙනි. ඇගේ අදහස් ප්‍රකාශ කිරීම ඉතා ම සරල වූ ගැමි බසින් කළ ප්‍රකාශයන් ය. ව්‍යාජ ලෙස අදහස් ප්‍රකාශ කිරීම සහ අතිශයෝක්තියෙන් තම අදහස් කියා පෑම ඇය කිසි දිනක නො කළා ය. එසේ කතා කිරීමට ඇය දැන සිටියේ ද නැත. එනිසා ඈ දුන් උපදෙස් ඍජු ය. සරල ය. කෙටි ය. පැහැදිලි ය. ඇගේ ලුහුඬු සංක්ෂිප්ත පැහැදිලි කිරීම් හදවත පතුලට ම කා වදින ආකාරයේ ඒවා ය. එසේ ම එම උපදෙස් අසන්නාට ද තීරණයන්ට එළඹීමට ඉඩ සැලසෙන සේ

සැකසී තිබිණි. අවවාද ලබා ගැනීමට ඈ ළඟට පැමිණි අයගේ ශීල ගුණය ගැන ඇයට මනා අවබෝධයක් තිබුණි. එසේම එක් එක් අයෙකුට අවශ්‍ය විශේෂිත උපදේශයන් ගැන ද ඇය මනා වැටහීමකින් යුතුව උපදෙස් දුන්නා ය. එසේ වුව ද සමහරු දීර්ඝ විස්තර දක්වමින්, අවශ්‍ය අනවශ්‍ය බොහෝ කරුණු පටලවමින් ඇසීමට ද පුරුදු ව සිටියහ. සත්‍යය වටහා ගන්නා අය බොහෝ විට නිහඬ බව ඇය දැන සිටියා ය. සත්‍යය ගැන වැඩිපුර කතා කරන අය, මඳක් දැන ගොඩක් කතා කරන අය බව ද ඇය දැන සිටියා ය.

බාන් හුආයි සායි සිල් මාතා ආරණ්‍යය යුතුකම් දෙකකට මැදි වී ඒවා සමබර ව ගෙන ගියා ය. ආරණ්‍යයේ භාවනා පුහුණුව සහ ගැමි ජනතාව සඳහා ආගමික සේවාව මෙම යුතුකම් ය. සිල් මාතා කායිව් මෙම අවශ්‍යතා දෙක ම ඉටු කරමින් සේවාවේ මධ්‍යස්ථ ව සිටියා ය. එක් එක් සිල් මාතාවගේ භාවනා ප්‍රගතිය ගැන සොයා බලමින් ඔවුනට පෞද්ගලික ව උපදෙස් දෙමින් උනන්දු කළා ය. සෑම පියවරක් ම සමර්ථ වූ සියලුම බාධක මර්දනය කරමින් ඉදිරියට ගිය කෙනෙකු සේ සැමට අනුකම්පාවෙන් අවශ්‍ය උපදෙස් දුන්නා ය. කිසිවකට යටත් නොවන චරිත ලක්ෂණයකින් හෙබි සිල් මාතා කායිව්, අනෙක් සිල් මාතාවන්ට ආදර්ශයක් විය. එමෙන් ම ඈ ලත් හැකියාවන් ඔවුනට ද ලබා ගත හැකි යයි කියා පාන සජීවී සාක්ෂියක් ද විය.

දශක කීපයක අත්දැකීම් තුළින් දුෂ්කර ගැමි ජීවිතය ගැන මනා අවබෝධයක් ඇති ඇය විශේෂයෙන් ගැමි කාන්තාවක එදිනෙදා මුහුණ දෙන කටුක ජීවිතය ගැන ඉතා අනුකම්පාවෙන් සහ මෛත්‍රී සිතින් බැලුවා ය. එදිනෙදා ජීවිතයේ සුළු සුළු කරුණු ගැන ඇය ඔවුනට ඉතා වටිනා ප්‍රඥාවන්ත අවවාද දුන්නා ය. ඔවුන් හා අදහස් හුවමාරු කර ගත් ඇය ඔවුනගේ ආත්ම ගෞරවය ද රකිමින් අදාළ ගැටලු විසඳමින් අවශ්‍ය උපදෙස් දුන්නා ය. ඇයගේ අවවාද අනුශාසනා ලබා ගැනීමට ආරණ්‍යයට පැමිණි අයට ඇගේ පූජනීය පෙනුම සහ ඇය දැකීමෙන් ඇති වූ සතුට තුළින් ඔවුහු අමුතු ම ලොවකට ගෙන ගියහ. ඇයගේ අවවාද ලෞකික ලෝකයෙන් ඈතට ගෙන යන ඒවා බව ඔවුහු දැන සිටියහ. තවද විශේෂ කරුණක් විය. පියවි ඇසට නොපෙනෙන භෞතික කයක් නොමැති සත්ත්වයන්ගේ ශුභසාධනය ගැන ද ඇය විශේෂ උනන්දුවක් දැක්වූවා ය. මධ්‍යම රාත්‍රියේ දී බොහෝ විට ඇය වෙනත් ලෝකවලින් පැමිණි ජීවීන් වූ අමුත්තෝ ද පිළිගත්තා ය. ප්‍රේත භූත ලෝකවලින් පැමිණි ජීවීන්

හා සමාන ව දිව්‍ය ලෝකවලින් පැමිණි ජීවීන්ට ද සමසේ අවවාද උපදෙස් දුන්නා ය. අතීතයේ ප්‍රගුණ කළ නිහඬ භාෂාවෙන් ඔවුන් හා සමීප සාකච්ඡාවල යෙදුණා ය. මනසින් කළ එම සාකච්ඡා වචනෙන් කෙරෙන සාකච්ඡාවලට වඩා තියුණු පැහැදිලි අදහස් හුවමාරුවක් වූ හෙයින් ඇගේ මෛත්‍රිය සහ කරුණාව පැහැදිලි ව ඔවුනට වැටහුණේ ය. ඔවුනට දුන් උපදෙස් ඉතා ශාන්ත ව අවහිරයකින් තොර ව සියුම් ව ගලා ගියේ ය. ඇය උරුම කර ගත් මෙම විශේෂ හැකියාව නිසා වෙනත් ලෝකවල ජීවීන්ට මෙම ජීවිතය නිම වන තුරු උපකාර වීම තමාගේ යුතුකමක් හැටියට ඇය සැලකුවා ය. මහලු ව අසනීප ව සිටියත් ඇය එම යුතුකම නො පිරිහෙලා දිගට ම ඉටු කළා ය.

අපි ඉපදුණ දා සිට ළමා කාලය නිම වී
වැඩිවිය පැමිණෙන තුරු
අපගේ දෙමාපියන් සහ ගුරුවරුන් යටතේ
හැදී වැඩී පරිණත භාවයට පැමිණියෙමු.
අප අද මේ තත්ත්වයේ සිටින්නේ
ඔවුන් අපට අනුකම්පාවෙන් දැක්වූ සහාය නිසයි.
අපි ඔවුනට මහත් සේ ණය ගැති වෙමු
ඔවුනට කෘතඥ විය යුතුයි

නිර්ලෝභී කෘතඥතාවය

වසර කීපයක් යන තුරු ආචාර්ය මහා බෝවා සහ උන්වහන්සේගේ ගෝල පිරිස බාන් හුආයි සායි ගම අවට වාසය කළ හ. සිල් මාතා කායිව්, සිය විශේෂ කුසලතා ශක්තියෙන් උන්වහන්සේලාගේ යෑම් ඒම් ගමන් විස්තර දැන සිටියා ය. 1953 වසරේ වස් විසීම හමාර වනවාත් සමගම ආචාර්ය මහා බෝවා හිමි තම ආධ්‍යාත්මික ශක්තියෙන් අනාගත සිද්ධියක් දුටුවේ ය. ධ්‍යාන බලයෙන් අහසට නැගි උන්වහන්සේ අනුගාමිකයන් රාශියක් ඇමතීමට සූදානම් වූහ. පහළ බැලූ උන්වහන්සේ, තම මහලු අම්මා උන්වහන්සේට වැඳ නමස්කාර කරන අයුරු දුටුසේක. කඳුළු පිරි දෑසින් උන්වහන්සේ දෙස එබිකම් කරමින් ඇයව අමතක කරන ලෙස ඉල්ලා සිටියා ය.

"පුතේ උඹ කවදාවත් ආපහු එන්නෙ නැද්ද ?" යනුවෙන් ප්‍රශ්න කරන්නා සේ ඇය බලා සිටියා ය. භාවනාවෙන් නැගී සිටි මහා බෝවා තෙරණුවෝ එම දර්ශනය ගැන ආවර්ජනය කළහ. අම්මාට උදව් කිරීමට කාලය ළඟා වී ඇති බවත් ඇය ආධ්‍යාත්මික මාවතකට යොමු කර වීමට සුදුසු කාලය මෙය බවත් උන්වහන්සේට වැටහුණේ ය. තමා වෙනුවෙන් මේ අම්මා කර ඇති පරිත්‍යාගයන් ගැන සිහි කළ උන්වහන්සේ තම උපන් ගමට යෑමට තීරණය කළහ. එසේ ගොස් අවුරුදු හැටක් වයසැති අම්මා සුදුවත් හඳින සිල් මාතාවක්

වශයෙන් සසුන්ගත කිරීමට ඉටා ගත් සේක. ඇගේ ඉතිරි ජීවිත කාලය තුළ ඇයට ආධ්‍යාත්මික දියුණුවක් සලසා දීමට උන්වහන්සේ සිතා ගත්හ. හනික තම මෑණියන්ට ලිපියක් යවමින්, 'මයි චී' සිල් මාතාවක් වශයෙන් මහණ වීමට මූලික කටයුතු සූදානම් කරගන්නා මෙන් ඉල්ලා සිටියහ.

ආචාර්ය මහා බෝවා හිමි උන්වහන්සේගේ ගමට වඩින ගමනට සිල් මාතා කායිව් තෙරණියට ද සූදානම් වන ලෙස පණිවිඩ යැවී ය. ඇය උන්වහන්සේගේ මවට ඉතාමත්ම සුදුසු මිතුරියක් වනවා සේ ම යහපත් ගුරුවරියක් ද වන බැව් සිතුවේ ය. භාවනා පුහුණුවේ ආරම්භය සකසා දී ඊට ගුරුහරුකම් දීම සඳහා සිල් මාතා කායිව් හට පැවරිය හැකි බව ද උන්වහන්සේ කල්පනා කළහ.

ඈ ලද උත්තරීතර මානසික දියුණුවේ ගෞරවය ආචාර්ය මහා බෝවා මහා තෙරුන් වහන්සේට හිමිවන බැව් ද ඊට කෘත ගුණ සැලකීම ඇගේ පරම යුතුකමක් බව ද සිතා, එම ඉල්ලීම අතිමහත් ගෞරවයෙන් පිළිගත්තා ය. එසේ සිතා තව සිල් මාතාවන් දෙදෙනෙකු ද කැටුව මහා බෝවා හිමි සහ උන්වහන්සේගේ පිරිවර සමග බාන් තාඩ් ගම බලා යන දීර්ඝ ගමනට එක්වූවා ය.

ආචාර්ය මහා බෝවා හිමිගේ උපන් ගම පිහිටියේ බාන් හුආයි සායි සිට සැතපුම් දෙතුන් සියයක් ඈතින් පිහිටි උදොන් තානි ප්‍රාන්තයේ ය. බාන් තාඩ් ගම්මානයට පැමිණි ඔවුනට මහා බෝවා හිමිගේ මව්තුමිය ඇගේ අළුත් ජීවිතයට සතුටින් සූදානම් ව සිටින බැව් පෙනී ගියේ ය. වහ වහා ඔවුන් මහණ පින්කමට කටයුතු සූදානම් කළහ. ඇගේ මහලු වයසට උන්වහන්සේ සමග තැනින් තැන චාරිකාවේ යෑමට ඇයට අපහසු බැවින් ගම්මානය අසල කුඩා ආරණ්‍යයක් තැනීම සඳහා සුදුසු තැනක් සෙව්වේ ය. උන්වහන්සේගේ මව් පාර්ශවයේ මාමා කෙනෙකු සහ ඔහුගේ මිතුරෙකු ගමට සැතපුමක් පමණ දුරින් පිහිටි අක්කර හැත්තෑවක් පමණ වූ වන ගත ඉඩමක් පූජා කරන ලදුව, උන්වහන්සේ එය පිළිගත්හ. උන්වහන්සේ ද එම ඉඩමේ පදිංචි ව සිටිමින්, භික්ෂූන්ට සහ සිල් මාතාවන්ට විවේකයෙන් වාසය කිරීමට සුදුසු වෙන් කරන ලද ආරණ්‍යයක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව උණ බම්බුවලින් ශාලාවක් සහ දෙපාර්ශවයට ම අවශ්‍ය කුටි දායකයන් ලවා සෑදීමට පටන් ගති.

ආරණ්‍යය සෑදෙන තුරු මහා බෝවා ස්වාමීන් වහන්සේ, උන්වහන්සේගේ අම්මා, භික්ෂූන් පිරිස සහ කායිව් සිල් මාතාව, චන්තබූරි ප්‍රාන්තයේ ඈත මුහුදු වෙරළ අසබඩ ස්ථානයකට ගියහ. එහි වාසය කළේ මසුන් මරන්නෝ සහ පලතුරු වවන්නෝ ය. 1954 වසරේ වස් වැසීම සඳහා එම මුහුදු බඩ ස්ථානය තෝරා ගත්තේ ය. නමුත් බලාපොරොත්තු නොවූ ප්‍රශ්නයන්ට මුහුණ පෑමට සිදු වූ හෙයින් ඉක්මනින් නැවත බාන් තාඩ් ගම්මානයට ඒමට සිදු විය. චන්තබූරි හි දේශගුණය අම්මාට සහ සිල් මාතා කායිව් දෙදෙනාටම හිතකර නො වී ය. තවද එහි ආහාර දෙදෙනාට ම ගැළපුණේ නැති හෙයින් මහා බෝවා හිමිගේ අම්මා අසනීප විය. එම අසනීපය කුමක් දැයි සොයා ගැනීමට ද නොහැකි විය. වස්සාන කාලය අවසන් වෙත් ම අම්මාගේ අසනීප තත්ත්වය අසාධ්‍ය වී අංශභාගයට හැරී ගමන් කිරීමට පවා අපහසු තත්ත්වයකට පෙරළුණි. මහා බෝවා හිමි තම අම්මා ඉක්මනින් ඇයට හුරු පුරුදු ගමට ගෙන ගොස් අවශ්‍ය වෙදකම් කළ යුතු යයි සිතුවේ ය. කණ්ඩායම නැවත බාන් තාඩ් ගම්මානයට පිවිසෙද්දී ඉතා රමණීය ආරණ්‍යයක් ඉදි වී අවසාන වෙමින් තිබුණි.

අලුත් ආරණ්‍යයට පිවිසි වහාම සිල් මාතා කායිව් තම කටයුතු ආරම්භ කළා ය. වනාන්තරයේ ඇති ඖෂධ පැළැටි ඇය හඳුනන බැවින් ඒවායේ ගුණාගුණ ද ඇය හොඳින් දන්නා හෙයින් මහලු සිල් මාතාවට සුදුසු යයි සිතූ ඖෂධ එකතු කළා ය. ඇගේ ශරීරයට හිතකර යයි සිතූ පොතුවර්ග, පැලැටි, ගෙඩි, මුල් යනාදී ඖෂධ ගෙනැවිත්, මහලු අම්මාට සාත්තු කිරීම ඉක්මනින් ඇරඹුවා ය. ඖෂධ කොටස් හොඳින් දැන මැන සකස් කර රෝගී අම්මාගේ දිනෙන් දින වෙනස් වන තත්ත්වයන්ට ගැලපෙන සේ කැපවීමෙන් සාත්තු කළා ය.

මහලු සිල් මාතාව, සිල් මාතා කායිව්ගේ වෙද හෙදකම් ලබමින් දවසින් දවස සුව අතට හැරුණා ය. ඇයගේ අංශභාග තත්ත්වය කෙමෙන් සුව අතට පත් වුණි. ඇයට සෙමින් සෙමින් ඇවිදීමට හැකි ශරීර ශක්තිය වර්ධනය විය. අවුරුදු තුනක පමණ කාලයක් එම ප්‍රතිකාර ලබමින් සිටි ඇයට පසුව හොඳින් අත පය මෙහෙය වීමට ශක්තිය ලැබුණි.

බාන් තාඩ් ආරණ්‍යයෙහි වාසය කළ මුල් වසර කීපය ඉතා දුෂ්කර කාලයක් විය. මූලික අවශ්‍යතා සොයා ගැනීමට පවා බැරි තත්ත්වයක් විය. සිල් මාතා කායිව් සහ අනෙක් සිල් මාතාවෝ තම සුදු සිවුරු මසා සකසා ගත්තේ මළමිනී ඔතා සොහොනට ගෙන දමන රෙදිවලින් ය. ඔවුනගේ කොට්ට පිදුරු

පිරවූ ඒවා ය. ඔවුනගේ පාවහන් වූයේ පරණ ටයර් කැලිවලින් සකස් කරගත් පාවහන් ය. ආහාර ඉතා කටුක ය. අමිහිරි ය. දවස ගෙවා ගැනීමට යන්තමින් සෑහුණි. බාන් තාඩ් ආරණ්‍යයෙහි ජීවත්වීම කොතරම් අසීරු වූවා ද කියතොත් සිල් මාතා කායිව් ඒ ගැන විස්තර කීමට අකමැති වූවා ය.

1960 වර්ෂය වන විට රටේ දියුණුවත් සමග කැලෑ එළිවන්නට විය. වනාන්තර එළි වන විට ධුතාංගධාරී භික්ෂූන්ගේ ජීවන රටාවට බාධා පැමිණියේ ය. වනාන්තර එළිපෙහෙළි කර වෙනත් සංවර්ධන කටයුතු කෙරෙද්දී ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලාගේ, හුරු පුරුදු භික්ෂු ජීවිතය වරින් වර විවිධ වෙනස්කම්වලට භාජනය විය. භූගෝලීය වෙනස්කම්වලින් ආරණ්‍ය පරිසරයට හානි පැමිණෙද්දී ඊට එරෙහිව ආරණ්‍ය රටාව රැක ගැනීමට බාන් තාඩ් ආරණ්‍යය පෙරමුණ ගත්තේ ය. ආචාර්ය මුන් මහා තෙරුන් වහන්සේගෙන් උරුම වූ ආරණ්‍යය භික්ෂු රටාව රැක ගනිමින් ස්ථිර වන සෙනසුන් බිහිකර ගැනීමට ආචාර්ය මහා බෝවා හිමි පෙරමුණ ගත්තේ ය. බ්‍රහ්මචරියා ශීලය රැකීම, දැඩි විනය සහ තීව්‍ර භාවනා පුහුණුව ඉදිරියට ගෙන යා යුතුව තිබුණි. ආරණ්‍යවාසී සහෝදර භික්ෂූන් වහන්සේලාගේ අයිතිවාසිකම් රැක දෙමින් ධර්මය සහ ශාසනය රැක ගැනීමේ මූලිකත්වය ආචාර්ය බෝවා හිමි වෙත පැවරුණි.

ආචාර්ය මුන් මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ආරම්භ කොට ඉදිරියට ගෙන ආ ආරණ්‍ය පටිපදාව රටට හඳුන්වා දෙමින් ඊට ජනතාව නම්මා ගැනීමට බෝවා තෙරුන් වහන්සේ මහත් පරිශ්‍රමයක් ගත්හ. ඊට උන්වහන්සේගේ සිත් ඇද බැඳ ගන්නා කතා විලාසය සහ ප්‍රඥාවන්තව සැලසුම් කළ පියවර මහෝපකාරී විය. ටික කලකින් ආචාර්ය මහා බෝවා හිමි වැඩ සිටි සෙනසුනට අධික ජනතාවක් ධර්ම පිපාසයෙන් ආකර්ෂණය වූහ. සැබෑ අව්‍යාජ කම්මට්ඨානාචාර්යයන් වහන්සේ නමක් යටතේ ධර්මය ඉගෙන ගනිමින් පුහුණුව ලැබීමට ජනතාව පෙළගැසුණහ. අවසානයේ පිරිසිදු ධර්මය සොයමින් වෙහෙසුණු මහජනතාව සංවිධාන වී, මෙම ආරණ්‍යය මහජන ප්‍රසාදයට පාත්‍ර වූ ශ්‍රේෂ්ඨ භාවනා පුහුණු මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කළහ.

මෙම පරිවර්තනය සිදුවන අතරතුර තම ශ්‍රේෂ්ඨ ගුරුදේවයනට සමීප ව සිටිමින් සිල් මාතා කායිව් එම කටයුතුවලට සහාය දුන්නා ය. ඉතා ශාන්ත තැන්පත් චරිතයකින් යුත් කායිව් සිල් මාතාවෝ ආරණ්‍යයට පැමිණි

කාන්තාවන්ට විශේෂයෙන් අදාළ වූ ධර්මාවවාද දෙමින්, භාවනා ගැටලු විසඳා දෙමින් එමෙන් ම ශාසනයට ඇතුළුවීමේ වටිනාකම ද පහදා දුන්නා ය.

ආචාර්ය මහා බෝවා හිමිගේ මව්තුමියගේ සෞඛ්‍යය යහපත් අතට හැරුණු පසු ඇගේ හදවත මුළුමනින් ම භාවනා පුහුණුව සඳහා යොමු කළ යුතු යයි කායිව් සිල්මාතාව ඇයට අවවාද දුන්නා ය. භාවනාව සඳහා ශක්තිමත් පදනමක් ඇතිකර කැපවීමෙන් සහ ධෛර්යවත් ව පුහුණු කටයුතු කරගෙන යෑමට මහලු සිල් මාතාව උනන්දු කළා ය. එහි සාර්ථක ප්‍රතිඵල ඇයට ම බලා ගත හැකි බැව් පහදා දුන්නා ය. ඇගේ භාවනා ප්‍රගතිය පෙර ආත්මයන්හි දී ඈ විසින් වඩන ලද කුසලයන් මත රඳා පවතී. එසේම මෙම ආත්මයේ දී ඇය දරන වීර්යය මත ද භාවනා දියුණුව රඳා පවතී. එම වීර්යය ඇය සක්මන් භාවනාවට සහ හිඳි ඉරියව්වෙන් කෙරෙන භාවනාව සඳහා යෙදවිය යුතු ය. ශීලය නිතර නිතර පිරිසිදු කර ගනිමින් අකුසල් තම මනසට වද්දා නො ගනිමින්, පුහුණු පටිපදාවෙහි නිරත වන විට ඇගේ මනස පිරිසිදු වී අවබෝධ ඥානය දියුණු වේ. අන්තිමේ දී සියල්ල නිර්මාණය වන්නේ සිතෙන් බව ඇයට පැහැදිලි වනු ඇත. ඇස් රූප දකී ; කන් ශබ්ද අසයි ; නාසය ගඳ සුවඳ විඳී ; දිව රස විඳී; කය ස්පර්ශ විඳී ; එසේ ම හදවත හැඟීම් අත්දකී. සිත ඒවා ගැන කල්පනා කරයි. කල්පනා කරමින් ඒවා ස්ථිර බවත් සත්‍ය බවත් සිතයි. නිරන්තරයෙන් හොඳ සිහියෙන් සිටීම වර්ධනය කර ප්‍රඥාව දියුණු කළ විට, සිතේ ඇත්ත ක්‍රියාකාරිත්වය දැක, ඒ හැම දෙයක් ගැන ම ඇත්ත ඇති සැටියේ දකින්නට හැකිවනු ඇත ;

වෙනස් වන බව,
පදනමක් නැති බව,
දුකින් බද්ධ වී ඇති බව.

නිසි අවධානයක් නොමැති කළ, මනස පිටුපසින් කෙලෙස් අධිවේගයකින් ඇදී අවුත් මුළු මනස ම දැඩි ව වෙළා ගනී. කුමක් වූවා දැයි තේරුම් යන්නටත් පෙර රාගය ක්‍රෝධය තණ්හාව සහ මෝහය කෙනෙකුගේ මනස විනාශ කරයි. ඒ හොඳ සිහිය නැති වෙලාවයි. එම අඩුපාඩුව මග හැරීම සඳහා තම මනස දෙස කල්පනාවෙන් බලා සිට කෙලෙස් සංසරණය සිතට බලපෑම් කරන අයුරු තීක්ෂණ ව දකින ලෙස වැඩිමහල් අම්මාගෙන් සිල් මාතා කායිව් ඉල්ලා සිටියා ය.

සිල් මාතා කායිව්ගේ කාරුණික ප්‍රඥාවන්ත වචන මහා බෝවා හිමිගේ අම්මාගේ මනස ධෛර්යවත් කළේ ය. එම අවවාද ඇයව භාවනා පුහුණුවේ නිවැරදි මාර්ගයට යොමු කළා ය. වසර නිම වෙත් ම ඇගේ මනස ආධ්‍යාත්මික පුහුණුව සඳහා හොඳ අඩිතාලමකට වැටී තිබුණි. 1967 දී සිල් මාතා කායිව් බාන් තාඩ් ආරණ්‍යයෙන් පිටව යද්දී මහලු සිල් මාතාව ස්ථිර ව ම ආර්ය අෂ්ඨාංගික මාර්ගයට යොමු වී සිටියා ය.

ප්‍රශ්නයක් ඇසීමට පූර්ව
ඊට පිළිතුරු
ඔබ ම සෙවීමට මහන්සි ගන්න.
ඔබ එසේ සොයන විට
බොහෝ විට
පිළිතුර
ඔබට ම සොයාගත හැක.

දිවිය පුරා ඇප කැප වී

සිල් මාතා කායිව් යටතේ භාවනා උපදෙස් ලද ආචාර්ය මහා බෝවා හිමිගේ අම්මා සහ අනෙක් සිල් මාතාවෝ 1967 වසර වන විට භාවනා පුහුණුවේ සිද්ධාන්තයන් ගැන මනා අවබෝධයක් ලබා තිබුණි. සිල් මාතා කායිව් නැවත බාන් හුආයි සායි සිල් මාතා ආරණ්‍යයට යෑමට බෝවා නායක හිමිපාණන්ගෙන් ගෞරවයෙන් අවසර ලබා ගත්තා ය. වැඩි කාලයක් ඇය බාන් තාඩ්හි රැඳුණ හෙයින් බාන් හුආයි සායි ආරණ්‍යයේ සිටි ඇගේ අනෙක් සොහොයුරියන් ගැන කනස්සල්ලට පත් වූවා ය. නමුත් කීපවරක් ඇය තම ආරණ්‍යයේ සොහොයුරියන්ගේ දුක් සැප සොයා බලා අත්‍යවශ්‍ය දේ සැපයුවා ය. ඇය ආරම්භ කළ ආරණ්‍යයට නැවත යාමට, මහා බෝවා හිමිගෙන් අවසර ලත් පසු සතුටින් එහි ගොස් නැවත සුපුරුදු ලෙස වාසය කිරීමට පටන් ගත්තා ය. මෙදා සිට වසර 24 කට පසු පිරිනිවන් පානා තුරු සිල් මාතා කායිව් වාසය කළේ මෙම ආරණ්‍යයේ ය.

බාන් හුආයි සායි ආරණ්‍යයට පැමිණි දා සිට සිල් මාතා කායිව් එම සෙනසුනේ සේනාසනාධිපතිනිය ලෙස කටයුතු කිරීම ඇරඹුවා ය. ආරණ්‍යයේ සිල් මාතාවන්ගේ ජීවන රටාව ඉතා සරල වූ චාම් ගති පැවතුම් ඇති නිහඬ පිළිවෙත් ඇති දිවි පෙවෙතකි. ඇය සම්මා සතිය දියුණු කිරීම ගැන විශේෂ

අවධානයක් යොමු කළා ය. සියලු ම සිල් මාතාවෝ ඇයගේ දැඩි විනයට අවනත වූ අතර ඔවුහු සමාදන් වූ අෂ්ඨාංග ශීලය ඉතා දැඩි ව ආරක්ෂා කළෝ ය. ගිහි ගෙය අත හැර යාමේ ආනිශංස සැම දෙනාගේ ම සිත් කා වදින ලෙස පහදා දුන් අතර එම අනුශාසනා ඉතාමත් සංවර විනයානුකූල සෘජු අවවාදවලින් යුක්ත විය.

"ඔබ දැන් සිල් මාතාවක් ලෙස සසුන් ගත වී මා සමගත් අනෙක් සිල් මාතාවන් සමගත් ජීවත් වීමට මෙම ආරණ්‍යයට ආවා. මේ වෙලාවේ ඉඳලා, ඔබේ සිතිවිලි වචනය ක්‍රියාව හැම වේලේ ම බොහොම උසස් සිතිවිලිවලින් යුක්ත වෙන්න ඕනෑ. ඔබ මේ ලෝකයේ සැප සම්පත් අත හැර දාලා මේ උතුම් ගමන ආවේ, ඔබලාගෙ හදවත් පිරිසිදු කරගන්නා ආකාරය ඉගෙන ගන්නයි. ඔබලා අත හැර දමා ආ ඒ පැරණි ජීවිතය ගැන ආපහු සැලකිල්ලක් දක්වන්න එපා. ගෙදර ගැන, දරු පවුල් ගැන කනස්සල්ලෙන් ඉන්න කාලයක් නොවෙයි මේ කාලය."

අසභ්‍ය දේවල් ගැන කතා නො කරන ලෙස ඇය සිල් මාතාවන්ට තදින් අවවාද කළා ය. කතා කරන හැම අවස්ථාවක දී ම අර්ථවත් දෙයක් ම කතා කළ යුතු බැව් අවධාරණය කළා ය. උතුම් ආරණ්‍යවාසී ගුණාංග වර්ධනය කර ගැනීමටත් තම භාවනා පුහුණුවේ දී කැපවීමෙන් යුතුව විඳිය යුතු දුෂ්කරතා ඉවසමින් තමා පිළිබඳ සත්‍යතාවය නිවැරදි ව දකිමින් කල් ගෙවීමට ඇය ඔවුනට අවවාද දුන්නා ය.

අතීතයේ නො ලැබුණු සැප සම්පත් ගැන සිතමින් කනස්සල්ලට පත්වීමත් අනාගතයේ සම්පත් ලැබීමට බලාපොරොත්තු ඇති කර ගැනීමත් ඔවුනට තහනම් කළා ය. එවන් සංකල්පනා ඔවුන් මුලා කරනු ඇත. අලසකම නමැති ක්ලේශය සමග සටන් වැදීමටත්, ලෙහෙසියෙන් කොට්ටයට යටත් නොවීමටත් ඇය ඔවුනට අවවාද දුන්නා ය. තම සිතිවිලි ගැන හොඳ අවධානයෙන් සිටීමටත් හදවත් පතුලේ ඇති සත්‍යය පමණක් සෙවීමටත් ඔවුන් දිරිමත් කළා ය.

බුදුරජාණන් වහන්සේ ගත් මාර්ගය ගැන දැඩි විශ්වාසයක් ඇති කර ගැනීම අත්‍යාවශ්‍ය බව ඇගේ ශිෂ්‍යාවන්ට අවධාරණය කළා ය. ඔවුන් තෝරාගත් ආර්ය මාර්ගයේ සෑම පියවරක් ගැන ම හොඳ සිහියෙන් සිටිය යුතු බව නිතර මතක් කර දුන්නා ය. ඒ මක් නිසා ද, එම මාර්ගය පවතින්නේ තමාගේ මනස සහ

හදවත තුළ බැවිනි. එනිසා එම මාර්ගයේ ගමන් කරමින් දුකින් නිදහස් වීම එක් එක් ශිෂ්‍යාව වෙන වෙනම සොයාගතයුතු බව පහදා දුන්නා ය. කැපවීමෙන් ධෛර්යවත් ව නිවන් සාක්ෂාත් කරන තුරු දැඩි අධිෂ්ඨානයෙන් යුතුව තම පුහුණු කටයුතු කරගෙන යෑමට ඔවුන් දිරිමත් කළා ය.

සිල් මාතාවන්ගේ දුර්වලකමක් දුටු වහාම ඔවුන්ගේ ප්‍රගතිය ඔවුනට ම තක්සේරු කර ගැනීමට යොමු කළා ය. "ඔබ බොහෝ කලක් මා සමග පුහුණු කටයුතු කරගෙන ගියා. නමුත් ඔබලා කීදෙනෙක් ජයග්‍රහණ කීයක් ලැබුවා ද? ඔබ සම්පූර්ණ කළ දෙයට වඩා වර්තමානයේ ඔබේ ඇලීම් ප්‍රමාණය විශාල ය. මා විශ්වාස නැතිනම් ඔබ ඔබගෙන් ම අහන්න. ආශාවන් කීයක් මම කපා හැර තියනවා ද? දිව්‍ය ලෝකවල දෙවිවරුන් පවා උපදින්නේ මැරෙන්නයි නැවත උපදින්නයි. ඔබ වාගේම ඔවුනුත් ඔවුනගේ කෙටි ජීවිත වටිනාකම්වලට ඇලුම් කරනවා. ඉපදීමට තිබෙන ආශාව, ජීවිතයට ඇති දැඩි ආශාව සියලු සත්ත්වයන් මෙම දුකින් පිරුණු ලෝකයේ නැවත නැවත ඉපදීමට හේතු වෙනවා."

"ආධ්‍යාත්මික ජීවිතයක් තුළ නොසැලකිල්ලට කිසිසේත් ඉඩක් නැත. ඔබ හැම ශීලයේ සහ කුසල්වල වාසනා බලයෙන් නිර්වාණ සතුට සෙවීමට වෙර දරන සිල් මාතාවෝ. තරුණ මහලු අපි හැමෝම මේ ආත්මයේ එකට ජීවත් වන අයයි. මුහුණ දීමට ඇති සියලු ම දුෂ්කරතාවයන්ට ධෛර්යයෙන් සහ ඉවසීමෙන් මුහුණ දී දැඩි ආත්ම ශක්තියකින් අලස නොවී, සිල් මාතාවක් සතු චාම් පැවැත්ම ගොඩනගා ගන්න ඕනෑ. ඔබ මුහුණ දෙන ගැටලු සහගත හැම අවස්ථාවකදීම මෛත්‍රිය සහ කරුණාව ක්ෂණික ව හැම වේලෙ ම ඉස්මතු වී එන්න ඕනෑ. ඔබේ යෙහෙළියන් මෙන් ඉන්නා සිල් මාතාවන්ට ගෞරව කරන්න. මෘදු වචනින් කතාකරන්න. කමටහන් ආචාර්යවරිය ගේ විවේචන කෘතඥ පූර්වක ව භාර ගන්න. ඔබේ හැසිරීම ගැන මම ඔබට චෝදනා නගද්දී, ඒවා ඔබේ යහපත සඳහා දෙන පාඩම් සේ සලකන්න. මගේ චෝදනා ඔබගේ ශුභසිද්ධිය සඳහාමයි. ඔබේ ආචාර්යවරියට සහ අනෙක් සිල්මාතාවන්ට ගරු කිරීම, ඔබ අතින් නොවරදවා ම ඉටුවිය යුතු යුතුකමක්. ඔබට වඩා එක දවසකින් පවා ජ්‍යේෂ්ඨ සිල් මාතාවකට ඔබ නැමී ආචාර කරන්න ඕනෑ. අප අතරේ පවතින සුහදත්වය ඔබ නිහතමානී ව සතුටින් භාර ගෙන එකමුතු ව වාසය කරන කොට අපි හැමෝටම ලද දෙයින් සතුටු වෙලා සැහැල්ලුවෙන් ජීවත් වෙන්න පුළුවන්. මෛත්‍රිය කරුණාව මුදිතාව ඒ ආකාරයට තම තමන්ගේ

හදවත්වල පුරවා ගෙන, එකිනෙකාට ඒවා පැතිරුවහොත් අවසානයේ සියලු සත්ත්වයන්ට මෙන් ම මුළු විශ්වයට ම පැතිරිය හැකි වෙනවා ඒකාන්තයි."

ආචාර්ය මහා බෝවා හිමි වරින් වර සිල් මාතා ආරණ්‍යයට පැමිණීමට පුරුදුව සිටියේ ය. උන්වහන්සේ හැම අවස්ථාවක දී ම සිල් මාතා කායිවිගේ ආදර්ශවත් චරිතය ගැන වර්ණනා කරමින් අන් සිල් මාතාවන් ඉන් පාඩම් උගත යුතු බැව් අවධාරණය කළහ. සත්‍ය වශයෙන් කියතොත් ඈ ගෙන ගිය ධර්මානුකූල පටිපදාව සෑම බෞද්ධයෙකු ම අනුගමනය කළ යුතු ආදර්ශවත් පටිපදාවකි. ඇගේ අප්‍රතිහත ධෛර්යය, දෘඪ අධිෂ්ඨාන ශක්තිය, උතුම් ප්‍රඥාව සහ අසීමිත කරුණා ගුණය ගැන ද නිතර නිතර සිහි කළයුතු බැව් ඇගේ ශිෂ්‍යාවන්ට මතක් කර දුන්නේ ය. දැඩි කැපවීමකින් ඇය හිමි කර ගත් එම ධර්මානුකූල චරිත ලක්ෂණ, ඇය ඍජු ව ම නිවන් මගට යොමු කළ ශ්‍රේෂ්ඨ ලක්ෂණයන් ය. අවසානයේ ඇයව අජරාමර නිවන කරා ගෙන ගියේ ය. සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ අතිඋතුම් ශ්‍රී සද්ධර්මය අනුව තම භාවනා කටයුතු සහ චරිතය සංවර්ධනය කරගත් සිල් මාතා කායිවි අවසානයේ විමුක්තිය කරා ගියා ය.

බුදුරජාණන් වහන්සේගේ
ශ්‍රාවකයන් හැටියට අප තුළ පවතින
අවිහාප ගුණාංගයක් හෝ
එසේ නැතහොත් කිසියම් හෝ හොඳක් නො දැන,
අපගේ පීවිත කුණු වී ජරාවට යන තුරු නිකරුණේ බලා නොසිටිය යුතුයි.
මරණය ඔබ සොයා පැමිණි කල
කිසිදු ඇලීමක් නොමැති ව ඔබේ කයත් මනසත් අතහරින්න.

පාරිශුද්ධ හදවත

මීළඟ අවුරුදු දහය තුළ දී සිල් මාතා කායිව් ඇය ආරම්භ කළ සිල් මාතා ආරණ්‍යයේ ආධ්‍යාත්මික ශුභසිද්ධිය ගැන මහත් වූ පරිශ්‍රමයක් දැරුවා ය. එය ආදර්ශවත් ආරණ්‍යයකට පරිවර්තනය කළ ඇය 1977 ජූනි මස හදිසියේ ම රෝගාතුර වූවා ය. කලක සිට එම රෝග ලක්ෂණ ශරීරය තුළ වර්ධනය වෙමින් තිබී ඇත. අන් අයට කරදරයක් වනවාට අකමැති වූ හෙයින් ඇය මේ බව කිසිවෙකුට නො දැන්වූවා ය. රෝගය සඟවාගෙන සිටීමට බැරි තරම් අසාධ්‍ය වූ පසු ඇය රෝහලකට ඇතුළත් කරන ලදී. වෛද්‍යවරු ඇගේ එක් පෙණහැල්ලකට ක්ෂයරෝගය වැළඳී ඇති බැව් අනාවරණය කළහ. තවද වැඩිපුර සිදුකළ පරීක්ෂණවල දී ඇයට දියවැඩියා රෝගය ද ඇති බැව් සොයා ගන්නා ලදී. මේ වන විට ඇගේ ශරීරය මැලවී ඉතා දුර්වල තත්ත්වයකට පත් ව තිබුණි. ඇය දැඩි වේදනාවෙන් පෙළුණා ය. දිනෙන් දින වර්ධනය වූ රෝග ලක්ෂණ ඇය අසාධ්‍ය තත්ත්වයකට පත්ව ඇති බව සනාථ කළේ ය. වෛද්‍යවරු ඇගේ ජීවිත කාලය සීමිත බැව් තීරණය කළෝ ය. ඔවුනගේ නිගමනය වූයේ අවුරුදු එකකට දෙකකට වඩා ඇය ජීවත් නොවන බව ය. සිල් මාතා කායිව්ගේ අසනීප තත්ත්වය එන්න එන්නම සංකීර්ණ වන්නට විය. ඇයට ඇදුම රෝගය ද ඒ මතුපිටට වැළඳී, කැස්ස වැඩිවී ලේ වමනය කරන්නට වූවා ය. මේ හේතුවෙන් ඇය බොහෝ වෛද්‍ය පරීක්ෂණයන්ට භාජනය කිරීමට

සිදු විය. එම පරීක්ෂණවල දී ඇගේ අනෙක් පෙණහැල්ලට හිංසක පිළිකාවක් වැළඳී ඇති බැව් අනාවරණය විය. ප්‍රධාන රෝග තුනක් ස්ථිර වශයෙන් ම සනාථ විය. ක්ෂය රෝගය, දියවැඩියාව සහ පිළිකාව, ඇය වැඩිකල් ජීවත් නොවන බැව් කාටත් පැහැදිලි විය.

රෝහලට ඇතුළු කර මසක් ගත වෙද්දී සිල් මාතා කායිව් ඇගේ රෝග තත්වය මොන තරම් අසාධ්‍ය වුවත් ඇගේ සිල් මාතා ආරණ්‍යයට යාමට අවශ්‍ය බව දැන්වූවා ය. ඇය කවදත් ප්‍රිය කළ ශාන්ත වූ රමණීය වූ ආරණ්‍යය පරිසරයේ සිල් මාතා යෙහෙළියන් වටකර සිටිය දී ඇගේ මරණය සිදු වේ නම්, එය තමා අගය කරන බැව් දැන්වූවා ය. රෝගාතුර වූ පසු ඇගේ බර ටිකෙන් ටික අඩු විය. එනමුත් ඇගේ හදවත සියලුම කෙලෙස් බරින් නිදහස් වූවකි. සිල් මාතා කායිව් ඇගේ ශුභසිද්ධිය ගැන සැලකිල්ලක් නො දැක්වූ අතර මරණයට ද කිසිදු බියක් නො දැක්වූවා ය. ඇගේ සිල් මාතා සොහොයුරියන්ගේ සහ දායක දායිකාවන්ගේ ද යහපත ගැන ඇය වඩාත් වෙහෙසුණා ය. ඇගේ දීප්තිමත් ජීවන රටාව ඇය ඇසුරු කළ සැමගේ ම ආධ්‍යාත්මික ගුණවගාව ආලෝකවත් කළ අතර ඔවුනගේ හදවත් ප්‍රභාස්වර කළේ ය. ඇගේ පවිත්‍ර මෛත්‍රී ගුණය හමුවේ සියලු බාධක තුනී වී යන බවක් කාටත් වැටහුණි. ඇගේ අවසන් කාලය ගතකිරීමට ඇයට අවශ්‍යවූයේ, බොහෝ ජනයාට හිත සුව පිණිස, වැඩදායක ලෙස ඉතිරි ආයු කාලය යෙදවිය හැකි තැනකි.

ඇගේ හිතවත් දායිකාවක් වූ වෛද්‍ය පෙන් ශ්‍රී මකරනොන් බැංකොක් නගරයේ වෛද්‍යවරියකි. බාන් හුආයි සායි සිල් මාතා ආරණ්‍යයට විත් සිල් මාතා කායිව් හට ප්‍රතිකාර කිරීමට ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වූවා ය.

වෛද්‍ය වෘත්තියේ අවුරුදු විස්සක පළපුරුද්දක් ඇති වෛද්‍ය පෙන් ශ්‍රී, කාස රෝගයට දියවැඩියා රෝගයට එවකට සොයාගෙන තිබූ නවතම ප්‍රතිකාර ක්‍රම ඈ වෙනුවෙන් ලබා දුන්නා ය. කාස රෝගය මර්දනය සඳහා ප්‍රබල ප්‍රතිජීවක ඖෂධ ද, දියවැඩියාව පාලනය කිරීම සඳහා දියවැඩියා ඉන්සියුලින් එන්නත වරින් වර දීම ද ඇය ඉතා ක්‍රමවත් ව සිදු කළා ය. නමුත් පිළිකාව සඳහා පිළියමක් නො වී ය.

සිල් මාතා කායිව් වැනි රහත් මෙහෙණින් වහන්සේ කෙනෙකුට ප්‍රතිකාර කිරීම තරම් භාරධූර වගකීමක් ඇගේ වෛද්‍ය ජීවිතයේ නො කළ බැව් ඇය පසු

කාලයක දී සිහි කළා ය. රහත් මෙහෙණින් වහන්සේ කෙනෙකුට ප්‍රතිකාර දීමට තරම් ආධ්‍යාත්මික පුහුණුවක් ඇයට නොතිබූ බැව් ද ඇය පැවසුවා ය. රහත් තෙරණියකට ඇති ගෞරවය කිසි විටක පළුදු නොවන සේ වෛද්‍ය පෙන් ශ්‍රී තම සේවය අතිමහත් ගෞරවයකින් භක්තියකින් ඉටු කළා ය. එක් රෝගයක් සුව වුවත් අනික් රෝගයෙන් කෙනෙකු මිය යන්නට හැකි හෙයින් වෛද්‍ය පෙන් ශ්‍රී රෝගයට බෙහෙත් කරනවාට වඩා රෝගියාට ප්‍රතිකාර කළා ය. සිල් මාතා කායිව් ළඟ දී යම් දිනක මිය යන බැව් දැන සිටි වෛද්‍ය පෙන් ශ්‍රී, ඇය අසහනයකින් තොරව කොයි වේලෙත් සුව පහසුව සිටීමට කටයුතු සැලසුවා ය. මේ හේතුව නිසා ඇයට විශේෂ බෙහෙතක් දීමට ප්‍රථම රෝගය ගැන කෙටි විස්තරයක් කර ඇයගේ සිතට බරක් නොදී එම බෙහෙත ගැනීමෙන් කයට ඇතිවන ප්‍රයෝජනය සිල් මාතා කායිව් හට පැහැදිලි කර දුන්නා ය. එම විස්තරය ඇසීමෙන් පසු ව ඒ බෙහෙත ගැනීම නො ගැනීම ඇය තීරණය කළා ය. ඇය යමක් එපා යයි කිවහොත් වෛද්‍ය පෙන් ශ්‍රී ඇයට බලපෑමක් නො කළා ය.

මේ ආකාරයෙන් අවුරුදු 14 ක් ගත විය. ඇගේ අසනීප තත්ත්වයේ වෙනසක් නො වූව ද භාවනා පුහුණුවට අවැසි අනුශාසනා දීමෙන් සහ අනුනට ධර්මය බෙදා දීමෙන් ඇය ඈත් නො වූවා ය. එම ආධ්‍යාත්මික වගකීම, අසනීපයෙන් සිටිය ද ඇය හැකි පමණින් ඉටු කළා ය. ඇයගේ ශරීර දුර්වලතා දිනෙන් දින හීන වෙද්දී ඊට අනුරූප ව ඇගේ දින චරියාව සකස් කර ගනිමින් ඈ සතු යුතුකම හොඳ සිහියෙන් ඉටු කළා ය. ආරණ්‍යය තුළ ඇය සිටින අවස්ථාවල, උත්තරීතර මනුෂ්‍යත්වය සහ එහි මුදු මොළොක්භාවය සතර දිසාවට ම විහිදෙන බවක් කාටත් හැඟුණි. ඇයට උදව් කරන හැමෝට ම ප්‍රශංසා කොට පින් අනුමෝදන් කිරීමට ඇය අමතක නො කළා ය. වෛද්‍යවරිය ඇයට බොන බෙහෙත් දුන් පසු එය අගය කරමින් තම දැතින් ම එම බෙහෙත් හිස මතට ගෙන වෛද්‍යවරියට පින් පමුණුවා ඉන් අනතුරුව බෙහෙත් බීවා ය. ඇය බැලීම සඳහා ආරණ්‍යයට එන හැමෝම ඇය පිළිගත්තේද ඔවුනට මහත් වූ ගෞරවයක් දක්වමින් ය. ඔවුන් ඇසූ ධර්ම ප්‍රශ්නවලට කිසිදු විශේෂ පක්ෂපාතිත්වයක් නොදක්වා ධර්මානුකූල වූ ප්‍රඥාවන්ත පිළිතුරුවලින් සංග්‍රහ කළා ය. ඇගේ මනස අතිපාරිශුද්ධත්වයකින් පැවති හෙයින් අනුනට ධර්මය ඉගැන්වීම ඇය දිගට ම කරගෙන ගියා ය. මනුෂ්‍ය ශරීරය මරණය කරා අඛණ්ඩ ගමනක යෙදී සිටින බව දන්නා ඇය, ඒ ගැන පසුතැවිලි නො වුණා ය. ඇගේ ශරීරයේ දුර්වලත්වය හඳුනා ගනිමින් ඉතිරි ව ඇති ආයු කාලය සහ ශරීර

ශක්තිය උපයෝගි කර ගනිමින් ඇගේ අනුකම්පාව සොයා පැමිණි අයට ධර්ම දානය බෙදා දුන්නා ය.

ශරීර සෞඛ්‍යය තව තවත් හීන වෙද්දී ඇගේ ආහාර අරුචිය වැඩි දියුණු විය. ආහාර දිරවීම ද දුර්වල විය. මේ හේතුව නිසා ඇයට එක් වේලකට කන්නට හැකි වූයේ පිඬු දෙකක් තුනක් පමණි. කටේ දත් සියල්ල ම පාහේ වැටී ඇත. එනිසා කටට ගත් බත් කට හැපුවේ ඉතා සෙමිනි. ආහාර කටවල් දෙක තුනක් කෑමට ඇයට පැයක් පමණ ගතවුණි. ශරීරයේ දුර්වලකම නිසාදෝ ආහාර හපද්දී ඇගේ හිස ද ඒ අනුව සෙලවුණේ ය. මනුෂ්‍ය ශරීරය නොපවතින දෙයක් බව ඇය දනී. ශරීරය දුර්වල වුවත් එය ඔසවා ගෙන සිටීම පවා ඇයට මහත් වූ බරක් විය. සිල් මාතා කායිවිගේ ශරීර කුඩුව එන්න එන්න ම දිරාපත් විය. ඉන්ද්‍රියන් අතිශයින් දුර්වල විය. රූපයේ අනිත්‍යභාවය දන්නා අයට එය සාමාන්‍ය දෙයක් විය. ඇගේ එක් අක්ෂි ගෝලයක පීඩනය වැඩි වී රුධිර පීඩනය අස්වාභාවික ලෙස, අනතුරුදායක ලෙස ඉහළ ගියේ ය. එනමුදු ඇය වෛද්‍ය ප්‍රතිකාර ප්‍රතික්ෂේප කළා ය. ස්වභාවධර්මය ස්වාභාවික ව ක්‍රියා කරන බවත් එසේ වීමට අප ඉඩ දිය යුතු බවත් ඇයගේ අදහස විය. මාස කීපයකට පසුව කළ වෛද්‍ය පරීක්ෂණයක දී ඇගේ එක් ඇසක් අන්ධ වී ඇති බැව් අනාවරණය විය. අනික් ඇස ද තද බල ලෙස සුදු පටලයකින් වැසී ඇතිබව දැන ගති. නමුත් එම ඇසින් යන්තමින් යමක් බලා ගැනීමට ඇයට හැකි විය.

තුනටිය වේදනාවක් මතුවී ආ හෙයින් ඇය කොන්ද නමාගෙන කුදු වී ඇවිදීමට පෙළඹුණාය. ගමන් කිරීම තවත් දුර්වල විය. කෙනෙකුගේ ආධාරයක් නොමැතිව පියවර කීපයක් වත් යෑමට නොහැකි තත්වයක් උදා වුණි. ටික දිනකට පසු එක් උදෑසනක ඇඳෙන් නැගිට ඇවිදීමට උත්සාහ කරද්දී, ඇයට තව දුරටත් ඇවිදීමට නො හැකි බැව් අවබෝධ විය. ඉන් පසු ඇයව තැනින් තැන ඔසවා ගෙන යෑමට සිදු විය.

සිල් මාතා කායිවිගේ ජීවිතය මෛත්‍රිය සහ කළ්‍යාණ මිත්‍රත්වය පදනම් කර බුදු දහමට කැප වූ ජීවිතයකි. මරණය පෙනී පෙනී වුවද ඇය වෙහෙස නො බලා බොහෝ ජනයාගේ සුව පිණිස බොහෝ ජනයාගේ සැප පිණිස කැපවෙමින් ආදර්ශවත් වූවා ය.

ඇගේ මෙම උත්තරීතර චරිත ලක්ෂණ විශේෂයෙන් ඇයගේ සමීප අනුගාමිකයන්ගේ සහ වෛද්‍යවරියගේ සිත් තුළ කිසිදා නො මැකෙන සේ

සටහන් විය. ශරීර වේදනා අතිශයින් පීඩාකාරී වුව ද තෙරණිය ඒ හැම නොසැලී ඉවසා දරා සිටියා ය. ඇය දුකින් මිදුණු ආර්ය ශ්‍රාවිකාවකි. කාම භවයන්හි පැවැත්ම සත්‍ය වශයෙන් ම දන්නා උත්තමාවියකි. ඇගේ පෙර ආත්ම භවයන් සහ වර්තමාන නිවන් අවබෝධය සාක්ෂාත් කරගත් බුද්ධ දියණියකි. ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමට දන්නා පරචිත්ත විජානන ඥානයෙන් යුත් රහත් තෙරණියකි. එබැවින් ශරීර වේදනා ගැන කිසිදු සසල වීමක් ඈ තුළ නොවී ය.

පහළට නැමුණු නිකට, ගිලුණු කම්මුල් සහිත මුහුණ, රැලි ගැසුණු කළු හම, කයට වැළඳුන රෝග, අත පය වාරු නැති වීම ඇගේ මරණාසන්න බව තහවුරු කළේ ය. සිල් මාතා මරණාසන්නව ඇඳේ වැතිරී සිටියේ ස්වභාව ධර්මයේ ජරාව සහ ව්‍යාධිය ලොවට නිවැරදි ව පහදා දෙන සජීවී නිදර්ශනයක් ලෙසිනි. ප්‍රාණය තවමත් යන්තමින් ගැට ගසා ගෙන දුබල ව පවතින ඉන්ද්‍රියන්ට තව ඉදිරියට යෑමට උගහට බැව් දන්වමින් සෙමින් සෙමින් අප්‍රාණික ව ස්වභාවධර්මයේ න්‍යායට යටත් වීම ආරම්භ කළාය. වෙහෙසට පත් වූ දුර්වල ඉන්ද්‍රියන් ජීවිතින්ද්‍රිය අත හැරීමට යන්නා සේ අඟවමින් ටිකෙන් ටික පිරිහෙන්නට විය. ශරීරය සහ මනස : නාමරූප, පෙර කර්ම විපාක ග්‍රහණයෙන් මිදී මහා භූතයන්ට බෙදී යෑම ඇරඹීමට සූදානම් වන බවකි. නමුත් නාම රූපයන්ගෙන් ශූන්‍ය වූ විනාශ කළ නොහැකි යථාභූත ඥානය, පවිත්‍ර සාරය අනාගත බලාපොරොත්තුවක් රහිත ව හාත්පස විසිර පැතිර තිබුණි.

එදා ආචාර්ය මහා බෝවා තෙරුන් වහන්සේ, උන්වහන්සේගේ මරණාසන්න ශිෂ්‍යාව බැලීමට පැමිණියහ. එසේ පැමිණි උන්වහන්සේ ස්වභාව ධර්මයට ඉඩ දී කිසිවක් නොකර සිටින සේ ඇගේ වෛද්‍ය උපස්ථායිකාවන්ට දැන්වී ය.

සිල් මාතා කායිව් ජීවත් වූයේ අන් අය වෙනුවෙනි. සියල්ලෝ ඇයට සැනසීමෙන් මැරෙන්නට ඉඩ හැරිය යුතුයි. රහත් තෙරණියකගේ අවසන් ගමනට කිසිවකු බාධා නොකළ යුතුයි.

මේ වන විට ඇගේ පෙනහලු සිර වී හුස්ම ගැනීම අතිශයින් දුෂ්කර විය. ඇගේ වැහැරුණු ශරීරය ඝන වී, කට ඇරී, දෑස් අඩවන් ව නොසෙල්වී වැතිරිණි. ඇගේ වෛද්‍ය සේවිකාවන් ඈ සමීපයේ සිට පණ ඇති සලකුණු සෙව්ව ද ඔවුනට හුස්ම වැටෙන බවක් නොපෙනුණි. අවසානය ළං වෙන බව ඇය වටා සිටි කා හටත් වැටහුණි.

නමුත් කිසිවෙකු ඔවුනගේ ඇස් ඇය ගෙන් ඉවතට නො ගත්හ. ඇගේ හුස්ම දැනෙන නො දැනෙන තරමට සියුම් විය. කෙමෙන් කෙමෙන් එය ද අඩු වී ගොස් හුස්ම ගන්නා බවක් නො දැනෙන තත්වයකට පැමිණියේ ය. නො දැනෙන හුස්ම රැල්ල සිහින් ව සියුම් ව අඩුවී ගොස් අවසන් විය. සන්සුන්ව අවසන් විය. ඇය කොයි මොහොතේ මිය ගියා දැයි ඈ වටා සිටි කිසිවෙකුට කීමට අපහසු විය. ඇගේ භෞතික කය නොසෙල් වී වැතිර පැවතුණි. නිසල ව වැතිර තිබුණි. ස්වභාව ධර්මයෙන් බැහැර වූ කිසිදු ක්‍රියාවලියක් මෙහි සිදු නො වී ය. ස්වභාව ධර්මය ම අනාවරණය විය.

කායිවි රහත් තෙරණින් වහන්සේ 1991 ජූනි මස 18 වැනි දින උදෑසන නිදහස් ව පිරිනිවන් පෑ සේක.

අවසානයේ දී ඇගේ පෞද්ගලික පවිත්‍ර සාරය, කුඩා ඇළක් නිදහසේ ගලා යමින් ගංගාවන් සහ මුහුදු සමග එක්වන්නා සේ, නො සැලෙන මහා සමුද්‍රයක් වන් සදාකාලික ශූන්‍යයක් සමග සම්පූර්ණයෙන් එක් වී මිශ්‍ර විය.

ටික වේලාවකට පසු ආචාර්ය මහා බෝවා තෙරුන් වහන්සේ දේහය බැලීමට පැමිණියහ. උන් වහන්සේ සුදු රෙද්දකින් වසා තිබූ මැලවුණු මළ සිරුර දෙස සෑහෙන වෙලාවක් නිහඬ ව බලා සිටිමින් මරණානුස්මෘතිය වැඩුවේ ය. උන්වහන්සේ රහත් මෙහෙණින් වහන්සේගේ ආදාහනය ජූනි මස 23 වෙනි දිනට නියම කළහ. දුර බැහැර සිට එන ඇගේ ඥාතීන්ට සහ ශ්‍රද්ධාවන්ත දායක දායිකාවන්ට තම අවසන් ගෞරවය දැක්වීමටත් ආදාහන උත්සවයට සහභාගි වීමටත් ඉන් ඉඩ කඩ ලැබුණි. ආචාර්ය මහා බෝවා හිමි ආදාහන උත්සවයේ දී ආශීර්වාද වන්දනා ගාථා සජ්ඣායනා කිරීමට අවස්ථාවක් නො දුන්නේ ය. උන්වහන්සේ එම තීරණය ගනු ලැබුවේ සිල් මාතා කායිවි තෙරණිය ලැබිය යුතු අවසන් ඵල නෙළා ගත් උත්තමාවිය හෙයින් ඇයට අලුතින් ආශීර්වාද ප්‍රාර්ථනා ගාථා සජ්ඣායනා කිරීමෙන් පලක් නොමැති හෙයිනි.

ජූනි මස 22 වන දින සන්ධ්‍යා සමයේ ආචාර්ය මහා බෝවා තෙරුන් වහන්සේ සිල් මාතා කායිවි තෙරණියට අවසන් ගෞරවය දැක්වීම සඳහා ආදාහන උත්සවයට රැස්වූ විශාල භික්ෂු, උපාසක උපාසිකා පිරිසක් අමතා විශේෂ ධර්මානුශාසනයක් පැවැත්වූහ. නූතන කාලයේ දිරියෙන් ම සිටි ආදර්ශවත් රහත් මෙහෙණින් වහන්සේ කෙනෙකු හැටියට සිල් මාතා කායිවි තෙරණිය ආදාහනෝත්සවයට සහභාගි වූවන්ට හඳුන්වා දුන්හ.

කායිව් තෙරණිය, ඇගේ මරණය, මේ ලෝකයේ ස්වභාව ධර්මය ගැන අවධානයට අපව යොමු කළා. අප කවුරුත් කිසිදු භේදයකින් තොරව යම් දිනක මැරෙනවා නියතයි. මිනිසත් බව ලබා ඉපදුණ අපි මේ වාසනාවන්ත උප්පත්තියෙන් යහපත් ප්‍රතිඵල ලබා අපගේ හදවත් තුළ ආධ්‍යාත්මික පරිපූර්ණත්වයක් ලැබීමට හැකි සෑම උත්සාහයක් ම ගත යුතුයි. බුදුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය ගැන කිසිදු සැකයක් ඇතිකර ගැනීමට අවශ්‍ය නැහැ. එම සද්ධර්මයේ සත්‍යතාවය සහතික කිරීමට චතුරාර්ය සත්‍යය පමණක් ප්‍රමාණවත් වේ. අප ශ්‍රද්ධා භක්තියෙන් යුතුව භාවනා පුහුණුව ගැන බුදුන් වහන්සේගේ අනුශාසනා අනුගමනය කළහොත් අනිවාර්යයෙන් අප මාර්ග ඵල ලබනු ඒකාන්තයි.

බුදු දහම අනුව ක්‍රමවත් ආධ්‍යාත්මික පුහුණුවෙහි යෙදෙන ඇත්තෝ සිටින තාක් ලෝකය රහතුන්ගෙන් අඩුවක් නොවනු ඇත. මෙම සත්‍යය ලොවට පෙන්වන ගුණවත් ආදර්ශවත් දුර්ලභ ගනයේ රහත් මෙහෙණින් වහන්සේ නමකි සිල් මාතා කායිව්. ඇය මැරුණේ ද අපි මැරෙන ආකාරයට ම ය. එසේ වුවද වැදගත් වනුයේ ඇගේ හදවත තුළ වර්ධනය කළ ධාර්මික ගුණ ධර්මයන් ය. එනම් ඇගේ සත්‍ය වූ පවිත්‍ර වූ ආධ්‍යාත්මයයි. ඇගේ මරණය නොවේ. මනස මූලික පදනමයි. හොඳ නරක ක්‍රියා දෙකම ගැන අපට අණ දෙන්නේ මනසයි. එනිසා අප ජීවත් ව සිටිය දී අපේ හදවත ධාර්මික ව වැඩි දියුණු කර ගැනීමට අපට ලැබී ඇති මෙම අනර්ඝ අවස්ථාවෙන් නිසි ප්‍රයෝජන ගත යුතුයි.

සිල් මාතා කායිව් රහත් තෙරණින් වහන්සේගේ ආදාහනය පසු දින දහවල් කාලයේ දී බාන් හුආයි සායිහි පිහිටි සිල් මාතා ආරණ්‍යයේ දී පැවැත්විණි. භික්ෂූන් වහන්සේලා 200ක් පමණත් ගිහි සැදැහැවතුන් දහස් ගණනිනුත් තෙරණියට අවසන් ගෞරව දැක්වීමට පැමිණ සිටියහ. ගිහි පැවිදි අති විශාල ජනකායක් පේළි සැදී සුදු හඳුන් කුඩුවලින් සෑදූ දීප්තිමත් සුවඳැති පුෂ්ප, විචිත්‍රවත් ලෙස තැනූ දෙණ මත සෑයක් මෙන් සිටින සේ උසට උසට තැන්පත් කරන ලදී.

ආදාහන උත්සවයට සහභාගි වූ අති විශාල ගිහි පැවිදි පිරිස මොහොතකින් ගෞරව සම්ප්‍රයුක්ත දැඩි නිහඬතාවයක් රකින ලදී. ආචාර්ය මහා බෝවා තෙරුන් වහන්සේ ගිනි සළුවක් රැගෙන, දෙණ යටින් සකසා තිබූ වහා ගිනි ඇවිලෙන කුහරයට යොමු කරන ලදී. මොහොතකින් ගිනි ඇවිලී ගිනි දැල්

බුර බුරා ඉහළට නැගෙන්නට විය. ඝනව සැකසුණු දුම් රැළි දෙණ ඔතාගෙන ටිකෙන් ටික අහසට එක් විය. ආශ්චර්යයකි, ඒ මොහොතේ ම ශීතල පිනිපොද වැස්සක් ආදාහන භූමිය අවට පතිත විය.

එදින සන්ධ්‍යා යාමයේ ගින්න නිවී ගියේ ය. උෂ්ණත්වය අඩු වූ පසු භික්ෂූන් වහන්සේලා සහ සිල් මාතාවෝ අළුයට තැන්පත් වූ රහත් තෙරණියගේ ධාතූන් විසුරුණු සොහොන අවට රැස් වූහ. සොහොන් බිමේ කලින් තුබූ දැඩි තාපය දුරු විය. ඇගේ ඇට කටු කුඩා කැබිලිතිවලට සුන් වී සුදු පාට වර්ණයෙන් අළු යට තැන්පත් වී තිබුණි. ජ්‍යේෂ්ඨ භික්ෂූන් වහන්සේලා ඉතා ප්‍රවේසමෙන් හා ගෞරවයෙන් අළු යට අඟුරු සමග තැනින් තැන විසිරී තිබූ කුඩා ඇට කැබිලිති සුදු රෙද්දකින් ආවරණය කළ බන්දේසියකට එකතු කළහ. එම ධාතූන් පසුදින උදෑසන තෙක් ඉතා ගෞරවයෙන් රඳවා ගත්තේ ය. එසේ එකතු කළ රහත් තෙරණියගේ ධාතූන් වහන්සේලා රාශියක් ඇයගේ ශ්‍රද්ධාවන්ත දායක දායිකාවන් අතර පූජනීය සිහිවටන ලෙස බෙදා දෙන ලදී. ඔවුන් එම ධාතූන් නිකැලැල් උතුම් ශීලය පෙන්නුම් කරන වටිනා මැණික් ගල් සේ ගෞරවයෙන් සලකමින් වැඳුම් පිදුම් කිරීමට පටන් ගති.

රහත් මෙහෙණින් වහන්සේ නමකගේ ධාතූන් ළඟ තබා ගැනීමෙන් ලෝකෝත්තර වූ ආශීර්වාදයක් එම අයට ලැබෙන බව ඔවුන්ගේ විශ්වාසය විය. තමන්ට යහපතක් වන බවත් ප්‍රාතිහාර්ය පෑමේ ශක්තියක් එම ධාතූන් වහන්සේලාට ඇති බවත් ඔවුහු පිළිගත්හ. ඔවුනගේ හදවත් තුළ ඇති ශ්‍රද්ධා ශීල බලය හා සමගාමී ව එම ධාතූන් වහන්සේලාගේ බලයක් ඇතැයි ඔවුහු පිළිගති.

ටික කලක් ගතවෙද්දී එම ධාතූන්ගෙන් බොහොමයක් ඇට කැබිලිති සෘද්ධිමය පරිවර්තනයකට භාජනය විය. කල් යත්ම මෙම ධාතූන් ටිකෙන් ටික, එකින් එක, එකට ඇලී පළිඟු මෙන් ඝන ව සැදී මැණික් ගල්වලට පරිවර්තනය විය. සමහරක් කෝනාකාර විනිවිද දැකිය හැකි පළිඟු බවට පෙරළිණි. තව සමහරක් සිනිඳු වර්ණවත් දිලිසෙන මුහුදු පබළු මෙන් වෙනස් විය.

මෙම රහත් මෙහෙණියගේ අට්ඨි ධාතූන් භෞතික ව ඉතිරි වූ පඨවි කොටස්, වචනින් විස්තර කිරීමට අපහසු 'රහතුන් ගේ පවිත්‍ර ආධ්‍යාත්මය' අද්භූත ලෙස අපූර්ව ලෙස පිළිබිඹු කරන්නකි. ජීවයක් නැති ඇට කැබිලිති

දියමන්ති, මුතු බවට හැඩ වෙනස්වීම ආශ්චර්යවත් පරිවර්තනයකි. රහතන් වහන්සේ කෙනෙකුගේ අතිපාරිශුද්ධ මනස, ටිකෙන් ටික පිරිසිදු වෙමින් අර්හත් ඵලය දක්වා එන විට, එය එම ශරීරයේ රූප කොටස්වලට මහත් සේ බලපාන බව මෙයින් තහවුරු වේ.

රහතන් වහන්සේ කෙනෙකුගේ සමාධි චිත්තයේ නෛසර්ගික පවිත්‍රත්වය එදිනෙදා භාවනා කටයුතුවල යෙදෙද්දී මොන තරම් පවිත්‍ර ව ඉටුවෙන්නේ දැයි කියතොත්, ශරීරයේ මහාභූත කොටස් ද පවිත්‍ර වනතුරු ක්‍රියාත්මක වේ. මෙම පිරිසිදු වීම, උන්වහන්සේලා පිරිනිවන් පෑමෙන් පසු එම පවිත්‍ර ධාතු කොටස් මුතු මැණික්වලට පෙරළීමට හේතු වේ.

සිල් මාතා කායිව් රහත් තෙරණියගේ අට්ඨි ධාතූන් ආශ්චර්යවත් ලෙස දීප්තිමත් මුතු මැණික් බවට පත්වීම ඉහත දැක්වූ මනසේ අසිරිමත් බව ඔප්පු කිරීම සඳහා ප්‍රබල සාක්ෂියක් වශයෙන් පෙන්විය හැක.

ඇය වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම බුදුරජාණන් වහන්සේගේ උතුම් ආර්ය ශ්‍රාවිකාවකි. නිදුකාණන් වහන්සේගේ අව්‍යාජ බුද්ධ දියණියකි.

භික්ඛු සීලරතනෝ

සිල් මාතා කායිව් රහත් තෙරණිය ගැන තායි භාෂාවෙන් ලියැවුණු මුල් කෘතිය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන ලද්දේ භික්ඛු සීලරතනෝ විසිනි. 1948 වර්ෂයේ දී ඇමෙරිකාවේ වර්ජිනියා ප්‍රාන්තයේ උපත ලැබ, වයස අවුරුදු 26 දී බුදුදහම ගැන මූලික දැනීමක් ලබා 1975 වසරේ දී ඉන්දියාවේ බැංගලෝර්හි පූජ්‍ය බුද්ධරක්ඛිත හිමි සමඟ සාමණේර හිමි නමක් ලෙස සසුන් ගත වුණි. සාමණේර සීලරතනෝ හිමි 1976 දී ශ්‍රී ලංකාවට වැඩම කොට මහරගම ශ්‍රී වණිරාණ ධර්මායතනයේ දී අතිපූජ්‍ය අග්ග මහා පණ්ඩිත මඩිහේ පඤ්ඤාසීහ මාහිමි යටතේ උපසම්පදාව ලබන ලදී. වසර 1977 දී තායිලන්තයට වැඩි උන්වහන්සේ අප්‍රේල් මස 21 වැනි දින, බැංකොක් නගරයෙහි වට් බොවෝනිවෙස් විහාරයේ දී ධම්මයුත නිකායට අනුයුක්ත ව නැවතත් මහණ උපසම්පදාව ලැබීය. එතැනින් උදෝන් තානි ප්‍රාන්තයේ බාන් තාඩ් ආරණ්‍යය බලා වැඩි සීලරතනෝ හිමි මේ දක්වා ආධ්‍යාත්මික දියුණුව සලසා ගනිමින් සහ ශාසන කටයුතුවල නියැළෙමින් උත්තරීතර දිවිපෙවෙතක් ගෙන යන්නේ ය. මෑත ඉතිහාසයේ පහළ වූ අතිශ්‍රේෂ්ඨ රහතන් වහන්සේ නමක් වූ ආචාර්ය මහා බෝවා ඥානසම්පන්නෝ මහා තෙරුන් වහන්සේ යටතේ ශිෂ්‍යයකු ව, උන්වහන්සේ 2011 වර්ෂයේ ජනවාරි මාසයේ 11 වැනි දින පිරිනිවන් පානා තුරු වැඩ වාසය කළහ.

අද වන විට සීලරතන හිමි බාන් තාඩ් ආරණ්‍යයේ සිට සැතපුම් 120ක් පමණ දුරින් පිහිටි ලොයි දිස්ත්‍රික්කයේ "වත් පා සාලා නොයි" නම් වූ ආරණ්‍යයේ අජාන් නිපොන් අභිසම්පන්නෝ මහා නායක හිමි යටතේ භාවනා සුවයෙන් සහ ධර්ම ග්‍රන්ථ සකස් කරමින් වැඩ වාසය කරයි. මේ වන විට උන්වහන්සේ වස් අවුරුදු 35 ක් සපුරා ඇත.

රහත් ඵලය ගැන සැක ඇත්තන් හට අනුකම්පාවෙනි .....

නිවන් මග එහි ඵල සහ නිවන් අවබෝධය මෙම ආත්ම භවයේ දී ම සාක්ෂාත් කිරීමට අපට ඇති හැකියාවන් සැකයට භාජනය කිරීම කිසිසේත් කළ නොහැක්කකි. බෞද්ධයන් වශයෙන් අපට ඒ සඳහා කිසිදු පිළිගත හැකි හේතුවක් දැක්වීමට ද නොහැක. සත්‍ය වශයෙන් ම අප බෞද්ධයන් වී ඇත්තේ නිවන් අවබෝධය කළ හැකි බවට අප තුළ පවතින දැඩි විශ්වාසය හේතු කොටගෙන ය. අපි සියල්ලෝ ම බුද්ධත්වය සහ සම්බුද්ධත්වය සාක්ෂාත් කිරීම විශ්වාස කරමු. ඒ නිසාම අපි බෞද්ධයෝ වෙමු. තවද බුදුරජාණන් වහන්සේ, භික්ෂූන් ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුව නිසි පරිදි වසන්නාහු නම් ලෝකය රහතුන්ගෙන් හිස් නොවන බැව් පැවසූ සේක. (දී.නි.- මහා පරිනිබ්බාණ සූත්‍රය) බොහෝ සූත්‍ර දේශනාවන්හි බුදුන් වහන්සේ නිවන් මග ඔස්සේ ගමන් කරන ඇත්තන් හට ලැබෙන ඵලදායී විපාක ගැන නොයෙක් වර දේශනා කර ඇත. දන් දීමෙන් ඇතිවන සතුට ගැන බුදුහු දේශනා කළහ. ශීලයේ ප්‍රතිපත්ති රකිමින් ධාර්මික ව ජීවත් වන විට ලබන සතුට : මෛත්‍රිය වඩන කල්හි ලබන ප්‍රීතිය : සමථ භාවනාව වඩන විට අත්දැකීමට ලැබෙන උතුම් ශාන්ත බව : කෙලෙස් ප්‍රහීණ කිරීමෙන් හා දුක් කෙළවර කිරීමෙන් ලබන නිරාමිස ප්‍රීතිය, ආදී වශයෙන් බුදුහු බොහෝ විට ධර්මයේ ඵල විපාක දක්වා ඇත.

මේ දෑ අත්විඳි ඇත්තෝ අනන්ත ය ; අප්‍රමාණ ය. නිවැරදි ධර්ම මාර්ග යේ ගමන් කරන ඇත්තන් හට මෙම ශාන්ත වූ ප්‍රීතිමත් තත්ත්වයන් ළඟා කරගත හැක. බුදුරජාණන් වහන්සේ දේශනා කළ මෙම මූලික ධර්මයන්හි සත්‍යතාවයන් සොයා දැන එහි යහපත් විපාක අත්දුටු කල්හි උන්වහන්සේ දේශනා කළ නිවන සාක්ෂාත් කිරීම කෙරෙහි විශ්වාසය තහවුරු වේ. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කරන ඕනෑම කෙනෙකුට නිර්වාණ ධාතුවේ උත්තරීතර සතුට සම්‍යක් ප්‍රඥාවෙන් අත්දැකිය හැකි බැව් තහවුරු වේ.

බුදුන් වහන්සේ සහ ශ්‍රාවක රහතන් වහන්සේලා මෙලොව අත්හැරියාට පසු නිවන් මග ද ඔවුන් හා රැගෙන ගිය බවක් ත්‍රිපිටකයේ කොතැනකවත් සඳහන් වී නැත. නමුත් අප ශාස්තෘන් වහන්සේ තම පරිනිර්වාණයෙන් පසු ධර්මය සහ විනය ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඔස්සේ යෑම සඳහා මග පෙන්වීමට ඉතිරි කර ඇති බැව් ඉතා පැහැදිලි ව පැවසූ සේක. බුදුන් වහන්සේගෙන් අප එසේ උරුම කර ගත් ධර්මය සහ විනයෙහි කිසිදු අඩුලුහුඬුවක් දැක්විය නොහැක. වසර 2600 කට කලින් දේශනා කළ පරිදි ම අදත් එහි පවිත්‍රත්වය සහ වලංගුභාවය ඒ ආකාරයෙන් ම ස්ථිර ව පවතී. ධර්මය සහ විනය ඔස්සේ දැඩි කැපවීමෙන් සහ අධිෂ්ඨානයෙන් යුතුව භාවනා පුහුණුවෙහි යෙදුණහොත් සංසාර චරයේ කුමන හෝ බලවේගයකටවත් සිතෙහි උපදින පරම සුඛ තත්ත්වය වැළකිය නොහැක.

යහපත් කර්ම විපාක හේතුවෙන්, නිර්මල බුදු දහම පවතින මෙම අවධියේ මිනිසත් බව ලැබ බුදුන් වදාළ ධර්මය ඒ අයුරින් ම දැන ගැනීමට වාසනා ලත් අය අතිවිශාල ය. කුසලතාවයන් හිමි බුද්ධිමත් ජනතාව බුදුන් වදාළ ධර්මය ප්‍රායෝගික ව පුහුණු වීමට නොපෙළඹවීම ගැන කිසිදු සාධාරණ හේතුවක් දැක්විය නොහැක. එසේ ම පුහුණු වූ ධර්මය තමාගේත් අනුන්ගේත් යහපත සඳහා නොයෙදවීමට ද සාධාරණ හේතුවක් දැක්විය නොහැක. මෙය වළක්වනුයේ අප සිත් තුළ සහ හදවත් තුළ ක්‍රියාත්මක වන කෙලෙස් ය. බුදුන් වදාළ නිවන් මාර්ගය එම කෙලෙස් ප්‍රහීණය කිරීමට හේතුවන ධර්ම මාර්ග යයි.

ක්ලේශයන් බලගතු වූ කල්හි මාර්ගය දුර්වල වේ. එසේ දුර්වල කර අප දකින බාහිර ලෝකය වැදගත් බවත් ධර්මය නොවැදගත් බවත් අපව විශ්වාස කිරීමට යොමු කරවයි. බාහිර ලෝකය අපට පෙන්වා දෙන්නේ නිවන්

අවබෝධය සඳහා බුදුන් වදාළ ධර්මය අනුව පුහුණුවීම දුෂ්කර බව ය. අප ජීවත් වෙද්දී අපට විඳීමට සිදුවන දුක් කරදර මග හැරීමට අවශ්‍ය නිසාම එය අවබෝධ කිරීමට නොහැකි බව පෙන්වා දෙයි. එය පිළිගත් විට නිවන් අවබෝධය සඳහා වීර්ය නොගැනීම ගැන වරදකරුවෙකු නොවේ යයි ඔහුට සිතෙනු ඇත. මේ හේතුව නිසා කෙනෙකු දැඩි වීර්යයක් ගෙන අර්හත්ඵලය සාක්ෂාත් කළේ යයි ඇසුණු කල්හි එය සත්‍ය යයි පිළිගැනීමට අප සූදානම් නැත. "සන්දිට්ඨිකෝ" යනුවෙන් බුදුන් දේශනා කරන ලද්දේ මේ ධර්මය තමා විසින් ම ප්‍රත්‍යවේක්ෂා ඥානයෙන් දැන ගත හැකි බවය. එසේ වුවද මෝහයෙන් වෙලී සැක කරන්නෝ මෙය විශ්වාස කිරීමට හෝ අත්හදා බැලීමට හෝ සූදානම් නැත. නමුත් අප ජීවත් වන කාලය තුළ අත් විඳින "දුක" බුදුන් වහන්සේ මුලින් ම වදාළ දුක්ඛ සත්‍යයයි. එම ධර්මතාවයේ සත්‍යතාවය අවබෝධ කරගැනීමට අපම විමර්ශනය කර බැලිය යුතු වේ. එසේ වුව ද දුක්ඛ ආර්ය සත්‍ය ගැන කියා දෙන විට මිනිස්සු අපහසුතාවයකට පත්වන බවක් හඟවති. එයින් ගම්‍යවන ගැඹුරු අදහස් තේරුම් ගැනීමට මැලි වෙති. මිනිසුන් දරන මෙම ආකල්පය නිසා බුදුදහමේ සත්‍ය වූ අරමුණු වටහා ගැනීමට අවශ්‍ය මූලික දැනීම ඔවුන් සතුව නැති බවත් එමෙන්ම ඉවසීමක් නොමැති බවත් මොනවට පැහැදිලි වේ. දුක පිළිබඳව බුදුන් ඉගැන්වූ කරුණු ඇත්ත ඇති සැටියේ ඉඳුරා ම පැහැදිලි කර දෙන්නකි. මෙය ආර්ය සත්‍යයක් වනුයේ එහෙයිනි. දුක මූලික බෞද්ධ සිද්ධාන්තයක් වන්නේ ද එහි ඇති පරම සත්‍යතාවය හේතුවෙනි.

බුදුරජාණන් වහන්සේ මෙම දුක්ඛ සත්‍යය නිශ්චිත වශයෙන් ම දැන ගත් එක ම ශාස්තෘවරයා ය. එහෙයින් දුක් වේදනා පැමිණි විට එය මග හැරීමට නිකරුණේ වෙර නො දරන ලෙසට උන්වහන්සේ අවවාද කළ සේක. දුක් වේදනා ඇතිවීම යමක ප්‍රතිඵලයකි. කෙලෙස් හේතුවෙන් දුක්වේදනා හටගනී. එහෙයින් එම හේතුව දුරු කළ යුතුවේ. මෙම කෙලෙස් දුරු කිරීම බුදුන් වහන්සේ දෙවන ආර්ය සත්‍යය වශයෙන් හඳුන්වා දී "දුක ඇතිවීමට ඇති හේතුව" අවබෝධ කළ යුතු බව ලොවට පෙන්වා දුන් සේක. හේතුව දුරු කළ කල්හි එහි ඵලය ස්වභාවයෙන් ම අහෝසි වේ. බුදුන් වහන්සේ දුක්ඛ සත්‍යයෙන් ධර්මය හඳුන්වා දීම ආරම්භ කරනුයේ ඊට ඇති සාක්ෂි පෙන්වා දීමට ය. එවිට එම හේතූන් සොයා ඒවා නිවැරදි කිරීමට අපට හැකි වේ.

තුන්වන ආර්ය සත්‍යය නම් දුක නැති කිරීමය. සියලු දුක් වේදනා හදවත තුළින් ම සම්පූර්ණ වශයෙන් දුරු කිරීමය. මෙය කළ හැක්කේ හතර වන ආර්ය

සත්‍ය වන, අප පුරුදු පුහුණු කරන මාර්ගයේ ඇති විශේෂිත වූ බලය යොදවමිනි. මාර්ගය යනු දුක් වේදනා ඇති වීමට තුඩු දුන් හේතු පියවරෙන් පියවර විනාශ කරමින් සියල්ල සම්පූර්ණයෙන් ප්‍රහීණ කරවන ක්‍රම වේදයන් ය.

බුදුන් වදාළ මෙම චතුරාර්ය සත්‍යය දේශනා කරන ලද්දේ ලෝක සත්වයා දුකින් මිදවීම පිණිස ය. දුක් කන්දරාවන්ගෙන් පිරි ලෝකයක සත්වයා ගිල්වා තැබීමට බුදුරදුන් ධර්මය දේශනා නො කළේ ය. චතුරාර්ය සත්‍ය ධර්මයන් ප්‍රඥාවෙන් දැන විමසා, දුක නැතිකර නිවන් අවබෝධය සඳහා ම දේශනා කරන ලද උතුම් ධර්මයන් ය. මෙම ධර්මය එක් වයස් සීමාවකට, එක් ජාතියකට, එක් වර්ගයකට ස්ත්‍රී පුරුෂ භේදයකින් යුතුව එමෙන්ම එක් කාල පරාසයකට වෙන් කළ දේශනාවක් නොවේ. එසේ ම ඕනෑ ම පරම්පරාවක ඕනෑ ම පුද්ගලයෙකුට නිවන් මාර්ගයේ ඵල නෙළා ගැනීමට හැකි බව තහවුරු කළ දේශනාවකි. එනිසා බුදුන් වහන්සේ ධර්මය "අකාලික" බව පැවසූ සේක. එදා මෙන් ම අදටත් මෙම උත්තරීතර ධර්මයේ ප්‍රතිඵල නොඅඩුව නෙළා ගැනීමට හැකි බැව් තහවුරු වේ.

මග්ග ඵල සහ නිර්වාණය යන උතුම් ධර්මතා වර්තමාන මිනිසාගෙන් ඈත්වූවක් යයි සිතීම අතිශය මෝඩකමකි. බෞද්ධයන් වශයෙන් එම උත්තරීතර අරමුණ සාක්ෂාත් කර ගැනීමට අප තුළ ඇති හැකියාව අතපසු කර ඇත්තේ අප ම ය. එම වරද භාර ගත යුත්තේ ද අප ම ය. ධර්මය සම්බන්ධ ව අපි දාර්ශනික විසඳුම් කරා මනස මෙහෙයවන නමුත් ප්‍රායෝගික ව එය අත්හදා බැලීම බොහෝ විට අත පසු කරමු. ත්‍රිපිටකයේ පිටු කට පාඩම් කර විවිධ මත ප්‍රකාශ කරන පොතේ ගුරුන් බවට අද බොහෝ දෙනා පත්ව සිටිති. ධර්ම ග්‍රන්ථයන්හි ඇති ධර්ම කරුණු දැඩිව ග්‍රහණය කොට ගෙන නා නා දෘෂ්ටීන් ගොඩනගා ගනිමින්, "තම නැණ පමණින් අත්දැකිය හැකි ධර්මය" පසකට දමති. මෙම උතුම් ආර්ය සත්‍යයන් තම මනසේ ම කොටසක් බව නො දන්නා හෙයින් එය විමර්ශනය කිරීමට ඔවුහු නො පෙළඹෙති. බුදුන් වහන්සේ වදාළ උත්තරීතර වචන පමණක් තමාගේ පෞද්ගලික දායාදය ලෙස සලකා ඒවායේ රැඳෙමින් ප්‍රායෝගික දහම වරදවා ගන්නා හෙයින් මේ අවාසනාවන්ත තත්ත්වය ඇතිවී ඇත. මොවුහු බුද්ධ දේශනා කට පාඩම් කරති. ඒ අනුව ධර්මයේ විශාරදයන් වශයෙන් පෙනී සිටිති. නමුත් කඳු ගණන් උසට ඔවුනගේ හදවත් තුළ කෙලෙස් පිරෙමින් කැකෑරෙමින් පවතී. ඉන් අංශුවක්වත් අඩුවීමක්

වී නැත. අප අතර බොහෝ දෙනා තම අදහස් සාධාරණය කරනුයේ බුදුන් වහන්සේගේ අකාලික වූ ධර්මය සඳහන් පාලි ග්‍රන්ථයන්හි ඇති කරුණු ගෙන හැර පාමින් ය. පාලි ග්‍රන්ථ පරිශීලනය කරන ශිෂ්‍යයෝ එම ග්‍රන්ථ සියල්ලේ ම සඳහන් කරුණුවල එකතුව ධර්මය යයි පිළිගැනීමට සූදානම් ව සිටිති.

අනාදිමත් කාලයක සිට බුදු දහම හැදෑරූ අතිමහත් සංඛ්‍යාවක් වූ ජනයා එමෙන් ම එහි ඵල නෙළා ගත් අනන්තවත් බෞද්ධයන්ගේ අපූර්ව අත්දැකීම්වලට එකම පිළිතුර ධර්ම ග්‍රන්ථයන්හි සඳහන් න්‍යායන් සහ සම්මතයන් පමණක් බැව් ඔවුන් ස්වයං තීරණයන්ට බැස ඇත. නමුත් සත්‍ය ධර්මය ඉස්මතු වන්නේ තම හදවත හා මනස තුළින් බව ඔවුහු නොදනිති. බුදුන් වදාළ ධර්මය අදත් නිර්මල ව ජීවමාන ව පවතින හෙයින් වර්තමානයේ එම ධර්මය පුරුදු පුහුණු කරමින් ධර්මයේ ප්‍රතිඵල අත් විඳින අනන්තවත් බෞද්ධයන්ගේ හදවත් තුළ සහ සිත් තුළ සත්‍ය ධර්මය උපදින බව ඔවුහු නො දනිති. බුදුන් වහන්සේ සහ බුද්ධශ්‍රාවක රහතුන් ගැන මඳක් විමසා බලන්න. පාලි ග්‍රන්ථ එළිදැක්වීමට බොහෝ කලකට පෙර මෙම උත්තමයෝ ධර්මය දැන ඉගෙන අවබෝධ කර ගත්හ. ධර්ම ග්‍රන්ථ මගින් ධර්මය පිළිබඳ ප්‍රමිතීන් ඉදිරිපත් කිරීමට ප්‍රථම එම උත්තමයෝ උත්තරීතර මානසික තත්ත්වයන් හිමි කර ගත්හ.

සත්‍ය ධර්මය නිතර ම "**පච්චුප්පන්නය.**" එනම් - වර්තමාන මොහොතේ පවතින ධර්මයකි - යන තේරුමයි. බුදුන් වදාළ ධර්මය කාලය සහ අවකාශය යන ලෞකික සම්මුතීන්ට කිසිසේත් සකස් කළ හැක්කක් නොවේ. මේ හේතු කොට ගෙන බුදුන් වදාළ ධර්මය නිසි පරිදි හදාරන ඇත්තන් විසින්, එනම් නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි ලා මෙසේ දත යුත්තේ ය. බුදුහු "**පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි ති.**" යනුවෙන් දේශනා කළේ එහෙයිනි. ඊට වයස බල නො පායි. කිනම් ශතවර්ෂයක ඔවුන් ජීවත් වන්නේ ද යන්න ද බල නො පායි. මෙම ධර්මය "**ස්වාක්ඛාතො**" යනුවෙන් දක්වා තමන් වහන්සේ මනා කොට කියන ලද ධර්මයකැයි පහදා දෙන සේක. එසේ නම් මෙම ධර්මය ගැන සැකයක් ඇතිකර ගන්නෝ බුදුරජාණන් වහන්සේ කෙරෙහි සැක ඇති කර ගන්නෝ නො වේ ද? තවද "**සන්දිට්ඨිකො**" යනුවෙන් මෙම ධර්මය තමා විසින් ම ප්‍රත්‍යවේක්ෂා ඥානයෙන් දැක්ක යුතු බව ඉදුරා ම දේශනා කළේ ය. අරිඅටඟි මගට නොබැස රහත් ඵලය ගැනත් රහතුන් ගැනත් සැක කරන්නෝ ධර්මයෙන් බොහෝ සේ ඈත් වී තර්ක ඔස්සේ පමණක් යන්නෝ ය. මේ

ධර්මය ඇවිත් බලන්න යයි, "**එහිපස්සිකො**" යනුවෙන් පැවසූ ලොව පහළ වූ එකම ශාස්තෘවරයා බුදුන් වහන්සේ ය. මෙම ධර්මය අර්හත්වය සමීපයට රැගෙන යන ධර්මයකැයි, "**ඔපනයිකො**" යන්නෙන් පැවසූ සේක. පියවරෙන් පියවර ඉදිරියට යා හැකි බව ධර්මය පුහුණු වන්නෝ දනිති. එය පොත් කියවා දැන ගත නොහැක. මෙහි දී බුදුන් වහන්සේගේ තවත් සුවිශේෂ අවවාදයක් සඳහන් කළ යුතු වේ. එනම්, භාවිතා බහුලිකතා යන්නයි. වඩන්න බොහෝ සේ වඩන්න යනු එහි අදහසයි. ධර්මය එනම් මාර්ගය බොහෝ සේ වඩන විට ඵල සහ නිවන ළඟා කරගතහැක. මිනිසත් බව ලත් අපට එම වාසනාව ඇති බවට විශ්වාසය ඇතිකර ගනිත්වා!

සිල් මාතා කායිවි රහත් තෙරණියගේ උත්තම සිතිවිලි හා අවවාද

1. මෙලොව ඉපදුණ ඔබ, ඔබ හිමිකරගත් ප්‍රඥාව කෙරෙහි විශ්වාසයක් ඇති කර ගත යුතු වේ. ඔබට වේදනාකාරී දැය ද, සතුට ගෙන දෙන දැය ද, සෙවිය හැක. වටිනා දැය ද, කිසිදු වටිනාකමක් නොමැති දැය ද ඔබට සෙවිය හැක. ඔබ තෝරාගන්නා දිසාව අනුව දෙව්ලොව හෝ අපාය හෝ තෝරා ගත හැක. නැතහොත් නිවනට පිවිසෙන මාර්ගය සහ ඵල සොයා ගත හැක. ඕනෑම දෙයක් ඔබට සොයා ගත හැක. එය ඔබ තීරණය කළ යුතු වේ.

2. අනුනට අයත් යහපත් දෑ ඔවුනගේ ය. ඔවුනගේ යහපත් ක්‍රියාවන්ගෙන් ලබන යහපත් ඵල අපට බෙදා හදා ගැනීමට නො හැක. එනිසා අප විසින් යහපත් ක්‍රියා කළ යුතු වේ.

3. කර්ම ඵල විපාක ගැන සැකයක් ඇති නො කරගන්න. එසේම ඔබගේ ක්‍රියාවන් හේතුකොට ඇතිවන ඵල විපාක ගැන අඩු තක්සේරුවක් නො කරන්න. මනුෂ්‍යයන් හැටියට අප, දුක් විඳින සියලු සත්ත්වයන් කෙරෙහි දයානුකම්පාව දැක්විය යුතු වේ. එසේ කළ යුතු වන්නේ, අප සැවොම ද, පෙර කළ ක්‍රියාවන් හේතුවෙන් දුක් විඳින්නන් වූ හෙයිනි. මෙසේ බලද්දී

අප සැවොම එක සමාන ය. හොඳ නරක වශයෙනුත්, යහපත් අයහපත් වශයෙනුත් අපව වෙනස් කරනුයේ, පෙර භවයන්හි අප සිදුකළ ක්‍රියාවන්හි ස්වභාවය අනුව ය.

4. නගරයේ සෑම නිවසක ම වහල සෙවිලි කිරීම සඳහා ඔබට අවශ්‍ය තරම් තණකොළ වගා කළ නොහැක. ඔබට හැකි පමණින් පරිත්‍යාගශීලී වන්න.

5. කටමැත දොඩවමින් පුරසාරම් කියවමින් ගම රට පුරා නො ඇවිදින්න. යමකින්, ඔබ දොස් සහිත බැව් පෙනුණු දාට, මිනිසෙකු එනු දුටු මැඩියා වතුරට පැන සැඟවෙන්නා සේ, ඔබට ද සැඟවී සිටීමට සිදු වනු ඇත. ඔබ ගොළුවකු නම්, තමා විචක්ෂණ කෙනෙකු යයි ප්‍රසිද්ධ නො කරන්න.

6. තමන්ගේ වචනය හික්මවා ගැනීමට අසමත් අය, ඔවුනගේ වදන්වල හරි වැරැද්ද වටහා ගැනීමට අසමත් වෙති. සත්‍යය වටහා ගත් අය බොහෝ විට නිහඬ වෙති. සත්‍යය ගැන නිතර නිතර කථා කරන ඇත්තෝ "සත්‍යය" ගැන දන්නේ ස්වල්පයකි.

7. ඔබගේ කායික ක්‍රියාවන් ගැන, වචන ගැන සහ සිතිවිලි ගැන විමසිල්ලෙන් සිටීමට අධිෂ්ඨාන කරගෙන ශාන්ත ව වාසය කරන්න. වැඩිපුර කතා නොකරන්න. ඔබ කරදරවලට පැටලෙන අවස්ථාවන් උද්ගත නො කරගන්න. ඔබ සතු ස්වයං පාලනය විනාශ වීමට ඉඩ නො දෙන්න. වැඩිමහල්ලනට අගෞරව නො කරන්න. ඔබ කථා කරන දේ ගැන විමසිලිමත් වන්න. සංයමයෙන් සිනාසෙන්න.

8. මොන තරම් සමීප කුලුපග කෙනෙකු සමග වුව ද, ඔබේ වචනය නො සැලකිලිමත් තත්ත්වයකට වැටීමට ඉඩ නො තබන්න. ඔබ මොනතරම් ඉච්ඡා භංගත්වයට පත් වුව ද, ඔබේ වදන් ක්‍රෝධ සහගත නො කරගන්න.

9. ඔබ සුදනෙකු නොවී, යහපත් අයෙකු බව අන් අයට හැඟවීමට ප්‍රයෝගකාරී නොවන්න. කපටි නො වන්න. තමා සීලවන්තයෙකු යයි ද, නුවණැත්තෙකු යයි ද, අඟවමින් අනුන් රවටන්නා සදාචාරයෙන් පිරිහුණු මෝඩයෙකි.

10. මෙලොව ඉපදුණු අප, ගෙවී යන දින මාස සහ අවුරුදුවලට වැඩි වටිනාකමක් දීමට පෙලඹේ. අපි අපගේ ජීවිත සහ අනුනගේ ජීවිතවල වටිනාකම් ගැන විශ්වාස කරන්නෙමු. මෙම හේතුව නිසා අපි නිතර දෙවේලේ දුක් වේදනා ගැන වැඩි සැලකීමක් දක්වන්නෙමු.

11. අපි ඉපදුණු දා සිට අස්ථිර වූ මේ ජීවිතයට තදින් ඇලී පසුතැවීමට මුල පුරන්නෙමු. අපි එයට බිය වෙමු. මෙයට බිය වෙමු. අපගේ සිත් වහ වහා ලෞකික පෙලඹවීම්හි ගිලී, ලෝභ ද්වේශ භය මගින් මෙහෙයවන මෝහාධික ප්‍රවණතාවයකට ඇද ගෙන යයි. අප ඉපදෙනුයේ මෙම ස්වභාවය උරුම කොට ගෙනයි. මේ ගැන අප අද ම යමක් නොකළහොත් මෙම ස්වභාවය ඉදිරියට ගෙන යමින් මැරෙනු ඇත. මොන මෝඩ කමක් ද ?

12. දුක - අප උපදින විට ගෙනා දේ පමණයි අපට ඇත්තේ. අවශ්‍ය දෑ, අවශ්‍ය නොවන දෑ, සෑහීමකට පත්වීම, නො සෑහීමකට පත් වීම, හිඳ ගැනීම, හාන්සි වීම, කෑම, මළපහ කිරීම, මුත්‍රා කිරීම, ..., නමුත් කෝ සැනසීමක් ? කෝ අස්වැසිල්ලක් ? දුක එසේම පවතී. එනිසා අප භාවනා කරද්දී, මෙම සමස්ත දුක් කන්දරාව ම විමසිය යුතු වේ.

13. අපි කිසිදාක සෑහීමකට පත් නො වෙමු. කුරුලු ගී ඇසීමට අපි ප්‍රිය කරමු, නමුත් එම ගී හඬ ඝෝෂාවකට පෙරළුණ හොත් අපි කෝප වෙමු.

14. මිනිසුන්ගේ හදවත් දුක් වේදනාවන්ගෙන් හිරවී ඇති හෙයින්, කිසිවක් පැහැදිලි ව දැකිය නො හැක. ආශාවන් පසු පස හඹා යමින්, ඒවා අභිනන්දනය කරමින්, මෝඩ මිනිස්සු දෑත් දිගුකර, දුක් කන්දරාව සාදරයෙන් පිළිගනිති. ඔවුහු දුක, සතුට යයි වරදවා පිළිගනිති. ඥානවන්තයෝ සත්‍යය වූ සතුට කුමක්දැයි හඳුනාගන්නා තුරු, එසේම සත්‍යය වූ දුක කුමක්දැයි හඳුනා ගන්නා තුරු තම හදවත තුළට එබී බලා නිරීක්ෂණය කරති. ඔවුනගේ හදවත් පහසුවෙන් සිර වන්නේ නැත. ඔවුන් තුළ මුරණ්ඩුකම ඇතිවූ විට, ඔවුහු මුරණ්ඩුකම හඳුනා ගනිති. ඔවුන් තුළ කනස්සල්ල ඇති වූ විට, ඔවුහු කනස්සල්ල හඳුනා ගනිති. ඔවුන් තුළ මෝඩකම දුටු විට ඔවුහු එය ද හඳුනා ගනිති. ඔවුහු තම දෝෂයන් දෙස බලති. ඔවුන් අනුන් දෝෂ දර්ශනයට ලක් කිරීමට වෙහෙසෙන්නේ නැත.

15. පරිපූර්ණ ශීලය ඉස්මතු කර ගත හැක්කේ 'අත්හැරීමේ' ගුණය වර්ධනය කිරීමෙනි. සත්‍යය වූ විශිෂ්ටත්වය ඇත්තේ හදවත තුළය.

16. ඔබේ හදවත සහ මනස දෙස සෝදිසියෙන් බලන්න. සියුම් ලෙස නිරීක්ෂණය කරන්න. ඔබ සොයනා දිව්‍ය ලෝකය සහ අපාය ඇත්තේ එහි ය. සියලු දුක් වේදනාවන්ගෙන් මිදුණු, ආරක්ෂිත වූ නිවන කරා යන ආර්ය මාර්ගය ඇත්තේ ද එතැන ය.

17. විවේචන හමුවේ නො සැලී සිටින්න. එසේම ප්‍රශංසා හමුවේ උද්දාමයට පත් නො වන්න. ඔබේ සිත භාවනා වැඩීම ගැන පමණක්, ඉඳුරා ම යොමු කොට, අලුයම සිට අඳුර වැටෙන තෙක් පුරුදු පුහුණු කරන්න. ශීලයේ පරිපූර්ණත්වය ගොඩ නගා ගන්න. සත්‍යය වූ වචන ම පමණක් කතාකරන්න.

18. තමාට අවංක වීම ඔබේ ශීලයේ අඩිතාලමයි. ඔබ ඔබව හඳුනා ගන්න. ඔබ, ඔබේ වරද පිළිගෙන, ඒවා නිවැරදි කර ගැනීමට කටයුතු කරන්න. කිසිවක් ඔබෙන් නො සඟවන්න. විශේෂයෙන් ඔබ, ඔබට බොරුකාරයෙකු නො වන්න. ඔබට බොරුකාරයෙකු වීම, ඔබගේ ශීලයේ මුල් අඩිතාලම විනාශ කර ගැනීමකි. ඔබ සතුටු නම් මුළුමහත් ලෝකයට ම බොරු කිව හැක. නමුත් ඔබ ඔබට බොරු නො කියා ගන්න.

19. ගොවීන් තම කුඹුරු සකස් කරගන්නා සේ ඔබ ඔබේ මනස ද සකස් කරගන්න. ක්‍රම ක්‍රමයෙන් බිම සකස් කරගන්න. පස සකස් කර ගන්න. නියරවල් බඳින්න. බීජ වපුරන්න. පොහොර ඉසින්න. වතුර බඳින්න. වල් පැළ ගලවා දමන්න. අවසානයේ අනර්ඝ අස්වැන්නක් නෙළා ගැනීමට ඔබට හැකිවනු ඇත.

20. ඔබ භාවනාව පුහුණු නො කළේ නම්, භාවනාව කළ යුතු අන්දම ඔබට වටහා ගත නො හැකි වනු ඇත. ඔබ ම සත්‍යය නො දැක, එහි තේරුම ඔබට නො වැටහෙනු ඇත.

21. උදෑසන බොහෝ ශීතයි කියමින් ද, දහවල ග්‍රීෂ්මයි කියමින් ද, සවස නිදිමතයි කියමින් ද, උදාසීන ව සිට, භාවනා කිරීමට කාලයක් නැතැයි නො කියන්න. අලස බවේ කෙලෙස් නාදයට සවන් දී, ප්‍රඥාවන්තයන්ගේ අවවාදවලට විරුද්ධ නො වන්න. තමන් ගේ සිතිවිලිවල පමණක් වෙළී සිටින බයාදු පුද්ගලයා තම කොට්ටය අත පත ගගා සිටිනවා මිස නිවන් මගෙහි කිසිදු ප්‍රගතියක් නො ලබනු ඇත.

22. භාවනාව දැඩි කැපවීමකින් යුතුව පුරුදු පුහුණු කිරීමට අධිෂ්ඨාන කර ගන්න. ඔබේ සිතත් කයත් ධර්මය සෙවීම සඳහා කැප කරන්න. නිවන් මග ආලෝකවත් කර ගැනීමට ඔබේ හදවත දැල්වුණු පන්දමක් කර ගන්න. නොසැලී එම මගෙහි යන ඔබට, 'දුක' අවබෝධ කරගත හැකිවනු ඇත. ශීලයේ පරිපූර්ණ බව ද ඇති කර ගැනීමට වෙහෙසෙන්න. ධර්මයේ වැදගත්කම පහත් කොට නො සිතන්න.

23. පිරිසිදු ශීලය නො කඩා රැකගෙන කැපවීමෙන් භාවනා කරන්න. මේ සඳහා ඔබට තඹ සතයක්වත් වියදම් නොවනු ඇත. කම්මැලිකම දුරලන්න. සිතේ සංසිඳීම හා ප්‍රඥාව දියුණු වූ විට, කෙලෙස්වලින් සිත මිදෙනු ඇත. සියලු ඇලීම් දුරු කර, මහත් වූ දුක් කන්දරාවෙන් මිදෙන්න.

24. පමා නොවී, ඔබ තුළම ආරක්ෂිත රැකවරණයක් ස්ථාපිත කර ගන්න. ඔබ එසේ නො කළ හොත්, ඔබ මැරෙන මොහොතේදී, හදවත තුළ, සුගති ගාමී වීමට සවිමත් බලයක් ඇති පසුබිමක් ගොඩ නො නැගෙනු ඇත. කිසිදු භේදයකින් තොර ව, සෑම සත්ත්වයෙකු ම ඉපදීම හෝ මරණය හෝ අත්දකී. සෑම පුද්ගලයෙකු ම නොනවත්වා ම දුක් ගැහැට විඳිමින් මැරි මැරී උපදී. සෑම වයසක ම මිනිසුන්, කිනම් ගෝත්‍රයකට අයත් වුවත්, කිනම් සමාජ තලයක සිටියත්, මෙහි දී හැමෝම එක සමානය. අප හෙට උදේ මැරේ ද, අද සවස මැරේද, අපි නො දනිමු. නමුත් නිසි වේලාව පැමිණි විට මරණය අප කරා එන බව නම් නියත ය.

25. අපි නැවත නැවත මැරි මැරී උපදිමු. ඉපදීම, ජරාවට යෑම, මරණය යන චක්‍රය නො නවත්වාම ක්‍රියාත්මක වේ. බුදුරජාණන් වහන්සේ ගෙන් පැවතෙන අපි, අප තුළින් සත්‍ය වූ ධර්මයක් නො සොයා දිරාපත් වී කුණු වී යෑමට පමණක් ජීවත් වීමෙන් ඇති ඵලය කුමක් ද? මරණය පැමිණි කළ පිරිසිදුව යහතින් මැරෙන්න. මැරෙණ විට සිතත් කයත් කිසිදු ඇලීමකින් තොරව අත හැර, මැරෙන්න. සියල්ලේ ම ඇති තතු යථාභූත ව දකිමින්, මැරෙන්න. බුදුන් වහන්සේ දැක්වූ මග නිතර නිතර සිහි කරමින්, මැරෙන්න. යළිත් වරක් නො මැරෙන තත්වයකට පැමිණ මැරෙන්න.

26. මට ඇහුම්කන් දෙන්න. සාමාන්‍ය සතෙකු වාගේ කකා බිබී නිදා ගනිමින් කාලය ගත නොකරන්න. ලෞකික සැප සම්පත් අභිනන්දනය නො කරමින්, ජීවත් වීමට තදින් සිතට ගන්න. අනාගත භවයන් පිළිබඳව භයක් ඇතිකර ගන්න. නිරාමිස සතුට දෙස ඔබේ හදවත විවර කරන්න. තම ජීවිත පතුලේ අළුයට ගිනි මෙන් දැවී දැවී පවතින කෙලෙස් ගොන්න දෙස නිකරුණේ බල බලා කාලය ගත නො කරන්න.

27. අප ජීවත් වන ලෝකය ගැන දැනීම ප්‍රයෝජනවත් විය හැක. නමුත් ඔබ පිළිබඳ දැනීම අන් කිසිදු දැනීමක් සමග සැසඳිය නො හැක. අප අපගේ පියවි ඇසින් යමක් දෙස් බලා, ලබා ගන්නා අවබෝධයට වඩා විදර්ශනා ඇසින් බලා ලබා ගන්නා අවබෝධය බොහෝ සේ වෙනස් ය.

අපගේ ලෞකික සිතිවිලිවලින් වටහා දෙන, හරයක් නො මැති දැනීම, වස්තූන්ගේ යථා තත්වය ගැන, ප්‍රඥාවෙන් ලබන දැනීම තරම් ගැඹුරක් නැත.

28. දිනක් මාගේ කම්මට්ඨානාචාර්ය, මුන් මහා තෙරුන් වහන්සේ ගෙන් කෙනෙකු මෙවැනි ප්‍රශ්නයක් ඇසුවේ ය. "ආරණ්‍යවාසී භික්ෂූන් මොන වාගේ පොත් ද කියවන්නේ ?" එවිට උන්වහන්සේගේ පිළිතුර වූයේ, "ඒ ඇත්තෝ ඉගෙන ගන්නේ ඇස් වසා ගෙන, සිත අවදි කරගෙන යි." මම අලුයම අවදි වූ වහා ම මගේ ඇස්වලට, රූප නම් වූ වෙඩි වරුසාවක් වදිනවා. එතකොට මම ඇසේ සහ රූපයේ එක් වීම විමර්ශනය කරනවා. මගේ කන් ශබ්දවලින් ගැටෙනවා. මගේ නාසයට ගඳ සුවඳ දැනෙනවා. මගේ දිවට රස දැනෙනවා. මගේ ශරීරය ශීතල උෂ්ණ, තද ගතිය, සිනිඳු ගතිය විඳිද්දී, මගේ සිත සිතිවිලිවලින් හා හැඟීම්වලින් බැට කනවා. මම මේ හැම දෙයක් ම නිරන්තර ව විමර්ශනය කරනවා. එසේ කරන විට මාගේ සෑම ඉන්ද්‍රියක් ම මට ගුරුවරයෙක් වෙනවා. එවිට මම මුළු දවස තිස්සේ ම කිසිදු විවේකයක් නොමැතිව ධර්මය ඉගෙන ගන්නවා. මොන ආයතනය ගැනද මම අවධානය යොමු කළ යුත්තේ කියා තීරණය කරන්නේ මම යි. එසේ තීරණ කළ පසු එහි සත්‍යය විනිවිද දකින්න මම වෙහෙසෙනවා. මගේ ගුරුතුමා, ආචාර්ය මුන් මට භාවනා කරන විදිය ඉගැන්වූයේ මෙහෙමයි.

29. අපගේ කය 'දැඩි ආශාව' මතු කරවන වැදගත් අරමුණකි. දැඩිව ග්‍රහණය වන ක්ලේශයක් වන "ඇලීම" මෙහි ප්‍රතිඵලයකි. එහි අවසානය 'දුක' ය. මෙය ජය ගැනීමට නම්, ඔබගේ අවධානය, දිරාපත් ව ජරාවට යන, එමෙන් ම සිදි බිඳී යන 'මිනිස් කය' වෙත යොමු විය යුතු වේ. එසේ යොමු වෙද්දී, මිනිස් ශරීරයේ සංයුතිය ගැන මනසේ පිළිකුලක් ඇති වේ. මිනිස් ශරීරය සකස් ව ඇති අයුරු පිළිබඳව අතිශයින් අප්‍රියක් ඇති වේ. කය ගැන පිළිකුල වර්ධනය වෙත් ම, සිතෙහි සැහැල්ලු බව සහ ප්‍රභාස්වරය තීව්‍ර ව ඉස්මතු වේ. මිනිස් කය, මොහොතින් මොහොත වෙනස් වන, අඩියක් පළල, අඩි හයක් දිග, ලේ මස්වලින් පිරුණු මස් ගොඩකි. මෙවන් ශරීරයකට අප දක්වන ඇල්ම නිසා ඇතිවන දුක් ගොඩ දැකීම, ධර්මය දෙසට අපගේ සිත් යොමු කරවන මූලික ප්‍රඥාවයි. කය දෙස යථා තත්වයෙන් දකින ඇත්තෝ ධර්මය වහ වහා අවබෝධ කර ගනිති.

30. භාවනාවේ යෙදී සිටිද්දී අරුම පුදුම අස්වාභාවික දේ සිදු වේ. ඒවා එසේ සිදුවීමට ඉඩ හරින්න. ඒවාට නො ඇලෙන්න. ඇත්තෙන් ම එම සිදුවීම්, බාහිර කරුණු නිසා ඇති වන, අත් හැරිය යුතු දේවල් ය. ඒවා පසකට දමා ඉදිරියට ම යන්න. ඒවා අල්ලා ගෙන නො සිටින්න. සියලු විඤ්ඤාණ තලයන් උපදින්නේ සිතෙන් ය. දිව්‍යලෝකය සහ අපායෙහි ආරම්භය සිතය. ප්‍රේතයෝ, දෙවියෝ, පෘථග්ජන මිනිස්සු, භික්ෂුණීන් ..... සියලු සත්ත්වයන්ගේ ආරම්භය සිත ය. එනිසා තම සිත ගැන ම පමණක් සිත යොමු කර සිටීම වඩාත් සුදුසු ය. එතැන මුළු විශ්වය ම ඔබට හමුවෙනු ඇත.

31. අතිශයින් පිරිසිදු නො සෙල්වෙන ජලය ඇති පොකුණක පතුලෙහි ඇති දෑ ඉතා පැහැදිලි ව දැකගත හැක. ගැඹුරු ලෙස තැන්පත් වූ හදවත නො සැලී නිශ්චල ව පවතී. හදවත නිශ්චල වූ කළ ප්‍රඥාව පහසුවෙන් මෝදු වී ගලා එයි. ප්‍රඥාව ගලා එද්දී, පිරිසිදු අවබෝධය ඒ සමග ඉස්මතු වේ. ලෝකයේ අනිත්‍යතාවය, දුක්ඛිත ස්වභාවය, සහ අසාරවත් බව, විදුලි සැරයක් සේ ප්‍රඥා ඇසින් දිස් වී, මහත් වූ දුක් කන්දරාවකට ඇලී ගැලී සිටීම ගැන කනස්සල්ලට පත්වී, තැන්පත් දිවියකට සිත සකස් වේ. එසේ සිත සිසිල් වූ අවස්ථාවේ හදවතේ දැවෙමින් තිබූ ගිනි දැල් කෙමෙන් නිවී, ස්වභාවයෙන් ම දුකින් මිදීමට සිත සකස් වේ. සිතේ මෙම පරිවර්තනය සිදුවනු යේ, 'ආරම්භක සිත' ස්වභාවයෙන් ම අතිපිරිසිදු නිකැලැල් සිතක් හෙයිනි. සිතෙහි ආරම්භක සාමාන්‍ය තත්ත්වය, පිරිසිදු බවයි. එය කිලිටි වන්නේ බාහිර අරමුණු බලහත්කාරයෙන් ඇතුළු කරගන්නා හෙයිනි. එසේ පිළිගන්නා අරමුණු, දොම්නස සොම්නස ආදී හැඟීම්වලට ඉඩ දී, සිතෙහි ස්වකීය පිවිතුරු බව සම්පූර්ණයෙන් ම අඳුරු කරගන්නා තෙක්, සිතිවිලි (සංස්ඛාර) ජනිත කරවයි.

32. සියල්ල මවන්නේ අපගේ සිතය. ඇස් රූප දකී. කන් ශබ්ද අසයි. නාසය ගඳ සුවඳ ආඝ්‍රාණය කරයි. දිව රස විඳියි. ශරීරය පහස විඳියි. හදවත හැඟීම් අත්දකී. නමුත් සිත මේ හැම දෙයක් ගැන ම බලමින් දැනුවත් වී සිටී. සිත මේ සියල්ල දකී. ඒවා ගැන නා නා අයුරින් සිතයි. අපගේ සිහිය සහ ප්‍රඥාව තීව්‍ර වූ විට, මේ සෑම මැවීමක් ම අපට බලා ගත හැක. නමුත් බොහෝ විට ක්ලේශයෝ අපව ඔවුනගේ ස්වභාවික, ශක්තිමත් වූත් වේගවත් වූත් ප්‍රවාහය සමග ගෙන යති. අපට කුමක් වී දැයි වැටහෙන්නටත් ප්‍රථම අපි කෝපයට පත්වී හමාර ය. අපි ලෝභ සහගත වී, මුලා වී

මානාධික වී හමාර ය. එසේ වන්නේ අපව කෙලෙස්වලින් රැවටූ හෙයිනි. එනිසා මෙම කෙලෙස්වල බලපෑම ගැන ඉතාමත් විමසිලිමත් වී සිදුවිය හැකි පිරිහීම ගැන කල්පනාකාරී වන්න. පහසුවෙන් ඔබව මුලා කිරීමට කෙලෙස්වලට ඉඩ නො දෙන්න. කෙලෙස්වල ක්‍රියාකාරිත්වය මෙල්ල කිරීමට අප දක්ෂ වුවහොත්, එහි අශුභවාදී ශක්තිය, ශුභවාදී ආධ්‍යාත්මික බලයකට පරිවර්තනය කළ හැක. උද්‍යෝගිමත් ව ඉවසිලිවන්ත ව උනන්දු වන්න.

33. ඔබේ ප්‍රගතියේ වේගය, ඔබ අතීතයේ ගොනු කරගත් සීල පාරමී කුසලයන් මත සහ වර්තමානයේ ඔබ වාඩිවී සහ සක්මන් ඉරියව්හි කෙරෙන භාවනා සඳහා යොදවන වීර්යය මත රඳා පවතිනු ඇත. එම නිසා නිතර ම සීලය රකිමින් කිසිදු අකුසල් චේතනාවක් ඔබ සිත තුළට නො වද්දා ගැනීමට වෙහෙසෙන්න. මෙසේ ඔබ ක්‍රම ක්‍රමයෙන් පුහුණු වෙද්දී ඔබගේ වටහා ගැනීමේ ශක්තිය ටිකෙන් ටික දියුණු වී සිත පිරිසිදු වේ. ඔබ, ඔබේ යථාභූත ඥානය හදවත තුළින් පුබුදින බව දකිද්දී දුක් විඳිමින් පැමිණි දීර්ඝ මාවතක අවසානය ඔබට ටිකෙන් ටික දිස් වෙනු ඇත.

34. උත්පත්තියෙන් ඔබ උරුම කරගත් "සතිය" සහ "ප්‍රඥාව" දියුණු කරගැනීම නො සලකා උදාසීන ව සිටීමෙන්, එමෙන් ම, ඔබගේ ජීවිතය හා සම්බන්ධ සත්‍යතාවයන් ගැන උනන්දුවක් නො මැතිව කල් ගත කිරීමෙන්, ඔබ ගමන් කරන නිවන් මගෙහි බාධක ටිකෙන් ටික වර්ධනය වී, සම්පූර්ණයෙන් ම, වැසී නො පෙනී යාමට ඉඩ ඇත. එම මාර්ගයෙහි අවසානය සදාකාලිකව ම ඔබට අඳුරෙන් වසා තබනු ඇත.

35. නිවන් යන්න ඕනෑ යයි කියමින් මිනිසුන් බෙල්ල කරකවමින් නිමක් නැති අනන්ත වූ ආකාශය දෙස බලමින් ඉන්නවා. එසේ මොනතරම් මහන්සි වී බලා සිටිය ද, නිවන සොයා ගැනීමට අපහසු බැව් ඔවුහු නො දකිති. ලෞකික යථාර්ථවාදය තුළ නිවන කිසිසේත් නො පවතී.

36. පසුගිය අවුරුදු ගණනාව තුළ මා වඩාගෙන ආ භාවනා පුහුණුව පහසුවෙන් කළ හැක්කක් නොවේ. එය බොහෝ දුෂ්කර ය. මෙම ගමන යද්දී, මාගේ ශරීර ශක්තිය, අධිෂ්ඨානය දැන මැන ගැනීමට මම බොහෝ දුෂ්කරතා ඉවසා සිටියෙමි. දින ගණනාවක් මම ආහාර නොමැති ව නිරාහාර ව සිටියෙමි. බොහෝ රාත්‍රීන් මම වැතිරී, නිදාගැනීම ප්‍රතික්ෂේප කෙළෙමි. දුෂ්කරතා ඉවසීම මාගේ හදවතට ආහාරයක් විය. මගේ හිසට විවේකයක්

වූයේ උත්සාහය නම් වූ කොට්ටයයි. ඔබද අත්හදා බලන්න. ඔබේ අධිෂ්ඨානය ඔබ ම විභාග කර බලන්න. ඔබේ සිතෙහි ඇති අද්භූත බලය ඔබට වහා සොයාගත හැකිවනු ඇත.

37. වචනයේ පරිසමාප්තයෙන් ම සිල් මාතාවක් වන්න. දුගඳ හමන ලෞකික ජීවිතයන්හි පටලැවී, ඔබට නියම වූ කාර්ය අහෝසි නො කර ගන්න. එසේම ඔබ අත හැර ආ නිවස සහ පවුල දෙස ඇලුම් ඇතිකර ගනිමින් ආපසු හැරී නො බලන්න. නිතරම කතා කරන, අනුන් ගෙන් උදව් පදව් ඉල්ලන අලස සිල් මාතාවක් නො වන්න. චාම් දිවි පෙවෙතකින් සෑහීමකට පත්වන්න. මරණයට භය නො වන්න. අසභ්‍ය දේවල් ගැන කිසි දිනක කතා නොකරන්න. යථාර්ථය පමණක් කතා කරන්න. මාගේ සිල් මාතාවන් ශිෂ්ටසම්පන්න ව හැසිරිය යුතු වේ. ඔබ සත්‍ය වශයෙන් ම මාගේ අනුගාමික සිල් මාතාවන් වීමට අපේක්ෂා කරන්නේ නම්, මාගේ උපදෙස්වලට ඇහුම්කන් දෙන්න. ඔබේ හැසිරීම ගැන මම චෝදනා කරද්දී, මා ආදර්ශයට ගනිමින්, ඔබ ඉගෙන ගන්නේ යයි සැම විටම සිතන්න.

38. ඔබ මාගේ ශිෂ්‍යාවන් වීමට පැමිණියේ නම්, උතුම් වූ ආදර්ශවත් මිනිසුන් වීමට වීර්ය ගන්න. දුෂ්කරතා ජය ගැනීමේ ආත්ම ශක්තියෙන් යුතු ධෛර්යවත් ව භාවනා පුහුණුවෙහි යෙදෙන, සැම මොහොතක ම ඔබේ ඇතුළත සත්‍යය දැන ගැනීමට වෙහෙසෙන, ප්‍රසන්න සිල් මාතාවක් වන්න.

39. මගෙන් ඉගෙන ගන්නා අය, ඉදිරියට තබන පියවරක් පියවරක් පාසා, බුදුරජාණන් වහන්සේ ගත් මග ගැන මහත් වූ විශ්වාසයක් තැබිය යුතුයි. අතීතයේ අහිමි වූ සම්පත් ගැන කස්සලු නො වන්න. අනාගතයේ වාසි බලාපොරොත්තු නො වන්න. එවන් සිතිවිලි ඔබව මුලා කරයි. අලස කමට සිත නැඹුරුවන සෑම මොහොතක ම ඊට එරෙහිව සටන් කරන්න. ලෙහෙසියෙන් කොට්ටයට යටත් වෙන්න එපා. ඔබේ සිත දෙස විමසිල්ලෙන් බලන්න. එසේ බලා හදවත තුළ ඇති සත්‍යය සොයන්න.

40. ප්‍රශ්නයක් අසන්නට ප්‍රථම, ඔබ ම පිළිතුරක් සෙවීමට වෙහෙසෙන්න. ඔබ හරි හැටි විමර්ශනය කළ හොත් බොහෝවිට පිළිතුරක් සොයා ගැනීමට ඔබට හැකි වනු ඇත.

41. බුදුදහම පුහුණු වෙද්දී, ඔබ යා යුතු මග ඔබ ම සොයාගත යුතු ය. "දුක" අබිබවා යන මාර්ගය සොයා දැන පටන් ගත යුත්තේ ඔබම ය. නිවැරදි

ව එය සොයන ක්‍රමය නම්, ඔබේ සිත තුළට එබී බැලීමයි. මාර්ගය වැටී ඇත්තේ අපගේ හදවත් සහ සිත් ඇතුළත ය. එනිසා අවසානය කරා යන තුරු දැඩි අධිෂ්ඨානයෙන් කටයුතු කරන්න.

42. මිනිස්සු තදින් අල්ලාගෙන දුක් විඳිති. ඔවුහු ඒවා අත නො හරිති. කුරිරු බලාපොරොත්තු සිතෙහි රඳවා ක්‍රෝධයෙන් අත් නොහරිති. ඔවුන් යන යන තැන දුක ඔවුන් පසුපස ලුහුබඳී. එනිසා ඔබ, ඔබව නිරීක්ෂණය කොට 'අත් හැරීම' ඉගෙන ගන්න.

43. භාවනා පුහුණුවේ වටිනාකම ගැන සැක නොකරන්න. ඔබේ හැකියාවන් අවතක්සේරුවට ලක් නො කරන්න. ඔබ (භාවනාවෙන්) යම් ප්‍රගතියක් ලැබුවේ ද, එයින් සෑහීමකට පත් වන්න. එම ප්‍රගතියෙන් පිළිබිඹු වන්නේ "ඔබ කව්දැයි" යන්න පිළිබඳ සත්‍ය තත්ත්වයේ කොටසකි. එම නිසා ඒ ගැන ඔබට විශ්වාසයක් තැබිය හැක. ඔබ ඇත්ත වශයෙන් ම කවුරුන් දැයි ඔබ ම විමසා බලන්න. උපදින්නේ කව්රුන් ද? අසනීප වන්නේ, මහලු වන්නේ, මැරෙන්නේ කව්රුන් ද? ඔබේ ශරීරය ඔබේ මනස, ඔබේ ජීවිතය ..... මේ දෑ ඔබට අයත් දේ නො වේ. ලෝකයේ ඇති දුක් දොම්නස්වලින් ඔබගේ සත්‍ය ස්වභාවය නො කෙලෙසා ගන්න.

44. මම උපාසිකාවක් ලෙස සසුන් ගත වූ දා සිට මාගේ හදවතෙහි අප ද්‍රව්‍ය පිරිසිදු කිරීම නො කඩවා කරගෙන ගියෙමි. මගේ මූලික ස්වභාවය නිතර දෙවේලේ පිරිසිදු කරමින් ඔප දැමිය යුතුය, යන්න ගැන මම සිහි කල්පනාවෙන් සිටියෙමි.

45. බුද්ධ ධම්ම සංඝ යන බෝධි වෘක්ෂයන්හි සිසිල් සෙවණ ලබමින් සරණ යා හැක්කේ ආර්ය ප්‍රඥාවන්තයෙකුට පමණි.

සමාප්තිය

ආචාර්ය ඉන්තවායි සන්තුස්සකො හිමි තායිලන්ත වන සෙනසුන් ජ්‍යේෂ්ඨ ස්වාමීන් වහන්සේ නමකි. සිල් මාතා කායිව්ගේ අද්විතීය ජීවිත පුරාවෘත්තය ගැන විශේෂ උනන්දුවක් දැක්වූයේ ය. බාන් හුආයි සායි ගම්මානයට නුදුරු ගමක ඉපිද අවුරුදු 11 දී සාමණේර හිමි නමක් වශයෙන් සසුන් ගත වූ උන්වහන්සේ සිල් මාතා කායිව් ළමා කාලයේ සිට හඳුනන කෙනෙකි. මෙම දෙදෙනා ආධ්‍යාත්මික වශයෙන් සමීප සබැඳියාවක් සංසාරය තුළ තිබූ බැව් ප්‍රසිද්ධ විය. මෙම කර්මානුකූල ඥාතිත්වය සිල් මාතා කායිව් නොයෙක් අවස්ථාවල සනාථ කර ඇත.

ආදාහන පූජෝත්සවය නිම වී ටික දිනකින් ආචාර්ය ඉන්තවායි සන්තුස්සකො හිමි කායිව් රහත් තෙරණියගේ දයාව අනුකම්පාව අසීමිත මෛත්‍රිය කරුණාව සහ ප්‍රඥාව පිළිබිඹු කරන සිහිවටන ස්මාරකයක් ඉදි කිරීමට අදහස් කළේ ය. කායිව් රහත් තෙරණියට ගෞරව දැක්වීම සඳහා ඇගේ ධාතූන් නිධන් කොට එම ස්මාරකය ඉදි කිරීමට සුදුසු ස්ථානයක් උන්වහන්සේ සලකුණු කර ගත්තේ ය. එය හැම තරාතිරමක අයවලුන්හට වන්දනාමාන කිරීමට පහසු තැනක් විය.

අවුරුදු ගණනාවක් සැලසුම් කර අවසානයේ බැංකොක් නගරයේ දුම්රිය ඉංජිනේරු මහතුන් කීපපොළක් සමග අඩි 80 ක් උස ස්ථූපයක් ඉදි කළේ ය. එය බාන් හුඅායි සායි සිල් මාතා ආරණ්‍යයට සමීපව ඉදි කෙරුණි. ධාතු ගර්භය වටා රෝස මල් සහ නිල් මානෙල් මල් පිරුණු දර්ශනීය පොකුණකි. ස්වාභාවික සෞන්දර්ය හා බද්ධ වෙමින් ඉදි කෙරුණු මෙම ස්මාරකය ඉතා ආකර්ෂණීය ය. සිහිවටන ස්ථූපය 2006 මැයි මස 21 වැනි දින නිල වශයෙන් විවෘත කරන ලදී. එදා සිට මෙම ස්මාරකය ලෝක පූජිත වී ඇත. මුතු මැණික් ස්වරූපය ගත් ඇගේ අට්ඨි ධාතූන් පූජාසනය මත ප්‍රදර්ශනය කර ඇත. ජීවමාන ප්‍රමිතීන්ට අනුව ප්‍රතිමා තුනක් තනා ඇත. දෙවන මහලේ සුදුවතින් සැරසුණු, ඉටිවලින් තැනූ හිඳි ඉරියව්වෙන් යුත් ප්‍රතිමාවකි.

තායිලන්ත ජාතික කලාකරුවන් මෙම මන්දිරය අතිශයින් කලාත්මක කර ඇත. ආචාර්ය මහා බෝවා තෙරුන් වහන්සේ මෙම ධාතූන් ධාතු ගර්භයේ තැන්පත් කිරීමේ උත්සවයට සහභාගි විය.

මේ පූජනීය අවස්ථාවේ අපි සිල් මාතා කායිව් රහත් තෙරණියට ගෞරව කිරීම සඳහා රැස් වී සිටිමු. ඇය ආචාර්ය මුන් මහා තෙරුන් වහන්සේගේ ආර්ය ශ්‍රාවිකාවකි. ආචාර්ය මුන් හිමිගේ ධාතූන් මේ වන විට පළිඟු තත්වයට වෙනස් වී ඇත. රහත්භාවය ස්ත්‍රී පුරුෂභාවය මත රඳා නොපවතින්නකි. ස්ත්‍රී පුරුෂ කවුරුන් හෝ වේවා, පාරමී ධර්මයන් සම්පූර්ණ කොට සියලු කෙලෙස් ප්‍රහීණ කිරීමට කෙනෙකු සමත් වේද, එම තැනැත්තා අර්හත් වේ. සිල් මාතා කායිව් අපට දුන් ආදර්ශය අනුව යමින් පාරමී ධර්මයන්ගෙන් අප හදවත් පුරවා ගැනීමට වීර්ය ගත යුතුයි.

ඈ ලද අතිවිශිෂ්ට ආධ්‍යාත්මික දියුණුවට මුළු හදවතින් ම ගරු කිරීම බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයට වන්දනා කිරීම හා සමාන ය. අප හැමෝට ම ඇගේ නිකැලැල් පවිත්‍රත්වය සරණ යා හැක.

සිහිවටන

සිල්මාතා රහත් තෙරණියගේ ස්මාරකය

මුතු බවට පත්වූ අස්ථි ධාතූන්

පළිඟු බවට පත්වූ අස්ථි ධාතූන්

රහත් තෙරණියගේ ප්‍රතිමාව හා
පාරිභෝගික වස්තූන්

තායිලන්තයේ
සිල්මාතා කායිව්
1901 දී ඈත පිටිසර වනගත
ගම්මානයක ඉපිද හැදුණු වැඩුණු
ගෙවිලියකි.
පාසල් නොගිය ඇය
දෑතේ වීරියෙන්
දුෂ්කර කටුක දිවියක් ගෙන ගිය
ගැහැනියකි.
නිසරු විවාහ ජීවිතයක
දුක් ගැහැට විඳි
ගෘහණියකි.
ගිහිගෙය අතහැර ගොස්
රහතන් වහන්සේ නමක් යටතේ
ධර්මය අසා ධරා පුහුණු වී
රහත් ඵලය ලැබූ
තෙරණියකි.
1991 දී පිරිනිවන් පෑ
බුද්ධ ශ්‍රාවිකාවකි.
අදත් පිරිසිදුව පවතින
ධර්මය අනුව පිළිපැද
නිවන් දැකිය හැකි බවට ඇති
ප්‍රබල සාක්ෂියකි.